ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

ஜெனரல் சேர் ஜோன் கொத்தலாவல பாதுகாப்புப் பல்கலைக்கழகம்

GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY



වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන

வருடாந்த அறிக்கையும் நிதிக்கூற்று அறிக்கைகளும்

ANNUAL REPORT & FINANCIAL STATEMENTS

2020

සිංහල

හැඳින්වීම



ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ පිහිටුවනු ලැබූ අතර ඉන්පසුව සංශෝධන කීපයක් මගින් එහි මෙහෙයුම් විෂය පථය පුළුල් කරනු ලැබ ඇත. පසුව 1988 අංක 27 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල (සංශෝධිත) පනත මගින් විශ්වවිද්‍යාල තත්වයට උසස් කරනු ලැබූ ආරක්ෂක අභ්‍යාස ආයතනය, 2007 අංක 50 දරන (සංශෝධිත) පනත මගින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (කොආවි) ලෙස නැවත නම් කරනු ලැබීය.

මෙම වාර්ෂික වාර්තාව මගින් 2020 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වන කාල සීමාව තුල විශ්වවිද්‍යාලයේ කාර්යයන් සහ කාර්යසාධනය ආවරණය කෙරේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වන වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 හා 17 වන වගන්තිවලට අනුකූලව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් මේ සමග ඉදිරිපත් කරමි.

විශ්වවිද්‍යාල ලාංඡනය



ශ්‍රී ලංකාවේ ප්‍රථම ත්‍රිවිධ හමුදා අධ්‍යාපන ආයතනය වන කොආවියේ ලාංඡනය, පිළිවෙලින් ශ්‍රී ලංකා යුධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව නියෝජනය කරමින් කතිරයක් ආකාරයෙන් පිහිටි කඩු දෙකක්, නැංගුරමක් හා පියාපත් දෙකක් ඇතුලත්වේ. එය ලාංඡනය මධ්‍යයේ ඇති පන්දම මගින් අධ්‍යාපනය සඳහා ලබාදී ඇති කේන්ද්‍රීය ස්ථානය නිරූපනය කෙරේ. ලාංඡනය පහලින් "සිය රටටමයි කවදත්" යන විශ්වවිද්‍යාලයේ ආදර්ශ පාඨය සඳහන්වේ. ලාංඡනය මුදුනේ ඇති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ලාංඡනය මගින් කොආවියේ ජාතියට ඇති ස්ථීර රාජපාක්ෂිකභාවය පෙන්නුම් කෙරේ.

විශ්වවිද්‍යාල ධජය

කොආවි ධජය, ශ්‍රී ලංකා යුධ හමුදාව සඳහා තැඹිලි පැහැයද, ශ්‍රී ලංකා නාවික හමුදාව සඳහා තද නිල් පැහැය සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා ලා නිල් පැහැය ද ලෙස විවිධ පැහැයන්ගෙන් යුත් තීරුවලින් ත්‍රිවිධ හමුදාව නිරූපනය කරන සංකේතාත්මක සම්මිශ්‍රණයකින් යුක්තවේ. තවද ධජයට කොආවි ලාංඡනය ඇතුලත් කිරීම මගින් දේශයේ ත්‍රිවිධ හමුදාවන්හි වෘත්තීය හා අධ්‍යාපනික අවශ්‍යතා ඉටුකිරීම මගින් කොආවි මවුබිමට සේවය කිරීමේ කාර්යභාරය සංකේතවත් කෙරේ.



විශ්වවිද්‍යාල ගීතය

දෑ අනුරාගෙන් ප්‍රාණ ප්‍රබෝධිත
සියරටටම කවදත් කැප අප වෙත
ශිල්ප ශ්‍රාස්ත්‍ර සංග්‍රාම තාක්ෂණ
ඥාණ විභූෂණ ශික්ෂණ දානී
ශ්‍රීමත් කොතලාවල
ආරක්ෂක සරසවි ලංකා
ධරණී ජයතු

ත්‍රිවිධ හමුදා ජීවය විදහා
දෙස රැක ගැනුමට ජය ධජ නැගුමට
දෑ අභිමානෙන් පෙරට තබන පා
සතුරන් මැඩ මිස නොගනිමු ආපසු
දිවි දෙමු සාමයේ කුසුම් පිපෙන තුරු
ඒ කුසුමෙන් ලක් මව සැනසෙන තුරු//

දෑ අනුරාගෙන් ප්‍රාණ ප්‍රබෝධිත
සියරටටම කවදත් කැප අප වෙත
ශිල්ප ශ්‍රාස්ත්‍ර සංග්‍රාම තාක්ෂණ
ඥාණ විභූෂණ ශික්ෂණ දානී
ශ්‍රීමත් කොතලාවල ආරක්ෂක
සරසවි ලංකා ධරණී ජයතු

විශ්වවිද්‍යාල සිතියම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය - රත්මලාන



විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථ

අපගේ දැක්ම

හමුදාවට, රාජ්‍ය අංශයට හා සමස්ත සමාජයට සුවිසල් මෙහෙවරක් ඉටුකෙරෙන වෙසෙස් සහ විෂයාන්තර ආරක්ෂාවට අදාල උසස් අධ්‍යාපනයෙහි උපාධි අපේක්ෂකයින් සහ උපාධිලාභී ශිෂ්‍යයින් යන දෙපාර්ශවයම නිරත කරවනු පිණිස පවත්නා අද්විතීය හැකියාව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රකට කෙරෙන විශ්වවිද්‍යාලයක් බවට පත්වීම.

අපගේ මෙහෙවර

ආරක්ෂක ක්ෂේත්‍රයෙහි විෂය ක්ෂේත්‍ර ගණනාවක් හරහා උසස් තත්වයේ පර්යේෂණ සමගින් උපාධි අපේක්ෂක, උපාධි, සහ වෘත්තීය වැඩසටහන් තුලින් ඉහල ගුණාත්වයේ ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන අත්දැකීමක්, විශ්වවිද්‍යාලයෙහි වාසික හා වාසික නොවන සන්දර්භ දෙක තුලදීම සහතික කිරීම.

පරමාර්ථ

අ. කැඩෙට් නිලධාරීන් සන්නද්ධ සේනාවලට අනුයුක්ත කිරීමට පෙර, ඔවුන්ව සන්නද්ධ වෘත්තියට හඳුන්වාදීමට පහසුකම් සැලසීම සහ සිය වෘත්තිය පිළිබඳ ඔවුන්ගේ දැනුම හා කුසලතා දියුණු කිරීමට මාර්ගෝපදේශත්වය සැපයීම.

ආ. කැඩෙට් නිලධාරීන්ට, නිලධාරීන්ට හා රජයේ සේවකයින්ට සහ ඕනෑම වෙනත් තැනැත්තන්ට ඔවුන්ගේ වාත්තීන් හා හැකියාවන්ට අදාල විෂයන්වල පළමු උපාධිය සඳහා සූදානම් වීමේද ශාස්ත්‍රීය අධ්‍යාපනය සඳහා පහසුකම් හා උපදෙස් ලබාදීම.

ඇ. සන්නද්ධ හමුදාවල නිලධාරීන්ගේ සේවාකාලය තුල ඒකාබද්ධ මෙහෙයුම් වලට පහසුකම් සැලසීමේ අරමුණ උදෙසා හමුදා නිලධාරීන් අතර මිත්‍රත්වය සහ සමගිය ගොඩනැගීමට කැඩෙට් නිලධාරීන් අතර සහෝදරාත්මක බැඳීම හා හොඳ හිත වර්ධනය කිරීම.

ඈ සන්නද්ධ සේනාවල නිලධාරීන්ට සහ වෙනත් තැනැත්තන්ට විශ්වවිද්‍යාලය මගින් පිරිනමන පශ්චාද් උපාධි, උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් සහතික පත්‍ර ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තිය දියුණුව වෙනුවෙන් අධ්‍යයන පාඨමාලා පිරිනැමීම.

ඉ. විශ්වවිද්‍යාලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය බවට විශ්වවිද්‍යාලය මගින් සලකනු ලබන පර්යේෂණ සහ සංවර්ධන ඇතුළු වෙනත් කාර්යයන් ඉටුකිරීම.

විශ්වවිද්‍යාලය පිළිබඳව සැකෙවින්

• ස්ථාපනය	- 1980 ඔක්තෝබර් 11 වන දින
• සම්පූර්ණ වපසරිය (අක්කර)	- 48 (රත්මලාන) - 144 (සූරියවැව) - 49 (වේරහැර)
• මණ්ඩප	- 01 (සූරියවැව)
• ප්‍රතීතනය ලද ආයතන	- 07
• පීඨයන්	- 09
• දෙපාර්තමේන්තු	- 31
• අංශ	- 36
• මධ්‍යස්ථාන/අංශ	- 08
• පළමු උපාධි	- 32
• බිහිකරන ලද උපාධිධාරීන් සංඛ්‍යාව	- 10,121
• පශ්චාත් උපාධි	- 10
• පළමු උපාධි සඳහා බඳවා ගැනීම් සංඛ්‍යාව	- විදේශීය ශිෂ්‍යයින් 219 ඇතුළුව 6124
• පශ්චාද් උපාධි සඳහා බඳවා ගැනීම් සංඛ්‍යාව	- 1300
• පුස්තකාල ජාලයේ ඇති පොත් සංඛ්‍යාව	- 38,666
• ඊ-පොත් සංඛ්‍යාව, ඊ-සඟරා හා ඊ-දත්ත සමුදායන්	- 248,000
• ක්‍රීඩා සංඛ්‍යාව	- 19
• ශිෂ්‍යයින් සඳහා සමාජ	- 14
• අධ්‍යයන කාර්ය මණ්ඩලය	- 260
• පරිපාලන හා මූල්‍ය නිලධාරීන්	- 27
• අනධ්‍යයන කාර්ය මණ්ඩලය	- 754
• මහාචාර්යවරුන්	- 22
• PhDs /MDs/MSs සුදුසුකම් සහිත අධ්‍යයන කාර්ය මණ්ඩලය	- 101
• විදේශ රටවල් සමග එළඹෙන ලද MoU	- 41
• 2020.12.31 දිනට වත්කම්වල එකතුව	- රු.මිලි. 47,578
• කොඅාවි හා කොඅාවි රෝහල මගින් උපයන ලද මුළු ආදායම	- රු.මිලි. 8,919
• විශ්වවිද්‍යාලයට අයත් රෝහල	- ඇඳන් ධාරිතාව 814

කොඅාවි උපාධි වැඩසටහන්හි අලෙවිකරණ දැක්ම

වෙළඳපල සාරාංශය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (විප්‍රකොා) යටතේ ක්‍රියාත්මක විශ්වවිද්‍යාල 15ක් හා අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විශ්වවිද්‍යාල 02 ක් ඇත. තවත් පශ්චාද් උපාධි ආයතන 07ක් හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන 09ක් ක්ෂේත්‍රයේ ඇති අතර මේ සියල්ලම විප්‍රකොා විසින් පාලනය කෙරේ. මීට අමතරව ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපනික ආයතනය මගින් පාලනය කරන උසස් තාක්ෂණික ආයතන 12ක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. තවද, තෘතික මට්ටමේදී විදේශීය විශ්වවිද්‍යාල කීපයක් මගින් පිරිනමන උපාධි සඳහා සිසුන් ඉදිරිපත් කරන පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතනද ඇත. වාත්තීය අධ්‍යාපන ආයතන බොහොමයක්ද ශ්‍රී ලංකාවේ තෘතික මට්ටමේ අධ්‍යාපන ආයතන ගණයට වැටේ.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකාවේ එකම විශ්වවිද්‍යාලය වේ. මෙම විශ්වවිද්‍යාලය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සභාපතිත්වය දරන හා විප්‍රකොා සභාපතිවරයා සමාජිකයෙකු වන කළමනාකරණ මණ්ඩලයක් මගින් පාලනය කෙරේ. කැඩෙට් නිලධාරීන් හා සිවිල් සිසුන් (ගෙවීම් පදනම මත සිවිල් ශිෂ්‍යයින්) බඳවාගැනීමේ අනුමැතිය සහිත කොඅාවි විප්‍රකොා මගින් ‘‘වෙනත් රාජ්‍ය විශ්වවිද්‍යාල’’ කාණ්ඩය යටතේ පිළිගනු ලබන අතර විශ්වවිද්‍යාලයේ සියලු උපාධි හා වෙනත් අධ්‍යයන වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවේ නියෝගයන්ට අනුව කටයුතු කරනු ලැබේ. ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයනය, වෛද්‍ය විද්‍යාව, ඉන්ජිනේරු විද්‍යාව, නීතිය, කළමනාකරණය, සමාජ විද්‍යාව, සම සෞඛ්‍යය විද්‍යාව, පරිගණක, නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යාව වැනි උපාධි සහ දර්ශනපති හා ආචාර්ය උපාධි වැඩසටහන් ඇතුලුව පශ්චාද් උපාධි වැඩසටහන් ගණනාවක් සඳහා අත්‍යවශ්‍ය අධ්‍යයන ක්ෂේත්‍ර වැඩි ගණනක් ආවරණය වන පීඨ 09ක් විශ්වවිද්‍යාලය සතුව ඇත. 2021 Webometrics අනුව කොඅාවි ශ්‍රී ලංකාවේ විශිෂ්ඨ විශ්වවිද්‍යාල අතර 14වන ස්ථානයේ ශ්‍රේණිගතකර ඇත. කෙසේවුවද, විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය සමග සම්බන්ධ වෙනත් අභ්‍යන්තර ජාලයන් විශාල සංඛ්‍යාවකට අනුව එය 10වන ස්ථානයේ ඇත. එසේම කොඅාවි ලෝකයේ වඩාත් පිළිගැනීමට ලක්වූ ආරක්ෂක අභ්‍යාස ආයතන අතර 4වන ස්ථානයේ ශ්‍රේණිගතකර ඇත.

ඉල්ලුම තක්සේරු කිරීම.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අනුව සෑම වසරකම අ.පොෙ.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි ශිෂ්‍යයින් 200,000කට වැඩි පිරිසක් රාජ්‍ය විශ්වවිද්‍යාලයන්ට ඇතුලත් වීමට සුදුසුකම් ලබයි. නමුත් සීමිත සම්පත් සමගින් සෑම වසරකම විප්‍රකොා යටතේ ඇති විශ්වවිද්‍යාල සඳහා ඇතුලත්වීමේ හැකියාව ලැබෙන්නේ ශිෂ්‍යයින් 40,000ක් පමණ පිරිසකට පමණි. මෙවන් පසුබිමක පසුගිය වසර පහ තුල කොඅාවි උපාධි වැඩසටහන් සඳහා එයට වසරකට සාමාන්‍යයෙන් අයදුම්පත් 7500ක් පමණ ලැබී ඇති අතර අ.පොෙ.ස. උසස් පෙළ විභාගයේ Z ලකුණු හා තරගකාරී ඇගයීම් මාලාවක් මගින් ඔවුන්ගේ කාර්යසාධනය සලකා බැලීම මගින් අයදුම්කරුවන් අතරින් විශිෂ්ඨතයමයන් තෝරාගනු ලැබේ. ඒ අනුව, සෑම වසරකම කොඅාවි සඳහා කැඩෙට් නිලධාරීන් හා සිවිල් සිසුන් ලෙස සාමාන්‍යයෙන් ශිෂ්‍යයින් 1000ක් පමණ බඳවා ගැනේ. තෝරගැනීමේ සම්මුඛ පරීක්ෂණයේදී ක්‍රීඩා හා වෙනත් විෂය බාහිර ක්‍රියාකාරකම් වලදී ඔවුන්ගේ දක්වා ඇති දක්ෂතා ද හඳුනාගනු ලැබේ. තවද, කොඅාවි මගින් යහපත් ආකල්ප හා අර්ථාන්විත මෘදු කුසලතා සහිත සංයමයකින්යුත් උපාධිධාරීන් බිහිකරන බව දෙමාපියන්ගේ මෙන්ම ආයතන අංශයේ සාමාන්‍ය මතය වන අතර කොඅාවි විසින් සඳහන් කරන ලද නියමිත කාලය තුල පාඨමාලා සම්පූර්ණ කිරීම සඳහා විශේෂයෙන් සැලකිලිමත්වීම එහි අධ්‍යයන වැඩසටහන් සඳහා ඇති ඉහල ඉල්ලුම සඳහා ඇති ප්‍රබල හේතුවකි. නිරන්තරයෙන් තත්වය වැඩිදියුණුවීමේ ප්‍රතිඵලයක් ලෙස පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා ඇති ඉල්ලුමද කැපීපෙනෙන ලෙස වැඩිවී ඇත. වාර්ෂිකව ශිෂ්‍යයින් 220කට වැඩි ගණනක් කොඅාවියේ පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා ඇතුලත්වේ.

පසුගිය වසර පහේ (05) දී උපාධි වැඩසටහන් සඳහා ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව පහත දැක්වේ:

ඇතුලත්කර ගැනීම්	ලැබූ අයදුම්පත් සංඛ්‍යාව සිවිල් සිසුන්	ලැබූ අයදුම්පත් සංඛ්‍යාව කැඩෙට් නිලධාරින්	එකතුව
ඇතුලත්කර ගැනීම 34	2439	3720	6159
ඇතුලත්කර ගැනීම 35	3012	2963	5975
ඇතුලත්කර ගැනීම 36	4215	2973	7188
ඇතුලත්කර ගැනීම 37	5806	4200	10006
ඇතුලත්කර ගැනීම 38	3140	5396	8536



<u>ඛණ්ඩනය, ඉලක්ක කිරීම, ස්ථානගත කිරීමේ (STP) විෂ්ලේෂණය</u>

සේවාවන්හි විස්තීර්ණ ආයෝජන කලඹ සමගින් කැඩෙට් නිලධාරින් හා සිවිල් සිසුන් ලෙස දේශීය සිසුන් සහ කැඩෙට් නිලධාරින් හා දෛනික සිසුන් ලෙස විදේශීය සිසුන් වශයෙන් වෙනස් අදාල වෙළඳපල දෙකක් සඳහා අධ්‍යාපන සේවාවන් සැපයීම කොආවි අරමුණ වේ. එබැවින් කොආවි වෙළඳපල සැලසුම නම්ගත කිරීමේ ආකාර දෙකකින් සමන්විත වේ. උදා:-දේශීය සිසුන් බඳවා ගැනීම් හා විදේශීය සිසුන් බඳවා ගැනීම්. පහත දැක්වෙන විශ්ලේෂණය මගින් ශිෂ්‍ය වෙළඳපල, විශේෂිත ශිෂ්‍ය කණ්ඩායම් සහ අධ්‍යාපනික සේවාවන් සඳහා සිසුන්ගේ මනසේ කිනම් ස්ථානයක් හිමිකර ගනු ඇතිද යන්න හඳුනා ගැනේ.

ඛණ්ඩනය (Segmentation)

ප්‍රථම උපාධි වැඩසටහන්		
කාණ්ඩකරණය	**ලක්ෂණ**	
දේශීය ශිෂ්‍යයින්	කැඩෙට් නිලධාරීන්	සිවිල් සිසුන්
	අවශ්‍ය ප්‍රතිඵල සහිතව අ.පො.ස. උ/පෙළ විභාගය/ Pearson/Edexcel හෝ Cambridge උ/පෙ විභාගය සම්පූර්ණ කර ඇති අය.	
විදේශීය ශිෂ්‍යයින්	කැඩෙට් නිලධාරීන්	දෛනික සිසුන්
	අවශ්‍ය ප්‍රතිඵල සහිතව අ.පො.ස. උ/පෙළ විභාගය/ Pearson/Edexcel හෝ Cambridge උ/පෙ විභාගයට සමාන සුදුසුකම් ලබා ඇති අය.	

පශ්චාත් උපාධි වැඩසටහන්	
දේශීය හා විදේශීය ශිෂ්‍යයින්	**විද්‍යාපති වැඩසටහන්**
	වසර කිහිපයක පළපුරුද්දක් සහිත ත්‍රිවිධ හමුදා නිලධාරීන්.
	පන්ති සාමාර්ථ සහිත උපාධිධාරීන්, පන්ති සාමාර්ථ හා වසර 1-2ක අවම පළපුරුද්දක් සහිත, හා වසර කිපයක පළපුරුද්දක් සහිත උපාධිධාරීන්.
	දර්ශනපති/ආචාර්ය උපාධි වැඩසටහන්
	විද්‍යාපති උපාධිධාරීන්, පන්ති සාමාර්ථයක් සහිතව සිවු වසරක උපාධි, අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක පළපුරුද්දක් සහිත පන්ති සාමාර්ථයක් සමග අදාල ක්ෂේත්‍රයේ වසර තුනක උපාධි ලබා ඇති උපාධිධාරීන්, වසර 20ක අවම සේවාව කාලයක් සහිතව මාණ්ඩලික තනතුරු විද්‍යාලය (psc)/ කාර්ය සම්පාදන මාණ්ඩලික පාඨමාලාව (lsc) හෝ ඒ හා සමාන දේශීය හෝ විදේශීය ආයතනයක පාඨමාලාවක් සමත්වීම
වෙනත් පාඨමාලා	
දේශීය හා විදේශීය ශිෂ්‍යයින්	පිළිගත් විශ්වවිද්‍යාලයකින් සහතිකපත් හා ඩිප්ලෝමා මට්ටමේ සුදුසුකම් ලබාගැනීමට අවශ්‍ය අය.

ඉලක්ක කිරීම (Targeting)

ඉලක්ක කිරීම	ලක්ෂණ
කැඩෙට් නිලධාරීන්	ක්‍රීඩා, ශිෂ්‍ය භට/ බාලදක්ෂ හා වෙනත් විෂය බාහිර ක්‍රියාකාරකම්හි දක්ෂතා සමගින් ඉහළ ශ්‍රේණි/ ඉහළ Z-අගයන්/ විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති අය. හා හමුදා නිලධාරීන් වීමේ අපේක්ෂාව ඇති අය.
සිවිල් සිසුන්	ක්‍රීඩා හා වෙනත් විෂයභාහිර ක්‍රියාකාරකම්හි ජයග්‍රහණ සමගින් ඉහළ ශ්‍රේණි/ ඉහළ Z-අගයන්/ විශ්වවිද්‍යාල ප්‍රවේශ සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති අය. හා සිවිල් සිසුන් ලෙස ඇතුලත් වීමේ අපේක්ෂාව ඇති අය.
පශ්චාද් උපාධි සිසුන්	**විද්‍යාපති උපාධි -** කළමනාකරණය, ඉංජිනේරු විද්‍යාව හා නීතිය යන ක්ෂේත්‍රයන්හි පශ්චාද් උපාධි සුදුසුකම් ලබාගැනීමට අවශ්‍ය වසර කීපයක හමුදාමය පළපුරුද්දක් සහිත ත්‍රිවිධ හමුදා නිලධාරීන්. **විද්‍යාපති උපාධි -** රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වසර එකක පළපුරුද්දක් හා පළමු පන්ති සමාර්ථයක් සහිත උපාධිධාරීන් හෝ වසර දෙකක පළපුරුද්දක් හා දෙවන පන්ති සමාර්ථයක් සහිත උපාධිධාරීන් (MSc. කළමනාකරණ සහ MBA - කාර්ය සම්පාදන කළමනාකරණ උපාධි සඳහා).

	විද්‍යාපති උපාධි - විශේෂයෙන් දක්වා ඇති වසර සංඛ්‍යාවක් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ පලපුරුද්දක් ලබා ඇති හා පශ්චාද් උපාධි සුදුසුකම් අපේක්ෂා කරන උපාධිධාරීන් (සියලු විද්‍යාපති උපාධි සඳහා යම් විශේෂ සුදුසුකම් නිර්නායක ද අදාල විය හැක) **දර්ශනපති/ ආචාර්ය උපාධි (MPhil/PhD) -** පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් ලබාගත් විද්‍යාපති උපාධියක් (SLQF L9/10) හෝ පළමු හා දෙවන පන්ති සමාර්ථයක් සමගින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් ලබාගත් අදාල ක්ෂේත්‍රයේ වසර හතරක (SLQF L6) උපාධියක්; හෝ අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ වසර දෙකක පලපුරුද්දක් සමග පළමු හා දෙවන පන්ති සමාර්ථයක් සහිත අදාල ක්ෂේත්‍රයේ වසර තුනක (SLQF L5) උපාධියක්; හෝ මාණ්ඩලික තනතුරු විද්‍යාලය (psc)/ කාර්ය සම්පාදන මාණ්ඩලික පාඨමාලාව හෝ ඒ හා සමාන දේශීය හෝ විදේශීය ආයතනයක ඒ හා සමාන සුදුසුකමක් සමග අවම වශයෙන් වසර 20ක සේවා කාලයක් (පර්යේෂණ ප්‍රකාශන සාක්ෂි සහිත).
කෙටි කාලීන පාඨමාලා	පිළිගත් විශ්වවිද්‍යාලක් මගින් සහතිකපත් හා ඩිප්ලෝමා මට්ටමේ සුදුසුකම් ලබාගැනීමට අවශ්‍ය අය.

ස්ථානගත කිරීම (Positioning)

කොආවියේ වත්මන් ශක්‍යතාවන් පදනම්ව මුදල් නොගෙවීම හා ගෙවීම යන දෙයාකාරයේම පදනම මත ත්‍රිවිධ හමුදා සේවය හා සිවිල් යන අංශ දෙකටම උසස් ප්‍රමිතියෙන් යුත් අධ්‍යාපනයක් ලබාදීමේ හැකියාව ඇත. තවද, විශේෂිත කාර්ය පරිසරයට ඉක්මනින් හැඩගැසීමේ හැකියාව ඇති, ඉහල දැනුමක්, කුසලතා සහ ආකල්ප සහිත මනා ශික්ෂණයකින් යුත් උපාධිධාරීන් හා පශ්චාද් උපාධිධාරීන් බිහිකිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයට පිළිගැනීමක් තිබේ. එසේම කොආවි මගින් දෙපාර්ශවයටම ප්‍රතිලාභ ලැබෙන සිවිල්-හමුදා අධ්‍යාපනික සංස්කෘතියක් ප්‍රවර්ධනය කෙරේ. කැඩෙට් නිලධාරීන් සඳහා තරගකාරී ඉගෙනීමේ පරිසරයක් ලැබෙන අතර සිවිල් සිසුන්ට ශික්ෂිත පරිසරයක ඉගෙනීමේ අවස්ථාව ලැබීමේ වාසිය හිමිවේ.



උපකුලපතිතුමාගේ සමාලෝචනය



ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (කොආවි) ආරම්භයේ සිට ඉතා කෙටි කාල පරාසයක ඉතිහාසයක් තුළ ක්‍රමිකව පරිපූර්ණත්වය කරා ගමන්කර එක්සත් රාජධානියේ පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සංගමයේ සාමාජිකත්වය ලබා අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත්ව තිබේ. මෙම විශ්වවිද්‍යාලය මඟින් මෙහෙයවනු ලබන උපාධි පාඨමාලා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ද නිසි පිළිගැනීමට බඳුන් වූ පාඨමාලා වේ. මෙම පරිවර්තනය තුළ විශ්වවිද්‍යාලය උපාධි අධ්‍යයන, ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන පීඨය, නීති පීඨය, වෛද්‍ය පීඨය, ඉංජිනේරු පීඨය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, කළමනාකරණ පීඨය, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය හා පරිගණක පීඨය ආදී පීඨ නවයකින් සමන්විත විවිධ ශික්ෂාවන් යටතේ අධ්‍යයන කටයුතු සිදු කරනු ලබන ආයතනයක් බවට සංවර්ධනය වී ඇති අතර, දිවයිනෙහි සුදුසුකම්ලත් සිවිල් ශිෂ්‍යයන් වෙත හිමි වී ඇති උසස් අධ්‍යාපන අවස්ථා ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ගයක් වශයෙන් නේවාසිකව අධ්‍යයන කටයුතු වල නිරත නොවන සිවිල් විද්‍යාර්ථීන් වෙත ද උපාධි පිරිනැමීමේ පාඨමාලා ආරම්භ කරන ලදී. වර්තමානයේ දී කොආවි හි උපාධි පාඨමාලා හැදෑරීම සඳහා වාර්ෂිකව ඇතුළත් වීමට ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් දහස් ගණනක් මෙන්ම ඇතැම් විදේශීය ශිෂ්‍යයන් අතර ද දැඩි තරඟකාරීත්වයක් පවතියි.

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව මඟින් අදාළ වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ විවිධ අධ්‍යයන පීඨ සහ අනුබද්ධ අංශ විසින් විවිධ ක්‍රියාකාරකම් සහ කටයුතු මඟින් ලද ජයග්‍රහණ සංක්ෂිප්ත වශයෙන් පිළිබිඹු කෙරේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවෙහි දැඩි අභියෝගාත්මක තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වුව ද විශ්වවිද්‍යාලයේ සැලසුම් කරන ලද කාර්යයන් අවම වශයෙන් හැරුණු කොට සියල්ලම පාහේ අවසන් කිරීමට සමත් විය. මේ ආකාරයෙන් 2020 ඔක්තෝබර් මාසයේ දී 13 වන ජාත්‍යයන්තර පර්යේෂණ සමුළුව ‘‘ජාතික සංවර්ධනය හා ආරක්ෂාව උදෙසා සාකල්‍ය ප්‍රවේශය’’ යන තේමාව යටතේ සාර්ථකව පැවැත්වීම ඔස්සේ කොආවි හි ප්‍රකෘතිමත් බවට පත්වීමේ ස්වභාවය සහ නව්‍යකරණ හැකියාව එහි සියලුම පාර්ශවකරුවන් වෙනුවෙන් මනාව ප්‍රදර්ශනය කරන ලදී. නවීන තාක්ෂණය විවිධ ක්‍රම ඔස්සේ නව්‍යාකාරයෙන් උපයෝගී කරගනිමින් සියලුම අධ්‍යයන පාඨමාලා අඛණ්ඩව පැවැත්වීම සහ දැඩි සෞඛ්‍ය ආරක්ෂක ක්‍රම භාවිතා කරමින් පරීක්ෂණ පැවැත්වීම නව සාමාන්‍යකරණ ක්‍රියාවලිය තුළ විශ්වවිද්‍යාලය අත්කරගත් සුවිශාල ජයග්‍රහණයකි.

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන මෙන්ම භෞතික වශයෙන් අත්කරගත් ජයග්‍රහණ කොආවි කාර්ය මණ්ඩලයෙහි ස්ථාවර නායකත්වය සහ නිවැරදි මඟපෙන්වීම තුළින් ලබාගත් සාමූහික ජයග්‍රහණකි. භාවිතා කරන ලද උපායමාර්ගික කළමනාකරණ ප්‍රවේශයන්, විවිධ සුභසාධන ක්‍රියාකාරකම් තුළින් කාර්ය මණ්ඩල අභිප්‍රේරණය, ජාත්‍යන්තර ප්‍රවණතා වෙත දූරදර්ශීව අනුවර්තනය වීම සහ ඒවා කාලානුරූපව මඟහරවා ගතහැකි අභියෝග පිළිබඳව නිරන්තරයෙන් විමසිල්ලෙන් පසුවීම විශ්වවිද්‍යාලයේ 2020 කාර්යසාධනය කෙරෙහි නිසැකව ම බලපා තිබේ. නිදසුනක් වශයෙන් ඩිජිටල් යටිතල පහසුකම් ඉහළ නංවා ඉගෙනීම සහ ඉගැන්වීම මෙන්ම කළමනාකරණ කාර්යයන් සඳහා මාර්ගගත ක්‍රමවේදය භාවිතාකිරීම අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව

සැලසුම්කළ කාර්යයන් අවසන් කිරීම සහතික කරන ලදී. මෙම සියලුම සාධක විශ්වවිද්‍යාලයට දිවයින තුළ මෙන්ම කලාපය තුළ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සුවිශේෂී ස්ථානයක් හිමිකරගැනීම සඳහා විශ්වාසයෙන් යුතුව ස්ථීර වශයෙන් ඉදිරියට පියනැඟීමට ශක්තිමත් පදනමක් සකස් කිරීමට සමත් විය.

මනා ජයග්‍රහණ හා වැදගත් අවස්ථා සාක්ෂාත් කරගැනීමේ ඉලක්කය පෙරදැරිව ක්‍රමෝපායික සැලසුම්කරණයට අනුකූලව කොආවිහි ආයතනික සැලැස්ම සුවිශේෂී සංශෝධනවලට ලක් කිරීම 2020 වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රධාන කාර්යයකි. අපරාධ නීති පීඨය හා තාක්ෂණ පීඨය වශයෙන් නව පීඨ ද්විත්වයක් ස්ථාපනය කිරීම සඳහා මූලික කටයුතු සිදු කිරීම හා වර්තමානයේ ක්‍රියාත්මක වන පීඨ ඔස්සේ නව උපාධි වැඩසටහන් ත්‍රිත්වයක් ආරම්භ කිරීම 2020 වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයේ ප්‍රගමනය සම්බන්ධයෙන් ගන්නා ලද ප්‍රධාන පියවර කිහිපයකි. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය හා උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන ආයතනය (KDU-CARE), කෙයාර් ටෙක්නොලොජි ලංකා ප්‍රයිවට් ලිමිටඩ් නමින් නැවත ක්‍රියාත්මක කිරීම සහ වසර 05කට ආසන්න කාලයක් ඇණහිට තිබූ විශ්වවිද්‍යාලයීය ශ්‍රවණාගාරය ඉදිකිරීමේ කටයුතු නැවත පණගැන්වීම ද මෙම විශ්වවිද්‍යාලයේ අභිවෘද්ධිය ළඟා කරගැනීමේ ප්‍රයත්නයේ ප්‍රබල හා අත්‍යවශ්‍ය කාර්යයන් දෙකක් ලෙස සැලකිය හැකි ය.

නව මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම, උදා. ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා වන මධ්‍යස්ථානය (CGEE), ජාත්‍යන්තර සබඳතා කාර්යාලය (IRO), රැකියා මාර්ගෝපදේශ ඒකකය (CGU) හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විශ්වවිද්‍යාලයේ අනාගත විකාශයේ සැලකිය යුතු ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය. පෙර පැවති අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකය (IQAU) වෙනුවට 2020 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිද්දෙන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය තුළ ස්ථාපිත කරන ලද තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාල කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා නිර්දේශ කරනු ලැබූ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ පද්ධති වලට අනුකූලවීම සඳහා කොආවිහි කැපවීම පෙන්නුම් කෙරේ.

වසර 2020දී මෙන්ම ඉන් ඉදිරියටත් සාකල්‍ය වර්ධනයක් සාක්ෂාත් කරගැනීම සඳහා විශාල හා සුළු පරිමාණ ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමුකරමින් අපගේ මෙහෙවර ළඟාකර ගැනීමට අප එකාවන්ව කටයුතු කළෙමු. මෙම වසංගතය හමුවේ එළඹී දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුව ඇති පසුබිමක අප ලද ජයග්‍රහණයන් කැපීපෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර දුර්වලතාවයන් සාර්ථක ලෙස ශක්තීන් බවට පරිවර්තනය කර විශ්වවිද්‍යාලයක් ලෙස නව සාමාන්‍යකරණයේදී ලබාගත් එම ජයග්‍රහණයන්, අනාගතයේදී රට නැවත සාමාන්‍ය තත්වයට පත්වූ විට විශාල ජයග්‍රහණයන් සඳහා මඟ සලසනු ඇත.

අවසාන වශයෙන්, අපගේ ජයග්‍රහණයන් යතාර්ථයක් කරගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී කටයුතු කළ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සියලුම කාර්ය මණ්ඩලයට අවංක කෘතඥතාවය පිරිනැමීම මාගේ යුතුකමක් ලෙස සලකමි.

මේජර් ජෙනරාල් එම්පී පීරිස් RWP RSP VSV USP
උපකුලපති
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

කොඅාවි කුලපතිවරුන් හා උපකුලපතිවරුන්

අනු අංකය	කුලපති	කාල සිමාව	උප කුලපති	කාල සිමාව
01	ජෙනරාල් එස්.සී.රණතුංග VSV rcds psc	1990.11.09 - 1995.11.08	මේජර් ජෙනරාල් එස්.ආර්. බාලසූරිය USP ndc psc IG MSc (DS)	2007.10.11 - 2008.12.27
02	ජෙනරාල් දේශමාන්‍ය ජේ.ඊ.ඩී. පෙරේරා VSV D Litt (Honoris Causa) FCMI (UK) FlMgt (SL) ndc psc	1995.11.09 - 2010.11.09	මේජර් ජෙනරාල් එම්.පී. පිරිස් RWP RSP VSV USP ndc psc MPhil (Ind)	2008.12.28 - 2016.02.18
03	ජෙනරාල් ආර්. ද එස් දළුවත්ත WWV RWP RSP VSV USP lom ndc psc	2010.11.09 - 2016.06.09	රියර් අද්මිරාල් ජේ.ජේ. රණසිංහ VSV USP psc MSc(DS) Mgt MMaritimePol(Aus), PG Dip in CPS, Dip in CR, AFNI (Lond), සාමදාන විනිසුරු (මුළු දිවයිනටම)	2016.02.18 - 2019.01.01
04	අද්මිරාල් ඩී.ඩබ්.කේ. සඳගිරි RSP VSV USP rcds, psc, MSc (DS), FLMgt (Lond), සාමදාන විනිසුරු (මුළු දිවයිනටම)	2016.06.09 - 2020.01.20	එයා වයිස් මාර්ෂල් එච්.එම්.එස්.කේ.බී. කොටකදෙණිය WWV RWP RSP VSV USP MSc (Def & Strac Stu), MA (IR), fndu psc	2019.01.02 - 2020.01.15

වසර 1980 සිට 2019 දක්වා විශ්වවිද්‍යාලයේ සුවිශේෂී සිදුවීම්

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ඉතිහාසයේ වැදගත් ඉසව් හා සිද්ධීන් කලානුක්‍රමික පිළිවෙලින් පහත දක්වා ඇත.

1980

- එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විසින් සමරු ඵලකයක් නිරාවරණයකර 1980 ඔක්තෝබර් 11 වන දින කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය (කොආඅ) ලෙස විශ්වවිද්‍යාලය නිලවශයෙන් විවෘත කරනු ලැබීය.

1981

- 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත ලෙස හඳුන්වනු ලබන පාර්ලිමේන්තු පනතක් මගින් අභ්‍යාස ආයතනය ස්ථාපනය කිරීම බලාත්මක කරනු ලැබීය.
- පළමු ඇතුලත් කිරීමේ කැඩෙට් නිලධාරීන් 34දෙනෙකු සඳහා, 1981 මාර්තු 02වන දින අධ්‍යයන දේශන ආරම්භ කරනු ලැබීය.
- කළමනාකරණ මණ්ඩලයේ ප්‍රථම රැස්වීම 1981 දෙසැම්බර් 28 දින පැවැත්විණ.

1984

- කොආවි පළමු ඇතුලත් කිරීමේ විසිරයාමේ පෙලපාලිය 1984 මැයි 02වන දින රත්මලාන ගුවන් තොටුපලේදී පැවැත්විණ. අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මේ අවස්ථාවට සහභාගි විය.

1986

- 4 වන ඇතුලත් කිරීමෙහි ආරක්ෂක සේවාවන්හි කැඩෙට් නිලධාරීන් 54ක් සමගින් කොආවියේ ශ්‍රාස්ත්‍රවේදී උපාධි (ආරක්ෂක අධ්‍යයන) වැඩසටහන 1986 වසරේදී ආරම්භවිය.

1987

- 5 වන ඇතුලත් කිරීම නම්ගත කිරීමත් සමග කොආවි 1987 වසරේදී සිය ආරක්ෂක අධ්‍යයන (තාක්ෂණ) උපාධි වැඩසටහන ආරම්භ කරනු ලැබීය.

1988

- 1988 අංක 27 දරන පනත මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ විශ්වවිද්‍යාල තත්වයට අභ්‍යාස ආයතනය උසස් කිරීමට කළමනාකරණ මණ්ඩලය තීරණය කරනු ලැබීය.

1989

- 1989 වසරේදී අභ්‍යාස ආයතනය සිය ආරක්ෂක මාණ්ඩලික විද්‍යාලය ආරම්භ කරන ලදී.
- දේශන ශාලා, ශ්‍රවණාගාරයක්, පුස්තකාලයක් හා පරිගණක විද්‍යාගාරයකින් සමන්විත අංගසම්පූර්ණ ඉඩකඩ සහිත අධ්‍යයන අංශයක් ඉදිකර 1989 දෙසැම්බර් 15වන දින අතිගරු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් උත්සවාකාරයෙන් විවෘත කරනු ලැබීය. එය වසරේ ජයග්‍රාහී ඉදිකිරීමක් විය.

1990

- 7 වන ඇතුලත් කිරීමේ සිට තාක්ෂණ උපාධි වැඩසටහන ඉංජිනේරු විද්‍යාව පිළිබඳ (ආරක්ෂක අධ්‍යයන) විද්‍යාවේදී උපාධියක් දක්වා උත්ශ්‍රේණිගත කරනු ලැබීය.
- සමුද්‍රිය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ (ආරක්ෂක අධ්‍යයන) විද්‍යාවේදී උපාධිය හඳුන්වාදෙනු ලැබීය.
- 1990 අංක 30 දරන කොආවි (සංශෝධිත) පනත මගින් 1990 අගෝස්තු 24 දින කුලපතිවරයා පත්කරනු ලැබීය.

1991

- කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය පළමු උපාධි ප්‍රදානෝත්සවය 1991 ජනවාරි 14වන දින BMICHහිදී පවත්වනු ලැබීය.
- ආදිකර්තෘ නැසීගිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා වෙත මරණින් පසු නීතිවේදී ආචාර්ය (සම්මාන) උපාධිය (LLD) පිරිනමනු ලැබීය.

1993

- 1993 වසරේදී කඳවල වලව්ව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල අනුස්මරණ කෞතුකාගාරය බවට පත්කරන ලද අතර එය අතිගරු ජනාධිපති ඩී.බී.විජේතුංග මැතිතුමා විසින් 1993 ඔක්තෝබර් 11වන දින විවෘත කරන ලදී.

1994

- 11 වන ඇතුලත් කිරීමේ ශ්‍රී ලංකා ගුවන් හමුදා කැඩෙට් නිලධාරින් සඳහා ගගන විද්‍යා ඉංජිනේරු උපාධි වැඩසටහන හඳුන්වාදෙනු ලැබීය.

1995

- කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය පළමු ක්‍රීඩා උළෙල 1995 සැප්තැම්බර් මස සුගතදාස ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.
- 13 වන ඇතුලත් කිරීම සමග අභ්‍යාස ආයතනය සඳහා කාන්තා කැඩෙට් නිලධාරිනියන් නම්ගත කිරීම 1995 වසරේදී ආරම්භ විය.

1996

- කොආඅ එක්සත් රාජධානියේ පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ (ACU) සාමාජික විශ්වවිද්‍යාලයක් බවට පත්විය.
- 12 වන ඇතුලත් කිරීම සිට කොආඅ කළමනාකරණ විද්‍යාවේදී උපාධිය හා තාක්ෂණික විද්‍යා උපාධි වැඩසටහන ආරම්භ කරන ලදී.

1999

- වසර 1999දී 16 වන ඇතුලත් කිරීම සඳහා වාණිජවේදී උපාධි වැඩසටහන හඳුන්වාදෙනු ලැබීය.

2000

- 17 වන ඇතුලත් කිරීම සඳහා බංගලාදේශ ජාතික කැඩෙට් නිලධාරීන් 2නෙක් නම්ගත කිරීම සමග අභ්‍යාස ආයතනය සඳහා විදේශිය කැඩෙට් නිලධාරීන් නම්ගත කිරීම ආරම්භ විය.

2001

- කළමනාකරණ විද්‍යාපති (ආරක්ෂක අධ්‍යයන) උපාධි පළමු වැඩසටහන ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම මට්ටමේ ආරක්ෂක සේවා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සඳහා ආරම්භ විය.

2002

- ඇමරිකානු රජය මගින් අංග සම්පූර්ණ භාෂා විද්‍යාගාරයක් පරිත්‍යාග කරන ලදී.

2003

- ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම මට්ටමේ ආරක්ෂක සේවා නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් සඳහා කළමනාකරණ විද්‍යාවේදී (ආරක්ෂක අධ්‍යයන) උපාධි වැඩසටහන ආරම්භ විය.

2007

- 2007 ඔක්තෝබර් 11 වන දින අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් අභ්‍යාස ආයතනය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (කොආවි) ලෙස උත්සවාකාරයෙන් නැවත නම්කරනු ලැබීය. (2007 අංක 50 දරන සංශෝධිත පනත මගින්) .

2008

- කොආවි විසින් සංවිධානය කරන ලද ප්‍රථම සම්මන්ත්‍රණය 2008 දෙසැම්බර් 19 දින පැවැත්විණ.

2009

- ආරක්ෂක අධ්‍යයන, වෛද්‍ය, ඉංජිනේරු, නීතිය හා කළමනාකරණය, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය යන පීඨයන් පහ ස්ථාපනය කරන ලදී.
- වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (MBBS), නීතිවේදී (LLB), කාර්ය සම්පාදන කළමනාකරණ විද්‍යාවේදී (BSc) හා සමාජ විද්‍යා විද්‍යාවේදී (BSc) උපාධි යන නව උපාධි වැඩසටහන් හතර හඳුන්වා දෙනු ලැබීය.
- කොඅාවි කැඩෙට් නිලධාරීන් රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේදී පුහුණු කිරීම සඳහා 2009 සැප්තැම්බර් 02වන දින කොඅාවි හා රුහුණු විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ QAAC කුසලතා පදනම් පාඨමාලා ඒකක ක්‍රමය, හා ශ්‍රේණි ලකුණු සාමාන්‍යය ක්‍රමය අනුව දැනට පවතින හා නව උපාධි වැඩසටහන්වල විෂයමාලාවන් සංශෝදනය කරනු ලැබීය.

2010

- 2010 අගෝස්තු 13 වන දින ප්‍රථම වරට නියෝජ්‍ය උප කුලපතිවරයා (අධ්‍යයන) සහ ඉංජිනේරු පීඨාධිපතිවරයා පත්කරනු ලැබීය.

2011

- නීති හා ඉංජිනේරු උපාධි වැඩසටහන් ගාස්තු ගෙවන සිසුන්ට විවෘත විය.
- කොඅාවි විසින් දියතලාව ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යාපීඨය (SLMA), ත්‍රිකුණාමලය නාවික හා සාගරික විද්‍යාපීඨය (NMA), චීන වරාය ගුවන් හමුදා විද්‍යාපීඨය, සපුගස්කන්ද ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය සහ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (CRD) කොඅාවි ට ප්‍රතීතනය කරනු ලැබීය.

2012

- ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් වෛද්‍ය පීඨයේ පළමු ගොඩනැගිලි සංකීර්ණය විවෘත කරන ලැබීය.
- කොඅාවි මේස පන්දු කණ්ඩායම ඉන්දියාවේ Birla Institute of Technology and Science විසින් සංවිධානය කරන ලද 2012 Birla Institute විවෘත ක්‍රීඩා උළෙලේදී රිදී පදක්කමක් දිනාගනු ලැබීය.
- කොඅාවි 2012 වසරේ සැප්තැම්බර්හිදී ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සංගමයේ (IAU) සාමාජිකත්වය ලබාගනු ලැබීය.

2013

- 2013 වසරේ ජනවාරි 18 දින සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ උපාධි වැඩසටහන් සඳහා පළමු සිසුන් කණ්ඩායම බඳවාගනු ලැබීය.
- උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන ආයතනය (KDU-CARE) පිහිටුවනු ලැබීය.

2014

- ප්‍රතිසංස්කරණය කරනලද කඳවල වැව හා නව ඇවිදින මංතීරු විවෘත කරන ලදී.
- 2014 වසරේ 03වන දින නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යා පීඨය ස්ථාපනය කිරීම.
- 2014 වසරේ 19වන දින වේරහැර පිහිටි සම සෞඛ්‍ය විද්‍යා පීඨ ගොඩනැගිල්ල අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් විවෘත කරනු ලැබීය.

2015

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ විද්‍යාවේදී හෙද උපාධි අපේක්ෂකයින්ගේ පළමු දිවුරුම්දීමේ උත්සවය 2015 වසරේ මාර්තු 09වන දින පැවැත්විණ.
- 2015 වසරේ අප්‍රේල් 06වන දින ඉංජිනේරු පීඨ ගොඩනැගිල්ල විවෘත කරන ලදී.

- 2015 වසරේ මැයි 05වන දින අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා විසින් කොඅාවි දක්ෂිණ මණ්ඩපය විවෘත කරන ලදී.
- 2015 වසරේ ජූනි 04 දින විශ්වවිද්‍යාලීය වෛද්‍ය මධ්‍යස්ථානය විවෘත කරන ලදී.
- 2015 වසරේ අගෝස්තු 04වන දින අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා විසින් උපාධි අධ්‍යයන පීඨය විවෘත කරන ලදී.
- 2015 වසරේදි පරිගණක පීඨය ස්ථාපනය කරන ලදී.

2017

- 2017 වසරේ මැයි 21වන දින අතිගරු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා විසින් විශ්වවිද්‍යාල රෝහල උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.
- 2017 ඔක්තෝබර් 7 හා 8 යන දිනයන්හිදී 24 පැය අන්තර් විශ්වවිද්‍යාලයීය හැකතන් (Hackathon) ඉසව්වේදී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල විශ්වවිද්‍යාලය iHack 3.0 ජයග්‍රහණය ලබාගැනීමට සමත්විය.

2018

- 2018 අංක 05 දරන කොඅාවි විශේෂ පනත මගින් සයිටම් ආයතනයේ වෛද්‍ය සිසුන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීම 2018 වසරේ 25 වන දින ආරම්භ විය.
- කොඅාවි කණ්ඩායම විශ්‍රාමික ධජ නිල නිලධාරී සංගමය (ARFRO) විසින් සංවිධානය කරන ලද පළමු මාස්ටර්මයින්ඩ් ප්‍රශ්ණ විචාරාත්මක වැඩසටහනෙහි දෙවන ස්ථානය ලබා ගනු ලැබීය.

2019

- 2019 වසරේ 26වන දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට සැපයුම් සේවා කලමනාකරණ විද්‍යාවේදී උපාධි සහ කාර්ය සම්පාදන කලමනාකරණ ව්‍යාපාර පරිපාලනවේදී උපාධි වැඩසටහන් සඳහා කාර්ය සම්පාදන හා ප්‍රවාහන වරලත් ආයතනයේ සහතිකකරණය හිමිවිය.
- දක්ෂිණ මණ්ඩපයේ නව ශ්‍රවණාගාරය 2019 වසරේ අගෝස්තු 04 වන දින උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.
- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ බර ඉසිලීමේ කණ්ඩායම 2019 වසරේ අගෝස්තු 11 හා 12යන දිනයන්හි පැවති ‘‘සමස්ත ලංකා ශක්ති විවෘත බර ඉසවීමේ තරගයේ‘ සමස්ත ශූරතාව (පිරිමි) හිමිකර ගනු ලැබීය.
- කොඅාවි නව වෙබ් අඩවිය නිල වශයෙන් විවෘත කරන ලදී.
- වෛද්‍ය පීඨයේ මහාචාර්ය ජී.එල්.ගුණසේකර හා ආචාර්ය ප්‍රසාද් ප්‍රේමරත්නගෙන් සමන්විත කොඅාවි පර්යේෂණ කණ්ඩායමට 2019 වසරේ දෙසැම්බර් 18 දින ජෛවතාක්ෂණ කාණ්ඩය යටතේ ජාතික විද්‍යා පදනමේ හොඳම පර්යේෂණය සඳහා වන සම්මානය දිනාගනු ලැබීය.

2020 වසරේ විශේෂ සිදුවීම්

1. ප්‍රධාන පත්කිරීම්

- ශ්‍රී ලංකා යුධ හමුදාවේ 13 වන යුධ හමුදාපති, ජෙනරාල් ජී.එච්.ද සිල්වා මහතා (RWP VSV USP) 2020.01.20 දින සිට බලපැවැත්වෙන පරිදි ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 5වන කුලපතිවරයා ලෙස පත්කරනු ලැබීය.
- මේජර් ජෙනරාල් එම්.පී.පීරිස් මහතා (RWP RSP VSV USP ndc psc Mphil (Ind)) 2020.02.16 දින සිට බලපැවැත්වෙන පරිදි විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා ලෙස පත්කරනු ලැබීය.

2. තත්ත්ව සහතික කිරීම හා වැඩිදියුණු කිරීම්

- තත්ව සහතිකකරණ මධ්‍යස්ථානය ස්ථාපනයකර අධ්‍යක්ෂකවරයෙකු පත්කරනු ලැබීය.
- තත්ව සහතිකකරණ සනාතන සභා ස්ථාවර කමිටුව පිහිටුවන ලදි.

3. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මකතාව

- තිරසර සංවර්ධන ඉලක්ක අංක 05 (ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මකතාව ලභාකර ගැනීම සහ සියලු කාන්තාවන් හා ගැහැණු ළමුන් බලගැන්වීම) අනුකූලව ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය සා සමානාත්මකව පිළිබඳ මධ්‍යස්ථානය (CGEE) පිහිටුවා අධ්‍යක්ෂවරයෙකු පත්කරනු ලැබීය.

4. රැකියා මාර්ගෝපදේශනය

- විප්‍රකෝ විසින් ලබාදෙනු ලැබූ මාර්ගෝපදේශයන්ට අනුව කොආවි රැකියා මාර්ගෝපදේශ ඒකකය ස්ථාපනයකර අධ්‍යක්ෂකවරයෙකු පත්කරනු ලැබීය.

5. ජාත්‍යන්තරකරණය

- ජාත්‍යන්තර සබඳතා කාර්යාලය (IRO) පිහිටුවන ලද අතර විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තරකරණයට අදාල කාර්යයන් සාක්ෂාත් කරගැනීම සඳහා අධ්‍යක්ෂ - ජාත්‍යන්තර සබඳතා පත් කෙරිණ. ජාත්‍යන්තරකරණය කොආවි ක්‍රමෝපාය ප්‍රමුඛතාවක්වේ. ඒ අනුව, විශ්වවිද්‍යාලයට වසර තුල විදේශිය ආයතන හතරක් (04) සමග අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම් අලුත් කිරීම්/වලට එළඹීමට හැකිවිය.

වසර තුල අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්/ ගිවිසුම්

අ. නොර්වේ ඇග්ඩාර් විශ්වවිද්‍යාලය (University of Agder, Norway) සමග ඇතලත්ව තිබූ අවබෝධතා ගිවිසුම නැවත අලුත් කිරීම.

ආ. ඇ.එ.ජ. ලා ජොල්ලා ආයතනය (La Jolla Institute, USA) සමග ගිවිසුම

ඇ. ස්වීඩන් ක්‍රිස්ටියන්ස්ටැඩ් විශ්වවිද්‍යාලය (Kristianstad University, Sweden) සමග හවුල්කාරිත්ව ගිවිසුම

ඈ. ඔස්ට්‍රියාවේ වියානාහි ටෙක්නිස්චි විශ්වවිද්‍යාලය (Technische University, Vienna Austria) සමග හවුල්කාරිත්ව ගිවිසුම

විදේශීය ප්‍රදාන හරහා කොආවි ලැබුණු අරමුදල්

ප්‍රදානය	මුදල
ජපානයේ යුරේෂියා පදනම මගින් ලද පර්යේෂණ ප්‍රදාන	ඇ.ඩො. 24000
ඇ.එ.ජ. ලා ජොල්ලා අසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ ආයතනය	ඇ.ඩො. 40000

ERASMUS+ පරිගණක පීඨය මගින් ධාරිතා සංවර්ධන ප්‍රදානය	යුරෝ 27060
ERASMUS+ සම සෞඛ්‍ය පීඨය මගින් ධාරිතා සංවර්ධන ප්‍රදානය	යුරෝ 12825
පොදු රාජ්‍යමණ්ඩලීය විශ්වවිද්‍යාලීය සංගමය මගින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වයට අදාල කාර්යයන් සඳහා ලබාදෙන ප්‍රදාන	බ්‍රිතාන්‍ය ස්ටර්ලින් පවුන් 1000

ලැබීමට ඇති අරමුදල්

ප්‍රදානය	මුදල
Duke විශ්වවිද්‍යාලය	ඇ.ඩො. 119,951
Houston විශ්වවිද්‍යාලයේ NIH ප්‍රදානය	ඇ.ඩො. 376,000
ඇ.එ.ජ. ලා ජොල්ලා අසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ ආයතනය	ඇ.ඩො. 40000

6. අධිශිෂ්‍යත්වලාභීන් (Fellowships)

- මහාචාර්ය ජී.ඩී.අයි. රොද්‍රිගු - 2020 වසරේ ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ අධිශිෂ්‍යත්වය ලැබීය.
- වෛද්‍ය කේ.ඒ.එස්.ජේ. බලවර්ධන - 2020 වසරේදී ලන්ඩන් වෛද්‍යවරුන්ගේ රාජකීය සංගමයේ සහ 2019 වසරේදී එඩින්බරෝ වෛද්‍යවරුන්ගේ රාජකීය සංගමයේ අධිශිෂ්‍යත්ව ලැබීය.

7. ක්‍රීඩා කටයුතු හා ජයග්‍රහණයන්

- 2020. 02.28 දින පැවති වර්ණ ප්‍රදානෝත්සවයේදී කොඅාවි වර්ණලාභීන් 169 දෙනෙකු සඳහා, ජාතික මට්ටමේ ජයග්‍රහණ සඳහා ප්‍රදාන 17ක් සහ ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ සඳහා 01 ප්‍රදානයක් ලෙස වර්ණ ප්‍රදානය කෙරිණ.
- විශ්වවිද්‍යාලයේ වාර්ෂික ක්‍රීඩා උළෙලේ ත්‍යාග ප්‍රදානෝත්සවය 2020 සැප්තැම්බර් 14වන දින උත්සවාකාරයෙන් පැවැත්වුණි.

8. නව පීඨයන්

- තාක්ෂණ පීඨය හා අපරාධ විනිශ්චය පීඨය ස්ථාපනය කිරීම සඳහා කටයුතු කරන ලදී.

9. නව උපාධි වැඩසටහන්

පහත සඳහන් නව උපාධි වැඩසටහන් 2021 වසරේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා සකස්කර ඇත.

- ව්‍යවහාරික දත්ත විද්‍යා සන්නිවේදන **(ADC)** විද්‍යාවේදී උපාධිය.
- වෙනත් භාෂා කථාකරන්නන්ට ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධිය **(TESOL)**
- දත්ත විද්‍යා හා ව්‍යාපාර විශ්ලේෂණ (DBA) විද්‍යාවේදී ගෞරව උපාධිය

10. සිසුන් බඳවා ගැනීම.

- 38 වන ඇතුලත් කිරීමට අයත් කැඩෙට් නිලධාරීන් 258 දෙනෙක් හා ශිෂ්‍ය පොලිස් නිලධාරීන් 10 දෙනෙකු සඳහා ආරම්භක උලෙල 2020 සැප්තැම්බර් 11 දින පැවැත්විණ.

11. උපාධි ප්‍රදානය

- දර්ශනපති/ආචාර්ය උපාධි 05ක් ඇතුලුව උපාධිධාරීන් 1379 දෙනෙකු සඳහා BMICHහිදී උපාධි පිරිනැමිණ.

12. අධ්‍යයන හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය විශ්‍රාමයාම

- අධ්‍යයන කාර්ය මණ්ඩලය - 40
- අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය - 72

13. ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති

- කොආවි සෞඛ්‍ය අමාත්‍යාංශයේ COVID සමාජ ආරක්ෂණ අරමුදල සඳහා රු.මිලි.5ක් පරිත්‍යාග කරන ලදී.
- සිසුන් හතලිස් හතර (44) දෙනෙකු සඳහා රු. 715,000 ක වටිනාකමකින් යුත් ශිෂ්‍යත්ව පිරිනමන ලදී.
- 2020.06.08 දින කොආවි දී සහ 2020.09.16 දින කොආවි රොහලේදී පැල සිටුවීමේ වැඩසටහනක් ආරම්භ කරනු ලැබීය.
- පුස්තකාලයේ සේවකයෙකුගේ පවුල සඳහා අලුතින් ඉදිකරන ලද නිවසක් පරිත්‍යාග කරන ලදී.
- 2020.02.02 සහ 2020.04.30 දිනයන්හිදී කොආවි රෝහලේදී ලේ දන්දීමේ කඳවුරක් පැවැත්විණ.

14. කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ ප්‍රදාන හා පර්යේෂණ දීමනා

- කොආවි පර්යේෂණ දීමනා ලෙස රු.මිලි.14.65ක් පිරිනමන ලදී.
- කොආවි මගින් පර්යේෂණ ප්‍රදාන, සම්මන්ත්‍රණ සඳහා සහභාගිවීම් හා ඉහල ප්‍රතිඵල සහිත සඟරාවන්හි ප්‍රකාශන පළකිරීම සඳහා වසර තුල කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත රු.මිලි.22ක පර්යේෂණ ප්‍රදානයන් පිරිනැමීය.

15. පරිත්‍යාග ලෙස ලැබුණු ඉඩම් හා වෙනත් උපකරණ

- මාලිනී කොතලාවල මහත්මිය විසින් 2020.05.04 දින වේරහැර පිහිටි ඉඩම (පර්චස් 20) කොආවිට පරිත්‍යාග කරන ලදී.
- පෞද්ගලික සමාගම විසින් කොආවි රෝහල සඳහා පිසිආර් යන්ත්‍රයක් පරිත්‍යාග කරන ලදී.
- 2020.06.15 දින හුවාවේ නවෝත්පාදන පර්යේෂණාගාර පරිත්‍යාග ගිවිසුම (Huawei innovation Laboratory Donation Agreement) අත්සන්කරන ලදී.
- සී.එෆ්.ජේ.රිවඩිස් මහතා විසින් යාපනය වඩුක්කොඩෙයිහි පිහිටි ඉඩම හා අර්ධද්වීපයේ පිහිටි ඉඩම් දෙකක් (අක්.1 රූඩ්1 පර්.5.5 සහ රූඩ්1 පර්.18.8) පරිත්‍යාග කරන ලදී.

16. සමාගම් ප්‍රතිසංස්කරණය/නව අස්තිත්ව

- කෙයා ටෙක්නොලොජීස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්.

17. කාර්ය මණ්ඩලයේ හා සිසුන්ගේ පේටන්ට් බලපත්‍ර සහ වෙනත් නව නිපයුම්

- ජාතික පේටන්ට් බලපත්‍ර LK/P/1/19832 - ඩෙංගු රෝගය සඳහා වෛරස් උදාසීන කිරීමේ විභව්‍යතාවයක් සහිත ප්‍රතිදේහජනක නිර්ණායකයන් පාදක එන්නත් ඉලක්කයක්.

- ජාතික පේටන්ට් බලපත්‍ර LK/P/1/19833 - ඩෙංගු වයිරස් ප්‍රභේද හතරක විශේෂිත හඳුනාගැනීම සඳහා හඳුනාගැනීමේ ලකුණුකරණයක්.
- ජාතික පේටන්ට් බලපත්‍ර LK/P/1/ 17255 - මෝටර් රථ සඳහා සුහුරු දුම් අනාවරණ හා පිටකිරීම් පද්ධතියක්.

18. කාර්ය මණ්ඩලය වෙනුවෙන් ආරම්භ කරන ලද සුභසාධන වැඩසටහන් සහ වෙනත් ක්‍රියාකාරකම්

- සියළුම ස්ථිර සිවිල් කාර්ය මණ්ඩල සේවකයින් සඳහා විශ්වවිද්‍යාලය විසින් නොමිලේ සෞඛ්‍ය රක්ෂණයක් පිරිනමන ලදී.
- අප්‍රේල් හා දෙසැම්බර් මාස සඳහා දිරි දීමනා දෙකක් ගෙවනු ලැබිය.
- 2020.10.09 දින සිවිල් කාර්ය මණ්ඩලය සඳහා දීර්ඝ සේවා කාලයක් සේවය කිරීම වෙනුවෙන් සම්මාන ප්‍රදානය කිරීමේ උත්සවය පවත්වනු ලැබිය.
- කාර්ය මණ්ඩලයේ හා රෝගීන්ගේ පහසුව සඳහා කොඅාවිවිරෝ Laugh සුපිරි වෙළඳසැලක් හා ATM යන්ත්‍ර කීපයක් ස්ථාපනය කරනු ලැබිය.
- සිවිල් හා හමුදා කාර්ය මණ්ඩලයේ හා සිසුන්ගේ සහභාගිත්වයෙන් 2020.12.15.දින නත්තල් කැරොල් ගී ප්‍රසංගයක් පැවැත්විණ.

19. සිසුන් සඳහා ක්‍රියාපටිපාටි සහ විභාග පැවැත්වීම සඳහා නීති අත්පොත.

- 2021 වසරේ සිට ක්‍රියාක්මක කළ යුතු විභාග පැවැත්වීම සඳහා වන නීති සමග නම්ගත කිරීමේ සිට උපාධි ප්‍රදානය දක්වා ආදාල වන සෑම පියවරක්ම සංශෝධනය කරනු ලැබිය.

20. සිසුන්ට අදාල වැඩසටහන්

- කොඅාවි උපාධි සඳහා ලියාපදිංචි වූ සෑම සිසුවෙක් සඳහාම නොමිලේ ලැප්ටොප් පරිගණකයක් ප්‍රදානය කිරීම 2020 සිට නැවත ආරම්භ කරනු ලැබිය.
- 2020.11.25 දින කොඅාවි තොරතුරු මධ්‍යස්ථානය විවෘත කරන ලදී.
- 24/7 දුරකථන මාර්ගයෙන් උපකාරක උපදේශක සේවාව ආරම්භ කරන ලදී.
- Wifi හා අන්තර්ජාල පහසුකම් වැඩි දියුණු කරන ලදී.
- කැඩෙට් නිලධාරින් සඳහා 100%ක් නවාතැන් පහසුකම් සපයනු ලැබිය.
- දක්ෂිණ මණ්ඩපයේ සිවිල් සිසුන් සඳහා සාමාන්‍ය ගාස්තුවක් අයකර 100% නවාතැන් පහසුකම් සපයනු ලැබිය.
- 2020 වසර සඳහා වන කැඩෙට් පාලනය 2020 සැප්තැම්බර් 18 දින ප්‍රකාශයට පත්කරනු ලැබිය.
- 2020 සැප්තැම්බර් 21 වන දින කොඅාවි ටෝස්ට්මාස්ටර් සමාජයේ 8වන සමාරම්භක උත්සවය පැවැත්විණ.

21. ග්‍රන්ථ එළිදැක්වීම

- 2020.12.31 දින Logistics Times Magazine එළිදක්වනු ලැබිය.
- 2020 වසරේදී දී කොඅාවි සහ නව දිල්ලියේ නොලේජ් වර්ල්ඩ් (KW) ප්‍රකාශකයන් විසින් DSS ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය සතිර ප්‍රනාන්දු මහතා විසින් “Comprehensive Maritime Security in the Indian Ocean Region: යන මාතෘකාව යටතේ සංස්කරණය කරන පොත ප්‍රකාශයට පත්කරන ලදී.

22. ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRC)

- කොඅාවි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව -2020 “ජාතික සංවර්ධනය හා ආරක්ෂාව උදෙසා සාකල්‍ය ප්‍රවේශය” යන තේමාව යටතේ ඔක්තෝබර් 15 හා 16 වන දිනයන්හිදී පැවැත්විණ. ගරු අධ්‍යාපන අමාත්‍ය, මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා

ප්‍රධාන අමුත්තා ලෙස මෙම අවස්ථාවට සහභාගිවූ අතර ප්‍රධාන දේශකයා වූයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතාය.



23. ඉදිකිරීම්

ඉදිකිරීම	අයවැය	2020 වසරේ වියදම	තත්වය
ශ්‍රවනාගාරය	රු. 1,392,000,000	රු. 242, 259,212	ක්‍රියාත්මකව ඇත
ඉංජිනේරු පීඨයේ තෙමහල් විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම.	රු. 5,000,000	රු. 1,741,483.94	ක්‍රියාත්මකව ඇත
Club House ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම	රු. 7,150,000.00	රු.1,642,422.08	ක්‍රියාත්මකව ඇත
දෙමහල් ආරක්ෂක හමුදා නිවස්න ඉදිකිරීම	රු. 20,000,000	රු.12,627,427.05	ක්‍රියාත්මකව ඇත

24. කොආවි රෝහලේ විශේෂ අවස්ථා

- විශ්වවිද්‍යාල රෝහලේ පෞද්ගලික බාහිර රෝගී දෙපාර්තමේන්තුව විවෘත කිරීම 2020 සැප්තැම්බර් 14වන දින පැවැත්විණ.
- 2020 සැප්තැම්බර් 03වන දින කොආවි රෝහලේ කාන්දුපෙරණ ඒකකය විවෘත කරන ලදී.
- සුව ළදරු සායනය, ළමා ස්නායුවේද සායනය, අන්තරාසර්ග සංක්‍රාන්ති සායනය ආදී විවිධ ක්ෂේත්‍රයන්හිට අදාල සායන ගණනාවක් ආරම්භ කරන ලදී.
- පෝෂණ ඒකකය, විකිරණ චිකිත්සා ඒකකය, නවජන්ම අධිසත්කාර ඒකකය ඇතුලු ඒකක ගණනාවක් ආරම්භ කරන ලදී.

අන්තර්ගතය

හැඳින්වීම	i
විශ්වවිද්‍යාල ලාංඡනය	ii
විශ්වවිද්‍යාල ධජය	ii
විශ්වවිද්‍යාල ගීතය	iii
විශ්වවිද්‍යාල සිතියම	iv
විශ්වවිද්‍යාලයේ දැක්ම, මෙහෙවර සහ පරමාර්ථ	v
විශ්වවිද්‍යාලය පිළිබඳව සැකෙවින්	vi
කොආව් උපාධි වැඩසටහන්හි අලෙවිකරණ දැක්ම	vii
උපකුලපතිතුමාගේ සමාලෝචනය	xi
කුලපතිවරු සහ උපකුලපතිවරු	xiii
වසර 1980 සිට 2019 දක්වා විශ්වවිද්‍යාලයේ සුවිශේෂී සිදුවීම්	xiv
2020 වසරේ විශේෂ සිදුවීම්	xviii

1. විශ්වවිද්‍යාලය

1.1 විශ්වවිද්‍යාලයීය ඉතිහාසය	04
1.2 ආයතනික ව්‍යුහය	05
1.3 කළමනාකරණ මණ්ඩලය	06
1.4 විශ්වවිද්‍යාලයේ සනාතන සභාව	08
1.5 විශ්වවද්‍යාලයේ විගණන හා කළමනාකරණ කමිටුව	09
1.6 විශ්වවිද්‍යාලයේ කුලපති හා ප්‍රධාන කාර්ය මණ්ඩලය	10
1.7 ආයතනික අරමුණු (2020-2024)	14
1.8 කාර්ය සාධනය - 2020 වර්ෂය	15
1.9 අනාගත සැලසුම්	18

2. විශ්වවිද්‍යාලයේ පීඨ, මණ්ඩප, ප්‍රතීතන ප්‍රදානය ලද ආයතන සහ මධ්‍යස්ථාන/ඒකක

2.1 පීඨ

2.1.1 පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය	20
2.1.2 ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය	23
2.1.3 වෛද්‍ය පීඨය	29
2.1.4 ඉංජිනේරු පීඨය	36
2.1.5 නීති පීඨය	44
2.1.6 කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය	48
2.1.7 සමසෞඛ්‍ය විද්‍යා පීඨය	55
2.1.8 නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය	60
2.1.9 පරිගණක පීඨය	64

2.2 මණ්ඩප හා ප්‍රතීතන ප්‍රදානය ලද ආයතන

2.2.1 දක්ෂිණ මණ්ඩපය, සූරියවැව	73

2.3 ප්‍රතීතන ප්‍රදානය ලද හමුදා ආයතන

2.3.1 ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය 80
2.3.2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය, දියතලාව 80
2.3.3 නාවික හා සාගරික විද්‍යා පීඨය 81
2.3.4 ශ්‍රී ලංකා ගුවන් හමුදා ඇකඩමිය, චීන වරාය 81
2.3.5 යුද්ධ හමුදා භට කාර්ය සම්පාදන විද්‍යාලය, ත්‍රිකුණාමලය 82
2.3.6 නාවික ශිල්පීය පුහුණු ආයතනය, වැලිසර 82
2.3.7 හෙද පුහුණු විදුහල, වැලිසර 83

2.4 මධ්‍යස්ථාන/ඒකක

2.4.1 පීඨාධිපති කාර්යාලය (පර්යේෂණ හා සංවර්ධන) 84
2.4.2 උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන ආයතනනය 89
2.4.3 තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය 91
2.4.4 තොරතුරු තාක්ෂණ සහාය හා සංවර්ධන සේවා මධ්‍යස්ථානය 93
2.4.5 ස්ත්‍රී පුරුෂ සමාජභාවය සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය97
2.4.6 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 99
2.4.7 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 101
2.4.8 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 103
2.4.9 ජාත්‍යන්තර සබඳතා කාර්යාලය 104

3. පුස්තකාල ජාලය 105

4. ශිෂ්‍ය තොරතුරු
4.1 උපාධි අධ්‍යයන පාඨමාලා සඳහා ඇතුළත් වූ නවක සිසුන් (දේශීය) 110
4.2 උපාධි පාඨමාලා සඳහා ඇතුළත් වූ නවක සිසුන් (විදේශීය) 111
4.3 2020.12.31 දිනට ශිෂ්‍ය සංඛ්‍යාව 111

5. ශිෂ්‍යයන් වෙත උපාධි පිරිනැමීම (උපාධි ප්‍රදානෝත්සවය)
5.1 විශ්වවිද්‍යාලයීය උපාධිලාභී සිසුන් සංඛ්‍යාව 118
5.2 විශ්වවිද්‍යාලයීය පශ්චාත් උපාධිලාභී සිසුන් සංඛ්‍යාව 120
5.3 උපාධිලාභී සහ පශ්චාත් උපාධිලාභී සිසුන් සංඛ්‍යාව - ප්‍රතීතන ප්‍රදානය ලද හමුදා අභ්‍යාස විද්‍යාල 122
5.4 උපාධිධාරීන් සංඛ්‍යාව (2016 - 2020) 122

6. මානව සම්පත්
6.1 අනුමත සේවක සංඛ්‍යාව සහ සමාලෝචිත වර්ෂයේදී සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය 123

7. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය රෝහල 125

8. වෙනත් අංශ
8.1 විශ්වවිද්‍යාල මූලස්ථානය 145
8.2 අභ්‍යන්තර විගණන අංශය 149

8.3 ව්‍යාපෘති සහ නඩත්තු අංශය 151
8.4 කාර්ය සම්පාදන අංශය 158
8.5 විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය 159
8.6 දන්ත වෛද්‍ය මධ්‍යස්ථානය 162
8.7 මාධ්‍ය මධ්‍යස්ථානය 163
8.8 ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල අනුස්මරණ කෞතුකාගාරය 169
8.9 කොඅාවි ක්ලබ් හවුස් 170

9. ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග 171

10. මූල්‍ය සමාලෝචනය
10.1 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය 178
10.2 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 179

11. විගණකාධිපති වාර්තාව 235

1. විශ්වවිද්‍යාලය

1.1 විශ්වවිද්‍යාලයීය ඉතිහාසය

තරුණ හමුදා නිලධාරීන්ගේ අධ්‍යාපනික ප්‍රමිතීන් ඉහළ නැංවීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා යුධ හමුදා, නාවික හමුදා සහ ගුවන් හමුදා ආඥාපතිවරුන් විසින් 1978 වර්ෂයේදී රජය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී. ඊට ප්‍රතිචාර දක්වමින්, විශේෂඥයින් විසින් අනාවරණය කරගත් කරුණුවල මඟපෙන්වීම අනුව ආරක්ෂක සේවාවන් සඳහා උපාධි ප්‍රදානය කරනු ලබන හමුදා අභ්‍යාස ආයතනයක් පිහිටුවීමට රජය තීරණය කරන ලදී.

යෝජිත ආරක්ෂක අභ්‍යාස ආයතනය සඳහා සුදුසු ස්ථානයක් සම්බන්ධයෙන් අවිනිශ්චිතභාවයක් පැවති තත්ත්වයක් තුළ එවකට සිටි යුධ හමුදා ආඥාපති ලුතිනන් ජෙනරාල් ජේ.ඊ.ඩී.පෙරේරා මහතා විසින් අවශ්‍යතාවය ඒත්තු ගැන්වීමෙන් පසු ශ්‍රී ලංකාවේ තෙවන අග්‍රාමාත්‍යවරයා වූ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා අක්කර 48 කින් සමන්විත කඳවල වත්ත එහි පැවති සියලුම වංචල සහ නිශ්චල දේපළ ඇතුළත්ව හමුදා අභ්‍යාස ආයතනයක් ස්ථාපනය කිරීම සඳහා රජයට පරිත්‍යාග කිරීමට ස්වකීය කැමැත්ත ප්‍රකාශ කරන ලදී. මෙම ප්‍රදානය සතුටින් පිළිගෙන අභ්‍යාස ආයතනය පිහිටුවීම සඳහා මූලික පියවර ගනු ලැබීය. 1980 ඔක්තෝබර් 01 වන දින අතිගරු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ලුතිනන් ජෙනරාල් ජේඒඩී පෙරේරා මහතා සමඟ ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා හමු වී ඔහු වෙත ජෙනරාල් යන ගරු නිලය පිරිනමන ලද අතර පසුකාලීනව රජය සහ ආරක්ෂක සේවාවන් විසින් මෙම අධ්‍යයන ආයතනය ඔහුගේ නමින් නම්කර ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමාට ගෞරව දක්වන ලදී.

මේ ආකාරයට ශ්‍රී ලංකා යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව සඳහා මනාව සංවර්ධිත බුද්ධිමය හැකියාවෙන් හෙබි නිලධාරීන් බිහි කිරීමේ සුවිශේෂී කාර්යය පෙරදැරිව 1980 වර්ෂයේ දී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය ආරම්භ කරන ලදී. මෙම ආයතනය 1981 අංක 68 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතන පනත යටතේ ස්ථාපනය කරන ලද අතර එම පනතට පසුකාලීනව එක් කරන ලද සංශෝධන කිහිපයක් මඟින් එහි මෙහෙයුම් ක්ෂේත්‍රය වැඩිදියුණු කරන ලදී. 1988 අංක 27 දරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස ආයතනය (සංශෝධන) පනත මඟින් අභ්‍යාස ආයතනය විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කරන ලද අතර 2007 ඔක්තෝබර් මස 11 වන දින එය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය වශයෙන් නැවත නම් කරන ලදී.

1.2 ආයතනික ව්‍යුහය



1.3 කළමනාකරණ මණ්ඩලය

විශ්වවිද්‍යාලයේ කළමනාකරණ සහ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලය විසින් ඉටු කරනු ලබයි.

01	ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය	**ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න** WWV RWP RSP USP ndc psc දර්ශනපති (2019.11.20 දින සිට)
02	යුධ හමුදාපති	**ජෙනරාල් එල්එච්එස්සී සිල්වා** WWV RWP RSP VSV USP ndc psc දර්ශනපති (2019.08.18 දින සිට)
03	නාවික හමුදාපති	**වයිස් අද්මිරාල් කේකේවීපීඑච් ද සිල්වා** WWV & Bar, RWP, RSP, VSV, USP, ndu (2020.07.15 දින දක්වා) **වයිස් අද්මිරාල් ඩීඑන්එස් උළුගේතැන්න** RSP & Bar, VSV, USP, ndc, psc, දර්ශනපති (ආරක්ෂක හා ක්‍රමෝපාය සේවා), ශාස්ත්‍රපති (ආරක්ෂක සේවා), ශාස්ත්‍රපති (සමුද්‍රීය ප්‍රතිපත්ති), පශ්චාත් උපාධි ඩිප්ලෝමා (SM) (2020.07.16 දින සිට)
04	ගුවන් හමුදාපති	**එයාර් මාර්ෂල් ඩීඑල්එස් ඩයස්** RSP and three Bars, VSV, USP, විද්‍යාපති (ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන), ndc, psc (2020.11.02 දින දක්වා) **එයාර් මාර්ෂල් එස්කේ පතිරණ** WWV and Bar, RWP and Bar, RSP and 3 Bars, VSV, USP (2020.11.03 දින සිට)
05	අතිරේක ලේකම් (ආරක්ෂක) ආරක්ෂක අමාත්‍යාංශය	**එස්.ටී.කොඩිකාර මහතා (වැ.බ.)** (2020.02.28 දින දක්වා) **පීබීඑස්සී නෝනිස් මහතා** විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ (විශේෂ ගෞරව) , රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති, ඕස්ට්‍රේලියාව LICA (2020.02.29 දින සිට)
06	උප කුලපති – කොආවි	**එයාර් වයිස් මාර්ෂල් එච්එම්එස්කේබී කොටකදෙනිය** WWV, RWP, RSP, VSV, USP, විද්‍යාපති (ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන), fndu, psc (2020.01.16 දින දක්වා) **මේජර් ජෙනරාල් එම්පී පීරිස්** RWP RSP VSV USP ndc psc දර්ශනපති (ඉන්දියාව) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (2020.01.16 දින සිට)

07	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත	**මහාචාර්ය මොහාන් ද සිල්වා** Ms, FRCS Edin, FCSSL, සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (2020.01.13 දින දක්වා) **මහාචාර්ය සම්පත් අමරතුංග** ආර්ථික විද්‍යා ශාස්ත්‍රවේදී (ගෞරව) (ශ්‍රී ජපුර විවි), ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති (කොළඹ විවි), විද්‍යාපති ග්‍රාමීය සංවර්ධන ආර්ථික විද්‍යා (Saga ජාතික විශ්වවිද්‍යාලය), දර්ශනශූරී (කොගොෂිමා ජාතික විශ්වවිද්‍යාලය, ජපානය), සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (2020.01.14 දින සිට)
08	භාණ්ඩාගාර නියෝජිත	**එස්ඒසී කුලතිලක මීය** වාණිජවේදී (විශේෂ) (ශ්‍රී ජපුර විවි), මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) (2020.02.27 දින දක්වා) **පීඒඑස්ඒ කුමාර මහතා** අධ්‍යක්ෂ ජෙනරාල් රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය (2020.02.28 දින සිට)
	ලේඛකාධිකාරී - කොආවි	**කර්නල් පීඑස්එස් සංජීව (වැ.බ.)** RSP psc ශාස්ත්‍රපති (NPS, USA), විද්‍යාපති (බංගලාදේශ විවි) M (ආරක්ෂක.) (කැලණිය විවි), IHR ඩිප්ලෝමාව (ශ්‍රී ලංකාව) (2020.03.30 දින දක්වා) **වීඩී කිත්සිරි මහතා** විධායක ව්‍යාපාර පරිපාලනපති (කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය - ශ්‍රී ජපුර විවි), කළමනාකරණ පශ්චාත් උපාධි (ශ්‍රී ජපුර විවි), වාණිජවේදී (විශේෂ) ගෞරව, LICA සහ PI- CASL, ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා (ඇක්වයිනාස්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ඇමෙරිකන් කොලේජ් ඔෆ් හයර් එඩියුකේෂන්) (2020.03.31 දින සිට)

සමාලෝචිත වර්ෂය තුළදී කළමනාකරණ මණ්ඩල රැස්වීම් දාහතරක් (14) පවත්වන ලදී.

1.4 විශ්වවිද්‍යාලයේ සනාතන සභාව

විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පහත දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත වේ;

- උපකුලපති
- මණ්ඩපාධිපති - දක්ෂිණ මණ්ඩපය
- නියෝජ්‍ය උපකුලපති (ආරක්ෂක සහ පරිපාලන)
- නියෝජ්‍ය උපකුලපති (අධ්‍යයන)
- ප්‍රතීතන ප්‍රදාන ලද සහ අනුබද්ධිත ආයතන ප්‍රධානීන්
- පර්යේෂණ සහ සංවර්ධන පීඨාධිපති
- සියලුම පීඨවල පීඨාධිපතිවරු
- සියලුම මධ්‍යස්ථානවල අධ්‍යක්ෂවරු
- සෑම පීඨයකින් ම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු / මහාචාර්යවරු දෙදෙනෙක්
- ලේඛකාධිකාරී
- පුස්තකාලයාධිපති
- විධායක අධිකාරී
- බලගණ අණ දෙන නිලධාරීන්
- සියලුම අධ්‍යයනංශාධිපතීන්
- ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයන පීඨයේ II වන ශ්‍රේණියේ මාණ්ඩලික නිලධාරියෙක්
- පීඨ සංඛ්‍යාවට සමාන වන පරිදි උපකුලපති විසින් නම්කරන ලද සහාය මහාචාර්යවරු සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු

2020 වර්ෂය තුළ සනාතන මණ්ඩලයේ රැස්වීම් දහතුනක් (13) ක් පවත්වන ලදී.

<u>විශ්වවිද්‍යාලයීය අනු කමිටු</u>

අනු. අංකය	කමිටුව	පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව
01	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC)	22
02	සුළු ප්‍රසම්පාදන කමිටුව (MPC)	23
03	නිවාඩු සහ ප්‍රදාන කමිටුව	12
04	දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කමිටුව	02
05	විනය, නේවාසිකාගාර හා ශිෂ්‍ය කටයුතු මණ්ඩලය	04
06	විභාග වැරදි පිළිබඳ විමර්ශන මණ්ඩලය	04
07	ආචාර ධර්ම සමාලෝචන කමිටුව	12
08	පර්යේෂණ ප්‍රදාන කමිටුව	06
09	පුස්තකාල කමිටුව	03
10	පරිසර, ආරක්ෂණ සහ කසල කළමනාකරණ කමිටුව	8
11	වෘත්තීය සෞඛ්‍ය, ආරක්ෂණ සහ තත්ත්ව ඒකක කමිටුව	2
12	ආරෝග්‍යශාලා කළමනාකරණ කමිටුව	11

1.5 විශ්වවිද්‍යාලයීය විගණන හා කළමනාකරණ කමිටුව

කාර්යභාරය සහ වගකීම්

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාර්යක්ෂමතාව සහතික කිරීම සහ ඒ හා සම්බන්ධ වෙනත් නිශ්චිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ‘‘යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ’’ ප්‍රකාරව කොආවි හි විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම කමිටුව අවම වශයෙන් වසරකට රැස්වීම් හතරක් (04) ක් පවත්වනු ලැබේ.

කමිටුවෙහි සංයුතිය

1. පී.ඒ.එස්.අතුල කුමාර මහතා	අධ්‍යක්ෂ ජෙනරාල් - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය) - භාණ්ඩාගාර නියෝජිත	සභාපති
2. පී.බී.එස්.සී.නෝනිස් මහතා	අතිරේක ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශ නියෝජිත	සාමාජික
3. මේජර් ජෙනරාල් එම්.පී. පීරිස් RWP RSP VSV USP	උප කුලපති - කොආවි	නිරීක්ෂක
4. එම්.එම්.ආර්.බෝගමුව මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිත	සාමාජික
5. බී.ඩබ්ලිව්. මෙන්ඩිස් මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක - ආරක්ෂක අමාත්‍යාංශය	නිරීක්ෂක
6. පී.එම්.ආර්. පතිරාජ මහතා	විගණන අධිකාරී - විගණකාධිපතිවරයාගේ නියෝජිත	නිරීක්ෂක
7. එන්.එම්.කේ.එස්. රංජිත් මහතා	නියෝජ්‍ය අභ්‍යන්තර විගණක	කැඳවුම්කරු

රැස්වීම්

2020 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්විණි.
(2020.05.29, 2020.09.28 සහ 2020.12.22 යන දිනයන්හිදී)

1.6 විශ්වවිද්‍යාලයේ කුලපති සහ ප්‍රධාන කාර්ය මණ්ඩලය

කුලපති
අද්මිරාල් දයා සඳගිරි (විශ්‍රාමික) , RSP, VSV, USP, rcds, psc, විද්‍යාපති (ආරක්ෂක සේවා) , FIMgt (එක්සත් රාජධානිය), MNI (ලන්ඩන්), MRIN (ලංඩන්), සාම විනිසුරු (මුළු දිවයිනටම)
(2015.11.09 – 2020.01.20)

ජෙනරාල් ජෙරාඩ් හෙක්ටර් ද සිල්වා (විශ්‍රාමික) RWP VSV USP ndc
(2020.01.21 සිට)

<u>ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්</u>

<u>හමුදා නිලධාරීන්</u>

උපකුලපති
එයාර් වයිස් මාර්ෂල් එච්.එම්.එස්.කේ.බී.කොටකදෙනිය WWV RWP RSP VSV USP MSc (ආරක්ෂක සහ ක්‍රමෝපාය අධ්‍යයනය) (2020.01.16 දින දක්වා)

මේජර් ජෙනරාල් මිලින්ද පිරිස් RWP RSP VSV USP ndc psc දර්ශන ශූරී (Ind) PGDM (2020.01.16 දින සිට)

මණ්ඩපාධිපති - දක්ෂිණ මණ්ඩපය
මේජර් ජෙනරාල් ඩබ්ලිව්.පී.ඒ.කේ. තිලකරත්න ශාස්ත්‍රවේදී (ආරක්ෂක අධ්‍යයන), විද්‍යාපති (කළමනාකරණ), psc (2020.03.01 දින දක්වා)
බ්‍රිගේඩියර් ඊ.ඒ.ඩී.පී. එදිරිසිංහ, psc ශාස්ත්‍රවේදී (ආරක්ෂක) ශාස්ත්‍රපති (රාජ්‍ය පරිපාලන) (2020.03.02 දින සිට)

නියෝජ්‍ය උපකුලපති (ආරක්ෂක සහ පරිපාලන)
බ්‍රිගේඩියර් එන්. හතුරුසිංහ psc IG Hdmc (2020.11.17 දින දක්වා)
බ්‍රිගේඩියර් ඩබ්ලිව්. චන්ද්‍රසිරි RSP USP psc (2020.11.18 දික්වා)

පීඨාධිපති – පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
බ්‍රිගේඩියර් ආර්.ජී.යූ.රාජපක්ෂ RSP psc විද්‍යාවේදී (ආරක්ෂක අධ්‍යයන) KDA, විද්‍යාපති (ආරක්ෂක අධ්‍යයන) කැලණිය විවි, MASS(NDU) වොෂින්ටන් DC

පීඨාධිපති - ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය
බ්‍රිගේඩියර් යූ.එල්.ජේ.එස්.පෙරේරා RSP USP psc (2020.11.23 දක්වා)
කර්නල් එච්.එම්.ජී.ඊ. හේරත් RSP USP (2020.11.24 සිට)

ලේඛකාධිකාරී (වැ.බ.)
කර්නල් පී.එස්.එස්. සංජීව RSP psc VIR MA (NPS, USA), විද්‍යාපති (බංගලාදේශ විවි) , M (ආරක්ෂක.) S (කැලණිය විවි), IHR ඩිප්ලෝමාව (ශ්‍රී ලංකාව) (2020.03.30 දින දක්වා)

සහායක නිලධාරී
කර්නල් ඩබ්ලිව්.එම්.එන්.කේ.ඩී.බණ්ඩාර RWP RSP USP Psc (2020.08.31 දින දක්වා)
ලුතිනන් කර්නල් ඒ.එම්.ඩී.බී. අධිකාරී RWP RSP psc (2020.09.01 දින සිට)

අණදෙන නිලධාරී (පරිපාලන)
ලුතිනන් කර්නල් ඒ.කේ.පීරිස් RSP (2019.11.16 දක්වා)
ලුතිනන් කර්නල් බීඒ.එම්.සී.බෙලිගස්වත්ත RSP (2019.11.17 සිට)

<u>සිවිල් නිලධාරීන්</u>

නියෝජ්‍ය උපකුලපති / අධ්‍යයන (වැ.බ),
මහාචාර්ය එම්.එච්.ජේ.ආරියරත්න, වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (කොළඹ) MS (කොළඹ) FRCS (එඩින්බර්ග්), FRCS (එංගලන්තය)
ජ්‍යෙෂ්ඨ සාමාජික - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (කොළඹ), FCS (ශ්‍රී ලංකාව)

පීඨාධිපති - වෛද්‍ය පීඨය
මහාචාර්ය එම්.එච්.ජේ.ආරියරත්න, වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (කොළඹ) MS (කෙළඹ) FRCS (එඩින්බර්ග්), FRCS (එංගලන්තය)
ජ්‍යෙෂ්ඨ සාමාජික - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (කොළඹ), FCS (ශ්‍රී ලංකාව)
(2020.04.20 දින දක්වා)

ගaaප් කපිතාන් (මහාචාර්ය) ආර්.ඒ.එන්.කේ.විජේසිංහ
වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී, MD (කොළඹ), MRCP (UK), FRACP, FRCP, FRCP Edin, FCCP, FCSANZ
(2020.04.21 දින සිට)

පීඨාධිපති - ඉංජිනේරු පීඨය
ආචාර්ය ටී.එම්.ඩබ්ලිව්.ආර්.එම්.බී.සමරකෝන්. ඉංජිනේරුවේදී (පේරාදෙණිය), ඉංජිනේරු විද්‍යාපති (AIT, බැංකොක්), දර්ශනශූරී (සයිටමා, ජපානය) , AMIE (ශ්‍රී ලංකාව), MSLAAS, උසස් අධ්‍යාපන ඉගැන්වීම් පිළිබඳ සහතිකපත්‍රලාභී (කොආවි) (2020.03.31 දින දක්වා)

ඉංජිනේරු (කපිතාන්) එස්.යූ. දම්පගේ (විශ්‍රාමික) ඉංජිනේරුවේදී සහ E Eng (ගෞරව) MEng, CEng, FIE, SMIEEE (2020.04.01 දින සිට)

පීඨාධිපති - නීති පීඨය
ඩබ්ලිව්.එම්.අමරදාස මහතා, නීතිය පිළිබඳ ශාස්ත්‍රපති (ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය), ශාස්ත්‍රපති (කොළඹ), නීතිවේදී (කොළඹ), ශාස්ත්‍රවේදී (ගෞරව), නීතීඥ, පශ්චාත් උපාධි සහතිකපත්‍ර (UK) (2020.02.19 දින දක්වා)

ඩබ්ලිව්.එස්.විජේසිංහ මහතා, නීතිය පිළිබඳ ශාස්ත්‍රපති**,** නීතිය පිළිබඳ ශාස්ත්‍රවේදී, නීතීඥ, පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ජාත්‍යන්තර සබඳතා), ඩිප්ලෝමා (Com SW), Cert **(**Eng Leg St**)**, අධ්‍යාපන ඉගැන්වීම් පිළිබඳ සහතිකපත්‍රලාභී (2020.02.20 දින සිට)

පීඨාධිපති - කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය
ආචාර්ය ආර්.එම්.එන්.ටී.සිරිසෝම මිය දර්ශනශූරී (මොරටුව), ඉංජිනේරුවේදී (මොරටුව), C. Eng, CMILT (එ.රා), MITE (US), MIE (SL) (2020.09.12 දින දක්වා)

ඩබ්ලිව්.ඒ.ඒ.කිත්සිරි අමරතුංග මහතා දර්ශනපති (කැලණිය), ශාස්ත්‍රපති (කැලණිය), ශාස්ත්‍රවේදී ගෞරව (පේරාදෙණිය), MELT (ඇ.එ.ජ. ටෙක්සාස්), AELIC (ඇ.එ.ජ. ටෙක්සාස්) (2020.09.13 දින සිට)

පීඨාධිපති - සම සෞඛ්‍ය විද්‍යා පීඨය
ආචාර්ය ඩී.යූ.කොට්ටහච්චි දර්ශනශූරී (කොළඹ) පර්යේෂණාත්මක රක්තපාතවේදය, දර්ශනශූරී (කොළඹ), විද්‍යාවේදී (සාමාන්‍ය) (පේරාදෙණිය), වෛද්‍ය රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා

පීඨාධිපති - නිර්මිත පරිසරය සහ අවකාශ විද්‍යා පීඨය
ආචාර්ය ඒ.ආර්.රූපසිංහ විද්‍යාවේදී (ගෞරව) භූගෝලවිද්‍යා විශේෂ (සොෆියා බල්ගේරියා) විද්‍යාපති, සිතියම් විද්‍යාව හා භූ රූප විද්‍යාව (2020.12.14 දින දක්වා)

ආචාර්ය ඒ.එච්.ලක්මාල්, දර්ශනශූරී, ශාස්ත්‍රවේදී ව්‍යාපාර පරිපාලන, විද්‍යාපති, විද්‍යාවේදී (ගෞරව), MSISL, MSSSI, MSLAAS (2020.12.15 දින සිට)

පීඨාධිපති - පරිගණක පීඨය
කොමදෝරු ජේ.යූ.ගුණසීල USP psc විද්‍යාවේදී (ගෞරව) (විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු) LESC (ඉන්දියාව) ඉංජිනේරු විද්‍යාපති (ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ), CEng. MIET, CEng. MIESL, MCSSL

පීඨාධිපති - පර්යේෂණ සහ සංවර්ධන
ජ්‍යෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ද අල්විස් සෙනවිරත්න වෛද්‍යාචාර්ය (ප්‍රජා වෛද්‍ය) (කොළඹ), වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (දන්ඩී) , වෛද්‍ය විද්‍යා විද්‍යාපති (ගෞරව) (දන්ඩී), වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (ශ්‍රී ලංකාව) (ගෞරව), FCCP(SL) (2020.03.13 දක්වා)

මහාචාර්ය සී.එල්.ගුණසේකර විද්‍යාවේදී (කොළඹ), දර්ශනශූරී (කැනඩාව), Postdoctoral fellow (කැනඩාව) (2020.03.14 සිට)

අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ සහාය හා සංවර්ධන සේවා මධ්‍යස්ථානය
බ්‍රිගේඩියර් ඩී.එල්.එස්.යූ.ද සිල්වා USP, රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (කොළඹ විවි), බ්‍රිතාන්‍ය පරිගණක සංසදයේ සාමාජික, පරිගණක විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ශ්‍රී ලංකාව) ADP Sys(ඉන්දියාව)**,** පද්ධති විශ්ලේෂණ සහ සැලසුම් පිළිබඳ ඩිප්ලෝමා, වෙබ් තාක්ෂණය පිළිබඳ ජාලකරණ හා සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමා, සාම විනිසුරු (මුළු දිවයිනටම) (2020.12.04 දක්වා)

ලුතිනන් කර්නල් එම්.ටී.සී.ද සිල්වා ශ්‍රී ලංකා සංඥා බලකාය (2020.12.05 සිට)

අධ්‍යක්ෂ - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
ලුතිනන් කර්නල් (වෛද්‍ය) නිශාන්ත කුමාරසිංහ වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී , දර්ශනශූරී (2020.01.06 සිට)

අධ්‍යක්ෂ - උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන ආයතනනය (KDU-CARE)
මහාචාර්ය සී.එල්.ගුණසේකර විද්‍යාවේදී (කොළඹ), දර්ශනශූරී (කැනඩාව) , Postdoctoral fellow (කැනඩාව)
(2020.03.13 දින සිට)

අධ්‍යක්ෂ - ජාත්‍යන්තර සබඳතා කාර්යාලය
කේ.එම්.ජී.පී.ප්‍රේමදාස (දර්ශනශූරී) (2020.03.10 දින සිට)

අධ්‍යක්ෂ - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
ආචාර්ය ආර්.එම්.එන්.ටී.සිරිසෝම මිය දර්ශනශූරී (මොරටුව), ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව), C Eng, CMILT (එංගලන්තය), MITE (ඇ.එ.ජ), MIE (ශ්‍රී ලංකාව) (2020.09.12 සිට)

අධ්‍යක්ෂ - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
ආචාර්ය ආර්.එම්.එන්.ටී.සිරිසෝම මිය දර්ශනශූරී (මොරටුව), ඉංජිනේරු විද්‍යාවේදී (ගෞරව), C Eng, CMILT (එක්සත් රාජධානිය), MITE (ඇ.එ.ජ), MIE (ශ්‍රී ලංකාව) (2020.09.12 දින සිට)

අධ්‍යක්ෂ - තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඩී.වර්ණසූරිය වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී, FRCP(ලන්ඩන්), FCCP, FSLCP, FCGP(ගෞරව), DCH (එංගලන්තය) (2020.09.02 දින දක්වා)

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.අල්විස් සෙනවිරත්න වෛද්‍යාචාර්ය (ප්‍රජා වෛද්‍ය) (කොළඹ), වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (දන්ඩී), වෛද්‍ය විද්‍යා විද්‍යාපති (ගෞරව) (දන්ඩී) වෛද්‍යවේදී සහ ශල්‍ය වෛද්‍යවේදී (ශ්‍රී ලංකාව) (ගෞරව), FCCP(SL)
(2020.09.03 දින සිට)

අධ්‍යක්ෂ – ස්ත්‍රී පුරුෂ සමාජභාවය සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය
ආචාර්ය ලක්ෂිකා ලියනගේ දර්ශනශූරී (ඩර්හැම්, එක්සත් රාජධානිය), ශාස්ත්‍රපති (ඩර්හැම්, එක්සත් රාජධානිය) ශාස්ත්‍රවේදී (ගෞරව) (පේරාදෙණිය) (2020.09.02 දින සිට)

අධ්‍යක්ෂ - කාර්ය සම්පාදන
කපිතාන් (S) පී.ආර්.පී.ප්‍රනාන්දු USP, psc

ලේඛකාධිකාරී
වී.ඩී.කිත්සිරි මහතා ශාස්ත්‍රපති විධායක ව්‍යාපාර පරිපාලන (කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය - ශ්‍රී ජපුර විවි), කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (ශ්‍රී ජපුර විවි), වාණිජවේදී (විශේෂ) ගෞරව, LICA & PI- CASL, ඉංග්‍රීසි භාෂා ඩිප්ලෝමා (ඇක්වයිනාස්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ඇමෙරිකන් කොලේජ් ඔෆ් හයර් ස්ටඩීස්) (2020.03.31 දින සිට)

පුස්තකාලයාධිපති (වැ.බ.)
ටී.සී.රණවැල්ල මිය විද්‍යාපති (කැලණිය), පුස්තකාල විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (කොළඹ) , ASLLA, CTHE (2018.11.11 දින සිට)

මූල්‍යාධිකාරී (වැ.බ.)
ඒ.කේ.එස්.ආරියපාල මහතා, ACA, විද්‍යාවේදී (ගණකාධිකරණ) විශේෂවේදී (ශ්‍රී ජපුර විවි), ACMA, APFA
(2020.06.09 දින දක්වා)

ඒ.ඩී.කේ.ඉමාලි මිය ACA, ව්‍යාපාර පරිපාලනවේදී (ගණකාධිකරණ) විශේෂවේදී (කොළඹ) (2020.06.23 දින සිට)

1.7 ආයතනික අරමුණු (2020-2024)

1 වන ඉලක්කය :

ජාතික අභිලාෂයන්, ඉලක්ක සහ අවශ්‍යතා සපුරාලීම සඳහා කොආවි අනාගතාභිමුඛ දැක්මක් සහිතව රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වශයෙන් අඛණ්ඩව සංවර්ධනය කිරීම

2 වන ඉලක්කය:

කොආවි උපාධි පාඨමාලා සඳහා වන ජාතික මෙන්ම ජාත්‍යන්තර පිළිගැනීම ඉහළ නැංවීම

3 වන ඉලක්කය:

විශ්වවිද්‍යාලයේ සියලුම වැඩසටහන් වඩාත් කාර්යක්ෂමව මෙන්ම සුමට ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා උසස් තත්ත්වයේ යටිතල පහසුකම් සහ සේවා පහසුකම් සහතික කිරීම සහ ගුණාත්මක භාවයෙන් ඉහළ පර්යේෂණ සහතික කිරීම, ඒ සඳහා පහසුකම් සැලසීම සහ අවස්ථාව ලබාදීම.

4 වන ඉලක්කය :

කොආවි හි මානව සම්පත් සංවර්ධනය කිරීම .

5 වන ඉලක්කය:

කොආවි උපාධිධරයන් රැකියා සඳහා සුදුසු, සමබර මනා පෞර්ෂයන්ගෙන් හෙබි වර්තමාන අභියෝග සඳහා මුහුණදිය හැකි පිරිසක් බව සහතික කිරීම.

1.8 කාර්ය සාධනය 2020 - වර්ෂය

01. මූල්‍ය ප්‍රගතිය

2020.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

විස්තර	ප්‍රතිපාදන 2020 රු.	සත්‍ය වියදම 2020.12.31 දක්වා රු.	මුළු වෙන් කිරීමෙන් ප්‍රතිශතයක් ලෙස
පුනරාවර්තන	1,501,000,000.00	1,550,532,685.63	103.30
ප්‍රාග්ධන	33,000,000.00	32,453,797.34	98.34
පොලී ගෙවීම - කොඅාවි විශ්වවිද්‍යාල රෝහල	4,649,883,000.00	4,640,631,035.29	99.80
මුළු මුදල	6,183,883,000.00	6,223,617,518.26	

02. ආයතනයේ ප්‍රගතිය

2.1 ආයතනයේ පොදු ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

2.1.1 සිවිල් කාර්ය මණ්ඩලය සාරාංශය

අනු අංකය	කාර්ය මණ්ඩලය	බඳවා ගැනීම්		විශ්‍රාම ගැනීම්		ඉල්ලා අස්වීම්		සේවය හැර යාම්		උසස්වීම්		කොන්ත්‍රාත් කාලය අවසන් කිරීම	
		2019	2020	2019	2020	2019	2020	2019	2020	2019	2020	2019	2020
1	අධ්‍යයන	11	40	01	00	09	07	00	01	13	44	04	03
2	පරිපාලන	01	06	00	00	01	03	00	00	00	02	01	00
3	අධ්‍යයන සහායක	35	72	00	00	23	19	00	00	01	03	07	06
4	ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි	03	57	06	02	02	02	00	00	09	00	00	00
5	සුළු ශ්‍රේණි	43	08	09	09	00	01	03	00	09	20	00	00
එකතුව		**93**	**183**	**16**	**11**	**35**	**32**	**03**	**01**	**32**	**69**	**12**	**09**

2.1.2 කාර්ය මණ්ඩල සාරාංශය - විශ්වවිද්‍යාල රෝහල (වේරහැර)

කාර්ය මණ්ඩලය	බඳවා ගැනීම්	විශ්‍රාම ගැනීම්	ඉල්ලා අස්වීම්	සේවය හැර යාම්	සේවයෙන් ඉවත් කිරීම්	උසස්වීම්	කොන්ත්‍රාත් කාලය අවසන් කිරීම්	මිය යාම්
වෛද්‍ය සේවක සංඛ්‍යාව								
ජ්‍යෙෂ්ඨ මට්ටම	57	00	02	00	00	00	00	00
තෘතීයික මට්ටම	83	01	04	08	00	00	00	00
ද්විතීයික මට්ටම	30	00	02	03	00	00	00	00
ප්‍රාථමික මට්ටම	00	00	04	01	00	00	00	00
පරිපාලන සේවක සංඛ්‍යාව								
ජ්‍යෙෂ්ඨ මට්ටම	00	00	00	00	00	00	00	00
තෘතීයික මට්ටම	00	00	00	00	00	00	00	00
ද්විතීයික මට්ටම	00	00	04	00	00	00	00	00
ප්‍රාථමික මට්ටම	29	00	01	02	00	00	00	00
එකතුව	**199**	**01**	**17**	**14**	**00**	**00**	**00**	**00**

2.1.3 ශිෂ්‍ය ජනග්‍රහනයේ වර්ධනය (දේශීය)

කාණ්ඩය	2019	2020
කෙඩෙට් නිලධාරීන්	218	268
දිවා විද්‍යාර්ථීන්	817	1070
එකතුව	**1035**	**1338**

2.1.4 ශිෂ්‍ය ජනග්‍රහනයේ වර්ධනය (විදේශීය)

කාණ්ඩය	2019	2020
කෙඩෙට් නිලධාරීන්	13	03
දිවා විද්‍යාර්ථීන්	34	29
එකතුව	**47**	**32**

03. ජයග්‍රහණ

3.1 නව උපාධි වැඩසටහන් හඳුන්වා දීම.

- දත්ත විද්‍යා හා ව්‍යාපාර විශ්ලේෂණ **(DBA)** විද්‍යාවේදී ගෞරව උපාධිය
- වෙනත් භාෂා කථාකරන්නන්ට ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රවේදී උපාධිය **(TESOL)**
- ව්‍යවහාරික දත්ත විද්‍යා සන්නිවේදන **(ADC)** විද්‍යාවේදී උපාධිය.

3.2 උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන ආයතනනය සහ කෙයා ටෙක්නොලෝජීස් පුද්ගලික සමාගම නැවත සක්‍රිය කිරීම.

3.3 කොඅාවි උපකාරක සේවාව සහ සෞඛ්‍ය සේවා සංවර්ධන මධ්‍යස්ථානය පිහිටුවීම.

3.4 පහත සඳහන් මධ්‍යස්ථාන පිහිටුවීම

- තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය
- වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය
- ජාත්‍යන්තර සබඳතා කාර්යාලය

3.5 කොඅාවි තොරතුරු මධ්‍යස්ථානයක් පිහිටුවීම.

3.6 ඊ- කේඩියු සංකල්පය දියත් කිරීම.

3.7 කොඅාවි ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා 100% නොමිලේ සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම.

1.9 අනාගත සැලසුම්

<u>ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය</u>

- නව පීඨ දෙකක් ස්ථාපනය කිරීම: උපාධි පාඨමාලා හතරකින් (04) සමන්විත අධ්‍යයනාංශ දෙකක් සහිත තාක්ෂණික පීඨය ස්ථාපනය කිරීම.
- අපරාධ යුක්තිය පිළිබඳ පීඨය ස්ථාපනය කිරීම: අධ්‍යයනාංශ දෙකකින් උපාධි පාඨමාලා (03) කින් සහ ශාස්ත්‍රපති උපාධි (04) කින් සමන්විතවේ.
- පීඨ සංඛ්‍යාව ඉහළ නැංවීමත් සමඟ ඇතුළත් කරගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම.
- නීති පීඨය සහ කළමනාකරණ, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය සඳහා නවීන පහසුකම්වලින් සමන්විත නව ගොඩනැඟිලි දෙකක් (02) ඉදි කිරීම.
- විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු නිමකිරීම .
- රත්මලාන පිහිටි නේවාසිකාගාරය පිළිසකර කිරීම.
- කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා වාහන නැවැත්වීමේ පහසුකම්, නවාතැන් පහසුකම්, සුපිරි වෙළඳ සංකීර්ණය, අවන්හල ආදී බහු විධ පහසුකම් ඇතුළත් ගොඩනැඟිලි සංකීර්ණයක් ඉදිකිරීම.
- නවීන තාක්ෂණයෙන් යුතු මාධ්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.
- රණවිරු ස්මාරකයක් ඉදිකිරීම .
- කොඅාවි සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කිරීම .
- කොඅාවි මූලස්ථානය වර්තමාන අධ්‍යයන කටයුතු සිදු කෙරෙන ගොඩනැගිල්ල වෙත ගෙන ඒම.
- ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් ස්ථාපනය කිරීම .
- ව්‍යායාම් මධ්‍යස්ථානය පුළුල් කිරීම .
- කොඅාවිට නව පෙනුමක් ලබාදීම සඳහා "බී" ගේට්ටුව ඉදිකිරීම.
- පොලිස් විද්‍යාලය සහ ජාතික ආරක්ෂක විද්‍යාලය කොඅාවි අනුබද්ධ කිරීම.
- මිලෝදා මූල්‍ය අධ්‍යයන ආයතන ගොඩනැඟිල්ලෙහි විශ්වවිද්‍යාලයේ නාගරික මණ්ඩපය සථාපනය කිරීම.
- කොඅාවි සඳහා වන නව පනත සම්මත කරගැනීම.
- ලොව ප්‍රසිද්ධ විශ්වවිද්‍යාල සමඟ එක්ව උපාධි පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් සපුරාලන පාඨමාලා, ඒකාබද්ධ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා, ද්විත්ව ආචාර්ය උපාධි පාඨමාලා සහ පර්යේෂණ සහයෝගීතාවයන් ආරම්භ කිරීම.
- ආපදා කළමනාකරණ හා පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- භාෂා විද්‍යාගාරයන්හි පහසුකම් ඉහළ නැංවීම.

<u>කොඅාවි - විශ්වවිද්‍යාල රෝහල</u>

- වේරහැර පිහිටි කාන්තා නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම.
- රෝහල් තොරතුරු කළමනාකරණ පද්ධතියක් පිහිටුවීම.
- විකිරණ චිකිත්සක ප්‍රතිකාර ඒකකයක් පිහිටුවීම.
- පරමාණුක බලශක්ති අධිකාරියේ සහයෝගය ඇතිව කොඅාවි රෝහලෙහි සයික්ලොට්‍රෝන බලාගාරයක් (Cyclotron Plant) ස්ථාපනය කිරීම.
- දෙමුහුන් ශල්‍යාගාරයක් (hybrid theater) සහ හෘද රෝග විනිශ්චය කිරීමේ විද්‍යාගාරයක් (cath lab) කොඅාවි රෝහලේ ස්ථාපනය කිරීම.

- කොඇවි රෝහලෙහි සුවසන ආධාරක කුටියක් (hypobaric chamber) ස්ථාපනය කිරීම.
- අනතුරු හා හදිසි ප්‍රතිකාර ඒකකයක් පිහිටුවීම.

<u>දක්ෂිණ මණ්ඩපය</u>

- දක්ෂිණ මණ්ඩපයේ ප්‍රකාශන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.
- අධ්‍යයන කාර්ය මණ්ඩල, ශිෂ්‍ය සහ සෙසු නිල මෙන්ම මණ්ඩපාධිපතිගේ නවාතැන් පහසුකම් වැඩිදියුණු කිරීම.
- පරිගණක පීඨය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම.
- ක්‍රීඩා පහසුකම් වැඩිදියුණු කිරීම (පිහිනුම් තටාකය)

2. විශ්වවිද්‍යාලයේ පීඨ, මණ්ඩප, ප්‍රතීතන ප්‍රදානය ලද ආයතන සහ මධ්‍යස්ථාන/ඒකක

2.1 පීඨ

2.1.1 පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය



ත්‍රිවිධ හමුදා හා පොලිස් නිලධාරීන් සඳහා විද්‍යාපති (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ උපාධිය හැදෑරීමේ අවස්ථාව ලබා දීමේ අරමුණින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨය 2001 වර්ෂයේ දී මුලින් ආරම්භ කරන ලද්දේ විද්‍යාපති උපාධි අංශයක් ලෙසිනි. පළමු විද්‍යාපති (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ උපාධි පාඨමාලාව 2001 මාර්තු 22වන දින ආරම්භ කරන ලද අතර විද්‍යාවේදී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ උපාධි පාඨමාලාව 2003 ජූලි 10වන දින ආරම්භ කරන ලදී.

උසස් මට්ටමේ අධ්‍යයන ප්‍රමිතීන් පවත්වා ගැනීම සහතික කිරීම මෙන්ම සේවයේ නියුක්තවන අතරම වසර දෙකක් තුළ උපාධිය හදාරා සම්පූර්ණ කරගැනීමේ අවස්ථාව ද සැලසෙන පරිද්දෙන් මෙම පාඨමාලා සැලසුම් කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පිළිගත් විශ්වවිද්‍යාලවල ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයින් හා වෘත්තීයවේදීන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විසිනි. පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනය (IPGS) 2007 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර එම ආයතනය ඉන් අනතුරුව කාර්ය මණ්ඩල සංවර්ධන හා වෘත්තීය අභිවර්ධන අංශය ලෙස නම් කරන ලදී. පසුව, 2012 වර්ෂයේ දී එම අංශය උපාධි අධ්‍යයන පීඨය ලෙස උසස් කරන ලදී.

මෙම පීඨය ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ අධිකාරිලත් නිලධාරීන් හා සෙසු නිලධාරීන් මෙන්ම පුද්ගලික අංශයේ විධායක නිලධාරීන් සඳහා විද්‍යාපති, දර්ශනපති හා දර්ශනශූරී උපාධි පාඨමාලා පැවැත්වීමේ කාර්යයේ අඛණ්ඩව නිරතවේ. උපාධි අධ්‍යයන පීඨය විසින් අන්‍යෝන්‍ය ක්‍රියාකාරී සැසි, පර්යේෂණාත්මක ඉගෙනුම් හා ස්වාධීන පර්යේෂණ ව්‍යාපෘති ඔස්සේ සිසුන්ගේ පුද්ගලික හා වෘත්තීය අභිවෘද්ධිය තහවුරු කිරීම ඉටු කරනු ලැබේ.

උපාධි අධ්‍යයන පීඨය විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා:

- දර්ශනශූරී/දර්ශනපති උපාධිය
- කළමනාකරණ විද්‍යාපති උපාධිය
- ඊ-පාලනය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිය
- කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිය
- නීතිය පිළිබඳ විද්‍යාපති උපාධිය
- ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන විද්‍යාපති උපාධිය
- ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු විද්‍යා විද්‍යාපති උපාධිය
- ඉලෙක්ට්‍රොනික් හා සන්නිවේදන ඉංජිනේරු විද්‍යා විද්‍යාපති උපාධිය
- සිවිල් ඉංජිනේරු විද්‍යාපති උපාධිය
- ආපදා අවදානම් අවම කරගැනීම හා සංවර්ධනය පිළිබඳ විද්‍යාපති උපාධිය

උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යයන මණ්ඩලය

අධ්‍යයන මණ්ඩලය	ප්‍රධානියා
වෛද්‍ය හා ජීව විද්‍යා අධ්‍යයන මණ්ඩලය	මහාචාර්ය ඩබ්. අමරවික්‍රම
ඉංජිනේරු, පරිගණක හා අවකාශ විද්‍යා අධ්‍යයන මණ්ඩලය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජේ.ආ.ර්.ලූකස්
කළමනාකරණ හා සමාජ අධ්‍යයන පිළිබඳ අධ්‍යයන මණ්ඩලය	ඩබ්.ඒ.ඒ.කේ. අමරතුංග මයා

බඳවා ගැනීම්

- 2020 වර්ෂය සඳහා උපාධි අධ්‍යයන පීඨයේ පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම 2020.06.18, 2020.06.22, 2020.06.24 හා 2020.06.26 යන දිනවලදී එම පීඨයේ ශ්‍රවණාගාරයේ දී සිදුකරන ලද අතර පහත ප්‍රස්තාරයේ දැක්වෙන පරිදි එසේ ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 281කි.



උපාධි ප්‍රදානය

පහත දැක්වෙන පරිදි පශ්චාත් උපාධිධාරීන් හා ප්‍රථම උපාධිය හිමිකරගත් උපාධිධාරීන් 132දෙනෙක් සඳහා උපාධි ප්‍රදානය කරන ලදී.

උපාධි වැඩසටහන	උපාධිධාරීන් සංඛ්‍යාව
දර්ශනශූරී/දර්ශනපති උපාධිය	5
කළමනාකරණ විද්‍යාපති උපාධිය	22
කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිය	24
ඊ-පාලනය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිය	11
නීතිය පිළිබඳ විද්‍යාපති උපාධිය	30
ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන විද්‍යාපති උපාධිය	11
ඉලෙක්ට්‍රොනික් හා සන්නිවේදන ඉංජිනේරු විද්‍යා විද්‍යාපති උපාධිය	01

කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	04
කාර්ය සම්පාදන කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	06
විද්‍යුත් හා සන්නිවේදන ඉංජිනේරු විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	06
කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	12



නව පත්වීම්

නම	තනතුර	පත්වීම් දිනය
ලුතිනන් කර්නල් පී.පී. සේරසිංහ	මාණ්ඩලික නිලධාරී I	2020.04.02
ලුතිතන් කමාන්ඩර් (එන්ඩී) ජේ.පී.සී.ජේ. ද සිල්වා	මාණ්ඩලික නිලධාරී II (වැඩසටහන්)	2020.10.12

විශේෂ සිදුවීම්

සිදුවීම	දිනය
තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ (XIXවන) සහතිකපත් ප්‍රදානෝත්සවය	2020.08.24
කොඅාවි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන සැසිවාරය	2020.10.15 2020.10.16

2.1.2 ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය

ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය කොආවිහි ප්‍රමුඛතම අධ්‍යයන ක්ෂේත්‍රයක් වන අතර, එහි වගකීම් විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති (ආරක්ෂක හා පරිපාලන) යටතේ ක්‍රියාත්මක වන ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන පීඨය වෙත පැවරී ඇත. මෙම පීඨය අධ්‍යයනාංශ 02කින් සමන්විත වේ: එනම් ආරක්ෂක අධ්‍යයනාංශය හා ක්‍රමෝපාය අධ්‍යයනාංශය වශයෙනි. කැඩෙට් නිලධාරීන් මෙන්ම ත්‍රිවිධ හමුදාවල සේවයේ නියුතුවූවන් සඳහා ඉහළ ගුණාත්මක තත්ත්වයේ හමුදා අධ්‍යාපනයක් හා පුහුණුවක් ලබාදීම තහවුරු කිරීම සඳහා බහුආංශික අධ්‍යයන හා හමුදා පුහුණු ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා මෙම අධ්‍යයනාංශ විසින් වගකීම් දරනු ලැබේ. මීට අමතරව, දේශීය හා විදේශීය සිවිල් ශිෂ්‍යයන්ගේ පරිපාලනය සහ නායකත්ව ගුණාංග, සාමූහික ක්‍රියාකාරකම් හා ධනාත්මක චින්තනය වර්ධනය කිරීම සඳහා න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු ඔස්සේ ඔවුන් දැනුවත් කිරීමේ වගකීම ද, රජයේ මෙන්ම පුද්ගලික පාසැල් සහ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා පුද්ගලාභිවර්ධන පුහුණු වැඩසටහන් පැවැත්වීම ද මෙම පීඨය විසින් සිදුකරනු ලැබේ.

<u>ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන පීඨයේ කාර්ය මණ්ඩල විස්තරය</u>

අනු අංකය	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය
01	මහාචාර්ය	02	00
02	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	10	01
03	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය		02
04	කථිකාචාර්ය		02
05	කථිකාචාර්ය (තාවකාලික)		03
06	උපදේශක	04	00
එකතුව		**16**	**08**

ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන පීඨය පහත දැක්වෙන අධ්‍යයනාංශ දෙකින් (02) සමන්විතවේ:

- ආරක්ෂක අධ්‍යයනාංශය
- ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශය

මෙම පීඨය මඟින් මෙහෙයවනු ලබන උපාධි පාඨමාලා:

- ක්‍රමෝපාය අධ්‍යයන හා ජාත්‍යන්තර සබඳතා විද්‍යාවේදී උපාධිය

<u>ආරක්ෂක අධ්‍යයන අධ්‍යයනාංශය</u>

ආරක්ෂක අධ්‍යයන අධ්‍යයනාංශය සියලුම කැඩෙට් සිසුන්ගේ විනය, හමුදා පුහුණුව හා සියලුම පරිපාලන කටයුතු සඳහා වගකිවයුතු වන අතර, නේවාසික නොවන සිවිල් සිසුන්ගේ පරිපාලන කටයුතු සඳහා ද වගකිවයුතු වේ. ආරක්ෂක අධ්‍යයන අධ්‍යයනාංශය බලගණ හයකින් (06), එනම් 32වන, 33වන, 34වන, 35වන, 36වන හා 37වන ඇතුළත් කරගැනීම් වලින් සමන්විත වේ. එක් එක් ඇතුළත් කරගැනීම්හි සිටින කැඩෙට් නිලධාරීන්ගෙන් එක් එක් බලගණ පිහිටුවා ඇති අතර, විධානය හා පාලනය සඳහා හට කණ්ඩායම් කිහිපයකට බෙදා ඇත. බලගණ අණදෙන නිලධාරී විසින් සම්පූර්ණ බලගණයේ සමස්ත වගකීම දරන අතර, හට කණ්ඩායම් අණදෙන නිලධාරීන් ඔවුන්ට පවරා ඇති හට කණ්ඩායම අධීක්ෂණය සඳහා වගකිවයුතු වේ.

ආරක්ෂක අධ්‍යයන පීඨයේ සංවිධානය

කැඩෙට් නිලධාරීන් ඇතුළත් කරගැනීම් හයක් සඳහා අනුමත සංවිධානය විසින් අවශ්‍යතා සපුරාලනු ලැබේ. 2020 දෙසැම්බර් 31වන දිනට ආරක්ෂක අධ්‍යයන පීඨයේ තත්‍ය සංවිධානය පහත පරිදි වේ:



යටිතල පහසුකම් සංවර්ධනය/ නව ව්‍යාපෘති

කැඩෙට් නිලධාරීන්ගේ භෝජනාගාරය සඳහා යටිතල පහසුකම් සැපයීම සඳහා සහ ක්‍රීඩා අයිතම මිලදී ගැනීම සඳහා පිළිවෙලින් රු. 5,050,032.50ක් හා රු.3,644,060.10ක් වැය කරන ලදී.

ක්‍රීඩා ක්‍රියාකාරකම්වලින් ලබාගත් ජයග්‍රහණ

හමුදා සේවයේ දී ශාරීරික හා මානසික යෝග්‍යතාවය, ශක්තිය හා ශක්‍යතාවය යන සාධකවල වැදගත්කම සැලකිල්ලට ගෙන, පෙර වසරවලදී ක්‍රියාත්මක කරන ලද ආකාරයෙන්ම සියලුම කැඩෙට් නිලධාරීන්ට ක්‍රීඩා හා සරඹ ක්‍රියාකාරකම්වල අඛණ්ඩව නිරතවීම ධෛර්යමත් කරන ලදී. විශ්වවිද්‍යාල අධ්‍යයන කාලසීමාව තුළ දී කැඩෙට් නිලධාරීන් අවම වශයෙන් එක් කණ්ඩායම් ක්‍රීඩා ඉසව්වකට හෝ සහභාගී වීම අනිවාර්ය කර ඇත. ක්‍රීඩා සඳහා අවශ්‍ය පහසුකම් සියල්ල සපයන අතර, කැඩෙට් නිලධාරීන් හා නේවාසික නොවන සිවිල් සිසුන් ක්‍රීඩාවල යෙදීම දිරිමත් කරන ලදී.

ක්‍රීඩා නිලධාරියෙකු ඉහත ක්‍රීඩා සංවිධානය කිරීම භාරව කටයුතු කරනු ලැබේ. අන්‍යෝන්‍ය වශයෙන් සමීප අන්තර් ක්‍රියාකාරීත්වයක් මෙන්ම අනෙකුත් විශ්වවිද්‍යාල හා බාහිර සංවිධාන සමඟ සමීප සබඳතාවයක් ඇති කර ගැනීම සඳහා එම විශ්වවිද්‍යාල සහ ක්‍රීඩා සමාජවලට එරෙහිව තරඟ පවත්වන ලදී. 2020 වර්ෂය තුළ දී ක්‍රීඩා කටයුතු වලින් ලබාගත් ජයග්‍රහණ පහත දැක්වේ:

'කොආවි වර්ණලාභීන්' සංඛ්‍යාව		
කොආවි මට්ටමේ කුසලතා	-	35
ජාතික මට්ටමේ කුසලතා	-	41



ශ්‍රී ලංකා කරාතේ සංගමය විසින් 2020 ජනවාරි 08 හා 09 යන දිනවලදී සංවිධානය කරන ලද දිස්ත්‍රික් හා බස්නාහිර පළාත් කරාතේ ශූරතාවලි වලදී ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කරාතේ කණ්ඩායම විසින් රන් පදක්කම් 09ක් ඇතුලුව සමස්ත පදක්කම් 34ක් දිනා ගන්නා ලදී.



විදේශීය රටවලින් පැමිණි කැඩෙට් නිලධාරින්ගේ වාර්ෂික චාරිකාව

විදේශීය රටවලින් පැමිණි කැඩෙට් නිලධාරීන්ගේ විවේක කාලසීමාව ගත කිරීමේ කටයුතු වල කොටසක් වශයෙන්, 2020 සැප්තැම්බර් 25 සිට 27 දක්වා ශ්‍රී ලංකාවේ විවිධ ස්ථාන ආවරණය වන පරිදි සංවිධානය කළ වාර්ෂික චාරිකාවට විදේශීය කැඩෙට් නිලධාරීන් 23දෙනෙකු සහභාගී විය. මේ සඳහා ප්‍රවාහන පහසුකම් කොආවි විසින් සපයන ලද අතර සංචාර කටයුතු සඳහා කැඩෙට් නිලධාරීන්ගේ භෝජනාගාර අරමුදලින් රු.211,000.00ක් වැය විය.

<u>ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශය</u>

නව බඳවාගැනීම් (හමුදා හා සිවිල්)

අනු අංකය	නම	තනතුර	පත්වීම් දිනය
1.	ලුතිනන් කර්නල් ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්.ටී. සුජිත් RWP psc	පර්යේෂණ සම්බන්ධීකාරක	2020.10.27
2.	ආචාර්ය එච්.ආර්. විදානගේ	අධ්‍යයනාංශාධිපති - ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශය	2020.11.10

නව උපාධි පාඨමාලා

ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශය විසින් 37වන ඇතුළත් කරගැනීම යටතේ උපාධි අපේක්ෂකයන් සඳහා විද්‍යාවේදී ක්‍රමෝපාය අධ්‍යයන හා ජාත්‍යන්තර සබඳතා නමින් නව උපාධි පාඨමාලාවක් ආරම්භ කරන ලදී. පළමු කණ්ඩායම ලෙස කැඩෙට් නිලධාරීන් 10දෙනෙකු හා සිවිල් සිසුන් 37දෙනෙකු බඳවා ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකින් පළමු වරට ක්‍රමෝපායික හා ජාත්‍යන්තර සබඳතා විෂය ක්ෂේත්‍ර කේන්ද්‍රකර ආරම්භ කරන ලද දෙමුහුම් උපාධි පාඨමාලාවක් ලෙස මෙම ක්‍රමෝපාය අධ්‍යයන හා ජාත්‍යන්තර සබඳතා නව උපාධි පාඨමාලාව සැලකේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ලබාගෙන ඇති පශ්චාත් උපාධි සුදුසුකම්

අනු අංකය	නම	තනතුර	ලබාගත් සුදුසුකම
1.	ආචාර්ය භාග්‍යා සේනාරත්න	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	දර්ශනශූරී උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
2.	ආචාර්ය සනත් ද සිල්වා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	දර්ශනශූරී උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය

අ. ජාත්‍යන්තර සබඳතා, ජාතික ආරක්ෂාව සම්බන්ධ විවිධ පැතිකඩ සහ රටෙහි සමස්ත ක්‍රමෝපායික පිහිටීම වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ සිදුකර ඇති ප්‍රතිපත්තිමය පර්යේෂණවල අඩු බව සැලකිල්ලට ගෙන, ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශය විසින් ආරක්ෂක සහ උපක්‍රමික අධ්‍යයන පීඨය ඉලක්ක කරගෙන ප්‍රතිපත්ති පර්යේෂණ සංවර්ධන වැඩමුළුවක් පවත්වන ලදී. 2020 නොවැම්බර් 13වන දින පැවැත්වූ මෙම වැඩමුළුව සඳහා විශ්‍රාමලත් විදේශ ලේකම්වරයෙකු හා රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියෙකු වන එච්එම්ජීඑස් පළිහක්කාර මහතා දායකත්වය ලබා දුනි.

අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම්

අනු අංකය	විෂයය	ස්ථානය	දිනය	සහභාගීවූවෝ
1.	ඉන්දු-ශ්‍රී ලංකා සබඳතා	ආරක්ෂක සහ ක්‍රමෝපාය	2020.03.05	ඉන්දියාවේ දිල්ලි නුවර Institute of Defence & Analysis ආයතනයේ ඉහළ මට්ටමේ

		අධ්‍යයන පීඨ ශ්‍රවණාගාරය		නිලධාරී පිරිසක්
2.	නිදහස් හා විවෘත ඉන්දු-ශාන්තිකර කලාපය: ජපාන පර්යාලෝකය	කුඩා ශ්‍රවණාගාරය	2020.03.16	මාරි යෝෂිඕකා මිය
2.1	ඉන්දු-ශාන්තිකර කලාපයේ ආරක්ෂක පරිසරය			කමාන්ඩර් සීයා ඊෆියුකියු (Seiya Eifuku)

ජාත්‍යන්තර සංවාද

අ. ඉන්දියන් සාගර කලාපයේ ක්‍රමෝපාය තරඟය යන මාතෘකාව යටතේ හවායිහි ආරක්ෂක අධ්‍යයන සම්බන්ධ ආසියා-ශාන්තිකර මධ්‍යස්ථානය (APCSS) සමඟ 2020 ඔක්තෝම්බර් 01වන දින පැවති සංවාදය සාර්ථකව නිම කරන ලදී.

ප්‍රධාන දේශක	ආවරණය කරන විෂය මාතෘකාව	සංවාදකරුවන්
ආචාර්ය භාග්‍යා සේනාරත්න	ඉන්දියන් සාගර කලාපයේ ක්‍රමෝපායික තරඟය	මහාචාර්ය අමල් ජයවර්ධන හා ආචාර්ය හරින්ද විදානගේ

ආ.ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශය විසින් ජාත්‍යන්තර අධ්‍යයන සඳහා වන ෂැන්ග්හයි ආයතනය (SIIS) සමඟ 2020 දෙසැම්බර් 03වන දින මාර්ගගත වෙබ් සාකච්ඡාවක් සංවිධානය කරන ලදී. මෙම සංවාදය කොආවි උපකුලපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර SIIS ආයතනයේ සභාපති එකී සැසියේ සම සභාපතීත්වය දැරීය.

අනු අංකය	දේශකයා	සාකච්ඡාවේ දී ආවරණය කළ උප මාතෘකා
1.	මහාචාර්ය අමල් ජයවර්ධන	ශ්‍රී ලංකා - චීන සබඳතාවල පසුබිම
2.	ආචාර්ය භාග්‍යා සේනාරත්න	ශ්‍රී ලංකාව සහ නව සේද මාවත (Belt and Road Initiative)
3.	ආචාර්ය හරින්ද විදානගේ	කලාපීය ආරක්ෂාව

ඇ. දෙපාර්ශවය විසින් ද්විපාර්ශ්වික සබඳතා ශක්තිමත් කරගැනීම සඳහා රජයන්ගේ කැපවීම අවධාරණය කරන ලදී. අනාගතයේ දී අන්‍යෝන්‍ය සබඳතා සඳහා විභව්‍ය ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා කරන අතරතුර, ශ්‍රී ලංකා-ඉන්දු සම්බන්ධතා, ඉන්දියන් සාගරය හා කලාපීය ආරක්ෂාව පිළිබඳ චීන ප්‍රතිපත්තිය වැනි විවිධ මාතෘකා ඔස්සේ කොආවි හා ෂැන්ග්හයි ආයතනයේ නියෝජිතයන් දෙපිරිස අතර අදහස් හුවමාරු කරගැනීම ද මෙහි දී සිදුවිය.

පොත් ප්‍රකාශනය

අ. ඉන්දියන් සාගර කලාපයේ පරිපූර්ණ සමුද්‍රීය ආරක්ෂාව: අභියෝග හා අවස්ථා මැයෙන් ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සිතාරා ප්‍රනාන්දු විසින් සංස්කරණය කරන ලද ග්‍රන්ථයක් ප්‍රකාශයට පත්කරන ලදී. මෙම ග්‍රන්ථය කොආවි හා දිල්ලි නුවර නොලේජ් වර්ල්ඩ් පබ්ලිෂර්ස් (KWPublishers) විසින් 2020 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. මෙම ග්‍රන්ථය දොරට වැඩීමේ

උත්සවයේ ප්‍රධාන අමුත්තා හා ප්‍රධාන දේශකයා වූයේ විදේශ අමාත්‍යාංශ ලේකම් අද්මිරාල් (මහාචාර්ය) ජයනාත් කොළඹගේ මහතා ය.

ප්‍රතිපත්ති පත්‍රය

අ. කොවිඩ්-19: ක්‍රමෝපායික පුරෝකථනය - උපකුලපතිවරයා විසින් ආරම්භ කරන ලද මෙම බහු විෂයයික විශ්ලේෂණ ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශය විසින් සිදුකරන ලදී. උපකුලපතිවරයා විසින් මෙහි වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙත පිළිගන්වන ලදී.

ආ. අසන්ත සෙනෙවිරත්න: කොවිඩ්-19 හා කලාපීය ගතික තත්ත්ව: ඉන්දු-ශාන්තිකර කලාපය තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය වාර්තා කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ පර්යාලෝකය; ගතික භූ-දේශපාලනික සංදර්භය තුළ රටවල් කටයුතු කරන්නේ කෙසේ ද යන්න - නැෂනල් ඉන්ස්ටිට්යුට් ඔෆ් ඇඩ්වාන්ස්ඩ් ස්ටඩීස් (NIAS), බැංගලෝර්, ඉන්දියාව

සම්මන්ත්‍රණ පත්‍රිකා

අනු අංකය	මාතෘකාව	කර්තෘ	සංවිධායක (සංවිධායකයින්)	පර්යේෂණ සමුළුව
1	නව සේද මාවත ප්‍රවේශය හා ඉන්දියන් සාගරයේ න්‍යෂ්ටික ස්ථාවරත්වය: කුඩා රාජ්‍යයක පර්යාලෝකය	ආචාර්ය සනත් ද සිල්වා	INCOIRe	කොළඹ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ වාර්ෂික සම්මන්ත්‍රණය
2	සමුද්‍රීය ජාතීන් සමඟ චීන සම්බන්ධතාවය: සිද්ධි අධ්‍යයනයකි.	ආචාර්ය. ඩබ්.බී.සේනාරත්න	ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය	INCOIRe 2020
3	ඉන්දු-ශාන්තිකර කලාපය: වැඩිදියුණු වූ සම්බන්ධීකරණයක් සඳහා වන කලාපීය මෙවලම් පිළිබඳ පිරික්සුම	ආචාර්ය ඩබ්.බී.සේනාරත්න	කොආවි	කොආවි ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය 2020
4	ස්ත්‍රීන්, සාමය හා ආරක්ෂාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ 1325වන යෝජනා සම්මතයෙන් 20 වසරකට පසු	ආචාර්ය. ඩබ්.බී.සේනාරත්න	දකුණු ආසියානු තරුණ සම්මන්ත්‍රණය	දකුණු ආසියානු තරුණ සම්මන්ත්‍රණය
5	නව සේද මාවත ප්‍රවේශය (Belt and Road Initiative) සහ ඉන්දු-ශාන්තිකර ක්‍රමෝපාය: පශ්චාත් කොවිඩ්-19 අභිමුව ගෝලීය ක්‍රමය තුළ ශ්‍රී ලංකාවට බලපාන භූ-දේශපාලනික බලපෑම්	අසන්ත සෙනෙවිරත්න මහතා	සවුත් ඉන්දියන් ස්කොලර්ස් ගෘප් ඔෆ් ඉන්ටර්නැෂනල් ස්ටඩීස් (SISGIS)	කෝවිඩ් -19 වසංගත තත්ත්වය අභිමුව සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ආරක්ෂක අභියෝග: තර්ජන හා ප්‍රතිචාර
6	ශ්‍රී ලංකාව හා කොවිඩ්-19 අර්බුදය: ක්‍රමෝපාය හා ඉදිරි අභියෝග - ත්‍රිබුවාන් විශ්වවිද්‍යාලය මඟින් ප්‍රකාශයට පත්කරන ජර්නලයේ කෝවිඩ්-19 විශේෂ කලාපය	අසන්ත සෙනෙවිරත්න මහතා	සෙන්ටර් ෆෝ රිසර්ච්, ත්‍රිබුවාන් විශ්වවිද්‍යාලය, කත්මණ්ඩු, නේපාලය	සෙන්ටර් ෆෝ රිසර්ච්, ත්‍රිබුවාන් විශ්වවිද්‍යාලය, කත්මණ්ඩු, නේපාලය

2.1.3 වෛද්‍ය පීඨය



2009 වර්ෂයේ දී ආරම්භ කරන ලද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත ජාතික මට්ටමේ එකම හමුදා උසස් අධ්‍යාපන වෛද්‍ය අධ්‍යාපන ආයතනය ලෙස සැලකේ. මෙම පීඨයේ වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධි පාඨමාලාව (MBBS) හැදෑරිය හැක්කේ හමුදාවේ කැඩෙට් නිලධාරීන්ට හා විදේශ කාණ්ඩය යටතේ ගාස්තු අය කිරීමේ පදනම මත ලියාපදිංචිවන සිසුන්ට පමණි.

වසර පහක කාල සීමාවක් වන සාම්ප්‍රදායික වෛද්‍ය උපාධි විෂය නිර්දේශය මෙම පීඨය විසින් අනුගමනය කරනු ලැබේ. සිවිල් සිසුන් සඳහා පවතින වෛද්‍ය විද්‍යාලවල ඉගැන්වෙන විෂයයන් 14ට අමතරව, මෙහි වෛද්‍ය සිසුන්ට හමුදා, ගුවන්, නාවික, න්‍යෂ්ටික, ක්ෂති හා හදිසි වෛද්‍ය කටයුතුවලට ද යොමුකරනු ලබන්නේ හමුදා වෛද්‍ය සිසුන් ත්‍රිවිධ හමුදාවල සේවය කිරීම සඳහා පුහුණු කරවන බැවිනි. ප්‍රධාන අධ්‍යයනාංශ තුනක් යටතේ අත්දැකීම් සහිත වෘත්තීය ආචාර්ය මණ්ඩලයක් විසින් මෙම වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධි පාඨමාලාවේ අධ්‍යයන කටයුතු මෙහෙයවනු ලැබේ: එනම් පූර්ව සායනික විද්‍යා අධ්‍යයනාංශය, සම සායනික විද්‍යා අධ්‍යයනාංශය හා සායනික විද්‍යා අධ්‍යයනාංශය වශයෙන් අධ්‍යයනාංශ තුනකි.

තවද, වේරහැර ඉදිකරන ලද කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අයත් විශ්වවිද්‍යාල රෝහල ඉතා නවීන තාක්ෂණයෙන් පරිපූර්ණ රෝහලක් වන අතර එමගින් කොආවි වෛද්‍ය සිසුන්ට සිය සායනික පුහුණු සඳහා ඉමහත් ප්‍රයෝජනයක් සැලසේ. මෙමඟින් කොආවි වෛද්‍ය පීඨය මඟින් පිරිනමන වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධි පාඨමාලාවේ ගුණාත්මක තත්ත්වය ඉහළ නංවනු ලැබේ.

වෛද්‍ය පීඨයේ කාර්ය මණ්ඩල විස්තරය

අනු අංකය	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය
01	මහාචාර්ය	15	07
02	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I පංතිය	64	16
03	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II පංතිය		26
04	කථිකාචාර්ය		04
05	කථිකාචාර්ය (පරිවාස)		06
06	ප්‍රදර්ශක(තාවකාලික)	18	10
එකතුව		**97**	**69**

වෛද්‍ය පීඨය පහත දැක්වෙන අධ්‍යයනාංශ හතර (04)කින් සමන්විත වේ:

- සායනික විද්‍යා අධ්‍යයනාංශය
- සම සායනික විද්‍යා අධ්‍යයනාංශය
- පූර්ව සායනික විද්‍යා අධ්‍යයනාංශය
- වෛද්‍ය අධ්‍යාපන හා කාර්යමණ්ඩල සංවර්ධන අධ්‍යයනාංශය

හමුදාවලට අයත්වන වෛද්‍ය ශිෂ්‍යයෙකු දක්ෂ, නිපුණතා සපිරි හා සානුකම්පිත වෛද්‍ය වෘත්තිකයෙකු බවට පත්කිරීමේ ක්‍රියාවලියේ මූලාරම්භය සඳහා ශක්තිමත් පදනමක් ඇතිකිරීමේ ප්‍රධාන කාර්යය සායනික විද්‍යා අධ්‍යයනාංශය සතු වේ. විද්‍යාත්මක පදනමක් මත සායනික විද්‍යාව අවබෝධ කරගෙන වෛද්‍ය විද්‍යාව ඉගැන්වීමට හා ඉගෙනගැනීමට පහසුකම් සැලසීම සඳහා මෙහි විෂයමාලාව සකස් කර ඇත. ව්‍යවච්ඡේදය, ජෛවරසායන විද්‍යාව හා භෞතවේදය මෙම අධ්‍යයනාංශය මඟින් පිරිනමන ප්‍රධාන විෂය ක්ෂේත්‍ර වේ.

සායනික වෛද්‍යවරයෙකු මෙන්ම ප්‍රජා වෛද්‍යවරයෙකු ලෙස තර්කානුකූල තීරණ ගැනීමෙහි ලා පහසුකම් සැපයෙන සායනික වෛද්‍ය දැනුම සඳහා අනුපූරකයක් සැපයෙන පරිද්දෙන් වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධි පාඨමාලාවේ 03 වන මට්ටමේ I හා II කොටස්වලට අදාළ විෂයයන් ඉගැන්වීමේ කටයුතු සම සායනික විද්‍යා අධ්‍යයනාංශය විසින් සිදු කෙරේ. වෛද්‍ය සිසුන්ගේ 04වන අධ්‍යයන වාරයේ සිට 07වන අධ්‍යයන වාරය දක්වා වූ අධ්‍යයන කටයුතු සඳහා මෙම අධ්‍යයනාංශය විසින් වගකීම දරනු ලැබේ. දේශන, නිබන්ධන, ප්‍රායෝගික ඉගැන්වීම් හා ප්‍රජාව ආශ්‍රයෙන් සිදුකරන ඉගැන්වීම් ද මෙහි ඉගැන්වීම් කටයුතුවලට අන්තර්ගත වේ. මෙම අධ්‍යයනාංශය මඟින් පිරිනමන ප්‍රධාන විෂයයන් වනුයේ ක්ෂුද්‍රජීව විද්‍යාව, පරපෝෂිතවේදය, ව්‍යාධි විද්‍යාව, ඖෂධවේදය, මහජන සෞඛ්‍ය හා ප්‍රජා සෞඛ්‍ය හා අධිකරණ වෛද්‍ය විද්‍යාව වේ.

වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස කටයුතු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ අවසන් වසරට අදාළ වෛද්‍ය විෂය ධාරාව ඉගැන්වීමේ කටයුතු සායනික අධ්‍යයනාංශය විසින් සිදුකරනු ලැබේ. වෛද්‍ය සිසුන්ගේ 06වන අධ්‍යයන වාරයේ සිට 10වන අධ්‍යයන වාරය දක්වා වූ අධ්‍යයන කටයුතු සඳහා මෙම අධ්‍යයනාංශය විසින් වගකීම දරනු ලැබේ. දේශන, නිබන්ධන හා සායනික පුහුණුව මෙහි ඉගැන්වීම් කටයුතුවලට අන්තර්ගත වේ. මෙම අධ්‍යයනාංශය මඟින් පිරිනමන ප්‍රධාන විෂයයන් වනුයේ වෛද්‍ය විද්‍යාව, ශල්‍යවේදය,ප්‍රසව හා නාරීවේදය, ළමා රෝග හා මනෝ වෛද්‍ය අධ්‍යයනය වේ.

වෛද්‍ය සිසුන් සඳහා අධ්‍යාපනික වැඩමුළු, සම්මන්ත්‍රණ හා වැඩසටහන් සංවිධානයකර පැවැත්වීම සහ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය විසින් පිරිනමන වෛද්‍ය විෂය ධාරාවට අදාළව විෂය සමගාමී ක්‍රියාකාරකම්හි දැනුම ලබා දීම සඳහා ප්‍රබල වශයෙන් දායක වීම වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය විසින් සිදුකරනු ලැබේ.

මෙම පීඨය මඟින් පහත උපාධි පාඨමාලාව පවත්වාගෙන යනු ලැබේ:

- වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධිය (MBBS)

<u>ප්‍රධාන තනතුරුවල සිදු වූ වෙනස්කම්</u>

අනු අංකය	නම	තනතුර	පත්වීම් දිනය
01	ගෘප් කපිතාන් (මහාචාර්ය) ආර්.ඒ.එන්.කේ.විජේසිංහ	පීඨාධිපති - වෛද්‍ය පීඨය	2020 අප්‍රේල් 08වන දින සිට

02	ලුතිනන් කර්නල් (වෛද්‍ය)ඩබ්.එම්.එම්.එස්.බණ්ඩාර	අධ්‍යයනාංශාධිපති - පූර්ව සායනික විද්‍යා අධ්‍යයනාංශය	2020 මැයි 14
03	වෛද්‍ය. අයි.එච්.එස්.කුමාරසිංහ	අධ්‍යයනාංශාධිපති - සම සායනික විද්‍යා අධ්‍යයනාංශය	2020 මැයි 06
04	මහාචාර්ය ඉෂානි රොඩ්රිගෝ	අධ්‍යයනාංශාධිපති - සායනික විද්‍යා අධ්‍යයනාංශය	2020 මාර්තු 05

<u>උසස්වීම්</u>

අනු අංකය	නම	පූර්ව තනතුර	උසස්වීම් ප්‍රදානය කරන ලද තනතුර
01	ගෘප් කපිතාන් (මහාචාර්ය) ආර්.ඒ.එන්.කේ. විජේසිංහ	වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය
02	මහාචාර්ය ජී.ඩී.අයි. රොඩ්රිගෝ	ළමා රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	ළමා රෝග පිළිබඳ මහාචාර්ය

<u>කාර්ය මණ්ඩලය සඳහා නව බඳවාගැනීම්</u>

අනු අංකය	නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
1	මහාචාර්ය දීපාල් වීරසේකර	නාරී හා ප්‍රසවවේද මහාචාර්ය	2020.02.01
2	වෛද්‍ය එන්.එස්.ප්‍රනාන්දු	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	2020.01.23
3	වෛද්‍ය ඒ.යු.ගමගේ	ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	2020.02.14
4	වෛද්‍ය සචිත්‍ර ඉලංගතිලක	වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	2020.12.14
5	වෛද්‍ය අයි.ලියනගේ	නව ඡන්ම රෝග පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා විශේෂඥ වෛද්‍ය	2020.02.28
6	කේ.ඕ.බණ්ඩාරනායක මෙය	පරපෝෂිතවේදය පිළිබඳ කථිකාචාර්ය	2020.10.29
7	වෛද්‍ය ෆාරා යූසුෆ්	ළමා රෝග පිළිබඳ කථිකාචාර්ය (තාවකාලික)	2021.01.01

යටිතල පහසුකම් සංවර්ධනය/නව ව්‍යාපෘති

අනු අංකය	කාර්යය විස්තරය
1	කොඅාවි, වෛද්‍ය පීඨයේ නිපුණතා විද්‍යාගාරය අලුත්වැඩියා කිරීම
2	කොඅාවි, වෛද්‍ය පීඨ ගොඩනැගිල්ලේ පියැසි මුදුන ප්‍රතිසංස්කරණය ඇස්තමේන්තුගත අයවැය - රු. 7,290,594.00
3	ව්‍යවච්ඡේද පර්යේෂණ විද්‍යාගාරයක් ඉදි කිරීම - මෙම කාර්යය සඳහා කොඅාවි සංයුක්ත සැලැස්ම යටතේ රු.මිලියන 1.7ක මුළු ප්‍රතිපාදනයක් වෙන්කර තිබේ. දැනට සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන වෛද්‍ය. එච්.එච්.එල්.කේ.ප්‍රනාන්දු මහතාගේ අධික්ෂණය යටතේ මෙම ඉදිකිරීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.
4	ප්ලැටිනිකරණය සඳහා රෙසිනයක් සෑදීමේ හා වැඩිදියුණු කිරීමේ කටයුතු (කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ කවය සමඟ සහයෝගීතාවයෙනි).
5	කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහලේ ඩෙංගු රෝගය පිළිබඳ තොරතුරු ලේඛනගත කිරීමේ කාර්යාලයක් ස්ථාපනය කිරීම.
6	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ පෝෂණය හා සුවතාවය හා සම්බන්ධිත වැඩසටහනක් දියත් කිරීම (Nutri-Fit Programme) - විශ්වවිද්‍යාල රෝහල වෙත පැමිණෙණ අධිබරතී හා ස්ථූලතාවයෙන් පෙලෙන දරුවන් හා යෞවන යෞවනියන් ඉලක්ක කරගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ආරම්භයේ දී මාසික වැඩසටහනක් ලෙස ආරම්භ වූ මෙම වැඩසටහන, වර්තමානයේ දී සතිපතා සායන ලෙස පවත්වන අතර එයින් අපේක්ෂා කරනුයේ මෙම පිරිසට ලබා දී ඇති ඉලක්ක සපුරා ගැනීම අධික්ෂණය කිරීම හා ඒ සඳහා ඔවුන්ට අවශ්‍ය සහාය හා ධෛර්යමත් කිරීම ලබා දීමයි. දරුවන් සහ ඔවුන්ගේ දෙමිපියන් යන දෙපිරිස වෙනුවෙන් මසකට වරක් පැවැත්වෙන වැඩසටහනක් සැලසුම් කර ඇති අතර එමඟින් පෝෂණය සම්බන්ධ අධ්‍යාපනයක් හා ආහාර පිසීමේ ක්‍රමවේද පිළිබඳව ඉදිරිපත් කිරීමක් හා ශාරීරික සුවතාවය වැඩි කිරීම සඳහා හේතු වන යෝග හා සුම්බා ව්‍යායාම පිළිබඳ සැසි ද පැවැත්වෙනු ඇත.
7	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ අන්තරාසර්ග පද්ධතිය සම්බන්ධිත සායනයක් පැවැත්වීම (Endocrine Transition Clinic) - අන්තරාසර්ග පද්ධතිය ආශ්‍රිත ගැටලුවලින් පීඩා විඳින නව යෞවනවියේ පසුවෙන පිරිස ඉලක්ක කරගෙන පැවැත්වෙන විශේෂ සායනයකි. එම පිරිස ළමා වාට්ටුවල සිට වැඩිහිටි වාට්ටු කරා යැවීමේ දී අඛණ්ඩව ඔවුන් සඳහා ප්‍රතිකාර කිරීම මෙමඟින් සිදුවන අතර මෙය රිජ්වේ ආර්යා ළමා රෝහල සමඟ හවුල් වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කෙරේ. අදාළ රෝගීන් රිජ්වේ ආර්යා ළමා රෝහලේ ළමා අන්තරාසර්ග සායනවල සිට කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ අන්තරාසර්ග සායනවලට නියමිත කාලවලදී මාරු කිරීම මෙම සායනය මඟින් අපේක්ෂා කෙරේ.
8	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ ළමා ස්නායු රෝග සායනයක් ස්ථාපනය කිරීම - උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ ළමා ස්නායු රෝග විශේෂඥ වෛද්‍යවරයාගේ සහභාගීත්වයෙන් මසකට වරක් ළමා ස්නායු රෝග සායනයක් පැවැත්වේ. මෙය පානදුර, හොරණ හා පිඹුර වැනි අනෙකුත් මූලික රෝහල්වල රෝගීන් යොමු කිරීම සඳහා සිදුකරන සායනයකි.
9	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ පෝෂණ ඒකකයක් ස්ථාපනය කිරීම - සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ ඒකකය හා පෝෂණවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සහයෝගීතාවයෙන් මෙම ඒකකය ස්ථාපනය හා පහසුකම් සැපයීම සිදු කරන ලදී. වීඩියෝ ටෙලිකොන්ෆරන්ස් තාක්ෂණය ඔස්සේ දැනට මෙහි සති සායන පැවැත්වේ.
10	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ නොමේරු ළදරු දැඩි සත්කාර ඒකකයක් ස්ථාපනය කිරීම - මෙම ඒකකය ඉදි කිරීම, උපකරණ මිලදී ගැනීම සිදුකර රෝගී සත්කාර ආරම්භ කිරීම 2020 ජූනි මාසයේ දී සිදුවිය. දැනට මෙම දැඩි සත්කාර ඒකකයෙන් පහසුකම් සැපයෙනුයේ කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ දී උපත ලබන නොමේරු ළදරුවන් සඳහා පමණි. ගාස්තු අය කරන වාට්ටුවල බිහිවන නොමේරු ළදරුවන් හා මෙම රෝහලින් පිටත වෙනත් රෝහල්වල බිහිවන නොමේරු ළදරුවන් ද මෙම රෝහල වෙත මාරු කර එවීමෙන් පසු ගාස්තු අය කිරීමකට යටත්ව

	මෙම සේවාව සැපයීමට අපේක්ෂා කෙරේ.
11	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ මව්කිරි දීම කළමනාකරණය කිරීමේ මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම - කොඅාවි ශික්ෂණ රෝහලේ දී බිහිකරන ළදරුවන් අතුරින් මව්කිරි දීම සම්බන්ධ ගැටලු පවතින ළදරුවන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා මෙම මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී. ආරම්භයේ දී කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ බිහිවන ළදරුවන් සඳහා පමණක් මෙමඟින් පහසුකම් සැලසිණි. වර්තමානයේ දී අපගේ භාහිර ප්‍රතිකාර අංශය හෝ ළදරු සායනය සඳහා රැගෙන එන ළදරුවන් සඳහා ද මෙම පහසුකම පුළුල්කර තිබේ.
12	සුව ළදරු (Well Baby) සායනය ස්ථාපනය කිරීම - මෙම සායනය සතිපතා පැවැත්වෙන අතර කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ උපත ලබන ළදරුවන් සඳහා මෙම පහසුකම ලබා දේ.
13	මෙම රෝහලේ නොමේරු ළදරු දැඩි සත්කාර ඒකකයෙන් මුදා හරින අවදානමක් සහිත ළදරුවන් සඳහා ස්නායු සංවර්ධන සායනයක් (Neurodevelopment Clinic) ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් මූලික සාකච්ඡා පවත්වන ලදී. මෙම සායනය සඳහා කොඅාවි විශ්වවිද්‍යාල රෝහල වෙත කථන හා භාෂා චිකිත්සකයන්, වෘත්තීය චිකිත්සකයන් සේවයේ නියුක්ත කරවන තෙක් කථන හා භාෂා චිකිත්සකවරයෙකුගේ හා වෘත්තීය චිකිත්සකවරයෙකුගේ සේවය සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ලබා ගැනීම සඳහා අප විසින් කටයුතු කරනු ලැබේ.
14	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ නිර්වින්දන හා දැඩි සත්කාර පහසුකම් වැඩි දියුණු කිරීම.
15	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ නිර්වින්දන හා දැඩි සත්කාර ශල්‍යාගාර පහසුකම් වැඩි දියුණු කිරීම.
16	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ පිළිකා හා කීමෝ තෙරපි ඒකක වැඩි දියුණු කිරීම.
17	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ පිළිකා වාට්ටුවක් හා වේදනා සමනය කිරීමේ සත්කාර ඒකකයක් (Palliative Care Unit) ආරම්භ කිරීම.
18	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ විකිරණ චිකිත්සක ඒකකයක් ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.
19	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ අධිපීඩන ඔක්සිජන් ප්‍රතිකාර ඒකකය (Hyperbaric Oxygen Therapy Unit) නැවත ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.
20	මෞත්‍රික රෝග සම්බන්ධ ශල්‍යාගාරයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
21	සැත්කම් භාවිතය අවම කරමින් TURP, TURBT, upper tract laser lithotripsy and PCNL වැනි ක්‍රමවේද ඔස්සේ කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ මෞත්‍රික සැත්කම් සිදු කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීම.
22	ගාස්තු අය කිරීමේ පදනම යටතේ මෞත්‍රික රෝග සම්බන්ධ සේවා කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ ආරම්භ කිරීම. මෞත්‍රික රෝග සහිත බාහිර රෝගීන් සඳහා විශේෂඥ වෛද්‍ය වැනලින් සේවා වාට්ටු අංක 09දී මෞත්‍රික රෝග සහිත රෝගීන් සඳහා ප්‍රතිකාර එන්ඩොස්කොපි අංශය තුළ මෞත්‍රික රෝග සම්බන්ධිත පරීක්ෂණ සිදු කිරීම
23	ශල්‍යාගාර තුළ මෞත්‍රික රෝග ආශ්‍රිත සැත්කම් සිදු කිරීම.
24	කොඅාවි විශ්වවිද්‍යාල රෝහල තුළ උගුර, කණ හා නාසය ආශ්‍රිත සැත්කම් වැඩිදියුණු කිරීම.
25	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ උගුර, කණ හා නාසය ආශ්‍රිත සැත්කම් සඳහා ශල්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම.
26	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ කර්ණශංඛ බද්ධ සැත්කම් හා ශ්‍රවණ ආධාර වැඩසටහන් (bone anchored hearing aid programs) ආරම්භ කිරීම සඳහා කටයුතු කිරීම.
27	කොඅාවි විශ්වවිද්‍යාල රෝහල් Universal Neonatal Hearing Screening වැඩසටහන ආරම්භ කිරීම.
28	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ සාමාන්‍ය සැත්කම් සේවා පහසුකම් වැඩිදියුණු කිරීම.
29	කොඅාවි විශ්වවිද්‍යාල රෝහලේ ශල්‍යාගාර පහසුකම් අංශයේ සේවා ගාස්තු අයකිරීමේ පදනම මත ආරම්භ කිරීම.
30	උපකරණ හා යටිතල පහසුකම් සංවිධානය ඔස්සේ කොඅාවි විශ්වවිද්‍යාල රෝහල තුළ අවම

	කැපුම් සහිත සැත්කම් පහසුකම් දියත් කිරීම.
31	සංකීර්ණ ස්වභාවයේ සත්කාර පහසුකම් අවශ්‍ය තැනැත්තන් සම්බන්ධයෙන් ප්‍රතිකාර හා සත්කාර පහසුකම් සැපයීම සඳහා (Multi-Disciplinary Team - MDT) වීඩියෝ කොන්ෆරන්ස් පහසුකම් සහිත සාකච්ඡා කාමර වැඩිදියුණු කිරීම.

ලබාගත් ජයග්‍රහණ

වෛද්‍ය පීඨය විසින් මහජන සෞඛ්‍යය සඳහා වූ ආසියා-ශාන්තිකර අධ්‍යයන සුසංධානයේ (APACPH) සාමාජිකත්වය ලබාගනු ලැබිය.

- කොවිඩ් -19 වසංගතය සම්බන්ධිත පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් සඳහා Ceylon College of Physicians Research Grant 2019 හා NRC Rapid Response Grant යන ප්‍රදානයන් වෛද්‍ය එම්.එම්.පී.ටී.ජයසේකර මහතා විසින් ලබාගන්නා ලදී.

සාමාජිකත්වයන් ලබා ගැනීම

- 2020 වර්ෂයේ දී මහාචාර්ය ජී.ඩී.අයි.රොඩ්රිගෝ විසින් ලංකාවේ ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ අධිශිෂ්‍යත්වයක් ලබාගන්නා ලදී.
- වෛද්‍ය කේ.ඒ.එස්.ජේ. බලවර්ධන - 2020 වසරේදි ලන්ඩන් වෛද්‍යවරුන්ගේ රාජකීය සංගමයේ සහ 2019 වසරේදී එඩින්බරෝ වෛද්‍යවරුන්ගේ රාජකීය සංගමයේ අධිශිෂ්‍යත්ව ලැබිය.

කාර්යමණ්ඩලය විසින් ලබාගත් පශ්චාත් උපාධි සුදුසුකම්

අනු අංකය	නම	සුදුසුකම	ආයතනය හා රට
01	වෛද්‍ය සී.ඩී.ඒකනායක	දර්ශනශූරි උපාධිය	උපාධි අධ්‍යයන පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය

විශේෂ සිදුවීම්/ උත්සව

- කොආවි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRC KDU 2020), "ජාතික අභිවෘද්ධිය, සුරක්ෂිතතාව හා ආරක්ෂාව උදෙසා සෞඛ්‍යය සඳහා සිදුකරන තාර්කික ආයෝජන"යන තේමාව යටතේ වෛද්‍ය පීඨය විසින් සංවිධානය කළ සැසි අන්තර්ජාලය ඔස්සේ හා අවම පුද්ගල සහභාගිත්වයක් සහිතව පැවැත්විණි.

- 37වන ඇතුළත් කරගැනීමේ වෛද්‍යවේදී හා ශල්‍යවෛද්‍යවේදී උපාධි අපේක්ෂ සිසුන්ගේ සමාරම්භක දේශනය හා දිවුරුම් දීමේ උත්සවය කොආවි ශික්ෂණ රෝහල් ශ්‍රවණාගාරයේ දී 2020 දෙසැම්බර් මාසයේ දී පැවැත්විණි. ආරාධිත දේශක: ශල්‍ය වෛද්‍ය රියර් අද්මිරාල් ලලිත් ඒකනායක

ආයතනික සමාජ වගකීම් (CSR) සම්බන්ධයෙන් දියත් කළ වැඩසටහන්වල විස්තර

අනුරාධපුරයේ දී නිදන්ගත වකුගඩු රෝගය ආශ්‍රිත සායන පැවැත්වීම/ ජනවාරි-ඔක්තෝම්බර් දක්වා (මාසිකව එක් දිනක්)/ වේදනා සමනය කිරීම ආශ්‍රිත සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය හා නිදන්ගත වකුගඩු රෝගය සම්බන්ධ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම.

- කොආවි විශ්වවිද්‍යාල රෝහලේ ප්‍රතිකාර ලබන කෝවිඩ් රෝගීන් සඳහා වෛද්‍ය සිසුන් විසින් 2020 දෙසැම්බර් මාසයේ දී නත්තල් කැරොල් ප්‍රසංගයක් සංවිධානය කරන ලදී.

- ළදරු වියේ දී සිදුවන අනතුරු, ළදරු වියේ දී වැළඳෙන දියවැඩියාව, ළමුන් අතර පවතින පිළිකා රෝග තත්ත්වයන්, අනුපූරක පෝෂණය සම්බන්ධයෙන් මහාචාර්ය ජී.ඩී.අයි.රොඩ්රිගෝ විසින් පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් (මෙම වැඩසටහන් ඩයලොග් රූපවාහිනී නාළිකාව ඔස්සේ විකාශනය විය).
- ළමාවියේ පෝෂණය ආශ්‍රිත ගැටලු හා පෝෂණ ආබාධ සම්බන්ධයෙන් මහාචාර්ය ජී.ඩී.අයි.රොඩ්රිගෝ විසින් රචිත සෞඛ්‍ය අධ්‍යාපනික ලිපි ‘‘නිරෝගයා’’ සෞඛ්‍ය අධ්‍යාපන සහරාවේ පළවිය.
- බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2020 මාර්තු 6-8 වන දින දක්වා පැවති ‘‘Medicare Exhibition’’ මැයෙන් වූ වෛද්‍ය ප්‍රදර්ශනයේ දී බ්‍රිගේඩියර් (මහාචාර්ය) ජී.ටී.ආර්.මකුළුලොලුව විසින් පවත්වන ලද වේදනා කළමනාකරණය කරගැනීම සම්බන්ධිත මහජන දැනුවත් කිරීම.

2.1.4 ඉංජිනේරු පීඨය



මෙම විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය අධ්‍යයනාංශ හයකින් සමන්විතවේ. එනම් ගගනයාත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය, සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය, විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය, නාවික ඉංජිනේරු අධ්‍යයනාංශය, යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය, ගණිත අධ්‍යයනාංශය හා කාර්මික පුහුණු ඒකකය වශයෙනි. මෙම පීඨය මඟින් විෂය ක්ෂේත්‍ර අටක් ඔස්සේ කැඩෙට් නිලධාරීන් සඳහා වසර හතර හමාරක සහ සිවිල් සිසුන් සඳහා වසර හතරක විද්‍යාවේදී ඉංජිනේරු විද්‍යා (ගෞරව) උපාධිය පිරිනමනු ලැබේ.

ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා කොආවි සංයුක්ත ඇතුළත් කරගැනීමක් පවතින අතර සාක් කලාපයේ විදේශීය සිසුන් සඳහා උපාධි පිරිනැමීම ද සිදු කරයි. 2012 වර්ෂයේ දී, පීඨය මඟින් නව උපාධි පාඨමාලා ත්‍රිත්වයක් පිරිනැමීම ආරම්භ කෙරිණි. එනම් විද්‍යාවේදී මැකාට්‍රොනික් ඉංජිනේරු උපාධිය, විද්‍යාවේදී ජෛව-වෛද්‍ය ඉංජිනේරු (ගෞරව) උපාධිය හා විද්‍යාවේදී ගුවන්යානා නඩත්තු ඉංජිනේරු (ගෞරව) උපාධිය වශයෙනි.

ත්‍රිවිධ හමුදා සේවා සඳහා ශාස්ත්‍රීය සුදුසුකම්ලත් නිලධාරීන් බිහි කිරීමෙහිලා ඉංජිනේරු පීඨය මඟින් සිදුකරන කාර්යභාරය සුවිශේෂී වේ. සියලු අධ්‍යයන පාඨමාලා පැවැත්වීම පමණක් නොව, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා නව්‍ය වෙනස්කම් හඳුන්වා දෙමින් තරුණ කැඩෙට් නිලධාරීන්ගේ බුද්ධිමය ප්‍රගමනය සඳහා ද ඉංජිනේරු පීඨය දායක වෙයි.

කොආවි විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා අනෙකුත් පිළිගත් විශ්වවිද්‍යාලවල පාඨමාලා සමඟ සමගාමීව ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වා ගනු ලැබේ. අධ්‍යයන පාඨමාලා ස්වාධීනව පවත්වාගෙන යෑම සඳහා, කොආවි සතුව සුදුසුකම් සපුරා ඇති අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටින අතර මොරටුව විශ්වවිද්‍යාලයේ, විවෘත විශ්වවිද්‍යාලයේ මෙන්ම ත්‍රිවිධ හමුදාවේ හා කර්මාන්ත ක්ෂේත්‍රයේ බාහිර කථිකාචාර්යවරුන්ගේ/උපදේශකවරුන්ගේ සේවයද ලබාගැනීමේ අවස්ථාවද පවතී.

ඉංජිනේරු පීඨය පහත සඳහන් අධ්‍යයනාංශ වලින් සමන්විත වේ:

- ගගනයාත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය
- සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය
- විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය
- ගණිත අධ්‍යයනාංශය
- නාවික ඉංජිනේරු අධ්‍යයනාංශය
- යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය

සමාලෝචිත වර්ෂය තුළ දී ඉංජිනේරු පීඨය විසින් පහත දැක්වෙන උපාධි පාඨමාලා දහය (10) පවත්වා තිබේ:

- ගගනයාත්‍රික ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- ගුවන්යානා නඩත්තු ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- ජෛව-වෛද්‍ය ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- සිවිල් ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- විදුලි හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- නාවික ඉංජිනේරු(ගෞරව) විද්‍යාවේදී උපාධිය
- යාන්ත්‍රික ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- ගුවන්යානා නඩත්තු (ගෞරව) විද්‍යාවේදී උපාධිය

පීඨයේ කාර්ය මණ්ඩල විස්තරය

අනු අංකය	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය
01	මහාචාර්ය	08	00
02	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	40	06
03	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය		17
04	කථිකාචාර්ය		02
05	කථිකාචාර්ය (පරිවාස)		03
06	ඉංජිනේරු ඉගැන්වීම් සහායක	02	02
07	උපදේශක - II ශ්‍රේණිය	17	11
08	උපදේශක (තාවකාලික)	00	15
එකතුව		**67**	**56**

ප්‍රධාන තනතුරුවල සිදුවී ඇති වෙනස්කම් (හමුදා/ අධ්‍යයන)

විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශයේ I ශ්‍රේණිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කපිතාන් (විශ්‍රාමික) එස්.යු.දම්පගේ මහතා 2020.04.01වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉංජිනේරු පීඨයේ පීඨාධිපති ලෙස පත්කර ඇත.

උසස් කිරීම්

අනු අංකය	නම	පෙර පත්වීම	නව පත්වීම
01	**ආචාර්ය ඒ.එච්.ලක්මාල්**	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I පංතිය
02	**ආචාර්ය ආර්.පී.කුමානායක**	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I පංතිය

උසස් අධ්‍යාපනයේ සඵලතාවය වැඩි දියුණු කිරීම සඳහා වන ශ්‍රී ලංකා සංගමයේ (SLAIHEE) විධායක කමිටු සාමාජිකයෙකු ලෙස 2020/21 වර්ෂය සඳහා ආචාර්ය ආර්.එම්.පී.එස්.බණ්ඩාර මහතා පත්කර ඇත.

නව බඳවාගැනීම්

නම	තනතුර	රාජකාරී භාරගත් දිනය	අධ්‍යයනාංශය
කපිතාන් (එල්) කේ.කේ.දඩැල්ලගේ	අධ්‍යයනාංශාධිපති (විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය)	2020.07.13	විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය
කපිතාන් එම්.එස්.ආර්. ද සොයිසා	කථිකාචාර්ය (පරිවාස)	2020.02.01	යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය
ලුතිනන් කමාන්ඩර් පී.එම්.කේ.සී. චන්දිමාල්	කථිකාචාර්ය (පරිවාස)	2020.04.08	
මේජර් ආර්.එම්.සී.එම්.රණසිංහ	කථිකාචාර්ය (පරිවාස)	2020.05.15	විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය
පියාසර ලුතිනන් එච්.ඩී.මිල්ලැව	කථිකාචාර්ය (පරිවාස)	2020.10.12	ගගනයාත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය

යටිතල පහසුකම් සංවර්ධනය/ නව ව්‍යාපෘති

අනු අංකය	අධ්‍යයනාංශය	විස්තරය	වැයවන මුදල (රු.)
01	ගගනයාත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය	• සීඑෆ්ඩී වර්ක්ස්ටේෂන් පරිගණක • රසදිය බැරෝමීටරය • වොච්මේකර් ටූල් කිට් • බෝරෙස්කෝප් උපකරණය • උෂ්ණත්වමානය • ස්මෝක් ජෙනරේටරය • මෝටර් සහිත විභ්‍රමේක්ෂය	**2,799,227.00**
02	සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය	• ගොඩනැගිලි ද්‍රව්‍ය ඉදිකිරීම සහ ඉංජිනේරු විද්‍යාගාරය හා භූතාක්ෂණික විද්‍යාගාරය ඉදිකිරීම	**5,000,000.00**
03	නාවික ඉංජිනේරු අධ්‍යයනාංශය	• ඉංජිනේරු පුහුණු වැඩපොළේ පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම • නාවික ඉංජිනේරු විද්‍යාගාරය වැඩිදියුණු කිරීම	අදාළ නොවේ

04	යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය	• මිනුම් අධ්‍යයන, මැකාට්‍රොනික් විද්‍යාගාරවල තත්ත්වය වැඩිදියුණු කිරීම	**600,000.00**

සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති හා යෝජිත නව ව්‍යාපෘති
<u>යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

තාපගති, ද්‍රව්‍ය පරීක්ෂණ, මෝටර් රථ ඉංජිනේරු, පාලන හා යාන්ත්‍ර විද්‍යා ඉංජිනේරු විද්‍යාගාර නවීකරණ කටයුතු සිදුවෙමින් පවතී.

<u>නාවික ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

නාවික ඉංජිනේරු සිමියුලේටරයක් (Marine Engineering Simulator) ඉදිකිරීම

<u>විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලිසංදේශ අධ්‍යයනාංශය</u>

පහත උපකරණ උපයෝගී කරගනිමින් විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම:

- රොබෝ විද්‍යාගාරය සඳහා 7 DOF රොබෝටික් බාහුව
- ජෛවයාන්ත්‍රික විද්‍යාගාරය සඳහා වැඩිදියුණු කළ සර්වර් යන්ත්‍රය
- පටක ඉංජිනේරු විද්‍යාගාරයේ සංයුක්ත ආලෝක අන්වීක්ෂය

ලංකා විදුලිබල මණ්ඩලයේ සහයෝගයෙන් ඉංජිනේරු පීඨය ඉදිරිපස ජාල උපමධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කරවීමෙන් විදුලි හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු අධ්‍යයනාංශවල සිසුන්ට උපමධ්‍යස්ථාන පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබාගැනීමේ හැකියාව සලසා දීම.

කොආවි තුළ IET on-campus ස්ථාපිත කිරීම ඔස්සේ උපාධි අපේක්ෂක සිසුන් අතර ඉංජිනේරු හා පරිගණක ආශ්‍රිත ප්‍රගමනය සඳහා උපකාරී වන අතර තරුණ වෘත්තිකයන් අතර තොරතුරු හා අදහස් හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැපයේ.

කොවිඩ් වසංගතය හමුවේ පැනනැඟී ඇති අභියෝග සඳහා මුහුණු දීම සඳහා මෙම අධ්‍යයනාංශයේ ආචාර්යවරු හා සිසුන් කණ්ඩායමක් විසින් ව්‍යාපෘති දෙකක් ආරම්භ කරන ලදී. ඒවා නම්, වෛද්‍ය සහායක රොබෝ සහ වෙන්ටිලේටර් ව්‍යාපෘතියයි. මෙම ව්‍යාපෘතිවල ප්‍රතිඵලයක් ලෙස, වෛද්‍ය සහායක රොබෝ යන්ත්‍ර 02ක් නිපදවා කොආවි ශික්ෂණ රෝහල සඳහා භාරදීමට අවකාශය සැලසිණි.

කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්

විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලිසංදේශ අධ්‍යයනාංශය

- ‘සංඛ්‍යාලේඛන දත්ත විශ්ලේෂණය’ මැයෙන් ආචාර්ය අජිත් ද මෙල් මහතා විසින් පවත්වන ලද වැඩමුළුව සඳහා අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය සහභාගී විය.
- ‘විශිෂ්ට පර්යේෂකයෙකු වන්නේ කෙසේ ද’යන මාතෘකාව යටතේ මහාචාර්ය ජේ.බී.ඒකනායක මහතා විසින් පැවැත්වූ වැඩමුළුව සඳහා අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය සහභාගී විය.
- කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය හා වෙනත් පීඨවලින් සංවිධානය කළ දේශන/ වැඩමුළු කිහිපයක් සඳහා ද අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය සහභාගී විය.

<u>සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

2020 ජනවාරි මස 27වන දින ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) විසින් පවත්වන ලද "IESL ප්‍රතිනය සඳහා සූදානම් වීම සඳහා පුහුණුව" මැයෙන් වූ වැඩමුළුව සඳහා සහභාගී වූ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙසේය.

- ආචාර්ය ටී.එම්.ඩබ්.ආර්.එම්.බී.සමරකෝන්
- ආචාර්ය ආර්.පී.කුමානායක
- ආචාර්ය එන්.කේ.ගුණසේකර
- ආචාර්ය ටී.ඩබ්.කේ.අයි.එම්.ඩයස්

පුහුණු/ ජයග්‍රහණ සඳහා දායකත්වය
<u>සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

සිවිල් ඉංජිනේරු 32වන ඇතුළත් කරගැනීමේ උපාධිධාරිණියක් මෙන්ම තාවකාලික උපදේශකවරියක ලෙස කටයුතු කරන චාරුනී වික්‍රමාරච්චි මෙනෙවියට ගංවතුර අවදානම් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය හැදෑරීම සඳහා Erasmus Mundus Joint Master's පූර්ණ ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරන ලදී. පිළිගැනීමක් සහිත මෙම ජල විද්‍යා හා ඉංජිනේරු විද්‍යාපති උපාධිය ඒකාබද්ධව පිරිනමනු ලබන්නේ IHE Delft institute for Water Education (නෙදර්ලන්තය) හා Technical University of Dresden (ජර්මනිය), Barcelona Tech (ස්පාඤ්ඤය) හා University of Ljubljana (ස්ලෝවේනියාව) විසිනි.

සිවිල් ඉංජිනේරු 32වන ඇතුළත් කරගැනීමේ උපාධිධාරිණියක් මෙන්ම තාවකාලික උපදේශකවරියක ලෙස කටයුතු කරන එස්.ඒ.අයි.ඒ.සුරවීර මෙනෙවියට ජපානයේ වැසේඩා විශ්වවිද්‍යාලයේ (Waseda University) සිවිල් ඉංජිනේරු විද්‍යාපති උපාධියක් හැදෑරීම සඳහා ජපාන රජය විසින් MEXT (Ministry of Education, Culture, Sports, Science and Technology**:** Monbukagakusho) 2020 ශිෂ්‍යත්වය ප්‍රදානය කරන ලදී.

සිවිල් ඉංජිනේරු 32වන ඇතුළත් කරගැනීමේ උපාධි අපේක්ෂකයින් වන පී.ඒ.සෙනෙවිරත්න මහතා හා වී.එල්.කුරුවිටාච්චි මහතා විසින් 2020 වර්ෂයේ කොආවි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ දී (KDU-IRC 2020) විශිෂ්ටතම පර්යේෂණ පත්‍රිකාවට හිමි සම්මානය දිනාගන්නා ලදී. ඔවුන්ගේ පර්යේෂණ අධීක්ෂක ලෙස කටයුතු කරන ලද්දේ එම අධ්‍යයනාංශයේම ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක් වන ආචාර්ය තනුජා කුලතුංග මහත්මියයි.

<u>විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලිසංදේශ අධ්‍යයනාංශය</u>

පේටන්ට් හිමිකම් විස්තර - ඉංජිනේරු (විශ්‍රාමික) එස්.යූ.දම්පාගේ

ඉල්ලුම්පත්‍ර අංකය : 21492
නව නිපැයුමේ නම : එන්ඩොස්කොපි පරීක්ෂණ සඳහා දිව පහතට තෙරපීමේ උපාංගය සහිත ද්විත්ව කුහර ප්‍රවේශය සහිත මුඛ උපකරණය

ඉල්ලුම්පත්‍ර අංකය : 21493
නව නිපැයුමේ නම : බාහිරයේ තබන ඉලෙක්ට්‍රොනික් උපකරණ සඳහා විදුලිසැර වැදීමෙන් වැළැක්වෙන රිටි උපාංගය

ඉල්ලුම්පත්‍ර අංකය : 21494
නව නිපැයුමේ නම : ගතික ප්‍රවාහ නියාමනයක් සහිත ස්වයංක්‍රිය ජෙට් නියුබියුලයිසර්

ඉල්ලුම්පත්‍ර අංකය : 21502
නව නිපැයුමේ නම : පෙට්‍රල් යානයක් සඳහා රේඩාර් හරස් සටහන, අවම උපරි ව්‍යුහය සමඟ ජලගතික ප්‍රශස්ත සැකිල්ල

ඉල්ලුම්පත්‍ර අංකය : 21503
නව නිපැයුමේ නම : ප්‍රශස්ත සම්පේක්ෂණ රේඩාර් අන්‍යතාවය සහිත පෙට්‍රල් යානයක් සඳහා සැකිල්ල

ඉල්ලුම්පත්‍ර අංකය : 21514
නව නිපැයුමේ නම : නායයෑම් ආපදා කළමනාකරණය කිරීම සඳහා සංයුක්ත රොබෝ සහිත මුදාගැනීමේ කණ්ඩායම

සංවිධානය කළ සංචාර/චාරිකා

<u>නාවික ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

- 34වන ඇතුළත් කරගැනීමේ උපාධි අපේක්ෂක සිසුහු ශ්‍රී ලංකා නාවික හමුදාවේ වැලිසර බෝට්ටු නිපදවීමේ අංගණයට චාරිකාවක නියුක්ත වූහ.
- 34වන ඇතුළත් කරගැනීමේ උපාධි අපේක්ෂක සිසුහු ශ්‍රී ලංකා නාවික හමුදාවේ යන්ත්‍රෝපකරණ පරීක්ෂා කිරීමේ හා තත්ත්ව සමේෂණ ඒකකයට චාරිකාවක නියුක්ත වූහ.

<u>ගගනයාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

35වන හා 36වන ඇතුළත් කරගැනීමේ ගගනයාන්ත්‍රික ඉංජිනේරු හා ගුවන්යානා නඩත්තු ඉංජිනේරු උපාධි අපේක්ෂක සිසුන් සඳහා 2020 ඔක්තෝම්බර් 05වන දින රත්මලාන ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ගුවන් යානා ඒකකය (ASW) තුළ ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කර තිබුණි.

ශුභසාධන කටයුතු

<u>නාවික ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන සියලුම ශුභසාධන කටයුතු සඳහා මෙම අධ්‍යයනාංශයේ සාමාජිකයන් සහභාගී විය.

විශේෂ සිදුවීම්/ උත්සව

<u>සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ සිවිල් ඉංජිනේරු සංගමය විසින් 2020 මාර්තු මස සංවිධානය කළ "Tips of Highrise Building Design" මැයෙන් වූ ආරාධිත දේශනය පවත්වන ලද්දේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ලක්සිරි ප්‍රදීප් හා ඉකෝ ඉන්ටර්නැෂනල්-ඉන්ජිනියරින්ග් ඇන්ඩ් ඩිසයින් කන්සල්ටන්ට්ස් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි විසිනි.
ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) තරුණ සාමාජික අංශය විසින් සංවිධානය කළ වාර්ෂික තාක්ෂණ සම්මන්ත්‍රණය 2020 ඔක්තෝම්බර් 29වන දින පැවැත්විණි. මෙහි මූලසුන හොබවන ලද්දේ කොඅවි සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඉෂානි ඩයස් මහත්මිය විසිනි.

<u>නාවික ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන සියලුම ශුභසාධන කටයුතු සඳහා මෙම අධ්‍යයනාංශයේ සාමාජිකයන් සහභාගී විය.

<u>ගගනයාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

2020 ඔක්තෝම්බර් 15 හා 16 යන දෙදින පැවැති කොආවි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා පහත නම් සඳහන් වන කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

අනු අංකය	නම	පර්යේෂණ පත්‍රිකාවේ මාතෘකාව
01	කේ.ඒ.පී.මාලක මයා	Airline Maintenance Cost Optimization through Spare Parts Inventory Control
02	බලගණ නායක ඩබ්.එන්.අයි.යාලගම	
03	ආචාර්ය ඩබ්.ටී.එස්.රොඩ්රිගෝ	An Enumerative Constraint Planning Framework for Airline Engineering Manpower Cost Optimization
04	ඩබ්.ඩී.ටී.ප්‍රනාන්දු මයා	
05	ජේ.අයි.අබේගුණවර්ධන මිය	Conceptual Design of Boom Mounted Inverted V-Tail for a UAV
06	ආචාර්ය ඩබ්.ටී.එස්.රොඩ්රිගෝ	Waste Minimization for Small Airlines by Using Safety Management System Concepts

විද්‍යාවේදී ගුවන්යානා නඩත්තු (ගෞරව) උපාධි පාඨමාලාව සඳහා ඇතුළත් කරගනු ලැබූ 3වන කණ්ඩායමේ සිසුන්ගේ සමාරම්භක උත්සවය ශ්‍රී ලන්කන් ඒවියේෂන් කොලේජ්හිදී 2020 සැප්තැම්බර් 07වන දින පැවැත්විණි.

ආයතනික සමාජ වගකීම (CSR) සම්බන්ධ වැඩසටහන්වල විස්තර

<u>නාවික ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

නාවික ඉංජිනේරු සංගමය හා යාන්ත්‍රික ඉංජිනේරු සංගමය එක්වී ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියක් ලෙස රත්මලාන දුම්රිය ස්ථානය හා එහි ප්‍රවේශ මාර්ගය පිරිසිදු කිරීමේ කටයුතු 2020 පෙබරවාරි 21වන දින සිදුකරන ලදී.

<u>විදුලි, ඉලෙක්ට්‍රොනික් හා විදුලිසංදේශ අධ්‍යයනාංශය</u>

කෝවිඩ් වසංගතය ආරම්භයත් සමඟ ව්‍යාපෘති දෙකක් ආරම්භ කරන ලදී. එනම්, වෛද්‍ය සහායක රොබෝ සහ වෙන්ටිලේටර් ව්‍යාපෘතියයි. වෛද්‍ය සහායක රොබෝ යන්ත්‍ර 02ක් නිපදවා කොආවි විශ්වවිද්‍යාල රෝහල සඳහා භාරදෙන ලදී.

<u>සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය</u>

ආචාර්ය ආර්.පී.කුමානායක මහතා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය) ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) සී කාණ්ඩයේ (ඉංජිනේරු, ගෘහනිර්මාණ හා මිනුම් කටයුතු) කමිටු සාකච්ඡා වාර්තා සැකසුම්කරු ලෙස 2020 වර්ෂය සඳහා තේරී පත්විය.

34වන ඇතුළත් කරගැනීමේ කණ්ඩායමේ පහත නම් සඳහන් සිවිල් ඉංජිනේරු උපාධි අපේක්ෂකයන් සිවිල් ඉංජිනේරුවන්ගේ ආයතනයේ ශ්‍රී ලංකා සංගමයේ (SLAICE) තනතුරු වලට 2020 වර්ෂය සඳහා තේරී පත්විය.

- ටී.ආර්.හේවාවඩුගේ මයා, උප සභාපති
- එන්.ඩබ්.ඩී.පී.රශ්මික මයා, කමිටු සාමාජික

කර්මාන්ත ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘතිය - ගංගා ඉවුරු කළමනාකරණය (Riverine Management)
මෙම ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා මහවැලි අධිකාරිය සමඟ එක්ව ආරම්භ කරන ලදී.

දේශගුණය සම්බන්ධිත හදිසි අවස්ථා කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සැකසීම සම්බන්ධයෙන් නවසීලන්තයේ, මැසේ විශ්වවිද්‍යාලය (Massey University) සමඟ සාකච්ඡා ආරම්භ කර ඇත.

2.1.5 නීති පීඨය



ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ නීති පීඨය 2011 වර්ෂයේ දී සිසුන් 22 දෙදෙනෙකුගෙන් ආරම්භ කරන ලදී. මෙම පීඨය ඇරඹීමේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවල නීති නිලධාරීන් වශයෙන් පත්වීම සඳහා කැඩෙට් නිලධාරීන්ට අවශ්‍ය නීති අධ්‍යාපනය ලබා දීම වේ.

වර්තමානයේ දී මෙම පීඨයේ ඕනෑම අවස්ථාවක සිසුන් 500ක පමණ පිරිසක් අධ්‍යාපනය හදාරමින් සිටිනු ලැබේ. ත්‍රිවිධ හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරීන්, කැඩෙට් නිලධාරීන් සහ සිවිල් සිසුන් මීට ඇතුළත් වේ.

ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා පිරිනමනු ලබන මෙම පීඨය විසින් නව්‍ය විෂය නිර්දේශයක් ඔස්සේ උපාධි අපේක්ෂක සිසුසිසුවියන්ට මනා අධ්‍යයන අත්දැකීමක් ලබාදේ. ජාතික,කලාපීය හා අන්තර්ජාතික මට්ටමේ අනෙකුත් තරඟකාරී නීති විද්‍යාල අතර නීති අධ්‍යාපනය සඳහා උචිත ආයතනයක් ලෙස පිළිගැනීමක් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා මෙම පීඨය කැපවී සිටියි.

නීති පීඨය පහත අධ්‍යයනාංශ දෙකෙන් (02) සමන්විත වේ:

- සිවිල් නීති අධ්‍යයනාංශය
- හමුදා නීති අධ්‍යයනාංශය

නීති පීඨය විසින් පහත උපාධි පාඨමාලාව පවත්වා ගෙන යනු ලැබේ.:

- නීතිවේදී උපාධිය (එල්එල්බී)

පීඨයේ කාර්ය මණ්ඩල විස්තරය

අනු අංකය	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය
01	මහාචාර්ය	02	00
02	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	10	01
03	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය		08
04	කථිකාචාර්ය		01
05	කථිකාචාර්ය (පරිවාස)		01
එකතුව		**12**	**11**

ප්‍රධාන තනතුරුවල සිදුවූ වෙනස්කම් (හමුදා/ අධ්‍යයන)

නව පත්වීම්		
නම	**තනතුර**	**පත්වීම් දිනය**
මේජර් ආර්.එම්.ආර්.කේ.කේ.රත්නායක	අධ්‍යයනාංශාධිපති - හමුදා නීතිය	2020.07.01

යටිතල පහසුකම් සංවර්ධනය/නව ව්‍යාපෘති

- නව පීඨ ගොඩනැගිල්ලක් ඉදි කිරීම

දැනට නීති පීඨය පවත්වාගෙන යනු ලබන්නේ වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල තුළ ය. නීති පීඨයේ සිසුන් සංඛ්‍යාව වැඩි වීමත් සමඟ, ඉගැන්වීම් හා ඉගෙනුම් කටයුතු සඳහා උචිත පරිසරයක් තුළ සිසුන්ට මනා පහසුකම් ලබා දීම සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම අවශ්‍ය වී තිබේ. නව පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත අයවැය රු. මිලියන 537කි වන අතර එහි විශාලත්වය වර්ග අඩි 3900කි. මහල් 06කින් යුතු නව පීඨ ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු 2022 වර්ෂයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්

- ඩබ්.එස්.විජේසිංහ මහතා - පීඨාධිපති, නීති පීඨය – සාගර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී සමුද්‍ර නීති හා ප්‍රතිපත්ති උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සැකසීමේ කටයුතු සඳහා පීඨාධිපතිවරයා දායක විය.

<u>පුහුණු කටයුතු සඳහා දායකත්වය/ ජයග්‍රහණ</u>

පුහුණු කටයුතු:

නම	තනතුර	පුහුණු වැඩසටහන
එන්.කේ.කේ.මුදලිගේ මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	ශ්‍රී ලංකාවේ කම්කරු නීති හා කාර්මික සබඳතා ක්ෂේත්‍ර කෙරෙහි කොවිඩ්-19 බලපෑම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් සංවිධානය කළ වෙබිනාර් මාලාව
වයි.පී.විජේරත්න මෙය	කථිකාචාර්ය (පරිවාස)	වාණිජ සංවිධාන කෙරෙහි පවතින චෝදනා සම්බන්ධ පුහුණු වැඩසටහන - මැලේසියාවේ දූෂණ විරෝධී කොමිෂන් සභා පනතේ (MACC) 17අ වගන්තිය 2009

ජයග්‍රහණ:

- ඩබ්.එස්.විජේසිංහ මහතා - පීඨාධිපති, නීති පීඨය – කොආවි නීතිවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ මූලික හා අතරමැදි විභාගවලින් නිදහස් කිරීම සිදුකරගැනීමට දායක විය.

- වයි.පී.විජේරත්න මෙය (කථිකාචාර්ය, පරිවාස) – Silk-Road Universities Network මඟින් සංවිධානය කරන ලද Writing Contest of SUN (WRISOS) of 2020 තරඟයේ දී මැය විසින් Selection Prize දිනාගන්නා ලදී.

උසස්කිරීම්:

උසස්කිරීම්		
නම	පූර්ව තනතුර	උසස් වීම ලද තනතුර
ඒ.ඒ.එදිරිසිංහ මෙය	කථිකාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය
එල්.එම්.ද සිල්වා මෙය	කථිකාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය
එන්.කේ.කේ.මුදලිගේ මෙය	කථිකාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය

සිසුන් විසින් ලබාගත් ජයග්‍රහණ:

තරඟයේ නම	ජයග්‍රහණය
පකිස්තානයේ ලාහෝර් නුවර පැවති LUMS Moot Court Competition තරඟාවලිය	අර්ධ අවසන් පූර්ව තරඟය දක්වා පැමිණ ඇත.
Victors Moot තරඟාවලිය	Respondent's Memorialට අදාළව 03වන ස්ථානයේ ශ්‍රේණිගතව ඇත.

විශේෂ සිදුවීම්/ උත්සව

- **නීති ආධාර මධ්‍යස්ථානය**

  නීති ආධාර මධ්‍යස්ථානයේ පුනරුදයක් ඇති කිරීම - අධිකරණ අමාත්‍ය ජනාධිපති නීතිඥ අලි සබ්‍රි මහතා විසින් 'ශ්‍රී ලංකාවේ නීති අධ්‍යාපනය හා නීති වෘත්තිය' මැයෙන් වූ ආරාධිත දේශනය පවත්වන ලදී.





මීට අමතරව නීති ආධාර මධ්‍යස්ථානය විසින් පහත සඳහන් දේශන ද සංවිධානය කරන ලදී.

- ‘නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ නීති කෙටුම්පත්කරණ ක්‍රියාවලිය’ යන මාතෘකාව යටතේ වූ ආරාධිත දේශනය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ, ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ, පාර්ලිමේන්තු භාෂණ පරිවර්තක නදීර ඒකනායක මහතා විසින් පවත්වන ලදී.

- ‘බෙරුම්කරණය හා අධිකරණය මඟින් ඉටුකරන භූමිකාව’ මැයෙන් වූ වෙබිනාර් වැඩසටහනක් පවත්වන ලද්දේ ජනාධිපති නීතිඥ කනගනයාගම් කැනග්-ඊශ්වරන් මහතා විසිනි.

- **ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2020**

  කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 13වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ නීතිය පිළිබඳ මණ්ඩල සැසිය 'ජාතික සංවර්ධනය හා ආරක්ෂාව සඳහා නීතියේ කාර්යභාරය' යන මාතෘකාව ඔස්සේ ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරු ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් 2020 ඔක්තෝම්බර් 15වන දින පැවැත්විණි.

  ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු යසන්ත කෝදාගොඩ මහතා, හිටපු අගවිනිසුරු ජනාධිපති නීතිඥ මොහාන් පීරිස්, මානව හිමිකම් හා ළමා අයිතිවාසිකම් පිළිබඳ ශ්‍රේෂ්ඨ උපදේශක හා නීතිඥ ආචාර්ය චාරිකා මාරසිංහ මහත්මිය, ජනාධිපති නීතිඥ රියර් අද්මිරාල් (විශ්‍රාමික) ෂවින්ද්‍ර ප්‍රනාන්දු හා ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ උප සභාපතිවරයා මෙම සැසියේ අනෙකුත් දේශකයන් ලෙස සහභාගි විය.

  මණ්ඩල සැසියෙන් අනතුරුව, නීතිය පිළිබඳ පෝස්ටර් සැසියක් ද 2020 ඔක්තෝම්බර් 15වන දින පවත්වන ලදී. මෙම පෝස්ටර් ඇගයීම සිදුකරන ලද්දේ අගවිනිසුරු විසින් ප්‍රධානත්වය දැරූ මණ්ඩලයක් විසිනි. හොඳම පෝස්ටර් ඉදිරිපත් කිරීම සඳහා වූ සම්මානය දිනාගන්නා ලද්දේ හෂිනි ඒ. ජිනසේන මෙනවිය විසිනි.

2.1.6 කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය

කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, අධ්‍යයනාංශ 03කින් සමන්විතවේ. එනම්, කළමනාකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය, සමාජ විද්‍යා අධ්‍යයනාංශය හා භාෂා අධ්‍යයනාංශය වශයෙනි. සමාජ විද්‍යා, කළමනාකරණ, කාර්ය සම්පාදන කළමනාකරණ, මානව ශාස්ත්‍ර හා භාෂා යන විෂය ක්ෂේත්‍ර ඔස්සේ මෙම අධ්‍යයනාංශ මඟින් කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයට අදාළ උපාධි පාඨමාලා හා වෙනත් අධ්‍යයන පාඨමාලා පවත්වනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මෙහෙවරට අනුකූල වන පරිද්දෙන් පීඨයටද මෙහෙවරක් තිබේ. එම මෙහෙවර වනුයේ කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර යන ක්ෂේත්‍රවලට අදාළව විද්‍යාත්මක හා තාක්ෂණික හරයක් සහිතව දැනුම ළඟාකර ගැනීම, නිර්මාණය කිරීම හා බෙදා හැරීම ඔස්සේ ජාත්‍යන්තර මට්ටමේ මානව සම්පතක් බිහි කිරීම මඟින් විශ්වවිද්‍යාලයේ මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා කණ්ඩායමක් වශයෙන් කටයුතු කිරීම වේ.

වර්තමාන ලෝකයේ, විශේෂයෙන් ජාතික හා කලාපීය ආරක්ෂක පාලන ක්ෂේත්‍රවල අභියෝගවලට මුහුණ දීම සඳහා දැනුම, තුසලතා, ධෛර්යමත්බව, කැපවීම හා විනය යන අංගවලින් පරිපූර්ණ වූ මනා සමබරතාවයකින් යුක්ත උපාධිධාරීන් හා පශ්චාත් උපාධිධාරීන් බිහිකිරීමට දායකත්වය දැරීම සම්බන්ධයෙන් පීඨය අවධානය යොමුකර සිටියි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකා තත්ත්ව සහතිකකරණ රාමුවේ, ශ්‍රී ලංකා කුසලතා මට්ටමෙහි (SLQL) 06 වන මට්ටමේ පවතින ප්‍රථම උපාධියක් පීඨය මඟින් පිරිනැමෙන අතර එහිදී අධ්‍යයන වාර 06ක් තුළදී අවම වශයෙන් ක්‍රෙඩිට් 122ක් ලබාගැනීම අවශ්‍ය කෙරේ.

කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය පහත දැක්වෙන අධ්‍යයනාංශ 03න් සමන්විත වේ:



කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ ඉහත පැහැදිලිව දක්වා ඇති අධ්‍යයනාංශ 03, පීඨ සාමාජිකයන් 35 දෙනෙකුගෙන් සමන්විත වේ. එක් එක් අධ්‍යයනාංශයට සුවිශේෂී වූ අධ්‍යයන විෂයයන් හා විශේෂායනය අනුව උපාධි පිරිනැමීම සඳහා එක් එක් අධ්‍යයනාංශය වෙත වෙන වෙනම වගකීම් පැවරී ඇත.

පීඨයේ කාර්ය මණ්ඩල විස්තර

අනු අංකය	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය
01	මහාචාර්ය	03	01
02	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	11	06
03	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය -II ශ්‍රේණිය		20
04	කථිකාචාර්ය		01
05	කථිකාචාර්ය (පරිවාස)		03
06	අධ්‍යයන උපදේශක/ කථිකාචාර්ය (තාවකාලික - කොන්ත්‍රාත් පදනම මත)	03	01
07	උපදේශක - II/ III ශ්‍රේණි	03	00
එකතුව		**20**	**32**

ප්‍රධාන තනතුරුවල ඇතිවූ වෙනස්කම් (අධ්‍යයන/පරිපාලන)

අනු අංකය	නම	පත්කිරීම	බලාත්මක වන දිනය
01	ආර්.එම්.එන්.පී.රාජපක්ෂ මිය	භාෂා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශාධිපති ලෙස පත්කරන ලදී.	2020.04.22
02	එස්.ජී.ජේ. සිල්වා මිය	කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ සහකාර ලේඛකාධිකාරී ලෙස පත්කරන ලදී.	2020.08.04
03	එච්.එම්.එන්.හේරත් මයා	සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශාධිපති ලෙස පත්කරන ලදී.	2020.09.12
04	ඩබ්.ඒ.ඒ.කේ.අමරතුංග මයා	කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති ලෙස පත්කරන ලදී.	2020.09.12

නව බඳවාගැනීම්

අනු අංකය	නම	තනතුර	රාජකාරි භාරගත් දිනය	අධ්‍යයනාංශය
අධ්‍යයන කාර්ය මණ්ඩලය				
01	මහාචාර්ය (දර්ශනශූරී) කේ.එල්.ඩබ්.පෙරේරා (කොන්ත්‍රාත් පදනම මත)	මූල්‍ය විෂයය පිළිබඳ මහාචාර්ය	2020.09.16	කළමනාකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය
හමුදා කාර්ය මණ්ඩලය				
01	බලගණ නායක අයි.කේ.ජේ.පී.කුමාර	කථිකාචාර්ය (පරිවාස)	2020.12.23	භාෂා අධ්‍යයනාංශය

උසස් කිරීම්/ පත්වීම්වල සිදුකරන ලද වෙනස්කම්

අනු අංකය	නම	මුලින් සිදුකළ පත්වීම	වර්තමානයේ දී පත්කිරීම	බලාත්මක වන දිනය
අධ්‍යයන කාර්ය මණ්ඩලය				
කළමනාකරණ හා මූල්‍ය අධ්‍යයනාංශය				
01	ඩබ්.ඩී.එච්. ද මෙල් මිය	කථිකාචාර්ය (පරිවාස)	කථිකාචාර්ය (ස්ථිර)	2016.08.01 (පෙර දාතම් කර ඇත.)
02	එම්.එම්.එල්.සී.ගුණතිලක මයා	කථිකාචාර්ය (ස්ථිර)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	2020.05.05
03	ආචාර්ය ආර්.එම්.එන්.ටී.සිරිසෝම මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)/ පීඨාධිපති- කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය	අධ්‍යක්ෂ - වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, කොඅවි	2020.09.12
සමාජ විද්‍යා අධ්‍යයනාංශය				
04	එච්.එම්.ඒ.ජී.කේ.ඒකනායක මිය	කථිකාචාර්ය (පරිවාස)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	2018.12.12 (පෙර දාතම් කර ඇත.)
05	ආචාර්ය එල්.එස්.ලියනගේ මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	2019.05.20 (පෙර දාතම් කර ඇත.)
			අධ්‍යක්ෂ - ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය කොඅවි	2020.09.02
භාෂා අධ්‍යයනාංශය				
06	බී.ඩී.කේ.ආනන්දවංශ මෙය	කථිකාචාර්ය (ස්ථිර)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	2019.10.01 (පෙර දාතම් කර ඇත.)

07	එන්.ඩී.රණසිංහ මිය	කථිකාචාර්ය (ස්ථිර)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	2019.12.01 (පෙර දාතම් කර ඇත.)
08	ඩී.ඩී.එල්.විල්ලරාච්චි	කථිකාචාර්ය (ස්ථිර)	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	2019.11.25 (පෙර දාතම් කර ඇත.)
පරිපාලන				
01	ඩී.එස්.සී.එස්.සී.ගුණසේකර මයා	පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	විභාග ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	2020.08.04

නිවාඩු/විශ්‍රාම යෑම්/ සේවයෙන් ඉල්ලා අස්වීම්

අනු අංකය	නම	තනතුර	කාණ්ඩය	බලාත්මක දිනය
01	අයි.ඩී.වට්ටුහේවා මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	සප්ත වාර්ෂික නිවාඩු (වර්ෂ 02කි)	2020.03.01
02	ජේ.ඒ.ඩී.යූ.එන්.ජයසූරිය මිය	කථිකාචාර්ය (සේවයේ ස්ථිර කළ)	ඉල්ලා අස්වීමකි	2020.08.27
03	ආචාර්ය එම්.එම්.ජයවර්ධන	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	විශ්‍රාම යෑමකි	2020.12.31

යටිතල පහසුකම් සංවර්ධනය/ නව ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතිය/ ප්‍රදානය	ප්‍රදානය කළ දිනය	ප්‍රදානය කරන ලද්දේ	ප්‍රදානය කළ මුළු මුදල	**2020** වර්ෂය තුළ ලැබී ඇති ප්‍රදානය
01	ආසියානු මතවාදයක් සඳහා සංස්කෘතික සබඳතා	2020.06.22	ඉයුරේසියා පදනම, ජපානය	ඩොලර් 24,000	ඩොලර් 24,000
02	ප්‍රචණ්ඩත්වයෙන් තොර සන්නිවේදනය හා මාධ්‍ය වගකීමෙන් යුතුව භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම	2020.12.04	යුරෝපා සංගමය	රු. 21,576,250	රු. 4,315,250

03	පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය - විශ්වවිද්‍යාල තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය වෙනුවෙන් පිරිනැමෙන ප්‍රදානය- 2020		පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය	යුරෝ1000	

විෂයමාලා සංවර්ධනය/ අධ්‍යයන පාඨමාලා ප්‍රගතිය

නව උපාධි පාඨමාලා සඳහා විෂයමාලා සකස් කිරීම

අනු අංකය	උපාධි පාඨමාලාව	පිරිනමනු ලබන්නේ
01	ව්‍යවහාරික දත්ත විද්‍යා සන්නිවේදන විද්‍යාවේදී උපාධිය	භාෂා අධ්‍යයනාංශය
02	වෙනත් භාෂා කතා කරන තැනැත්තන් සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL)	භාෂා අධ්‍යයනාංශය

කාර්ය මණ්ඩල සංවර්ධන කටයුතු
කාර්ය මණ්ඩලය විසින් ලබාගෙන ඇති පශ්චාත් උපාධි සුදුසුකම්

සම්පූර්ණ කර ඇති සුදුසුකම්				
අනු අංකය	**නම**	**තනතුර**	**සුදුසුකම**	**ආයතනය/රට**
01	ජේ.එම්.ඩබ්.ප්‍රේමරත්න මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ දර්ශනශූරී උපාධිය	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
02	ආර්.එම්.සී.එල්.කේ.රත්නායක මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	ගිණුම්කරණය පිළිබඳ දර්ශනශූරී උපාධිය	ලීසෙස්ටර් විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය
03	පී.ලන්කේශ්වර මෙය	කථිකාචාර්ය (පරිවාස)	ව්‍යාපාර සංඛ්‍යායන විද්‍යාපති උපාධිය	මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

පුහුණු කටයුතුවලදී දායකත්වය/ජයග්‍රහණ

කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය මඟින් ප්‍රකාශයට පත්කළ පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව මෙසේය:

ප්‍රකාශන- පත්‍රිකා/ ජර්නල්/පොත්



වැඩමුළු/ වෙබිනාර්

අනු අංකය	සම්පත් දායකත්වය	තනතුර	වැඩමුළුව/ වෙබිනාර්	ඉලක්කගත කණ්ඩායම	දිනය
01	මහාචාර්ය (දර්ශනශූරී) කේ.එල්.ඩබ්. පෙරේරා	මූල්‍ය විෂයය පිළිබඳ මහාචාර්ය	මූල්‍ය විෂයය ඉගැන්වීමේ දී සහභාගිත්ව, සාකච්ඡා පාදක ක්‍රමවේදය පිළිබඳ මාර්ගගත වැඩමුළුව	ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල ප්‍රජාව	2020 නොවැම්බර්
02	මහාචාර්ය (දර්ශනශූරී) කේ.එල්.ඩබ්. පෙරේරා	මූල්‍ය විෂයය පිළිබඳ මහාචාර්ය	පර්යේෂණ සැලසුම් රාමුවක් වන Pitching Research සම්බන්ධයෙන් සිසුන් රාශියකගේ සහභාගිත්වයෙන් පැවති දේශනය	ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාල ප්‍රජාව	2020 ඔක්තෝම්බර්
03	ආචාර්ය යූ.ජී.රාජපක්ෂ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	1. තත්ත්ව පාලන ශිල්පිය ක්‍රම හා තරහකාරී වාසිය 2. ක්‍රමෝපායික වාසිය සඳහා මෙහෙයුම් කළමනාකරණයේ දී මෙවලම්හි බලපෑම	*ඕවර්සීස් කැම්පස් ඔෆ් සිලෝන්හි* දර්ශනශූරී උපාධිය හදාරන සිසුන්	2020
04	එම්.එම්.එල්.සී. ගුණතිලක මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	විශ්වවිද්‍යාල සඳහා ක්‍රමෝපායික සැලසුම්කරණය හා කළමනාකරණය	කොඅාවි අධ්‍යයන කාර්ය මණ්ඩලය	2020.10.05

ජයග්‍රහණ

අනු අංකය	නම	තනතුර	සම්මානය	සිදුවීම
01	ආචාර්ය කේ.ආර්.අඹේපිටිය මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	තිරසාර සමාජයක් ගොඩනැංවීම සඳහා වූ දායකත්වය වෙනුවෙන් "පුරෝගාමී කාන්තා නායිකාව" - කලා, මාධ්‍ය, පරිසරය	7වන කාන්තා නායකත්ව කොංග්‍රසය - 2020

විශේෂ සිදුවීම්/ උත්සව

අනු අංකය	සිදුවීම	දිනය
01	ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව	2020.10.15 සහ 2020.10.16
02	"Logistics Times" නැමති සඟරාවේ 05වන සංස්කරණයේ දොරට වැඩුම	2020.12.31
03	"මෙඝ" නමින් ඊ-ප්‍රකාශනයක් ප්‍රකාශයට පත්කිරීම	2020.12.31
04	බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් ක්‍රියාත්මක කරන ක්‍රියාකාරී පුරවැසියා වැඩසටහන සඳහා පහසුකම් සැලසීමේ වැඩසටහන	2020.12.09 සිට 2020.12.16 දක්වා

2.1.7 සමසෞඛ්‍ය විද්‍යා පීඨය



ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සමසෞඛ්‍ය විද්‍යා පීඨය 2012 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. හෙද, භෞත චිකිත්සක, වෛද්‍ය රසායනාගාර විද්‍යා, විකිරණවේද හා ඖෂධවේද වශයෙන් වූ විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලා සඳහා පීඨයේ පළමු සිසු කණ්ඩායම ලෙස 2013 වර්ෂයේ දී සිසුන් 200දෙනෙකු එහි අධ්‍යයනාංශ 05ක් සඳහා බඳවාගනු ලැබීය. 2017 වර්ෂයේ දී විද්‍යාවේදී විකිරණ චිකිත්සක (ගෞරව) උපාධිය පිරිනැමීම මෙම පීඨය විසින් පළමු වරට ආරම්භ කරන ලදී. 2020 වර්ෂයේ දී පීඨය සඳහා සිසුන් 749ක් ඇතුළත් කරගැනීමෙන්, පීඨය සඳහා සිසුන් ඇතුළත් කරගැනීමේ කටයුතු සැලකිය යුතු මට්ටමකින් ඉහළ නැංවීමට පීඨයට හැකිවී තිබේ. පළමු සිසු කණ්ඩායම ඇතුළත් කරගැනීමේ සිට මේ දක්වා සිසු කණ්ඩායම් 04ක් උපාධිය ලබා පීඨයෙන් නික්මී ඇති අතර ඔවුන්ගෙන් බහුතරයක් කොඅවි විශ්වවිද්‍යාල රෝහලේ සේවයේ නියුක්ත වන අතර තවත් බොහෝ පිරිසක් ශ්‍රී ලංකාවේ ජාතික රෝහල්වල මෙන්ම විදේශීය රටවල රෝහල්වල ද සේවයේ නියුක්ත වේ.

සමසෞඛ්‍ය වෘත්තීයවේදීන්ගේ වෘත්තීය මට්ටම ඉහළ නැංවීමේ ජාතික වගකීම ඉටුකිරීමේ කාර්යයේ දී, සිවිල් සිසුන්ට අමතරව, සන්නද්ධ හමුදාවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව සේවයේ නිරතවන ඩිප්ලෝමාධාරීන්ව 2වන වසරට ඇතුළත් කරගැනීමේ වැඩසටහන ඔස්සේ පීඨයට ඇතුළත් කරගැනීමෙන් අනතුරුව පාඨමාලා සාර්ථකව හදාරා නිමකරන සිසුන් සඳහා විද්‍යාවේදී (ගෞරව)/ විද්‍යාවේදී ඖෂධවේද (ගෞරව) උපාධිය ද පිරිනමනු ලැබේ. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගෝලීය ගැටලු සම්බන්ධිතව පීඨයේ අන්තර්ජාතික ප්‍රවේශය තහවුරු කරගැනීම සඳහා සමසෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පිරිනමන උපාධි පාඨමාලා විදේශීය සිසුන් සඳහා ද විවෘතව පවතී.

සෞඛ්‍ය හා පාරිසරික ක්ෂේත්‍ර තුළ පවතින නූතන අභියෝග හා නිරන්තරයෙන් වෙනස්වීමේ අවශ්‍යතාවන්ට මුහුණදීමේ ශක්‍යතාවය සහිත උපාධිධාරීන් බිහිකිරීමට මෙම පීඨය අපේක්ෂා කරයි. ලෝකයේ ඕනෑම ස්ථානයක සිය අනාගත වෘත්තීය ආරම්භ කිරීමේ හැකියාවෙන් උපාධිධාරීන් සවිමත් කිරීම සඳහා පීඨය විසින් සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ.

සම සෞඛ්‍ය විද්‍යා පීඨය අධ්‍යයනාංශ හත (07)කින් සමන්විත වේ:

- මූලික විද්‍යා අධ්‍යයනාංශය
- වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය
- බහු ශික්ෂණ අධ්‍යයනාංශය
- හෙද හා වින්නඹුකර්ම අධ්‍යයනාංශය
- ඖෂධවේද අධ්‍යයනාංශය
- භෞත චිකිත්සක හා වෘත්තීමය චිකිත්සක අධ්‍යයනාංශය
- විකිරණවේද හා විකිරණ චිකිත්සක අධ්‍යයනාංශය

පීඨය විසින් පහත දැක්වෙන උපාධි පාඨමාලා පවත්වාගෙන යන ලදී:

- විද්‍යාවේදී වෛද්‍ය රසායනාගාර විද්‍යා (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී හෙද (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී ඖෂධවේදය
- විද්‍යාවේදී භෞත චිකිත්සක (ගෞරව) උපාධිය
- විද්‍යාවේදී විකිරණවේද (ගෞරව) උපාධිය

පීඨයේ කාර්ය මණ්ඩල විස්තරය

අනු අංකය	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය
01	මහාචාර්ය	06	00
02	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	52	00
03	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය		18
04	කථිකාචාර්ය		03
05	කථිකාචාර්ය (පරිවාස)		23
06	සහකාර පුස්තකාලයාධිපති	02	01
07	උපදේශක - II/III ශ්‍රේණි	29	00
08	ප්‍රදර්ශක (තාවකාලික)		14
එකතුව		**89**	**59**

ප්‍රධාන තනතුරුවල සිදුවී ඇති වෙනස්කම් (හමුදා/ අධ්‍යයන)

පීඨාධිපති - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ඩී.යූ.කොට්ටාහච්චි මහතා සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති වශයෙන් 2020.02.14වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - එස්.එස්.සමරතුංග මෙය සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වශයෙන් 2020.09.15වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.

මාණ්ඩලික නිලධාරී II - කපිතාන් එම්.එල්.එස්.මද්දුමගේ මහතා සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ මාණ්ඩලික නිලධාරී II තනතුර සඳහා 2020.02.27වන දින සිට බලපැවැත්වෙන පරිදි පත්කරන ලදී.

<u>අධ්‍යයනාංශාධිපතිවරු</u>

- අධ්‍යයනාංශාධිපති - වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය - ආචාර්ය ජේ.එම්.කේ.බී.ජයසේකර මයා (2020.03.04වන දින සිට දීර්ඝ කරන ලදී.)
- අධ්‍යයනාංශාධිපති - විකිරණවේද හා විකිරණ චිකිත්සක අධ්‍යයනාංශය - ආචාර්ය ආර්.විජිත මයා (2020.01.29වන දින සිට දීර්ඝ කරන ලදී.)
- අධ්‍යයනාංශාධිපති - භෞත චිකිත්සක හා වෘත්තීමය චිකිත්සක අධ්‍යයනාංශය - ජී.ඒ.ඩී.පෙරේරා මෙය (2020.02.27වන දින සිට දීර්ඝ කරන ලදී.)
- අධ්‍යයනාංශාධිපති - හෙද හා වින්නඹුකර්ම අධ්‍යයනාංශය - ආර්.ඩී.යූ.පී.සුගතපාල මෙය (2020.03.03වන දින සිට දීර්ඝ කරන ලදී.)

- අධ්‍යයනාංශාධිපති - ඖෂධවේද අධ්‍යයනාංශය - එස්.යූ.කංකානම්ගේ මෙය (2020.08.01වන දින සිට දීර්ඝ කරන ලදී.)
- අධ්‍යයනාංශාධිපති - මූලික විද්‍යා අධ්‍යයනාංශය - ඒ.ආර්.එන්. සිල්වා මයා (2020.05.04වන දින සිට දීර්ඝ කරන ලදී.)

නව බඳවාගැනීම් (අධ්‍යයන)

නම	තනතුර	රාජකාරී භාරගත් දිනය
අ. ආචාර්ය ඒ.ජේ.හලහකෝන් මයා	කථිකාචාර්ය (තනතුරේ ස්ථිරකර නොමැත)	2020.09.10
ආ. ඩබ්.එම්.අයි.එස්.වික්‍රමසිංහ මෙය	කථිකාචාර්ය (පරිවාස)	2020.12.01
ඇ. කේ.ජී.සී.කේ.නන්දසේන මෙය	කණිෂ්ඨ උපදේශක (තාවකාලික)	2020.10.10
ඈ. කේ.ඩී.එස්.සඳරේණු	කණිෂ්ඨ උපදේශක (තාවකාලික)	2020.07.03
ඉ. ජේ.එම්.ඒ.ඩී.ජයලත් මෙය	ප්‍රදර්ශක (තාවකාලික)	2020.09.21
ඊ. එෆ්.ඒ.එස්.එස්.පිල්ලේ මයා	ප්‍රදර්ශක (තාවකාලික)	2020.09.28
උ. කේ.කේ.ටී.ටී.රණවීර මෙය	ප්‍රදර්ශක (තාවකාලික)	2020.09.22
ඌ. එච්.ඩබ්.යූ.එස්.ජයසිංහ මයා	ප්‍රදර්ශක (තාවකාලික)	2020.09.25
එ. ඒ.ඩී.වීරසිංහ මෙය	ප්‍රදර්ශක (තාවකාලික)	2020.09.21

යටිතල පහසුකම් සංවර්ධනය/ නව ව්‍යාපෘති

- වේරහැර කොආවි පරිශ්‍රයේ පර්යේෂණ විද්‍යාගාර සංකීර්ණයක් ස්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කරන ලදී. උපකුලපති වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව මේ සඳහා වන අයවැය ඇස්තමේන්තුව හා උපකරණ ලැයිස්තුව පිළියෙල කර අවසන් වූ අතර මෙම ව්‍යාපෘතිය KDU-Care සමඟ ඒකාබද්ධ කරන ලෙස උපදෙස් ලැබිණි.
- යුරෝපා සංගමයේ Erasmus+ ප්‍රදාන වැඩසටහන යටතේ පශ්චාත් උපාධි (Master level; SLQF 9) පාඨමාලා වැඩසටහනක් සඳහා ආධාර ලැබිණි.

කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්

වැඩමුළු සඳහා සහභාගිත්වය

අනු අංකය	වැඩමුළුව	සංවිධානය කරන ලද්දේ	සහභාගී වූ අය	දිනය
01.	Online Endnote X9 නමැති වෙබිනාර් මාලාව	ක්ලැරිවේට් වෙබිනාර්ස් (Clarivate Webinars)	ආර්.ඩී.යූ.පී.සුගතපාල මෙය	2020 ජූලි මස 07-17වන දින දක්වා
02.	ජාත්‍යන්තර වෛද්‍ය කොංග්‍රස් වැඩමුළුව	ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය (SLMA)	එච්.එස්.එම්.එස්.කේ. විජේසිරි මෙය	2020 ජූලි මස 24-26වන දින දක්වා
03.	A+ Dissertation E-වැඩමුළුව	Institute for Health and Social Behavior – IHSB	ඩබ්.ජී.සී. කුමාර මයා	2020 මැයි මස 16වන දින

04.	Systematic Review & Meta-Analysis වැඩමුළුව	සත්ත්වි විද්‍යා සංගමය (SLALAS) සහ ශ්‍රී ලංකා භෞතවේදී සංගමය	කේ.ජී.ජී.ප්‍රියංගිකා මෙය	2020 අගෝස්තු මස 17 හා 18වන දින

පුහුණු කටයුතු සඳහා දායකත්වය/ජයග්‍රහණ

- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ආර්.විජිත මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වෛද්‍ය භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාවේ (2019/2020) ආචාර්ය මණ්ඩලය/විභාග පරීක්ෂක මණ්ඩලය සඳහා පත්කර තිබේ.
- එච්.එස්.නිරෝෂණී මෙය විසින් වෛද්‍ය භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (SLQF 10වන මට්ටම) නිම කරන ලදී.
- එල්.එච්.එම්.අයි.එම්.හේරත් මෙය විසින් වෛද්‍ය භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (SLQF 10වන මට්ටම) නිම කරන ලදී.
- ආචාර්ය එම්.පී.කේ.ඩබ්.අභයසිංහ මහතා පර්යේෂණ හවුල්කරුවෙකු වශයෙන් බත්තරමුල්ලේ පිහිටි පර්යේෂණ සංවර්ධන ආයතනය (Institute of Research Development) වෙත ගරු සේවයක් ලබා දී ඇත.
- කොළඹ විශ්වවිද්‍යාලයේ සමසෞඛ්‍ය විද්‍යා පීඨයේ හා වෛද්‍ය පීඨයේ භෞත චිකිත්සක විද්‍යාවේදී උපාධි පාඨමාලාවල බාහිර පරීක්ෂකවරු ලෙස ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජී.ඒ.ඩී.පෙරේරා මෙය හා කථිකාචාර්ය (තාවකාලික) ටී.පෙරේරා මෙය සහභාගී විය.
- ෆුල් බ්‍රයිට් කොමිසම විසින් ප්‍රදානය කරන ෆුල් බ්‍රයිට් මාස්ටර් ශිෂ්‍යත්ව වැඩසටහන - 2021/22 සඳහා වූ මූලික සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජී.ඒ.ඩී.පෙරේරා මෙය පත්කර ඇත.
- ආචාර්ය යූ.ටී.එන්.සේනාරත්න මහතා කොආවි විශ්වවිද්‍යාල රෝහලේ කොවිඩ්-19 විද්‍යාගාරයේ ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයෙකු ලෙස පත් කරන ලදී.

සුභසාධන ක්‍රියාකාරකම්

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ 35වන ඇතුළත් කරගැනීමේ උපාධි අපේක්ෂක සිසුන් වැඩිහිටි සත්කාරක නිවාසවල සායනික පුහුණු සඳහා රැඳවීමේ කාලය තුළ දී, එම සිසුන් විසින් වැඩිහිටි ප්‍රජාව සඳහා සෞඛ්‍ය අධ්‍යාපන සැසි හා සෞඛ්‍ය ප්‍රවර්ධන මැදිහත්වීම් සිදු කරන ලදී.

විශේෂ සිදුවීම්/ උත්සව

- කොආවි සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ තෙවන වසරේ විකිරණවේදී උපාධි අපේක්ෂක සිසුන් සඳහා කරාපිටිය ශික්ෂණ රෝහල විසින් පළමු වතාවට සායනික පුහුණුව සඳහා අවස්ථාව ලබාදෙන ලදී.

- කොආවි වාර්ෂික පර්යේෂණ සමුළුව - 2020 මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීමේ කටයුතු සංවිධානය සඳහා පීඨය විසින් සිය දායකත්වය ලබාදෙන ලදී.

ක්‍රියාත්මක කළ ආයතනික සමාජ වගකීම (CSR) වැඩසටහන් පිළිබඳ විස්තර

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ 35වන ඇතුළත් කරගැනීමේ විකිරණවේද හා විකිරණ චිකිත්සක උපාධි අපේක්ෂක සිසුන් විසින් ලෝක විකිරණවේද දිනය (World Radiography Day) සැමරීම සඳහා උත්සවයක් සංවිධානය කරන ලදී. මේ වෙනුවන් ඔවුන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත

ගඟපළාත මහ විද්‍යාලයේ පන්ති කාමර සංකීර්ණයක් අලුත්වැඩියා කරන ලදී. පරිත්‍යාග වශයෙන් ලැබුණු පාසැල් නිලඇඳුම්, ලිපිද්‍රව්‍ය හා පරිගණක උපාංග සිසුන් අතර බෙදාදීමද එකී පන්ති කාමර විවෘත කිරීමේ උත්සවය යෙදී තිබූ 2020 පෙබරවාරි මස 25වන දින සිදුකරන ලදී.

- ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAA) විසින් පාසැල් සිසුන් අතර විද්‍යාව ජනප්‍රිය කරවීමේ කමිටුව සඳහා ‘‘විදු ජය’’ නමින් හැඳින්වෙන සමස්ත ලංකා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන ආචාර්ය ජී.යු.ජයවීර මහතා විසින් සංකල්පනය කර සකස් කරන ලද අතර මෙය විදුසර පුවත්පත සමඟ එක්ව දියත් කරනු ලැබේ.

2.1.8 නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය



නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අලුතින්ම එක් වූ පීඨය වන අතර එම විශ්ව විද්‍යාලයේ දක්ෂිණ මණ්ඩපයේ පළමු පීඨය ද වේ. 2015 ජනවාරි මස සිට මෙම පීඨයේ උපාධි පාඨමාලා ආරම්භ කරන ලදී.

නිර්මිත පරිසරය යන යෙදුම මඟින් අදහස් වනුයේ මිනිසා විසින් නිර්මාණය කරන ලද මානව ක්‍රියාකාරකම් සඳහා පසුබිමක් සලසන ගොඩනැගිලි හා උද්‍යාන හෝ හරිත අවකාශවල සිට අසල්වැසි වටාපිටාව හා නගර ඒ හා සම්බන්ධිත ජල සැපයුම්, හෝ බලශක්ති ජාල ආදී ආධාරක යටිතල පහසුකම් ද සහිත අවට පරිසරයයි. පෘථිවිය, එහි භෞතික ලක්ෂණ, නිර්මිත පරිසරය විස්තර කෙරෙන මිනුම්, කළමනාකරණය, විශ්ලේෂණ හා නිරූපණ අවකාශීය විද්‍යාවේදී මූලිකව අවධානයට යොමු කෙරේ. නිරවද්‍ය දත්ත ලබාගැනීම ඔස්සේ සංකල්ප බෙදා හැරිය හැකි ප්‍රතිඵල බවට පත්කිරීම තහවුරු කෙරේ

මෙම පීඨයේ කේන්ද්‍රීය අරමුණ වන්නේ ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක්වන නිර්මිත පරිසරය හා අවකාශීය විද්‍යා සම්බන්ධිත විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත් වීමයි

මෙම පීඨය අධ්‍යයනාංශ 03කින් සමන්විත වේ.

- වාස්තු විද්‍යා අධ්‍යයනාංශය
- ප්‍රමාණ සමීක්ෂණ අධ්‍යයනාංශය
- අවකාශීය විද්‍යා අධ්‍යයනාංශය

මෙම පීඨය මඟින් උපාධි පාඨමාලා හතරක් (04)ක් පිරිනැමේ:

- වාස්තු විද්‍යා උපාධිය
- නිර්මිත පරිසරය පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- මැනුම් විද්‍යා (ගෞරව) විද්‍යාවේදී උපාධිය

පීඨයේ කාර්ය මණ්ඩල විස්තරය

අනු අංකය	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය
01	මහාචාර්ය	09	00
02	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	45	03
03	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය		08

	- II ශ්‍රේණිය		
04	කථිකාචාර්ය		02
05	කථිකාචාර්ය (පරිවාස)		16
06	උපදේශක	09	04
එකතුව		**63**	**33**

ප්‍රධාන තනතුරුවල සිදුවී ඇති වෙනස්කම් (හමුදා/ අධ්‍යයන)

පීඨාධිපති කාර්යාලය	ආචාර්ය ඒ.එච්.ලක්මාල් මහතා පීඨාධිපති ලෙස 2020.12.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කරන ලදී.
වාස්තු විද්‍යා අධ්‍යයනාංශය	වාස්තු විද්‍යා අධ්‍යයනාංශයේ පර්යේෂණ කවයේ (DARC) සභාපති ලෙස ආචාර්ය ටී.මෙන්ඩිස් මහතා අභිනවයෙන් පත්විය.
ප්‍රමාණ සමීක්ෂණ අධ්‍යයනාංශය	අධ්‍යයනාංශාධිපති ලෙස පත්කර තිබූ ආචාර්ය එස්.ඩී.ජයසූරිය මහතාගේ ධූර කාලය 2020.06.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි තවත් වසරකට දීර්ඝ කරන ලදී.
අවකාශ විද්‍යා අධ්‍යයනාංශය	2020.12.15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යයනාංශාධිපති ලෙස කේ.ඒ.දිනූෂා මෙය පත්කර ඇත. අවකාශ විද්‍යා අධ්‍යයනාංශයේ පර්යේෂණ සම්බන්ධීකාරක ලෙස ආර්.ජී.යූ.අයි.මෙත්තානන්ද මෙය පත්කර ඇත.
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය	2020.05.18 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකයේ සම්බන්ධීකාරක ලෙස පී.ඩී.ඩී.ඩී.වික්‍රමසිංහ මෙය පත්කර ඇත.

නව බඳවාගැනීම් (අධ්‍යයන)

නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
වාස්තු විද්‍යා අධ්‍යයනාංශය		
වාස්තු විද්‍යාඥ එච්.ඩී.එස්. අශෝක මහතා	කථිකාචාර්ය (පරිවාස)	2020 පෙබරවාරි මස 25වන දින
කේ.ඩී.එච්.ජේ.ප්‍රේමරත්න මෙය	කථිකාචාර්ය (පරිවාස)	2020 දෙසැම්බර් මස 04වන දින
එස්.එම්.එම්.සන්ජුනී මෙය	උපදේශක - II ශ්‍රේණිය	2020 දෙසැම්බර් මස 04වන දින
කේ.එස්.කේ.එන්.ජේ.කුඩාසිංහ මෙය	උපදේශක - II ශ්‍රේණිය	2020 දෙසැම්බර් මස 04වන දින
වාස්තු විද්‍යාඥ එච්.ටී.රූපසිංහ මහතා	කථිකාචාර්ය (පරිවාස)	2020 දෙසැම්බර් මස 18වන දින
ප්‍රමාණ සමීක්ෂණ අධ්‍යයනාංශය		
කේ.පී.එස්.පී.කේ.බණ්ඩාර මයා	කථිකාචාර්ය (පරිවාස)	2020 ජනවාරි මස 24වන දින
එන්.ඩී.අයි.චිතාන මයා	කථිකාචාර්ය (පරිවාස)	2020 පෙබරවාරි මස 05වන දින

නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
ටී.සී.කත්‍රිආරච්චි මෙය	කථිකාචාර්ය (පරිවාස)	2020 දෙසැම්බර් මස 01වන දින
ඩබ්.එන්.කවුමුදී මෙය	කථිකාචාර්ය (පරිවාස)	2020 දෙසැම්බර් මස 03වන දින
ඩී.එම්.එස්.ජයසූරිය මෙය	කථිකාචාර්ය (පරිවාස)	2020 දෙසැම්බර් මස 16වන දින
ටී.ඒ.ඩී.කේ.ජයසංක මයා	උපදේශක - II පංතිය	2020 දෙසැම්බර් මස 17වන දින
යූ.එම්.සාමරරත්න මෙය	උපදේශක - II පංතිය	2020 දෙසැම්බර් මස 17වන දින
අවකාශීය විද්‍යා අධ්‍යයනාංශය		
කේ.පී.මනුරංග මයා	කථිකාචාර්ය (පරිවාස)	2020 පෙබරවාරි මස 21වන දින
කේ.යූ.ජේ.සඳමාලි මෙය	කථිකාචාර්ය (පරිවාස)	2020 පෙබරවාරි මස 21වන දින
එන්.වී.වික්‍රමතිලක මයා	උපදේශක - II ශ්‍රේණිය	2020 පෙබරවාරි මස 21වන දින
එන්.වී.වික්‍රමතිලක මයා	කථිකාචාර්ය (පරිවාස)	2020 දෙසැම්බර් මස 02වන දින
ජේ.එම්.ඕ.ජයමාන්න මෙය	කථිකාචාර්ය (පරිවාස)	2020 දෙසැම්බර් මස 01වන දින
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය		
එච්.පී.අලහකෝන් මෙය	උපදේශක - III ශ්‍රේණිය	2020 ජූනි මස 02වන දින
ඩබ්.ඊ.දහනායක මෙය	උපදේශක - III ශ්‍රේණිය	2020 ජූනි මස 22වන දින
එච්.ආර්.තරංග මෙය	උපදේශක - III ශ්‍රේණිය	2020 ඔක්තෝම්බර් මස 10වන දින

විශේෂ සිදුවීම්/ උත්සව

අනු අංකය	දිනය	විස්තරය	අධ්‍යයනාංශය
1	2020 .02.19 සිට 22වන දින දක්වා	2020 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ සංගමයේ ප්‍රදර්ශනයේ දී උපාධි අපේක්ෂ සිසුන්ගේ නිර්මාණ ප්‍රදර්ශනය සඳහා කුටියක් වෙන්කර තිබුණි.	වාස්තු විද්‍යා
2	2020.06.27	ප්‍රමාණ සමීක්ෂණ උපාධිය සඳහා ඇතුළත් වූ සියලුම සිසුන් සඳහා වරලත් ප්‍රමාණ සමීක්ෂක මනෝජ් හේරත් මහතා විසින් ආරාධිත දේශනයක් මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලදී.	අවකාශ විද්‍යා
3	2020.07.01	දක්ෂිණ මණ්ඩපයේ කාර්මික පුහුණු පාඨමාලා ඒකකය සඳහා දිශානුගත කිරීමේ වැඩමුළුවක් ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය විසින් පවත්වන ලදී. (34වන ඇතුළත් කරගැනීම සඳහා)	අවකාශ විද්‍යා
4	2020.09.24	ආර්.ජී.යූ.අයි.මෙත්තානන්ද මෙය විසින් අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කළ Math Quiz Wizard නම් ගණිත තරඟය	අවකාශ විද්‍යා
5	2020.10.15 සිට 16වන දින දක්වා	කොආවි 13වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා සහභාගී වීම	සියලුම අධ්‍යයනාංශ
6	2020.11.20	දක්ෂිණ මණ්ඩපයේ කාර්මික පුහුණු පාඨමාලා ඒකකය සඳහා දිශානුගත කිරීමේ වැඩමුළුවක් ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය විසින් පවත්වන ලදී.	ප්‍රමාණ සමීක්ෂණ

උපාධි ප්‍රදානය

- 2020 වර්ෂයේ පැවැති උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධි අපේක්ෂකඅපේක්ෂිකාවන් 45 දෙනෙකු සඳහා උපාධි පිරිනමන ලදී.

උපාධිය	ඇතුළත් කර ගැනීම	ශිෂ්‍ය නිලධාරී සංඛ්‍යාව	කැඩෙට් නිලධාරී සංඛ්‍යාව	සිවිල් සිසුන් සංඛ්‍යාව	එකතුව	පළමු පෙළ සාමාර්ථය	දෙවන පෙළ (ඉහළ) සාමාර්ථය	දෙවන පෙළ (පහළ) සාමාර්ථය	සාමාර්ථය
වාස්තු විද්‍යා උපාධිය	32	-	07	09	16	1	04	07	04
විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය	33/34	-	-	02	02	-	02	-	-
විද්‍යාවේදී ප්‍රමාණ සමීක්ෂණ (ගෞරව) උපාධිය	33	01	02	16	19	05	10	03	01
විද්‍යාවේදී මැනුම් විද්‍යා (ගෞරව) උපාධිය	33	-	04	04	08	01	03	01	03

පර්යේෂණ ප්‍රකාශන

අනු අංකය	අධ්‍යයනාංශය	පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව
1	වාස්තු විද්‍යා	14
2	ප්‍රමාණ සමීක්ෂණ	06
3	මැනුම් විද්‍යා	13

වාස්තු විද්‍යා අධ්‍යයනාංශය:

වාස්තු විද්‍යා අධ්‍යයනාංශයේ පර්යේෂණ කවය (DARC) නමින් අධ්‍යයනාංශයේ පර්යේෂණ ඒකකය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ, දක්ෂිණ මණ්ඩපයේ පිහිටුවීම.

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් ඒකකය:

විශේෂ ඉංග්‍රීසි පාඨමාලා, අධ්‍යයන, අනධ්‍යයන හා හමුදා කාර්ය මණ්ඩල සඳහා වැඩමුළු

2.1.9 පරිගණක පීඨය



ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පුළුල් පරාසයක පරිගණක විද්‍යා උපාධි පිරිනැමීම සඳහා වෙන්වූ පළමු පරිගණක පීඨය ලෙස ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨය 2015 දී ආරම්භ කරන ලදී.

මෙම පීඨය මඟින් ප්‍රදානය කරන සියලුම උපාධි ජාත්‍යන්තර ACM/IEEE ප්‍රමිති හා අනුරූපවේ. පරිගණක භාවිතය පිළිබඳ සෛද්ධාන්තික පදනම, පරිගණක ඉංජිනේරු විද්‍යා, දෘඨාංග හා මෘදුකාංග, පරිගණක භාවිතය පිළිබඳ තාක්ෂණික හා සමාජමය කරුණු හා පරිගණක භාවිතය පිළිබඳ ගණිතමය හා සංඛ්‍යාලේඛන පදනම ආදි කරුණු සම්බන්ධ ඉගැන්වීම් හා පර්යේෂණ සඳහා මෙම පීඨය දායක වේ. අධ්‍යයන පොදු සහතික උසස් පෙළ භෞතික විද්‍යා, ජීව විද්‍යා, කලා හා වාණිජ්‍ය ධාරාවලින් හදාරන සිසුන්ට පරිගණක විද්‍යා උපාධි පාඨමාලාවක් හදාරා ගෝලීය පරිගණක ක්ෂේත්‍රය තුළ ඵලදායී රැකියා අවස්ථා ලබාගැනීම සඳහා අගනා අවස්ථාවක් මෙම පීඨය මඟින් සලසා දී තිබේ.

සහතිකලත් ජාල විදයාගාරයක් ද ඇතුළුව පරිගණක විද්‍යා පීඨය සතුව අංග සම්පූර්ණ නවීන දේශන ශාලා හා විද්‍යාගාර පහසුකම් පවතී. මෙම පීඨයේ ආරම්භක අවධියේ සිටම පීඨය විසින් පර්යේෂණ සංස්කෘතියක් ස්ථාපනය කිරීමට හා පරිගණක ආදර්ශන හා සමාකරණ, බහු නියෝජිත පද්ධති, තත්ත්ව විචාර ආදර්ශන, යාන්ත්‍රික පරිවර්තන, න්‍යායාත්මක පරිගණක භාවිතය, මෘදුකාංග ඉංජිනේරු, කෘත්‍රිම බුද්ධිය හා මොළය-මනස සමාකරණය වැනි නවීන පර්යේෂණ දියත් කිරීම සඳහා ප්‍රයත්න දරනු ලැබේ. පීඨය මඟින් ආරම්භ කළ බහු සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති ඔස්සේ BMind simulator සහ Octopus-Chatbot වැනි පර්යේෂණ ප්‍රතිඵල ලබාගැනීමට හැකි වී තිබේ.

පරිගණක පීඨය අධ්‍යයනාංශ හතරකින් (04) සමන්විත වේ:

- පරිගණක විද්‍යා අධ්‍යයනාංශය
- තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය
- පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය
- පරිගණක ගණිත අධ්‍යයනාංශය

මෙම පීඨය මඟින් පහත දැක්වෙන සිවු අවුරුදු උපාධි පාඨමාලා පහක් පවත්වා ඇත.**:**

- පරිගණක විද්‍යා (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- මෘදුකාංග ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- තොරතුරු තාක්ෂණ (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- තොරතුරු පද්ධති (ගෞරව) විද්‍යාවේදී උපාධිය
- පරිගණක ඉංජිනේරු (ගෞරව) විද්‍යාවේදී උපාධිය

පීඨයේ කාර්ය මණ්ඩල විස්තරය

අනු අංකය	තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය
01	මහාචාර්ය	10	00
02	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	49	02
03	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය		09
04	කථිකාචාර්ය		02
05	කථිකාචාර්ය (පරිවාස)		08
06	උපදේශක	10	04
07	උපදේශක -තාවකාලික	00	09
එකතුව		**69**	**34**

ප්‍රධාන තනතුරුවල සිදුවූ වෙනස්කම්/ සේවා කාලය දීර්ඝ කිරීම (හමුදා/ අධ්‍යයන/ පරිපාලන)

වගුව 01: නැවත පත්කිරීම්

අනු අංකය	නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
i.	ජේ.යු.ගුණසීල මයා	පීඨාධිපති -පරිගණක විද්‍යා පීඨය	2020 මාර්තු 07
ii.	ආර්.පී.එස්.කත්‍රිආරච්චි මයා	අධ්‍යයනාංශාධිපති - තොරතුරු තාක්ෂණ	2020 සැප්තැම්බර් 15
iii.	සී.පී.වඩුගේ මෙය	අධ්‍යයනාංශාධිපති - පරිගණක ගණිත	2020 ජනවාරි 01
iv.	ආචාර්ය බී.හෙට්ටිගේ මයා	අධ්‍යයනාංශාධිපති - පරිගණක ඉංජිනේරු	2020 ජනවාරි 01
v.	ආචාර්ය එච්.එල්.ප්‍රේමරත්න මයා	ආචාර්ය එච්.එල්.ප්‍රේමරත්න **(o.a.b.)**	2020 ජනවාරි 01

වගුව 02: උසස් කිරීම්

අනු අංකය	නම	තනතුර	බලාත්මක දිනය
i.	ඩබ්.පී.ජේ.ප්‍රේමරත්න මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	2019 සැප්තැම්බර් 16
ii.	එස්.සී.එම්. ද සිල්වා සිරිසූරිය මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	2019 නොවැම්බර් 10
iii.	ආචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය -	2020 මැයි 01

	ඒ.ඩී.ඒ.අයි.ගුණසේකර මයා	II ශ්‍රේණිය	
iv.	ආචාර්ය බී.හෙට්ටිගේ මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	2020 ජූලි 31
v.	ඩබ්.ජේ.සමරවීර මෙය	කථිකාචාර්ය (පරිවාස)	තනතුරේ ස්ථිර කිරීම 2016 අගෝස්තු මස 01වන දින
vi.	ඊ.ආර්.සී.සඳමාලි මෙය	උපදේශක - I ශ්‍රේණිය	2020 ජූලි 16

වගුව 03: නව පත්වීම්

අනු අංකය	නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
i.	ආචාර්ය ඩබ්.ඒ.ආර් ද මෙල් මයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	අධ්‍යයනාංශාධිපති - පරිගණක ගණිත	2020 පෙබරවාරි 07
ii.	ආචාර්ය ඒ.ඩී.ඒ.අයි.ගුණසේකර මයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	අධ්‍යයනාංශාධිපති - පරිගණක විද්‍යා	2020 සැප්තැම්බර් 15

නව බඳවා ගැනීම් (හමුදා/ අධ්‍යයන)

වගුව 04: ප්‍රධාන තනතුරු

අනු අංකය	නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
i.	ආචාර්ය ඩබ්.ඒ.ආර් ද මෙල් මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) (o.s.l)	2020 ජනවාරි 16
ii.	ආචාර්ය ඊ.ඒ.ටී.ඒ. එදිරිසූරිය මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) (o.s.l)	2020 ජනවාරි 17
iii.	එම්.ඩබ්.පී.මධුරංග මයා	කථිකාචාර්ය (පරිවාස)	2020 අප්‍රේල් 21
iv.	ජී.ඒ.අයි.යුවන්තික මෙය	උපදේශක (II ශ්‍රේණිය)	2020 ජනවාරි 27
v.	ජේ.ජේ.ආර්.එස්.ප්‍රනාන්දු මිය	උපදේශක (II ශ්‍රේණිය)	2020 පෙබරවාරි 03
vi.	කේ.බී.ඒ.මධුෂි මෙය	උපදේශක (II ශ්‍රේණිය)	2020 පෙබරවාරි 03

යටිතල පහසුකම් සංවර්ධනය/ නව ව්‍යාපෘති

i. විශ්වවිද්‍යාල සංයුක්ත සැලැස්ම 2020-2024 යටතේ පීඨය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීම

ii. පරිගණක ගණිත අධ්‍යයනාංශය විසින් "දත්ත විද්‍යා හා ව්‍යාපාර විශ්ලේෂණ විද්‍යාවේදී උපාධිය" නමින් නව උපාධි පාඨමාලාවක් 2021 වර්ෂයේ දී ආරම්භ කිරීම සඳහා මූලික කටයුතු සිදුකරන ලදී.

iii. පරිගණක විද්‍යා, පරිගණක ඉංජිනේරු හා මෘදුකාංග ඉංජිනේරු උපාධි පාඨමාලා සඳහා පරිගණක විද්‍යාගාර, දක්ෂිණ මණ්ඩපය සඳහා හුවාවේයි නවොත්පාදන විද්‍යාගාරය, සිසිඑන්ඒ විද්‍යාගාරය, ඩිජිටල් යන්ත්‍ර හා භාණ්ඩ සහ මානවයන් එකිනෙක සම්බන්ධිත පද්ධති (IoT) විද්‍යාගාර, කෘත්‍රිම බුද්ධිය (AI), මානව-පරිගණක අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය සම්බන්ධිත (HCI) හා පරිගණක ගණිත, පරිගණක ඉංජිනේරු කටයුතු සඳහා ඉහළ කාර්යසාධනයක් සහිත පරිගණක සමඟ පරිගණක විද්‍යා පර්යේෂණ විද්‍යාගාර, ඉලෙක්ට්‍රොනික් හා රොබෝ විද්‍යාගාර හා පරිගණක දෘඨාංග වැඩපොළ ස්ථාපනය කිරීම සඳහා මූලික කටයුතු සිදුකරන ලදී.

iv. 2020 සැප්තැම්බර් 03වන දින පරිගණක පීඨයේ විද්‍යාර්ථීන්ගේ සංගමයක් ස්ථාපනය කරන ලදී.

v. 2020.06.15 දින හුවාවේයි (පුද්ගලික) සමාගම සහ කොඅාවි අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

vi. සූරියවැව දක්ෂිණ මණ්ඩපයේ පීඨ ගොඩනැගිල්ලක් ඉදි කිරීමේ කටයුතු 2020 ජූලි 17වන දින ආරම්භ කරන ලදී.

vii. IET on Campus KDU වැඩසටහන ඉංජිනේරු පීඨය සමඟ ඒකාබද්ධව සිදුකරන ලදී.

viii. බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ (BCS) ශිෂ්‍ය ශාඛාවක් ආරම්භ කරන ලද අතර මෙය බ්‍රිතාන්‍ය පරිගණක සංගමය සමඟ ආරම්භ කරන ලද පළමු ශිෂ්‍ය ශාඛව වේ.

ix. පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය විසින් බුද්ධි පර්යේෂණ විද්‍යාගාරයක් ස්ථාපනය කරන ලදී.

x. පර්යේෂණ ව්‍යාපෘතිවල කාර්යයන් සඳහා අවශ්‍ය කෙරෙන HPC Cluster ජාලයක් ක්‍රියාත්මක කරන ලදී.

xi. "සුරනිමල ගොඩනැගිල්ල" ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ආරම්භ කිරීම හා ගිනි නිවීමේ උපකරණ ලබා ගැනීම

xii. පරිගණක පීඨය විසින් "CuRec" නමින් නම්කළ රෝගී-වෛද්‍ය සන්නිවේදන මෘදුකාංගයක් සාර්ථකව එළි දක්වන ලද අතර එය 2020 මැයි 15වන දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පිරිනැමීම සිදුවිය.

xiii. ව්‍යවසායකත්වය සඳහා රැකුල් දෙන කාර්මික පුහුණු කිරීමේ හා වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයක් (EICU) පරිගණක පීඨය තුළ ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු 2020 සැප්තැම්බර් මස 03වන දින ආරම්භ කරන ලදී**.**

xiv. "The integration of Location-based Services (LBS) into intelligent transportation systems (ITS)" මැයෙන් වන පර්යේෂණයක් දියත් කිරීම සඳහා Erasmus+ පර්යේෂණ ප්‍රදානය කොඅාවි වෙත පිරිනැමීම ප්‍රකාශයට පත් කරන ලදී.

කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්

i. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා Journal Reading සැසියක් සෑම මාසයකට වරක් පවත්වන ලදී.

ii. 2020 දෙසැම්බර් 07වන දින සිට කොඅාවි කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද CTHE batch VIII පාඨමාලාව පරිගණක විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය

(පරිවාස) අයි.ඒ.විජේතුංග මිය හා පරිගණක ගණිත අධ්‍යයනාංශයේ කථිකාචාර්ය (පරිවාස) බී.එච්.ඩී.පෙරේරා මිය විසින් සාර්ථකව නිම කරන ලදී.

iii. පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II පංතිය) ආචාර්ය බුද්ධිත හෙට්ටිගේ මහතා විසින් කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ දර්ශනශූරී උපාධිය මොරටුව විශ්ව විද්‍යාලයෙන් සාර්ථකව හදාරා නිමකරන ලදී.

iv. ආචාර්ය ඒ.ඩී.ඒ.අයි.ගුණසේකර මහතා විසින් කළමනාකරණ විද්‍යාව හා ඉංජිනේරු විද්‍යාව සම්බන්ධ සිය දර්ශනශූරි උපාධිය චීනයේ හියුආසොන්ග් යුනිවර්සිටි ඔෆ් සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි විශ්වවිද්‍යාලයයෙන් සාර්ථකව හදාරා නිම කරන ලදී.

v. ඩබ්.පී.ජේ.ප්‍රේමරත්න මිය විසින් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය සාර්ථකව හදාරා නිම කරන ලදී.

vi. එස්.සී.එම් ද සිල්වා මිය විසින් ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යාව පිළිබඳ දර්ශනපති උපාධිය සාර්ථකව හදාරා නිම කරන ලදී.

පුහුණු කටයුතු සඳහා දායකත්වය/ ජයග්‍රහණ

i. ඉංජිනේරු පීඨයේ අධ්‍යයන හා සන්නද්ධ හමුදා කාර්ය මණ්ඩලය සඳහා පරිගණක ගණිත අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශාධිපති ආචාර්ය ඩබ්.ඒ.ආර්. ද මෙල් මහතා විසින් "R Software for Statistical Modelling and Computing" මාතෘකාව යටතේ වූ වැඩමුළු පවත්වන ලදී.

ii. IET වාර්ෂික තාක්ෂණික සමුළුව (IETATC) - 2020 සඳහා ඩී.එස්.පණ්ඩිතගේ, ඒ.පී.විජේසේකර (34වන ඇතුළත් කරගැනීම - පරිගණක ඉංජිනේරු) සහ ඉංජිනේරු එම්.ඩබ්.පී.මධුරංග විසින් " Design of PABX System Using Single Board Computer" මැයෙන් ඉදිරිපත් කළ පත්‍රිකාව සඳහා තෙවන හොඳම පත්‍රිකාවට හිමි සම්මානය හිමි විය.

iii. 34වන ඇතුළත් කරගැනීමේ සියලුම සිසුන් (සිසුන් 131) ඔවුන්ගේ සේවාරම්භක පුහුණුව සඳහා ප්‍රධාන පෙලේ තොරතුරු තාක්ෂණ සමාගම් වෙත අනුයුක්ත කරන ලදී.

iv. TADHack Sri Lanka 2020 තරඟාවලියේ දී 35වන ඇතුළත් කරගැනීමේ සිසුන් විසින් පළමු හා තෙවන ස්ථානය ලෙස ජයග්‍රහණ දෙකක් දිනාගන්නා ලදී.

v. IEEE WIE Sri Lanka Section Affinity Group නැමති සංවිධානය IEEE HAC & SIGHT සමඟ සහයෝගීතාවයෙන් සංවිධානය කළ “Code with WIE- Let’s Rise Together” තරඟාවලියේ පළමු ස්ථානය 34වන ඇතුළත් කරගැනීමේ උපාධි අපේක්ෂක සිසුන් විසින් දිනාගන්නා ලදී.

vi. 35වන ඇතුළත් කරගැනීමේ තොරතුරු තාක්ෂණ සිසුන් හා 35වන ඇතුළත්කර ගැනීමේ පරිගණක ඉංජිනේරු සිසුන් විසින් IEEE Innovation Sri Lanka Problem Repository 2020 තරඟාවලියේ 2වන හා 4වන ස්ථාන පිළිවෙලින් දිනාගන්නා ලදී.

vii. ආචාර්ය ඒ.ඩී.ඒ.අයි.ගුණසේකර මහතා විදුලි හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ (IEEE) ජ්‍යෙෂ්ඨ සාමාජික තත්ත්වයට උසස් කර ඇත.

viii. ආචාර්ය ඒ.ඩී.ඒ.අයි.ගුණසේකර මහතාට හියුහොහොන්ග් විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලය (HUST) විසින් පහත සම්මාන ප්‍රදානය කර ඇත.

- මුදල් ත්‍යාගයක් සමඟ අධ්‍යයන විශිෂ්ටතා සම්මානය
- ජාත්‍යන්තර ශිෂ්‍ය ගුරු සම්මානය

ix. National Best Quality Software Award (NBQSA) සම්මානය සඳහා ආචාර්ය බී.හෙට්ටිගේ මහතා හා ඩබ්.එම්.කේ.එස්.ඉල්මිනී මෙය පත්කර තිබේ.

x. 2020 ඔක්තෝම්බර් 15හා 16වන දිනයන්හිදී පැවති කොආවි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව සඳහා පරිගණක විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය හා සිසුන් විසින් 43කට අධික පර්යේෂණ පත්‍රිකා ප්‍රකාශයට පත් කර ඇත.

xi. ඊගල්ස් ලේක් සයිඩ් හිදී හා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී 2021 ජනවාරි මස 19වන දින හා පෙබරවාරි මස 15වන දින පැවති කොආවි 2020 උපාධි ප්‍රදානෝත්සවයේ දී 32වන හා 33වන ඇතුළත් කරගැනීම්වල තොරතුරු තාක්ෂණ, තොරතුරු පද්ධති, පරිගණක විද්‍යා, පරිගණක ඉංජිනේරු හා මාංදුකාංග ඉංජිනේරු සිසුන්ට උපාධි ප්‍රදානය සිදුකරන ලදී. (වගුව 05 විස්තර දක්වා තිබේ.)

වගුව 05: 2020 වර්ෂය සඳහා වූ උපාධි ප්‍රධානෝත්සවයේ දී උපාධි ප්‍රදානය ලැබූ සිසුහු

ඇතුළත් කරගැනීම	විෂය ධාරාව	පළමු පන්තියේ සාමාර්ථය	දෙවන පන්තියේ ඉහළ පෙළ සාමාර්ථය	දෙවන පන්තියේ පහළ සාමාර්ථය	සාමාර්ථය	එකතුව
33/32	තොරතුරු තාක්ෂණ		3	4	25	32
33	තොරතුරු පද්ධති		3	5	13	21
	පරිගණක විද්‍යා	2	4	6	5	17
	පරිගණක ඉංජිනේරු		1	5	3	9
	මාංදුකාංග ඉංජිනේරු	1	4	2	4	11
මුළු එකතුව						**90**

විශේෂ සිදුවීම්/ උත්සව

දක්ෂිණ මණ්ඩපයේ ශිෂ්‍ය පාගමන

දක්ෂිණ මණ්ඩප සිසුන්ගේ ශිෂ්‍ය පාගමන 2020 සැප්තැම්බර් 18වන දින දක්ෂිණ මණ්ඩප පරිශ්‍රයේ දී පැවැත්විණි.

ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRC-2020)

2020 ඔක්තෝම්බර් 15 හා 16යන දිනවලදී රත්මලාන පරිශ්‍රයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRC-2020) පැවැත්විණි.

ආචාර්ය එල්.පී.කලන්සූරිය මහතා මෙම IRC 2020 සමුළුවේ සභාපති ලෙස යෝජනා කරන ලදී.

පැදුර සංගීත ප්‍රසංගය

37වන ඇතුළත් කරගැනීමේ තොරතුරු තාක්ෂණ/තොරතුරු පද්ධති උපාධි අපේක්ෂක සිසුන් සංවිධානය කළ සංගීත ප්‍රසංගය 2020 ඔක්තෝම්බර් 22වන දින දක්ෂිණ මණ්ඩපයේ දී පැවැත්විණි.

සදර්න් ප්‍රිමියර් ලීග් (SPL 2020)

35වන ඇතුළත් කරගැනීමේ තොරතුරු තාක්ෂණ/තොරතුරු පද්ධති උපාධි අපේක්ෂක සිසුන් සංවිධානය කළ සදර්න් ප්‍රිමියර් ලීග් 2020, 2020 පෙබරවාරි 06වන දින පැවැත්විණි.

පීඨයේ ආදී විද්‍යාර්ථීන්ගේ සංගමයක් පිහිටුවීම

පරිගණක පීඨයේ ආදී විද්‍යාර්ථීන්ගේ සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම පළමු වරට 2021 ජනවාරි මස 20 වන දින පැවැත්විණි. රටේ පවතින කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ මෙම රැස්වීම Zoom තාක්ෂණය ඔස්සේ පැවති අතර පීඨයෙන් උපාධි ලැබූ සිසුන් 45දෙනෙකු පමණ මෙම රැස්වීමට සහභාගී විය. පළමු පියවර ලෙස සංගමය සඳහා නිලධාරීන් පත්කරගත් අතර අනෙකුත් කමිටු සඳහා ද සාමාජිකයන් පත්විය. දැනට මෙම සංගමයේ ලියාපදිංචි සාමාජික සංඛ්‍යාව 44කි.

පරිගණක පීඨයේ ශිෂ්‍ය සම්මන්ත්‍රණය

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලීය ඉතිහාසයේ පළමු වරට එහි පරිගණක පීඨය විසින් 2020 දෙසැම්බර් මස 17වන දින මාර්ගගත ක්‍රමය ඔස්සේ ශිෂ්‍ය සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. මේ සඳහා පර්යේෂණ පත්‍රිකා 157ක් ලැබී තිබූ අතර ඒ අතුරින් උපාධි අපේක්ෂක සිසුන්ගේ පර්යේෂණ පත්‍රිකා 50ක් සම්මන්ත්‍රණය සඳහා ඉදිරිපත් කිරීමට තෝරාගන්නා ලදී. තොරතුරු තාක්ෂණය, තොරතුරු පද්ධති, පරිගණක විද්‍යාව, පරිගණක ඉංජිනේරු හා මෘදුකාංග ඉංජිනේරු යන අධ්‍යයන ක්ෂේත්‍ර 05ක් ඔස්සේ උපාධි අපේක්ෂක සිසුහු 50 දෙනෙක් සිය පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කළහ.

මෙම සම්මන්ත්‍රණය සඳහා සහභාගී වූ ප්‍රධාන දේශකයන් හා ඔවුන් විසින් ඉදිරිපත් කළ දේශනවල මාතෘකා මෙසේය:

- මහාචාර්ය අසෝක එස්.කරුණානන්ද මහතා, මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව - "How to do a Computing Research" මැයෙන් ඉදිරිපත් කළ දේශනය
- මහාචාර්ය සමන් මුතුකුමාරණ, මැනිටෝබා විශ්වවිද්‍යාලය, කැනඩාව - "Bayesian Networks Learning for Complex Data" මැයෙන් ඉදිරිපත් කළ දේශනය

II. වැඩමුළු/ ආරාධිත දේශකයෝ/ දේශන/ ප්‍රදාන/ කර්මාන්තශාලා වෙත සිදුකළ සංචාර

වගුව 06: පරිගණක පීඨය විසින් සංවිධානය කළ ආරාධිත දේශන

අනු අංකය	දිනය	දේශනය	සම්පත් දායකයා
i.	2020 ජනවාරි 21	කෘත්‍රිම බුද්ධිය (AI)	එච්.ආර්.එස්.කරුණාරත්න මයා ෆොට්ස්සිනර්ජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ජ්‍යෙෂ්ඨ තොරතුරු තාක්ෂණ උපදේශක
ii.	2020 මැයි 21	මාර්ගගත සම්මුඛ පරීක්ෂණ හා කාර්මාන්තයන්හි අපේක්ෂා	ඩී.ජයවීර මෙය (ව්‍යාපෘති කළමනාකරු) ක්‍රියේටිව් සොෆ්ට්වෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
iii.	2020 මැයි 28	මෘදුකාංග ඉංජිනේරු වෘත්තිය සැලසුම්කිරීමේ රාමුව	වී.කොටේලවල මහතා බෙදාහැරීම් හා පාරිභෝගික සාර්ථකත්වය පිළිබඳ ප්‍රධානී ලේ-අප් (ප්‍රයිවට්) ලිමිටඩ්
iv.	2020 ජූනි 03	office 365 ඔස්සේ විශ්වවිද්‍යාලයන්ගේ ඵලදායිතාවය වැඩි කිරීම	පී.මාන්නප්පෙරුම මයා තාක්ෂණ ක්‍රමෝපායඥ මයික්‍රෝසොෆ්ට් ශ්‍රී ලංකා

v.	2020 ජූනි 05	Microsoft Student Champs වෙබිනාර් මාලාවේ දෙවැන්න	එෆ්.ඉස්මයිල් මහතා හා එස්.සිල්වා මහතා මයික්‍රෝසොෆ්ට් ෆෝවුන්ඩර් පීච් අයිටී
vi.	2020 සැප්තැම්බර් 15	සංඛ්‍යාලේඛන මෘදුකාංගයක් වන Statistical software R පිළිබඳ හැඳින්වීමක්	ඊ.ආර්.සී. සඳමාලි මෙය එස්.මොරපිටිය මෙය ඒ.ජී.අෂානී මෙය ඉලෙක්ට්‍රොනික් හා විදුලි ඉංජිනේරු අධ්‍යයනාංශය, ඉංජිනේරු පීඨය
vii.	2020 නොවැම්බර් 01	වර්ධිත යථාර්ථය (Augmented Reality) සහ අතථ්‍ය යථාර්ථය (Virtual Reality) සම්බන්ධිත මාර්ගගත වැඩමුළුව	මහාචාර්ය ජේ.රාජපක්ෂ මහතා (තායිවානයේ තායිනාන් කලා ජාතික විශ්වවිද්‍යාලයේ සජීවිකරණ හා චිත්‍රපට කලා පිළිබඳ උපාධි ආයතනයේ මහාචාර්යවරයෙකි)

මූල්‍ය කරුණු

(අ) විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම සඳහා සම විද්‍යාගාර ස්ථාපනය කිරීම සඳහා කොඅාවි ස්වයං මූල්‍යයන අරමුදලින් පරිගණක පීඨය සඳහා රුපියල් මිලියන 150ක් වෙන්කර තිබේ.

වෙනත් තොරතුරු

විෂයමාලා සංවර්ධන/ අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය

- 37වන ඇතුළත් කරගැනීමේ විෂය නිර්දේශය සංශෝධන කර, පීඨයේ විෂයමාලා සංවර්ධන හා සමාලෝචන කමිටුව (CDRC) හා තත්ත්ව සහතික කවය (QA Cell) හා විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (UQAC) වෙත ඉදිරිපත් කර 2020 ජූලි 15වන දින සෙනට් සභාවේ අනුමැතිය ද ලබාගන්නා ලදී.
- පරිගණක පීඨ අධ්‍යයන කාර්ය මණ්ඩලය, සන්නද්ධ හමුදා, අධ්‍යයන හා කර්මාන්ත නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පරිගණක පීඨයේ පීඨ කර්මාන්ත උපදේශක සභාව (FICB) 2020 පෙබරවාරි 10වන දින පවත්වන ලදී.
- දත්ත විද්‍යා හා ව්‍යාපාර විශ්ලේෂණ උපාධි පාඨමාලාව සඳහා විෂය නිර්දේශයක් සකස්කර, පීඨයේ විෂයමාලා සංවර්ධන හා සමාලෝචන කමිටුව (CDRC) හා තත්ත්ව සහතික කවය (QA Cell) හා විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (UQAC) වෙත ඉදිරිපත්කර සෙනට් සභාවේ අනුමැතිය ද ලබාගන්නා ලදී.
- සියලුම උපාධි පාඨමාලාවල සියලු මොඩියුල විස්තරය සංශෝධනය කරන ලදී.
- පරිගණක විද්‍යා, තොරතුරු තාක්ෂණය හා තොරතුරු පද්ධති විෂය නිර්දේශ සඳහා ශ්‍රී ලංකා පරිගණක සංගමයේ ප්‍රතීතන ප්‍රදානය ලබාගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.
- විද්‍යාපති පරිගණක විද්‍යා උපාධිය සඳහා විෂය නිර්දේශය සැකසීම ආරම්භ කරන ලදී.
- ශ්‍රී ලංකා පරිගණක සංගමයේ ප්‍රතීතනය ලබාගැනීම සඳහා කටයුතු කිරීම හා තොරතුරු තාක්ෂණ, තොරතුරු පද්ධති හා පරිගණක විද්‍යා පාඨමාලා සඳහා බාහිර සමාලෝචක ඇගයීම් ලබාගැනීම් සිදුකරන ලදී.

අනාගත සැලසුම්

- පරිගණක පීඨයේ පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම.
- පීඨය සඳහා අධ්‍යයන/ අධ්‍යයන සහායක/ අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම
- සිසුන් කර්මාන්ත ශාලා වෙත රැගෙන යෑමේ සංචාර සංඛ්‍යාව වැඩි කිරීම
- සිසුන් බඳවා ගැනීම වැඩි කිරීම
- බ්‍රිතාන්‍ය පරිගණක සංගමය (BCS) සමඟ සබඳතා ගොඩනඟා ගැනීම ඔස්සේ එහි වෘත්තීය සුදුසුකම් ලබාගැනීම හා IET ශිෂ්‍ය ශාඛාවක් ගොඩනැගීම
- විදේශීය විශ්වවිද්‍යාල සමඟ සබඳතා ගොඩනඟා ගැනීම
- විද්‍යාගාර වැඩිදියුණු කිරීම
- ශ්‍රී ලංකා පරිගණක සංගමයේ ප්‍රතීතනය ලබාගැනීම
- විද්‍යාපති පරිගණක විද්‍යා උපාධි පාඨමාලා ආරම්භ කිරීම

2.2 මණ්ඩප හා ප්‍රතීතන ප්‍රදානය ලද අයතන

2.2.1 දක්ෂිණ මණ්ඩපය - සූරියවැව



කොඅාවි විසින් 2015 වසරේ සිට දකුණු හා උතුරු පළාත් වලද මණ්ඩප පිහිටුවමින් සිය විශ්වවිද්‍යාල ජාලය පුළුල් කිරීම පිළිබඳව දැක්මක් සහිතව කටයුතු කරනු ලැබීය. එබැවින් දකුණු පළාත තුළ විශ්වවිද්‍යාල ගම්මානයක් ආරම්භ කිරීමේ අවස්ථාවක් උදා වූ විටම, කොඅාවි, රජය විසින් විශ්වවිද්‍යාලය වෙත පවරන ලද අක්කර 148ක පුරා විහිදෙන භූමියක සියලු නවීන පහසුකම්වලින් සමන්විත මණ්ඩපයක් (campus) ස්ථාපනය කිරීමේ නිර්භීත තීරණය ගන්නා ලදී.

දක්ෂිණ මණ්ඩපය ඉදිකර නිමවීමෙන් අනතුරුව ස්වාභාවික වනාන්තර ආවරණය, දර්ශනීය වැව් යනාදියෙන් වටවූ අනන්‍ය හා මනරම් මණ්ඩපයක් ලෙස දක්ෂිණ මණ්ඩපය දිස්වන අතර ගොඩනැගිලිවල ඉහළ සිට අවට පරිසරය නරඹන විට දිස්වනුයේ ක්ෂිතිජය දක්වා දිවෙන ඉසිඹුවක් ලද හැකි දර්ශනයකි. මෑතක දී ගොඩනඟන ලද හම්බන්තොට වරාය, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ හා අගනුවර වෙත යා කෙරෙන දක්ෂිණ අධිවේගී මාර්ගය හේතුවෙන් මෙය දේශීය මෙන්ම විදේශීය සිසුන්ට සිය උපාධි පාඨමාලා හැදෑරීම සඳහා වඩාත් යෝග්‍ය විශ්වවිද්‍යාල මණ්ඩපයකි.

ඉහල ඉල්ලුමක් සහිත උපාධි පාඨමාලා පිරිනමන මෙම මණ්ඩපය වර්තමානයේ දී පරිගණක පීඨය හා නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය නමින් පීඨ දෙකකින් සමන්විත වේ. මණ්ඩපය විසින් ලබාදෙන නේවාසිකාගාරවල සිට අධ්‍යාපන කටයුතුවල නිරත වන සිසුන් සංඛ්‍යාව ආසන්න වශයෙන් සියයක් පමණ වේ. කැඩෙට් නිලධාරීන් මෙන්ම සිවිල් සිසුන් යන දෙපිරිසම විශ්වවිද්‍යාල මණ්ඩපය තුළ සුහද වාතාවරණයක අන්‍යෝන්‍ය අවබෝධයෙන් හා සෘහදත්වයෙන් අධ්‍යාපන කටයුතුවල නිරත වෙති.

පුස්තකාල පහසුකම්, නවීනතම උපකරණවලින් සමන්විත පරිගණක විද්‍යාගාර, අවශ්‍ය සියළු උපකරණවලින් සමන්විත වාස්තු විද්‍යාත්මක කුටි සේම අවශ්‍ය කරන ක්‍රීඩා හා විනෝදාස්වාද පහසුකම්ද සිසු ප්‍රජාව වෙත සැපයෙන අතර එහි අවසාන ප්‍රතිඵලය වනුයේ සමබර පුද්ගලයෙකු බිහිකිරීමට අවශ්‍ය කරන ගුණාත්මක තෘතීය අධ්‍යාපනයක් සිසුන් වෙත පිරිනැමීම වේ.

දක්ෂිණ මණ්ඩපය පීඨ දෙකකින් (02) සමන්විත වේ.

- නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය
- පරිගණක පීඨය

ප්‍රධාන තනතුරුවල සිදුවී ඇති වෙනස්කම් (හමුදා/ අධ්‍යයන කාර්ය මණ්ඩල)

පත්වීම්වල සිදුවී ඇති වෙනස්කම්	පත්වීම් දිනය	ශ්‍රේණිය	නම
ව්‍යාපෘති නිලධාරී	2020 පෙබරවාරි 22	ලුතිනන්	එච්.එම්.පී.ගුණරත්න
මණ්ඩප ප්‍රධානී	2020 මාර්තු 03	බ්‍රිගේඩියර්	ඊ්.ඒ.ඩී.පී.එදිරිසිංහ psc
සහකාර පුස්තකාලයාධිපති (තාවකාලික)	2020 අප්‍රේල් 01	-	පී.කේ.විජේසේකර මිය
35වන භට කණ්ඩායම් ඇතුළත් කරගැනීම කෘෂිකර්ම නිලධාරී	2020 ජූනි මස 12 2020 ජූනි මස 17	පියාසර ලුතිනන්	කේ.සී.පී.බණ්ඩාර ශ්‍රී ලංකා ගුවන් හමුදාව
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පීඨාධිපති - ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන	2020 සැප්තැම්බර් 16	කොමාන්ඩර්	(ASW) න්.ඒ.සී.සී.මුණසිංහ USP psc
සහකාර ව්‍යාපෘති නිලධාරී	2020 සැප්තැම්බර් 17	ලුතිනන්	ඩබ්.ඒ.එස්.ටී.වීරසිංහ මයා
ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී	2020 සැප්තැම්බර් 25	මේජර්	ජේ.ඩබ්.කේ.ගමගේ GW
සහායක නිලධාරී	2020 සැප්තැම්බර් 25- 2020 ඔක්තෝම්බර් 24	මේජර්	ඩබ්.ඒ.ඒ.පී. ගුණතිලක RSP psc Lsc
කාන්තා භට කමාන්ඩර්	2020 ඔක්තෝම්බර් 24	කැප්ටන්	පී.එම්.ගමගේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකාය

නව බඳවාගැනීම් (හමුදා/අධ්‍යයන කාර්ය මණ්ඩල)

නම	පත්වීම් දිනය	තනතුර
එච්.එම්.එල්.බී.ජයතිලක මයා	2020 ජූනි මස 09	කණිෂ්ඨ උපදේශක
එස්.එම්.එම්.සන්ජනී මෙය		
ඩී.එම්.වරකාගොඩ මෙය		
එච්.ඒ.එන්.ඉෂාර මයා	2020 සැප්තැම්බර් මස 02	ජාල පරිපාලක - II පංතිය

යටිතල පහසුකම් සංවර්ධනය/ නව ව්‍යාපෘති

අනු අංකය	යටිතල පහසුකම් සංවර්ධනය/ නව ව්‍යාපෘති	ස්ථානය	පිරිවැය (රු.)	නිමකිරීමට අපේක්ෂිත දිනය	ප්‍රතිඵල
01	පරිගණක පීඨයේ ගොඩනැගිල්ල	දක්ෂිණ මණ්ඩපය	මිලියන250	2021 පෙබරවාරි	පරිගණක පීඨයේ සිසුන්ගේ අධ්‍යයන

				28 (II අදියර)	කටයුතු පැවැත්වීම
02	යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය - පරිශීලකයන් සඳහා නවීන පහසුකම් සැපයීමේ මූලාරම්භය	දක්ෂිණ මණ්ඩපයේ පුස්තකාලය	මිලියන 1.8	2021 පෙබරවාරි මස 31	පහසුකම් වැඩිදියුණු කිරීමත් සමඟ, සිසුන් හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පහත පහසුකම් ලබාගත හැකි වනු ඇත. අ) ඊ-පහසුකම් සෝදිසි කර ලබාගැනීමේ හැකියාව. ආ) ඔවුන්ගේ පර්යේෂණ හා අධ්‍යයන අවශ්‍යතා සඳහා සුවිශේෂීවන ලිපි හා පර්යේෂණ පත්‍රිකා ඉල්ලුම පරිදි ලබා ගැනීම. ඇ) පුස්තකාලයෙන් ස්වකීය ලැප්ටොප් පරිගණකය හරහා තොරතුරු වෙත ප්‍රවේශය.
03	කාර්ය මණ්ඩල සඳහා නවාතැන් සංකීර්ණය (බිම් මහල)	දක්ෂිණ මණ්ඩපයේ නිලධාරීන්ගේ හමුදා නිවස්න ප්‍රදේශය	මිලියන 24.5	2020 ජූලි 17	මණ්ඩපයේ විධායක නිලධාරීන් සඳහා එක් නවාතැන් ප්‍රදේශයක් සඳහා පහසුකම් සැලසීම
04	ජලය රැස් කිරීමේ සම්ප් පහසුකම	දක්ෂිණ මණ්ඩපය	මිලියන 7.44	2020 ජූලි 17	මණ්ඩපය තුළ ජල සැපයුම ඒකාකාරී අයුරින් පවත්වා ගැනීම
05	පිහිනුම් තටාකය	දක්ෂිණ මණ්ඩපය	මිලියන 35	අඛණ්ඩව කෙරීගෙන යෑමට නියමිත ය.	දක්ෂිණ මණ්ඩපයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, උපාධි අපේක්ෂක සිසුන්ගේ පිහිනුම් කුසලතා වැඩි දියුණු කිරීම, පිහිනුම් තටාක පහසුකම් බාහිර පාර්ශව වෙත ලබාදීමෙන් අමතර ආදායමක් ඉපැයීම

06	පුස්තකාලයේ මාර්ගගත පහසුකම් නාමාවලි පද්ධතිය සම්පූර්ණ කිරීමේ නව ව්‍යාපෘතිය (KOHA software) (මෙම පද්ධතිය කොඅාවි පුස්තකාල ජාලය සඳහා අලුතින් හඳුන්වා දී ඇත)	දක්ෂිණ මණ්ඩපයේ පුස්තකාලය	-	2020 ඔක්තෝම්බර් 31	මෙම මෘදුකාංගය ඔස්සේ පරිශීලකයන්ට කොඅාවි පුස්තකාල ජාලයේ නාමාවලිය වෙත කෙටි කාලයකින් ප්‍රවේශ වී පුස්තකාලයේ භෞතිකව ඇති පහසුකම් පිළිබඳ තොරතුරු ලබාගත හැකිය.
07	මාර්ගගත පුස්තකාල කළමනාකරණ පද්ධතියට පසුගිය විභාග ප්‍රශ්නපත්‍ර අප්ලෝඩ් කිරීමේ නව ව්‍යාපෘතිය	දක්ෂිණ මණ්ඩපයේ පුස්තකාලය	-	2020 ඔක්තෝම්බර් 31	මෙම මෘදුකාංගය ඔස්සේ කොඅාවි සියලුම පීඨ විසින් මීට පෙර පවත්වන ලද විභාගවලට අදාළ පසුගිය ප්‍රශ්නපත්‍ර වෙත ඊ-ප්‍රශ්නපත්‍ර ආකාරයට ප්‍රවේශ වී බාගත කිරීමේ හැකියාව පවතී.
08	මහා පරිමාණ වගා ව්‍යාපෘතිය	දක්ෂිණ මණ්ඩපය	-	අඛණ්ඩව කෙරීගෙන යෑමට නියමිත ය.	පශ්චාත් වසංගත කාල සීමාවේ දී රට තුළ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාලීම සඳහා සහයෝගීව කටයුතු කිරීම
09	හරසර අලෙවිසැල	දක්ෂිණ මණ්ඩපය - නවාතැන් ප්‍රදේශය	-	2020 ඔක්තෝම්බර් 31	සාධාරණ මිල ගණන් යටතේ සිසුන්ගේ ආහාර හා වෙනත් විවිධ අවශ්‍යතා සපුරාගැනීම සඳහා පහසුකම් සැලසීම

කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්

- පුහුණු කිරීමේ කණ්ඩායමේ අධිකාරිලත් නිලධාරීන් හා සෙසු නිලවල උපදේශකයන් හා කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා පුහුණු කිරීමේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා විශේෂ පුහුණු වැඩසටහනක් 2020 අප්‍රේල් 01 -10 දක්වා පැවැත්විණි.
- කෘෂිකාර්මික ඵලදායිතාවය ඉහළ නැංවීම පිළිබඳ විශේෂ වැඩමුළුවක් 2020 මැයි 28වන දින හම්බන්තොට දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් ප්‍රධානත්වය දැරූ විශේෂඥ කණ්ඩායමක් විසින් පවත්වන ලදී.
- මාටින් වික්‍රමසිංහ ශූරීන්ගේ සාහිත්‍ය කෘතිවල සුවිශේෂී සලකුණු මැයෙන් වූ වැඩමුළුවක් මාටින් වික්‍රමසිංහ පදනම විසින් කොඅාවි දක්ෂිණ මණ්ඩපයේ දී 2020 අගෝස්තු 14 හා 15යන දෙදින පවත්වන ලදී.
- ‘‘සන්නද්ධ හමුදා ක්ෂේත්‍රය තුළ වෘත්තීය සංවර්ධනය හා අධ්‍යයන ජයග්‍රහණ’’ යන මාතෘකාව යටතේ ආරාධිත දේශනයක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ රියර් අද්මිරාල් සිසිර ජයකොඩි මහතා විසින් 2020 අගෝස්තු 27 වන දින පවත්වන ලදී.

පුහුණු කටයුතු සඳහා දායකත්වය

- තොරතුරු තාක්ෂණ/ තොරතුරු පද්ධති අධ්‍යයනාංශයේ 37වන ඇතුළත් කරගැනීමේ සිසුන් සඳහා පුස්තකාල අනුගතවීමේ වැඩසටහන දක්ෂිණ මණ්ඩපයේ සහකාර පුස්තකාලයාධිපති විසින් 2020 පෙබරවාරි 12වන දින පවත්වන ලදී.
- ප්‍රමාණ සමීක්ෂණ අධ්‍යයනාංශයේ 37වන ඇතුළත් කරගැනීමේ සිසුන් සඳහා පුස්තකාල අනුගත වීමේ වැඩසටහන දක්ෂිණ මණ්ඩපයේ සහකාර පුස්තකාලයාධිපති විසින් 2020 පෙබරවාරි 19වන දින පවත්වන ලදී.
- මැනුම් විද්‍යා අධ්‍යයනාංශයේ 37වන ඇතුළත් කරගැනීමේ සිසුන් සඳහා පුස්තකාල අනුගතවීමේ වැඩසටහන දක්ෂිණ මණ්ඩපයේ සහකාර පුස්තකාලයාධිපති විසින් 2020 මාර්තු 04වන දින පවත්වන ලදී.
- 35වන ඇතුළත් කරගැනීමේ මැනුම් විද්‍යා සිසුන් සඳහා තොරතුරු සාක්ෂරතාවය (පර්යේෂණ ක්‍රමවේද මොඩියුලය යටතේ) මැයෙන් වූ දේශනය දක්ෂිණ මණ්ඩපයේ සහකාර පුස්තකාලයාධිපති විසින් 2020 ජූනි 26වන දින පවත්වන ලදී.
- සියලු ඇතුළත් කරගැනීම් කණ්ඩායම්වල කැඩෙට් නිලධාරීන් සඳහා සජීව වෙඩිතැබීමේ පුහුණුවක් 2020 ජූලි 05වන දින පානලුව වෙඩිතැබීමේ පරිශ්‍රයේ දී සිදු කෙරිනි.
- සියලු ඇතුළත් කරගැනීම් කණ්ඩායම්වල කැඩෙට් නිලධාරීන්ගේ දරාගැනීමේ හැකියාව හා ඔරොත්තු දීමේ ශක්තිය වැඩිදියුණු කිරීමේ අභිලාෂයෙන් වාර්ෂික වෙරළ පාගමන 2020 සැප්තැම්බර් 06වන දින පවත්වන ලදී. ආසන්න වශයෙන් කිලෝ මීටර් 14ක පමණ දුරක් ආවරණය කරමින් හම්බන්තොට ප්‍රදේශයේ ගොඩවාය වෙරළින් ආරම්භ කළ මෙය අවසාන වූයේ කළමැටියාව වෙරළිනි.
- දක්ෂිණ මණ්ඩපයේ 1වන හා 2වන අධ්‍යයන වාර වල කැඩෙට් නිලධාරී සිසුන් සඳහා වූ Eight Mile runs වැඩසටහන 2020 මාර්තු 01වන දින හා ඔක්තෝම්බර් 11වන දින පැවැත්විණි.
- 35වන ඇතුළත් කරගැනීමේ ප්‍රමාණ සමීක්ෂණ සිසුන් සඳහා තොරතුරු සාක්ෂරතාවය මැයෙන් වූ දේශනය දක්ෂිණ මණ්ඩපයේ සහකාර පුස්තකාලයාධිපති විසින් 2020 ඔක්තෝම්බර් 8, 29 වන දිනවලදී හා නොවැම්බර් 05වන දින පවත්වන ලදී.
- කැඩෙට් නිලධාරීන් සඳහා වූ සම්මත හමුදා පුහුණුව නියමිත පරිදි පවත්වන ලදී.

විශේෂ සිදුවීම්/ උත්සව

සිදුවීම/ උත්සවය	දිනය
දක්ෂිණ මණ්ඩපය වෙත පැමිණි කොආවි උපකුලපතිතුමා එහි සිසුන් හා කාර්ය මණ්ඩලය අමතන ලදී.	2020 ජූලි 17
කොආවි, දක්ෂිණ මණ්ඩපය විසින් උපකුලපතිවරු හා අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ (CVCD) 432වන රැස්වීම පැවැත්වීම සඳහා අනුග්‍රාහකත්වය දක්වන ලදී.	2020 අගෝස්තු 01
කොආවි දක්ෂිණ මණ්ඩපයේ කැඩෙට් නිලධාරීන් සඳහා පත්වීම් ප්‍රදාන උත්සවය	2020 සැප්තැම්බර් 18
වාර්ෂික මණ්ඩප පාගමන සියලුම සිසුන්, සන්නද්ධ හමුදා හා හමුදා නොවන කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් සූරියවැව සිට කිරිඉබ්බන්ආර වැව දක්වා පැවැත්විණි.	2020 සැප්තැම්බර් 19
36වන ඇතුළත් කරගැනීමේ උපාධි අපේක්ෂ සිසුන් විසින් සංවිධානය කළ ඇතුළත් කරගැනීමේ කණ්ඩායම් අතර වූ අන්තර් බැඩ්මින්ටන් ශූරතාවලිය	2020 ඔක්තෝම්බර් 08
36වන ඇතුළත් කරගැනීමේ ප්‍රමාණ සමීක්ෂණ සිසුන් විසින් සංවිධානය කළ ඇතුළත් කරගැනීමේ කණ්ඩායම් අතර වූ අන්තර් වොලිබෝල් ශූරතාවලිය	2020 ඔක්තෝම්බර් 12
37වන ඇතුළත් කරගැනීමේ තොරතුරු තාක්ෂණ සිසුන් විසින් සංවිධානය කළ	2020 ඔක්තෝම්බර්

පැදුර විනෝදාස්වාද වැඩසටහන	22
දක්ෂිණ මණ්ඩපයේ නික්මයෑමේ කණ්ඩායම් සඳහා සමුගැනීමේ උත්සවය	2020 දෙසැම්බර් 11
කැඩෙට් නිලධාරින් සඳහා හමුදා නිවස්නයේ රාත්‍රිය (The Mess Night)	2020 දෙසැම්බර් 18

මූල්‍ය කටයුතු

විශ්ව විද්‍යාල අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පෙළ පොත් මිලට ගැනීම

අනු අංකය	පොත් වර්ගය	වැය වූ මුදල (රු.)
01	දේශීය සැපයුම්කරුවන්ගෙන් පොත් මිලදී ගැනීම	1,212,234.20
02	බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය- 2020 හිදී පොත් මිලදී ගැනීම	377,252.20
03	Taylor & Francis වෙතින් ඊ-පොත් සඳහා මාර්ගගතව ප්‍රවේශ වීමේ සඳහා දායකත්ව මුදල්	(ඇ.ඩො.4000) 744,000.00
	එකතුව	**2,333,486.40**

සඟරා මිලදී ගැනීම

අනු අංකය	සඟරාවේ නම	වැය වූ මුදල (රු.)
01	Wallpaper	63,000.00
02	The Architectural Review	63,000.00
03	Readers Digest	60,000.00
	එකතුව	**186,000.00**

ආදායම

අනු අංකය	ආදායම් ප්‍රභවය	ආදායම (රු.)
1	පුස්තකාල දඩ මුදල්	470.00
2	පුස්තකාලයෙන් ලබාදෙන කාඩ්පත් නැතිවී නැවත ලබාගැනීමේ දී අයකරන මුදල	900.00
	එකතුව	**1,370.00**

ආයතනික සමාජ වගකීම් වැඩසටහන්

දක්ෂණ මණ්ඩපයේ ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයන අධ්‍යයනාංශය විසින් ජනවාරි 22වන දින කිරිඉබ්බන්ආර බණ්ඩාරනායක විද්‍යාලයේ උසස්පෙළ පංතිවල සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් හා නායකත්ව වැඩමුළුවක් සංවිධානය කරන ලදී.

කාර්ය මණ්ඩලය විසින් හදාරා නිමකළ පශ්චාත් උපාධි හා ඩිප්ලෝමා පාඨමාලා

අනු අංකය	නම	ක්‍රියාකාරකම	ආයතනය	පැවැති කාල සීමාව
01	පී.කේ.විජේසේකර මිය/ අධ්‍යයන	පුස්තකාල හා තොරතුරු විද්‍යා	කොළඹ විශ්වවිද්‍යාලය	2015/2017 (බලාත්මක

		ශාස්ත්‍රපති උපාධිය		දිනය: 2020 අප්‍රේල් 01)
02	පී.කේ.විජේසේකර මිය/ අධ්‍යයන	FDP on Skills for Librarianship නැමති මාර්ගගත පාඨමාලාව	ඉන්දියාවේ, බෙන්ගලූරුහි LIS Academy සහ NCSI NET Foundation	2020 මැයි 16 - ජූනි 21 දක්වා
03	ඩබ්.පී.අයි.එම්.වර්ණසූරිය/ ලිපිකරු	පුස්තකාල හා තොරතුරු විද්‍යා උසස් ඩිප්ලෝමාව	ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (SLLA)	(බලාත්මක දිනය: 2020 අගෝස්තු 28)
04	එම්.ඒ.එම්.එච්.මාහරණ මෙය/ ලිපිකරු	ලේඛන හා ජනසන්නිවේදන ඩිප්ලෝමාව	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	2020 ඔක්තෝම්බර් 04
05	ඒ.ජී.කේ.එම්.ඩබ්.එස්.අතපත්තු මිය/ පරිපාලන	පරිසර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	කොළඹ විශ්වවිද්‍යාලය	2020 දෙසැම්බර් 31

පර්යේෂණ හා ප්‍රකාශන

අනු අංකය	කර්තෘ	පර්යේෂණ මාතෘකාව	ප්‍රකාශයට පත්කරන ලද ස්ථානය	ප්‍රකාශයට පත්කළ දිනය
01	පී.කේ.විජේසේකර	Access subscribed databases behind the Library wall during the COVID 19 මැයෙන් වූ විශ්වවිද්‍යාල පුස්තකාලය ආශ්‍රිත සිද්ධි අධ්‍යයනය	සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පිළිබඳ 8වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණය,ගෝල්ෆේස් හෝටලය, කොළඹ, ශ්‍රී ලංකාව	2020 දෙසැම්බර් 17

2.3 ප්‍රතීතන ප්‍රදානය ලද හමුදා ආයතන

2.3.1 ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය



යුද හමුදා අණ හා මාණ්ඩලික විද්‍යාලය, සිසු නිලධාරීන් 26දෙනෙකුගෙන් සමන්විතව 1998 මාර්තු 16වන දින ආරම්භ කරන ලදී. එසේ වුවද එම විද්‍යාලය නිලවශයෙන් ආරම්භ වූයේ 1998 අගෝස්තු මස 28වන දිනයේ දීය. ලෝකයේ බොහෝ හමුදා විසින් අනුගමනය කරන පරිද්දෙන් සියලුම සන්නද්ධ හමුදා අංශ හා ක්‍රමෝපායික මට්ටමේ සැලසුම් හා ඉගැන්වීම් එකම ස්ථානයක දී සිදුකරන ආකාරයට, 2007 ජනවාරි මස 22වන දින ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය ස්ථාපනය කරන ලදී.

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, සපුගස්කන්ද:

- ආරක්ෂක හා ක්‍රමෝපාය අධ්‍යයනය විද්‍යාපති උපාධිය

2.3.2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය, දියතලාව



දියතලාවේ පිහිටා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය, කැඩෙට් නිලධාරීන් බඳවා ගැනීමේ සිට පදවි ප්‍රදානය දක්වා පුහුණු කරන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රමුඛතම පුහුණු ආයතනය වේ. ඌව පළාතේ දියතලාව ප්‍රදේශයේ මෙය පිහිටා ඇති අතර මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ සුවදායි කාලගුණයකට හිමිකම් කියන ප්‍රදේශයකි. පිරිමි කැඩෙට් නිලධාරී පුහුණු පාඨමාලාව මෙම විද්‍යා පීඨය විසින් වසර 02 මාස 09ක දිගු කාලසීමාවක් දක්වා පවත්වන අතර ස්වේච්ඡා කණ්ඩායම්, කාන්තා ඇතුළත් කරගැනීම්, සෘජුව බඳවාගන්නා නිලධාරීන් හා කොඅාවි කැඩෙට් නිලධාරීන් සඳහා අඩු කාල සීමාවක් තුළ පැවැත්වෙන පාඨමාලා පවත්වනු ලැබේ.

ශ්‍රී ලංකා යුධ හමුදා විද්‍යා පීඨය විසින් 1999 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ සබරගමු විශ්වවිද්‍යාලය සමඟ එක්වී දිගු කාලීන පාඨමාලා හදාරන කැඩෙට් නිලධාරීන් සඳහා විද්‍යාවේදී මිලිටරි අධ්‍යයන උපාධිය හඳුන්වා දුන් අතර එහි අරමුණු වූයේ ඔවුන් සඳහා පිළිගත් අධ්‍යයන සුදුසුකමක් ප්‍රදානය කිරීමයි. එහි ප්‍රථම අධ්‍යක්ෂ - අධ්‍යයන ලෙස කටයුතු කළ ලුතිනන් කර්නල් (විශ්‍රාමික) ඒ.ඒ.ද අල්විස් SLSR මහතාගේ සංකල්පයකට අනුව මෙම උපාධි පාඨමාලාව ආරම්භ විය. 2011 වර්ෂයේ දී මෙම ඇකඩමිය විසින් පිරිනමනු ලැබූ උපාධිය, ත්‍රිවිධ හමුදාවල අධ්‍යයන විෂයමාලා පාලනය කරන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් ප්‍රතීතනය කරන ලදි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදා විද්‍යා පීඨය, දියතලාව:

- හමුදා අධ්‍යයන විද්‍යාවේදී උපාධිය

2.3.3 නාවික හා සාගරික විද්‍යා පීඨය



1967 ජනවාරි මස 15වන දින නාවික හා සාගරික විද්‍යා පීඨය එය දැනට පිහිටා ඇති පරිශ්‍රයේ ස්ථාපනය කරන ලද අතර ඉන් අනතුරුව නිලවශයෙන් ආරම්භ කරන ලද්දේ 1967 ජූලි මස 15වන දිනයේ දීය. වෙනත් ඕනෑම හමුදා ආයතනයකට නොදෙවෙනි ආකාරයෙන් නාවික හා සාගරික විද්‍යා පීඨය විසින් නාවික හමුදාවේ අවශ්‍යතානුකූලව නිලධාරීන් හා නාවිකයන් විශාල පිරිසක් පුහුණු කරවමින් ස්වකීය ශක්තිය සනාථ කර තිබේ.

නාවික හා සාගරික විද්‍යා පීඨය ජාත්‍යන්තර ප්‍රමිතීන් ලබාගැනීම සඳහා ද අඛණ්ඩ උත්සාහයක නිරත වන අතර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රදානය කරන ISO 9001:2000 තත්ත්ව කලමනාකරණ පද්ධති සහතිකය 2007 වර්ෂයේ දී හිමිකරගන්නා ලදී. ඉන් අනතුරුව 2010 වර්ෂයේ දී ISO 9001:2008 හා 2016 වර්ෂයේ දී ISO 9001:2015 තත්ත්ව සහතිකය ලබා තත්ත්ව සහතික කටයුතුවල වැඩිදියුණු වීමක් සිදුවිය. වසර ගණනාවක් මුළුල්ලේ මෙම ආයතනය විසින් සිදුකළ අනගිභවනීය සේවය ඇගයීමක් ලෙස 2003 වර්ෂයේ දී නාවික හා සාගරික විද්‍යා පීඨයට ජනාධිපති වර්ණ හිමිවිය.

නාවික හා සාගරික විද්‍යා පීඨය, ත්‍රිකුණාමලය:

- කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිය
- ආරක්ෂක කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- නාවික අධ්‍යයන පිළිබඳ විද්‍යාවේදී උපාධිය
- නාවික හා සමුද්‍රීය අධ්‍යයන විද්‍යාවේදී උපාධිය
- නාවික කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය

2.3.4 ශ්‍රී ලංකා ගුවන් හමුදා ඇකඩමිය, ත්‍රිකුණාමලය චීන වරාය



නැගෙනහිර පළාතේ විශාලතම ගුවන් කඳවුර වන ත්‍රිකුණාමලයේ චීන වරායේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා ඇකඩමිය සතුව මහා පරිමාණ ගුවන් මෙහෙයුම් මෙහෙයවීමේ ධාරිතාවය පවතී. මෙම ගුවන් කඳවුර සැලකිය යුතු ගුවන් ආරක්ෂාවක් සමඟ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමුඛතම මෙහෙයුම් මධ්‍යස්ථානය බවට පරිවර්තනය කිරීමේ කටයුතු දැනට සිදුවෙමින් පවතී. එසේම ගුවන් පියාසර පුහුණු පක්ෂාංගය ද වෙනත් ස්ථානයක ස්ථානගත කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

1976 වර්ෂයේ දී මෙම ඇකඩමිය ස්ථාපනය කිරීමේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ගුවන්හමුදා නිලධාරීන්

පුහුණු කිරීමට අදාළ ප්‍රමුඛතම ස්ථානය ත්‍රිකුණාමලය චීන වරායේ පිහිටි මෙම ශ්‍රී ලංකා ගුවන් හමුදා ඇකඩමිය වේ.

ශ්‍රී ලංකා ගුවන් හමුදා ඇකඩමිය, ත්‍රිකුණාමලය චීන වරාය:

- ආරක්ෂක කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- විද්‍යාවේදී ගුවන්යානා සේවා අධ්‍යයන උපාධිය

2.3.5 යුද්ධ හමුදා භට කාර්ය සම්පාදන විද්‍යාලය - ත්‍රිකුණාමලය:



යුද්ධ හමුදා භට කාර්ය සම්පාදන විද්‍යාලය 2011 මැයි මස 09වන දින ආරම්භ කරන ලද්දේ දිගු කාලයක සිට පැවැති අවශ්‍යතාවයක් වන කාර්ය සම්පාදන සැලසුම් හා කළමනාකරණයේ නව්‍ය න්‍යායාත්මක කරුණු හා පරිචයන් සම්බන්ධයෙන් දැනීමක් සහිත කාර්යසම්පාදන නිලධාරීන්ගේ නවමු ප්‍රබෝධයක් ඇති කිරීම පිණිස වේ. මෙම යුද්ධ හමුදා භට කාර්ය සම්පාදන විද්‍යාලය විසින් ප්‍රධාන පාඨමාලා තුනක් මෙහෙයවනු ලැබේ. එනම් කාර්ය සම්පාදනය පිලිබඳ මාණ්ඩලික පාඨමාලාව, කණිෂ්ඨ නිලධාරීන්ගේ කාර්ය සම්පාදන පාඨමාලාව හා ජ්‍යෙෂ්ඨ අධිකාරීලත් නිලධාරීන්ගේ කාර්ය සම්පාදන පාඨමාලාව වශයෙනි.

යුද්ධ හමුදා භට කාර්ය සම්පාදන විද්‍යාලය, ත්‍රිකුණාමලය:

- කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිය

2.3.6 නාවික ශිල්පීය පුහුණු ආයතනය, වැලිසර:



නිපුණතා සපිරි නිලධාරීන් ඉංජිනේරු හා විදුලි ඉංජිනේරු අංශවල ජාතික ඩිප්ලෝමා මට්ටම දක්වා පුහුණු කිරීමේ කාර්යය සිදුකළ හැකි ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රමුඛතම තාක්ෂණික පුහුණු ආයතනය වනුයේ නාවික ශිල්පීය පුහුණු ආයතනයයි. තත්ත්ව කළමනාකරණ පද්ධති ISO 9001:2008/SLS ISO 9001:2008හි අවශ්‍යතාවලට අනුකූලව පුහුණු කටයුතු සිදුවන බව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් සහතික කර තිබේ. නිපුණතාවයෙන් හෙබි ආධුනික නිලධාරීන් සඳහා මෙම ආයතනය විසින් වසර තුනක තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවක් පවත්වනු ලැබේ. 2013.06.10 දින පැවති කොආවි කළමනාකරණ මණ්ඩලයේ 551වැනි රැස්වීම් වාරයේ දී මෙම වැඩසටහන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සඳහා අනුබද්ධ/ප්‍රතීතනය කර තිබේ.

<u>නාවික ශිල්පීය පුහුණු ආයතනය, වැලිසර:</u>

• ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව

<u>2.3.7 හෙද පුහුණු විදුහල, වැලිසර:</u>



2015.08.21 දින පැවති කොඅාවි කළමනාකරණ මණ්ඩලයේ 569වැනි රැස්වීම් වාරයේ දී ද්වි අවුරුදු හෙද ඩිප්ලෝමාව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සඳහා අනුබද්ධ/ප්‍රතීතනය කර තිබේ. මෙම ද්වි අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව ඔස්සේ වසර 05ක් පලපුරුද්ද සහිත නාවිකයන්, වෛද්‍ය සහායකයන් ලෙස පුහුණු කිරීමට යෝජනා කරන අතර එතුළින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ වෛද්‍ය අංශයේ වෘත්තීය හෙද නිලධාරියෙකු ලෙස සේවය කිරීමට අවශ්‍ය කරන දැනුම, කුසලතා හා ආකල්ප ලබා දේ.

හෙද පුහුණු විදුහල, වැලිසර:

• හෙද ඩිප්ලෝමාව

2.4 මධ්‍යස්ථාන/ඒකක

2.4.1 පීඨාධිපති කාර්යාලය - පර්යේෂණ හා සංවර්ධන

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් විශේෂයෙන් විශ්වවිද්‍යාලය තුළ හා සමස්තයක් ලෙස රට තුළ පර්යේෂණ අවකාශය ශක්තිමත් කිරීම සඳහා ප්‍රයත්න දරනු ලැබේ. මෙම ප්‍රයත්නයේ දී, ආයතනික මට්ටමින් පර්යේෂණ කටයුතු ක්‍රමානුකූලව සිදුකිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා පීඨාධිපති - පර්යේෂණ හා සංවර්ධන තනතුරක් ඇති කිරීම ඔස්සේ කොආවි මෙරට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ මූලිකත්වය ගෙන තිබේ. පර්යේෂක ප්‍රජාවන් අතර බහුලව සංසරණය වන ජර්නල්වල (high impact journals) ප්‍රකාශයට පත් කිරීම, දේශීය හා විදේශීය පර්යේෂණ කණ්ඩායම්/ ආයතන සමඟ සහයෝගිතා ඇතිකර ගැනීම හා පර්යේෂණ අධ්‍යයන වාණිජකරණය සඳහා කොආවි පර්යේෂණ දායක වේ. ඒ අනුව, කෙටි කාලීන හා දිගු කාලීන පර්යේෂණ ප්‍රදාන, ජාත්‍යන්තර සමූළු සඳහා සහභාගී වීමට අවශ්‍ය කරන මූල්‍ය ප්‍රදාන, high impact open access journalsහි පර්යේෂණ පත්‍රිකා පළකිරීම වෙනුවෙන් දීමනා, පර්යේෂණ විශිෂ්ටතා සම්මාන පිරි නැමීම් හඳුන්වාදීම වැනි බහුආංශික දිරිගැන්වීම ඔස්සේ කොආවි කාර්ය මණ්ඩලය පර්යේෂණවල නිරත වීම දිරිගැන්වීම සිදු කෙරේ.

පීඨාධිපති, පර්යේෂණ හා සංවර්ධන - මහාචාර්ය සී.එල්.ගුණසේකර

නව ව්‍යාපෘති

සමාලෝචිත වසර තුළ කොආවි සඳහා පහත දැක්වෙන මූල්‍ය ආධාර යෝජනා ක්‍රම හඳුන්වා දී තිබේ.

I. **පර්යේෂණ ප්‍රදාන:**
කොආවි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදුකරන පර්යේෂණ කාර්යය සඳහා සහාය ලබාදීමේ අරමුණින් මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දී තිබේ. වසර 03ක කාල සීමාවක් සඳහා රුපියල් මිලියන 2ක උපරිමයක් දක්වා වන ප්‍රදානයක් මෙමඟින් පිරිනැමේ. සෑම වර්ෂයකදීම මෙම පර්යේෂණ ප්‍රදාන ඉල්ලුම් කිරීමට අදාළව දැන්වීමක් ප්‍රසිද්ධියට පත් කෙරේ.

II. **ඉහල බලපෑමක් ඇති ජර්නල්වල පළ කිරීම සඳහා සහාය ලබාදීමේ ක්‍රමවේදය:**
කොආවි අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකරන පර්යේෂණ ප්‍රතිඵල ඉහල බලපෑමක් ඇති ජර්නල්වල පළ කිරීම සඳහා සහාය ලබාදීම සඳහා මෙම ක්‍රමවේදය හඳුන්වා දෙනු ලැබීය. එවැනි ජර්නලයක පළ කිරීම සඳහා වැයවන ප්‍රකාශන ගාස්තුව ප්‍රතිපූරණය කරනු ලබන්නේ අදාළ විෂය ක්ෂේත්‍රය සඳහා වන අවම ප්‍රතිඵල සාධකයකට යටත්ව එක් අධ්‍යයන සාමාජිකයෙක් සඳහා වර්ෂයකට ඇමරිකන් ඩොලර් 2000ක් වශයෙනි.

III. **පර්යේෂණ විශිෂ්ටතා සම්මාන:**
සක්‍රීයව පර්යේෂණ කටයුතුවල නිරත වී සිටින අධ්‍යයන කාර්ය මණ්ඩල හා සිසුන් සඳහා ප්‍රසාදය පළ කිරීම සඳහා පර්යේෂණ විශිෂ්ටතා සම්මාන ප්‍රදානය හඳුන්වා ඇත. මේ සඳහා අයදුම්පත් කැඳවීම වාර්ෂිකව සිදුකරනු ලැබේ. මාර්ගෝපදේශවල දක්වා ඇති පරිදි, අධ්‍යයන කාර්ය මණ්ඩලවල හා සිසුන්ගේ පර්යේෂණ නිමැවුම් සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය ඔස්සේ ලකුණු පිරිනැමේ. අධ්‍යයන කාර්ය මණ්ඩල හා සිසුන් සඳහා නිශ්චිතව වෙන් වෙන්ව දක්වා ඇති පරිදි අවම ලකුණු ලබාගන්නා තැනැත්තන්, සම්මාන ප්‍රදානය සඳහා සලකා බැලීමට සුදුසුකම් ලබා ගනී.

IV. *කණිෂ්ඨ අධ්‍යයන කාර්යමණ්ඩල හා සිසුන් සඳහා පර්යේෂණ ලිවීම සම්බන්ධයෙන් සහාය ලබාදීමේ කවුළුවක් (Help-desk) ස්ථාපනය කිරීම*

නවක පර්යේෂකයන්ට ඔවුන්ගේ පර්යේෂණ ලේඛන ලිවීමේ දී (උදා. පර්යේෂණ ප්‍රදාන ලබාගැනීම සඳහා අයදුම්පත්, ජර්නර් ලිපි, පර්යේෂණ යෝජනා විධිමත් පරිදි සැකසීම යනාදිය) සහාය ලබාදීම සඳහා පීඨාධිපති - (පර්යේෂණ හා සංවර්ධන) කාර්යාලයේ සහාය කවුළුවක් ස්ථාපනය කර තිබේ. කොආවි ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත මණ්ඩලයක් අදාළ ලේඛන කටයුතු සඳහා උපදේශකත්වය සැපයීම සඳහා පත්කර තිබේ.

දැනට සිදුකෙරෙන ව්‍යාපෘති සඳහා සංශෝධන

V. සමූළු සඳහා සහභාගීවීම සඳහා ලබාදෙන සංශෝධිත මූල්‍යාධාර:

අධ්‍යයන කාර්ය මණ්ඩලය (හමුදා/සිවිල්) විසින් පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේදී හා දේශීය හා විදේශීය වශයෙන් පවත්වන වැඩමුළු/සම්මන්ත්‍රණ/ සමූළු/ සම්මේලන ආදියට සහභාගී වීමේදී මූල්‍යාධාර ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් 2011.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිද්දෙන් කොආවි විසින් ප්‍රතිපත්තිමය රාමුවක් අනුගමනය කරනු ලැබේ. මෙවැනි අවස්ථා සඳහා සහභාගීවීමේ දී ලබාදෙන සහාය පුළුල් කිරීමේ අරමුණින් එකී ප්‍රතිපත්ති රාමුව සංශෝධනය කර තිබේ. ඒ අනුව දේශීය හෝ විදේශීය සමූළු ආදී අවස්ථා සඳහා සහභාගී වීමේදී පිරිනමන මුදලේ උපරිම සීමාව පිළිවෙලින් රු. 35,000/- (වාර්ෂිකව) හා රු.500,000 (වර්ෂ 03කට වරක්) ලෙස වැඩිකර තිබේ. (මීට පෙර පිරිනැමූ ප්‍රදානය පිළිවෙලින් රු.25,000/- හා රු.100,000/-වේ).

පර්යේෂණ හා සංවර්ධන ඒකකය මඟින් සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ කටයුතු සඳහා ලබාදී ඇති සමස්ත ප්‍රතිපාදන

	සහභාගී වූ පිරිස/ අවස්ථා/ පත්‍රිකා (සංඛ්‍යාත්මකව)	**ප්‍රදානය කළ මුළු ප්‍රතිපාදන (රු.)**
කොආවි පර්යේෂණ ප්‍රදාන	15	21,705,550.00
ඉහල බලපෑමක් ඇති ජර්නල්වල පළකිරීම සඳහා මූල්‍ය සහාය ලබාදීම	3	354,804.00
සමූළු සඳහා සහභාගිත්වය	2	112,000.00
කොආවි මඟින් සම්පාදිත මුළු ප්‍රතිපාදනය		**22, 172, 354.00**

සමාලෝචිත වර්ෂයේ දී වෙනත් ප්‍රදාන මූලාශ්‍ර වලින් ලැබූ මුළු ප්‍රතිපාදන ප්‍රමාණය මෙසේය.

	සහභාගී වූ පිරිස/ අවස්ථා/ පත්‍රිකා (සංඛ්‍යාත්මකව)	**ප්‍රදානය කළ මුළු ප්‍රතිපාදන (රු.)**
වෙනත් රජයේ ප්‍රදාන	-	-
විදේශීය ප්‍රදාන හිමි බලපෑමක් ඇති ජර්නල්	1	7,411,315.00
කර්මාන්ත/ රාජ්‍ය නොවන ප්‍රදාන	23	2,445,975.00

කොඇවි අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදුකළ පර්යේෂණ ව්‍යාපෘති සඳහා වාර්ෂිකව වැයකර ඇති ප්‍රතිපාදන

වර්ෂය		*කොඇවි මඟින් මූල්‍යයනය කිරීම*	*වෙනත් - රජයේ මූලාශ්‍ර මඟින් මූල්‍යයනය කිරීම*	*විදේශීය මූලාශ්‍ර වලින් මූල්‍යයනය කිරීම්*	*කර්මාන්ත/ රජයේ නොවන ආයතන මඟින් මූල්‍යයනය කිරීම්*
2018	*වැයකළ මුළු මුදල*	-	*රු.* 2,943,268.34	*රු.* 15,248,201.69	*රු.* 1,601,460.51
	පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව	-	3	1	21
2019	*වැයකළ මුළු මුදල*	-	*රු.* 2,077,630.72	*රු.* 13,197,448.32	*රු.* 3,197,326.85
	පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව	-	3	1	20
2020	*වැයකළ මුළු මුදල*	*රු.* 1,707,000.48	*රු.* 427,900.8	*රු.* 11,161,927.24	*රු.* 2,023,792.10
	පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව	3	1	1	24

සමාලෝචිත වර්ෂයේ දී කොඇවි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂණ පත්‍රිකා එකතුව

පීඨය/ මධ්‍යස්ථානය/ඒකකය/	**ප්‍රකාශන වර්ගය**			
	ශ්‍රේණිගත සඟරා	**ශ්‍රේණිගත නොකළ සඟරා**	**සම්පූර්ණ සංවාද පත්‍රිකාව**	**සංවාද පත්‍රිකා උදෘත**
නීති පීඨය			15	
පරිගණක පීඨය	5	2	42	2
වෛද්‍ය පීඨය	26			27
කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය	5	1	22	2
ආරක්ෂක හා ක්‍රමෝපායික අධ්‍යයන පීඨය	1		13	
ඉංජිනේරු පීඨය	4		33	11
සමසෞඛ්‍ය විද්‍යා පීඨය	11	1		34
නිර්මිත පරිසරය හා අවකාශ විද්‍යා පීඨය	3		27	

උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන ආයතනනය (KDU-CARE)	1			
පුස්තකාලය				1
කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය	4			
එකතුව	**60**	**4**	**152**	**77**

පසුගිය වසර 05ක කාලසීමාව තුළ ප්‍රකාශන					
	2016	**2017**	**2018**	**2019**	**2020**
ජර්නල් ලිපි	57	56	66	35	64
සම්මේලන මුද්‍රිත වාර්තාවල පූර්ණ විස්තර ඇතුළත් පත්‍රිකා	15	13	26	20	152
සම්මේලන මුද්‍රිත වාර්තාවල සංක්ෂේප	164	161	164	173	77

කොඅාවි අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළ හිමිකර ගත් පේටන්ට් බලපත්‍ර

1. ජාතික පේටන්ට් බලපත්‍ර LK/P/1/19832 – An epitope-based vaccine target with viral neutralization potential for dengue disease.
2. ජාතික පේටන්ට් බලපත්‍ර LK/P/1/19833 – A diagnostic marker for specific identification of the four dengue viruses.
3. ජාතික පේටන්ට් බලපත්‍ර LK/P/1/ 17255 - Smart smoke detection and exhausting system for motor cars.

2020 වර්ෂය තුළදී කොඅාවි විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුම

විද්‍යා හා තාක්ෂණ සංවර්ධන නිමැවුම	**තත්ත්වය**		
	සංවර්ධනය කරන ලද	**පැවරීම**	**වාණිජකරණය/ ජනප්‍රියකරවීම**
විදුලියෙන් ක්‍රියාත්මක කළහැකි කාර්යය06කින් සමන්විත දැඩිසත්කාර ඒකක ඇඳ ***"MEDBED Ver 1.0" Intensive Care Unit Bed*** An Intensive Care Unit Bed with six electrically operatable functions.			√
පරිශීලක විසින් නිශ්චය කළහැකි පරිමාවක් හා වරණීය ප්‍රවාහ වේග සහිත වෙන්ටිලේටරය ***KDU Ventilator-2020 Ver. 1.0*** This is a pneumatically driven, time-cycled ventilator with user determined volume and flow rate selection capability.	√		
වීජන ක්‍රියාවලිය තුළදී සියලු වැදගත් පරාමිති පාලනය කළ හැකි වෙන්ටිලේටරය ***Ventilator Pro KDU Ver. 1.0*** A patient ventilator which allows the control of all vital parameters during ventilation.	√		

UV-C ආලෝකය භාවිතයෙන් වාතය මඟින් පැතිරෙන රෝගකාරක ක්ෂුද්‍රජීවීන් විනාශ කළ හැකි වායු පිරිසිදුකාරකය ***UV Air Purifier*** This purifier is capable of destroying airborne pathogens,using UV-C light.	√		
වාෂ්ප ඉන්හේලර් උපාංගය ***Steam Inhaler*** A steam inhalation device	√		
කෝවිඩ් රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමේ දී උපයෝගී කරගත හැකි වෛද්‍ය සහායක රොබෝව ***KDU MEDICARE Robot-2020 Ver. 1.0*** A medical assistant robot to take care of COVID-19 patients, feed them and to provide them medicine without human direct contact with them.	√		
වෛද්‍යවරයා -රෝගියා අතර සන්නිවේදන කටයුතු සඳහා දියුණු කළ යෙදුමකි . ***Curec: Doctor Patient Communication Platform*** A mobile application to link the doctors and patients during the COVID-19 Pandemic.	√		

2.4.2 උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන ආයතනය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් උසස් පර්යේෂණ හා අධ්‍යාපන සමායෝජන ආයතනනය (KDU-CARE) 2013 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. සියලුම පීඨවල අවශ්‍යතානුකූලව මෙම විශ්වවිද්‍යාලයේ විද්වත් ප්‍රජාව සඳහා මධ්‍යගත, අති-නවීන සංවර්ධිත පර්යේෂණ පහසුකම් ලබාදෙමින් පර්යේෂණ හා නවෝත්පාදන දිරිමත් කිරීම සහ පර්යේෂණ වාණිජකරණය කිරීම එහි අරමුණ විය. විශ්වවිද්‍යාල අධ්‍යාපනය හා පර්යේෂණ ශක්‍යතා වැඩිදියුණු කරන නවීන විද්‍යාත්මක තාක්ෂණයන් අනාවරණය කරගැනීම, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම එමඟින් අපේක්ෂා කෙරේ.

ජනතාවගේ ජීවන තත්ත්වය හා රටේ සමාජ-ආර්ථික තත්ත්වය වර්ධනය කිරීම ඔස්සේ ජාතික සංවර්ධනය උදෙසා දායකත්වය දැක්වීමට පර්යේෂණ වැඩිදියුණු කිරීම KDU-CARE හි මූලික ඉලක්කය වේ. මෙය යථාර්තයක් කරගත හැකි වනුයේ නවොත්පාදන ඉලක්ක කරගත් ඉහළ ගුණාත්මක තත්ත්වයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම මඟිනි. නව සොයා ගැනීම්වල පූර්ණ උපයෝගීතාවය ජාතික ආර්ථික අභිවෘද්ධිය උදෙසා දායක වියයුතුය. විවෘත හා දැනුම පාදක ආර්ථිකයක් තුළ තරඟකාරිත්වය පවත්වා ගැනීම ඔස්සේ තිරසාරත්වය සාක්ෂාත් කරගත හැකිවේ. එබැවින් පර්යේෂණ හැකියාවන් හා නවෝත්පාදන වැඩිදියුණු කිරීම සඳහා KDU-CARE විසින් රාජ්‍ය මෙන්ම පුද්ගලික අංශයේ සංවිධාන සමඟ ද බහු-ආංශික පර්යේෂණ සහයෝගීතාවයන් ගොඩනඟා ගන්නා අතර එමඟින් ජාතික සමාජ-ආර්ථික වෘද්ධිය සඳහා දායකත්වය ලබාදේ.

ජෛව-වෛද්‍ය විද්‍යාව, සමාජෙවඛ්‍යා, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂිකර්මය, අණුක ජීව විද්‍යාව, පරිගණක විද්‍යාවේ සිට ඉංජිනේරු විද්‍යාව දක්වා වූ අධ්‍යයන ක්ෂේත්‍ර පරාසයක පර්යේෂණ දියත් කිරීම සඳහා පර්යේෂණ මහාචාර්යවරු, පර්යේෂක විද්‍යාඥයන් හා පර්යේෂක සහායකයන් සඳහා KDU-CARE සහාය ලබාදේ. මෙහි පර්යේෂකයන් විසින් ජාතික ගැටලු නිරාකරණය, ජාත්‍යන්තර ප්‍රකාශන/පේටන්ට් හා නිෂ්පාදන සංවර්ධනය හා වැඩිදියුණු කිරීම් ප්‍රතිඵල වන පර්යේෂණ හා නවෝත්පාදන කෙරෙහි සිය අවධානය යොමු කරනු ලැබේ.

ප්‍රධාන තනතුරුවල සිදුවූ වෙනස්කම් (හමුදා/ අධ්‍යයන)

මහාචාර්ය සී.එල්.ගුණසේකර - අධ්‍යක්ෂ, KDU-CARE

KDU-CARE ක්‍රියාකාරිත්වයේ නව උපනතීන්

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ "*University Business Linkage Cell*" චක්‍රලේඛයට අනුකූලව KDU-CAREහි ක්‍රියාත්මක ව්‍යුහය සකස්කරන ලදී. ඒ අනුව, KDU-CAREහි ව්‍යාපෘති හා කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම සඳහා උපදේශක මණ්ඩලයක් පත්කරන ලදී. බහු-ආංශික පර්යේෂණ ප්‍රවර්ධන කටයුතු හා බාහිර කර්මාන්තකරුවන් හා පීඨ අතර හවුල්කාරිත්වයන් ගොඩනඟා ගැනීම සඳහා පීඨ මට්ටමින් සම්බන්ධීකාරකවරුන් පත්කරන ලදී.
- KDU-CARE මඟින් වාණිජ ව්‍යාපෘති සිදුකිරීම සඳහා CARE Technology (Pvt) Ltd නම් වූ සමාගම යළි සක්‍රීය කරන ලදී. උපකුලපති, නියෝජ්‍ය උපකුලපති (ආරක්ෂක හා පරිපාලන), පීඨාධිපති (පර්යේෂණ හා සංවර්ධන) හා අධ්‍යක්ෂ - KDU-CARE යන නිලධාරීන්ගෙන් සමන්විත නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කරන ලදී. කොආවි උපකුලපති සහ අධ්‍යක්ෂ - KDU-CARE පිළිවෙලින් එහි සභාපති

හා කළමනාකරණ අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී. සමාගමේ ගිණුම් පවත්වාගෙන යෑම සඳහා සහකාර මූල්‍යාධිකාරිවරයා පත්කරන ලදී.

- KDU-CARE සඳහා ගොඩනැගිල්ලක් හා විද්‍යාගාර ඉදිකිරීම සඳහා සෞභාග්‍යයේ දැක්ම වැඩසටහන සඳහා ව්‍යාපෘති යෝජනාවක් ද ඉදිරිපත් කරන ලදී.

නව පත්වීම්

නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
ආචාර්ය එච්.එස්. ජයසිංහආරච්චි මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය	2020.11.20
ආචාර්ය කේ.ඩබ්.සමරකෝන් මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	2020.12.21
ආචාර්ය එන්.පී.ඩබ්.රතුවඩු මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	2021.01.01
ආචාර්ය ඒ.අයි.කුරුප්පු මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - II ශ්‍රේණිය	2020.12.22
ආචාර්ය ඒ.එම්.සී.එස්.බී.අලහකෝන් මයා	කථිකාචාර්ය (සේවයේ ස්ථිර නොකළ)	2021 වර්ෂය තුළ

2020 වර්ෂයේ නිමකරන ලද ව්‍යාපෘති

- රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙනුවෙන් *Bioequivalence Study of Clarithromycin* නැමති පර්යේෂණය සිදුකරන ලදී. සමස්ත අයවැය: රු. 2,000,000.00.
- "Mechanistic verification of the suspected metal-linked etiology of the chronic kidney disease (CKDu) in Sri Lanka: a molecular approach" මැයෙන් වූ පර්යේෂණ ව්‍යාපෘතියක් වෛද්‍ය එස්.එච්.එන්.පී.ගුණවික්‍රම මහතා විසින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂම මඟින් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය (MSTR/TRD/AGR/RD/01) හරහා සිදුකරන ලදී.

දැනට සිදු කෙරෙන ව්‍යාපෘති

- Credence Genomics (Pvt) Ltd විසින් නිපදවා ඇති, කොවිඩ් රෝගය වැළඳී ඇතැයි සැකකරන රෝගීන්ගෙන් ලබාගන්නා ළෙව සාම්පලවල SARS Cov2 ආසාදනය වී ඇත්දැයි පරීක්ෂා කිරීමේ නව්‍ය කට්ටලයේ (VirFast COVID) ක්‍රියාකාරිත්වය සත්‍යාපනය කිරීම. Credence Genomics සහ KDU-CAREහි CARE Technology (Pvt) Ltd අතර ගිවිසුම 2020 නොවැම්බර් මස 5වන දින අත්සන් කරන ලදී. කාලය: මාස 06කි. අයවැය: එක් පරීක්ෂණයක් සඳහා රු.6,000.00 + මාසිකව Rs 100,000 (අමතර වියදම් සඳහා)

- ජාතික විද්‍යා පදනම විසින් ලබාදුන් ප්‍රදානයක් (ප්‍රදාන අංක. RPHS/2016/CKDu 04) මත වෛද්‍ය. එස්.එච්.එන්.පී.ගුණවික්‍රම මහතා විසින් "Immunomodulation associated with CKDu progression, of Sri Lanka" නැමති පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කරමින් පවතී.

2.4.3 තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය

හැඳින්වීම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA-KDU) ඔස්සේ විශ්විවිද්‍යාලයෙහි තත්ත්ව සහතිකකරණය සඳහා ඇති සැලකිල්ල පෙන්නුම් කෙරේ. අධ්‍යාපනික කටයුතු, පාලනය හා සමස්ත තත්ත්ව සහතික කළමනාකරණය මගින් විශ්වවිද්‍යාලය තුළ ගුණාත්මක තත්ත්වය හා තත්ත්ව ආරක්ෂණය ප්‍රවර්ධනය කිරීම, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අපේක්ෂාවවේ. කොආවි තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය විසින් සියලුම කාර්යයන් හා ක්‍රියාකාරිත්වය තුළ ගුණාත්මක තත්ත්වය හා ගුණාත්මක තත්ත්වය සහතික කිරීමේ පුළුල් පරිසරයක් ගොඩ නැංවීම, ප්‍රවර්ධනය හා පවත්වාගැනීම සඳහා ප්‍රයත්න දරයි.

ප්‍රධාන තනතුරුවල සිදුවූ වෙනස්කම්

කොආවි තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය යනු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා විසින් අධ්‍යක්ෂ ධූරය හොඹවන ලද අභ්‍යන්තර තත්ත්ව ආරක්ෂණ ඒකකය ප්‍රතිස්ථාපනය කර පිහිටුවන ලද නව මධ්‍යස්ථානයකි. 'විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ පද්ධති තවදුරටත් ශක්තිමත් කිරීම' මැයෙන් වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 09/2019 චක්‍රලේඛයේ නිර්දේශයන්ට අනුකූලව 2020 සැප්තැම්බර් සිට බලාත්මක වන පරිදි නව මධ්‍යස්ථානය හා එහි අධ්‍යක්ෂවරයා පත්කරන ලදී.

තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අරමුණු, කාර්යයන් හා වගකීම් සම්බන්ධයෙන් සනාතන සභාවේ දැනගැනීම සඳහා හා තත්ත්ව සහතික කිරීම පිළිබඳ සනාතන සභාවේ ස්ථාවර කමිටුවක් (SSC-QA) පත්කිරීමට අනුමැතිය ඉල්ලීම සඳහා පිළිවෙලින් Senate MEMO 074/40 හා Senate MEMO 074/39 නමින් වූ සෙනෙට් පත්‍රිකා ඉදිරිපත් කළ අතර එයට අනුමැතිය හිමිවිය. තත්ත්ව සහතික කිරීම පිළිබඳ සනාතන සභාවේ ස්ථාවර කමිටුවක් පත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය හිමිවුණි

තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයේ කාර්ය මණ්ඩලය

අනු අංකය	නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
01	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර් ද අල්විස් සෙනෙවිරත්න මයා	අධ්‍යක්ෂ, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, වෛද්‍ය පීඨය	2020.09.02
02	එන්.ටී.එන් ද සිල්වා මෙය	කළමනාකරණ සහකාර (තාවකාලික) – III පංතිය	2020.12.02

කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්/ පුහුණු

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින්, 2020 සැප්තැම්බර් CTHE පාඨමාලාව සඳහා සහභාගිවන්නන් සඳහා උසස් අධ්‍යාපනයේ තත්ත්ව සහතික කිරීම මැයෙන් දේශනයක් පැවැත්වීම සඳහා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයාට ආරාධනා කරන ලදී.

විශේෂ සිදුවීම්/ උත්සව

i. නව විෂය නිර්දේශ සඳහා තත්ත්ව සහතික අනුමැතිය:

නව උපාධි අපේක්ෂක පාඨමාලා තුනක් සඳහා පත්කරන ලද මණ්ඩල විසින් තත්ත්ව සහතික ඇගයීමක් සිදුකරන ලද අතර අදාළ සංශෝධන නියමිත පරිදි සිදුකිරීමෙන් අනතුරුව සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදී.

- පරිගණක විද්‍යා පීඨය: දත්ත විද්‍යා හා ව්‍යාපාර විශ්ලේෂණය (ගෞරව) විද්‍යාවේදී උපාධිය

- කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය: ව්‍යවහාරික දත්ත විද්‍යා සන්නිවේදනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හා වෙනත් භාෂා කතා කරන තැනැත්තන් සඳහා ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (TESOL)

ii. දැනට ක්‍රියාත්මක විෂය නිර්දේශ සඳහා වෙනස්කම්/ සංශෝධන සඳහා තත්ත්ව සහතික අනුමැතිය

දැනට ක්‍රියාත්මක වන උපාධි අපේක්ෂක පාඨමාලා සඳහා සිදුකළ යුතු වෙනස් කම් පිළිබඳ තත්ත්ව සහතික ඇගයීමක් සිදුකරන ලද අතර අදාළ සංශෝධන නියමිත පරිදි සිදුකිරීමෙන් අනතුරුව සෙනෙට් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදී.

- නාවික හා සාගරික විද්‍යා පීඨය: 62වන ඇතුළත් කිරීම සඳහා විද්‍යාවේදී උපාධි විෂය නිර්දේශය

- කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය: සමාජ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය

iii. කොඅාවි සංයුක්ත සැලැස්ම 2021-2025 හා 2021 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම සඳහා තත්ත්ව සහතිකකරණය පිළිබඳ අදාළ ක්‍රමෝපාය ඉදිරිපත් කරන ලදී.

iv. තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ පද්ධති අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මූලික කරුණු ඉදිරිපත් කිරීමෙන් කොඅාවි වෙබ් අඩවිය වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

2.4.4 තොරතුරු තාක්ෂණ සහාය හා සංවර්ධන සේවා මධ්‍යස්ථානය

අධ්‍යක්ෂ මණ්ඩල හා අනධ්‍යන කාර්ය මණ්ඩල අංශ ද ඇතුළුව සමස්ත විශ්වවිද්‍යාලය සඳහා තොරතුරු තාක්ෂණ සහාය හා වෙනත් අවශ්‍යය සංවර්ධන කටයුතු සම්පාදනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ සහාය හා සංවර්ධන සේවා මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී. මෘදුකාංග සංවර්ධන, ජාල පරිපාලනය, ජාල හා පරිගණක දෘඪාංග නඩත්තු කිරීම, වෙබ් අඩවි වැඩිදියුණු කිරීම, අන්තර්ජාල හා WIFI සේවා හා සම්බන්ධිත සේවා හා අනෙකුත් අධ්‍යාපනික සහාය සේවා ආරක්ෂක විශ්වවිද්‍යාලය වෙත ලබා දීම මෙම මධ්‍යස්ථානය මඟින් සිදු වේ.

ප්‍රධාන තනතුරුවල සිදුවූ වෙනස්කම් (හමුදා/ අධ්‍යයන)

	සේවා අංකය/ සේ.අ.අ.අංකය	උසස්වීම් ලද නිලය/ පත්වීම	නම	තනතුර
අ.	O/62859	ලුතිනන් කර්නල්	එම්.ටී.සී. ද සිල්වා psc SLSC	අධ්‍යක්ෂ- තොරතුරු තාක්ෂණ
ආ.	1398	උපදේශක - I ශ්‍රේණිය	කේ.ඩබ්.ඩී සිල්වා	උපදේශක - I ශ්‍රේණිය

නව බඳවාගැනීම්

	නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
අ.	පී.ඩී.පණ්ඩිතරත්න මයා	මෘදුකාංග ඉංජිනේරු	2020.09.14
ආ.	ටී.එච්.එන්.ප්‍රියදර්ශනී මෙය	පද්ධති විශ්ලේෂක	2020.09.02
ඇ.	එම්.ඒ.ඩී.බී.එල්.ජයවීර මයා	ජාල පරිපාලක	2020.10.02

යටිතල පහසුකම් සංවර්ධනය/ නව ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘති	කාර්යය/ නිමැවුම	වර්තමාන තත්ත්වය
පද්ධති සංවර්ධන ව්‍යාපෘති			
01	බාහිර රෝගී අංශය සඳහා ආරෝග්‍යශාලා කළමනාකරණ පද්ධතිය	රෝගීන් ලියාපදිංචි කිරීම, පෝලීම් ගැසීම, ඖෂධ තොග හා බිල් සැකසීම කළමනාකරණය	එම පද්ධතිය සකස් කිරීමේ කටයුතු නිම කර තිබේ.
02	සැත්කම් ගාස්තු ගෙවීම කළමනාකරණය කිරීමේ පද්ධතිය	කාර්ය මණ්ඩලය, සැත්කම් විස්තර හා බිල්පත් සැකසීම කළමනාකරණය	එම පද්ධතිය සකස් කිරීමේ කටයුතු නිම කර තිබේ.
03	මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (Profile Management Module)	Add Members: කොආවි සමස්ත කාර්ය මණ්ඩලය (හමුදා හා සිවිල්) විස්තර ඇතුළත් කිරීම. (අධ්‍යාපනික විස්තර, පවුලේ විස්තර හා පලපුරුද්ද) Profile Details: සියලුම හෝ	පද්ධතිය සැකසීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.

		තෝරාගත්සේවකයන්ගේ විස්තර දර්ශනය කිරීම හා ඇතුළත් කළ විස්තර වෙනස් කිරීම Search Profile: නම, සේවා හැඳුනුම්පත් අංකය, තනතුර හෝ දුරකතන අංකය වැනි විස්තර ඇතුළත් කර යම් සේවකයකුගේ විස්තර පහසුවෙන් ලබා ගැනීම Reports: අවශ්‍යතාව පරිදි විස්තර දර්ශනය වීම	
04	උපකාර කවුළුව (Help Desk) සම්බන්ධිත කළමනාකරණ පද්ධතිය	අයදුම්කරුවන්ට උපාධි පාඨමාලා විස්තර ලබාගැනීමට පහසුකම් සැලසීම. ඇතුළත් වීමේ සුදුසුකම් පරීක්ෂා කිරීම හෝ පාරිභෝගික සේවා නිලධාරියෙකුගේ සහාය ලබා ගැනීම	එම පද්ධතිය සකස් කිරීමේ කටයුතු නිම කර ඇති අතර තත්ත්ව සහතික කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.
05	පශ්චාත් උපාධි සඳහා සිසුන් මාර්ගගතව ලියාපදිංචි කිරීම	පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම	එම පද්ධතිය සකස් කිරීමේ කටයුතු නිම කර තිබේ.
06	සිසුන්ගේ පැමිණීමේ වාර්තා ජනනය කිරීමේ මෘදුකාංගය	සිසුන්ගේ පැමිණීමේ වාර්තා බාගතකිරීම සහ දර්ශනය කළ හැක.	එම මෘදුකාංගය සකස් කිරීමේ කටයුතු නිම කර තිබේ.
07	ගොල්ෆ් ලකුණු ගණනය- මාර්ගගත	තරඟ නියම කිරීම, ක්‍රීඩකයන් නියම කිරීම, සම්මත ගොල්ෆ් පහරවල් ඇතුළත් කිරීම, අවසාන ලකුණු ගණනය කිරීම, බාධා කළමනාකරණය කරගැනීම	එම පද්ධතිය සකස් කිරීමේ කටයුතු නිම කර තිබේ.
08	Global Talent Portal (GTP)	රැකියා සඳහා හෝ පර්යේෂණ සඳහා අයදුම් කිරීමේ පද්ධතිය සහ ආදී සිසු සංගම් පවත්වා ගැනීම	එම පද්ධතිය සකස් කිරීමේ කටයුතු නිම කර තිබේ.
09	කොඅාවි හැඳුනුම්පත මුද්‍රණය කිරීමේ පද්ධතිය	කාර්යමණ්ඩල හැඳුනුම්පත් මුද්‍රණය කිරීමේ පද්ධතිය	පද්ධතිය සැකසීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.
10	වෛද්‍ය පීඨය සඳහා ප්‍රශ්න ජනනය කිරීමේ පද්ධතිය	සිසුන් සඳහා විභාග ප්‍රශ්න ජනනය කිරීමේ පද්ධතිය	එම පද්ධතිය සකස් කිරීමේ කටයුතු නිම කර තිබේ.
වෙබ් අඩවි සංවර්ධන කිරීමේ ව්‍යාපෘති (දැනට වෙබ් අඩවි 48ක් පවත්වාගෙන යනු ලැබේ)			
11	KDU IRC 2020 වෙබ් අඩවිය	සබැඳුම: http://www.kdu.ac.lk/irc2020	වෙබ් අඩවිය සකස් කිරීමේ කටයුතු නිමකර තිබේ.
12	ජාත්‍යන්තර සබඳතා කාර්යාලයේ වෙබ් අඩවිය	සබැඳුම: https://www.kdu.ac.lk/international-relations/	වෙබ් අඩවිය සකස් කිරීමේ කටයුතු නිමකර තිබේ.

13	පීඨයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු	සබැඳුම: http://kdu.ac.lk/research-and-development/	වෙබ් අඩවිය සකස් කිරීමේ කටයුතු නිමකර තිබේ.
14	eKDU2020	සබැඳුම: https://www.kdu.ac.lk/ekdu/	වෙබ් අඩවිය සකස් කිරීමේ කටයුතු නිමකර තිබේ.
15	කොඅාවි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව - 2019 ආශ්‍රිත වෙබ් අඩවිය - KDU IRC 2019 Proceedings	සබැඳුම: https://www.kdu.ac.lk/proceedings/irc2019/	වෙබ් අඩවිය සකස් කිරීම හා අප්ලෝඩ් කිරීමේ කටයුතු නිමකර තිබේ.
16	Rover Scouts වෙබ් අඩවිය	සබැඳුම: https://www.kdu.ac.lk/roverscouts/site/	කොඅාවි සර්වර්ය තුළ පවතී.
17	Install SSL Certificate ස්ථාපනය කිරීම	යෙදවුමේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අයහපත් බලපෑමකින් තොරව කොඅාවි වෙබ් අඩවියේ ආරක්ෂාව තහවුරු කර ඇත.	නිම කරන ලදී.
ජාල හා යටිතල පහසුකම් සංවර්ධනය			
1	Learning Management System (LMS) වැඩිදියුණු කිරීම	වැඩිදියුණු LMS මඟින් අධ්‍යයන කාර්ය මණ්ඩලයට හා සිසුන්ට නව පහසුකම් (උදා. turnitin) සැපයිය හැකි වී තිබේ.	නිමකර තිබේ.
2	Firewall (LAN) අලුත් කිරීම	කොඅාවි WAN හා LAN ජාල සුරක්ෂිත කිරීම	නිමකර තිබේ.
3	Virus Guard අලුත් කිරීම	පරිගණක උපාංගවල ආරක්ෂාව තහවුරු වීම	නිමකර තිබේ.
4	උපාධි අධ්‍යයන පීඨයේ FGS LAN ජාලය කොඅාවි ප්‍රධාන KDU LAN ජාලයට සම්බන්ධ කිරීම	උපාධි අධ්‍යයන පීඨය සඳහා අන්තර්ජාල සේවා සැපයීම Main KDU LAN ඔස්සේ සිදුවේ.	නිමකර තිබේ.
5	Library Servers ස්ථාපනය කිරීම	මෙම සර්වර් ඔස්සේ KOHA සහ e-library සේවා සැපයේ.	නිමකර තිබේ.
6	Installation of Account Server ස්ථාපනය කිරීම	මූල්‍ය කළමනාකරණ පද්ධති මෙම සර්වරය ඔස්සේ සැපයේ.	ස්ථාපනය කිරීමේ කටයුතු නිමකර ඇත. ගිණුම් පද්ධති අර්ධ වශයෙන් සම්පූර්ණ කරතිබේ.

7	කොආවි විද්‍යුත් තැපැල් සේවා	කාර්ය මණ්ඩලය හා සිසුන් සඳහා විද්‍යුත්තැපෑල පහසුකම්	සේවා සැපයීමේ කටයුතු සිදුකරමින් පවතී.
8	ZOOM සහ Shibboleth සේවා	කොආවි පරිශ්‍රය තුළ ZOOM සහ Shibboleth සේවා (මාර්ගගත e-learning repositories සඳහා ප්‍රවේශය උදා. IEEE)පහසුකම් ඇත.	කටයුතු සිදුවෙමින් පවතී

කාර්යමණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම	සහභාගී වූ කාර්ය මණ්ඩල සාමාජිකයා/ සාමාජිකයෝ
Identity Access Management වැඩමුළුව	එච්.එම්.ජී.එල්.බණ්ඩාර මයා - IT POIT Dinesh RGD
ප්‍රසම්පාදන මාර්ගෝපදේප පිළිබඳ වැඩමුළුව	උපදේශකවරු/ මෘදුකාංග ඉංජිනේරුවරු
CISCO Networking Academy - සයිබර් ආරක්ෂාව පිළිබඳ පුහුණුව	සමස්ත කාර්ය මණ්ඩලය - තොරතුරු තාක්ෂණ සහාය හා සංවර්ධන සේවා සඳහා මධ්‍යස්ථානය

පුහුණු කටයුතු සඳහා දායකත්වය/ ජයග්‍රහණ

තොරතුරු තාක්ෂණ සහාය හා සංවර්ධන සේවා සඳහා මධ්‍යස්ථානය විසින් පවත්වන ලද eKDU 2020 සම්බන්ධ පරිශීලක පුහුණු සැසි හා විභාග ප්‍රතිඵල කළමනාකරණ පද්ධතිය පිළිබඳ පුහුණු සැසි

2.4.5 ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය

හැඳින්වීම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානය, 2020 සැප්තැම්බර් මස ස්ථාපනය කරන ලද අන්තර්-විෂයයික මධ්‍යස්ථානයකි. මෙම මධ්‍යස්ථානය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී විශ්වවිද්‍යාල සංස්කෘතියක් හා පරිසරයක් ප්‍රවර්ධනය කිරීමෙහිලා කටයුතු කරන අතර කොආවි තුළ සක්‍රිය මධ්‍යස්ථානයක් ලෙස පැවතීමට රැකුලක්වේ. හමුදා හා සිවිල් සිසුන් මෙන් කාර්ය මණ්ඩලය සඳහා ද ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් කිසිදු උවදුරුකින් තොරව සාමකාමී හා ප්‍රගමනශීලී අධ්‍යාපන හා කාර්යය පරිසරයක් ඇති කිරීමෙහිලා දායක වීම මෙම මධ්‍යස්ථානයේ දැක්ම වේ. මෙහි මෙහෙවර වනුයේ කොආවි තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරෙහි සාධාරණත්වය හා සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා හමුදා හා සිවිල් සිසුන් මෙන් කාර්ය මණ්ඩලය අතර අධ්‍යයන හා කාර්යය පරිසරය තුළ මනා පුද්ගල, සමාජ හා ආයතනික ඵලදායිතාවයක් සඳහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදීතාවය ඉහළ නැංවීමට අවකාශයක් සැලසීම සඳහා පහසුකම් සැලසීම වේ.

තවද විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය (අධ්‍යයන/පරිපාලන/ සහාය) විසින් සිය කාර්යයන් මානසික පීඩාවන් හා වෙනස්ව සැලකීම්වලින් තොරව කරගෙන යනු ඇතැයි විශ්වාස කෙරේ. කොආවි ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානයේ කාර්යය වනුයේ පර්යේෂණ සිදුකිරීම, ප්‍රතිපත්ති සමාලෝචනය, ප්‍රතිපත්ති යෙදවුම් සඳහා දායක වීම, කාන්තාවන් හා පිරිමින් අතර අවස්ථා, වාසි හා වගකීම් ව්‍යාප්තියේ දී සාධාරණත්වය හා යුක්තිය මත පදනම් වීම, ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් ප්‍රචණ්ඩත්වය සම්බන්ධ විමර්ශනය, ඒවා වැළැක්වීමේ ක්‍රම හා හා අදහස් මෙන්ම විනයානුකූල ක්‍රියාමාර්ගවලට යොමුවීම සඳහා කොආවි වෙත යෝජනා කිරීම යනාදියවේ. මෙම මධ්‍යස්ථානය උපකුලපතිවරයා වෙත සෘජුවම වාර්තා කරන අතර සමස්ත විශ්වවිද්‍යාලයම ආවරණය වන පරිදි සාමාජිකත්වය සඳහා තෝරාගනු ලැබේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය

2020.08.27 දින පැවති 618වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී කොආවි ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සාධාරණත්වය හා සමානාත්මතාවය සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලබා දී තිබේ.

ප්‍රධාන පත්කිරීම්

අධ්‍යක්ෂ - සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ලක්ෂිකා ලියනගේ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය) මහත්මිය 2020 සැප්තැම්බර් 02වන දින සිට බලපැවැත්වෙන පරිදි එම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ලෙස පත්කර ඇත.

නව බඳවාගැනීම් (හමුදා/ අධ්‍යයන) - නොමැත

නම	තනතුර	රාජකාරි භාරගත් දිනය
එච්.ඩබ්.පියුමාලි	කළමනාකරණ සහකාර (තාවකාලික)	2020.12.02

නව ව්‍යාපෘති

පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ 2020 වර්ෂය සඳහා වූ බ්‍රිතාන්‍ය පවුම් 1000 ක Gender Grant 2020 ආචාර්ය ලක්ෂිකා ලියනගේ මහත්මිය වෙත ප්‍රදානය කරන ලදී. මෙම ප්‍රදානය ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ දැනුවත් කිරීම්වලට අදාළ පුළුල් පරාසයක විහිදී යන පර්යේෂණ, මූලාරම්භ, වැඩමුළු, හා ඉසව් සංවිධානය කිරීමේ පිරිවැය පියවා ගැනීම සඳහා වැයකරමින් අවසානයේ දී ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය හා සමානාත්මතාවය පිළිබඳ ආයතනික ප්‍රතිපත්තියක් සකස් කිරීම මගින් සමාප්ත කරනු ඇත. මෙම ව්‍යාපෘතිය 2021 ජනවාරි මස ආරම්භ වී ඔක්තෝම්බර් මාසය දක්වා ක්‍රියාත්මක කරනු ඇත.

2.4.6 කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය 2011 නොවැම්බර් මාසයේ දී ස්ථාපනය කරන ලදී. මෙම මධ්‍යස්ථානය අධ්‍යක්ෂවරයෙකුගේ හා කළමනාකරණ කමිටුවක අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අතර එකී අධ්‍යක්ෂවරයා විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන මණ්ඩල සාමාජිකයෙකු වේ. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය උපදෙස් ලබා දීම හා නව අභියෝග හමුවේ පුද්ගල හා වෘත්තීය සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම එහි අරමුණුවේ. කොආවි කාර්යමණ්ඩලය සඳහා පුළුල් පරාසයක විහිදෙන අවස්ථා සඳහා ප්‍රවේශයක් සැලසෙන පරිද්දෙන් දේශීය හා විදේශීය විශ්වවිද්‍යාල ජාලය සමග සහයෝගීතාවය ඇතිකරගැනීම හා පවත්වාගෙන යෑම සහ යහපත් පරිවයන් හුවමාරු කරගැනීම ද එහි අභිප්‍රාය වේ.

දැක්ම

කොආවි කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ දැක්ම වනුයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල වෘත්තිය සංවර්ධනය සඳහා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමට ලක්වෙන විශිෂ්ට කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් බවට පත්වීමය.

මෙහෙවර

කොආවි කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ මෙහෙවර වනුයේ උසස් අධ්‍යාපනික විෂය ක්ෂේත්‍රය තුළ නවතම ප්‍රවණතා සමඟ යෝග්‍ය පුහුණු හා සංවර්ධන අවස්ථා සලසාදීම ඔස්සේ ඉගෙනුම් කේන්ද්‍රීය අත්දැකීම් ලබාගැනීම තහවුරු කිරීම වේ.

කාර්ය මණ්ඩල සංවර්ධන ක්‍රියාකාරකම්

- කොආවි සිසුන් හා කාර්යමණ්ඩලය සඳහා දවස පුරා ක්‍රියාත්මක වන KDU Helpline 24/7 දුරකතන උපදේශන සේවාව ආරම්භ කිරීම.
- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (CTHE) කණ්ඩායම් 08ක් දක්වා සාර්ථකව නිම කිරීම. මේ සඳහා අත්පොතක්ද පිළියෙල කරන ලදී (එය සෙනෙට් සභාව විසින් අනුමත කර ඇත)
- CTHE 09වන කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර 2020 පෙබරවාරි මාසයේ දී මෙම පාඨමාලාව ආරම්භ කෙරේ.
- විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු ස්ථිර උපදේශකවරු සඳහා වෘත්තීය සංවර්ධන පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු කරන ලදී. විශ්ව විද්‍යාල උපදේශකවරු සඳහා ඉගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව නමින් හැඳින්වෙන මෙම පාඨමාලාවේ පළමු කණ්ඩායම 2021 වර්ෂයේ දී ආරම්භ කරනු ඇත.

විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පහත දැක්වෙන පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදී.

	කාර්ය මණ්ඩල කාණ්ඩය	දිනය	වැඩසටහන	වැඩමුළුව
1	ඉහළ කළමනාකාරිත්වය	2020.09.17	1	ප්‍රසම්පාදන ක්‍රියාවලිය
2	අධ්‍යයන කාර්ය	2020.08.25	2	

	මණ්ඩලය			නිශ්චිත සැලැස්ම (Blue Print) තක්සේරු කිරීම හා ඇගයීම
		2020.08.25	3	විශ්වවිද්‍යාල සේවකයන්ගේ විනය කරුණු, අයිතිවාසිකම් හා වගකීම්, මානව අයිතිවාසිකම්
		2020.09.14	4	ඇගයීම් ක්‍රමවේද හා ප්‍රශ්න ආකාර
		2020.09.28	5	වෙනස්වීම සඳහා බලපෑම්, වෙනස්වීම සඳහා ප්‍රතිරෝධය, විෂයමාලා සංවර්ධනයේ දී සාර්ථක සාධක
		2020.10.13	6	e-board ඵලදායිව යොදාගන්නේ කෙසේ ද
3	අනෙකුත් අනධ්‍යයන හා පරිපාලන නොවන කාර්ය මණ්ඩලය	2020.09.18	7	විශ්වවිද්‍යාල කාර්යපරිපාටි
		2020.09.22	8	ගිණුම්කරණ හා ගබඩා කාර්යපරිපාටි
		2020.09.24	9	ඉන්ටර්නෙට්, ඊ-මේල්, මූලික පරිගණක දැනුම
		2020.09.30	10	ගණිතය හා ව්‍යාපාරික ගණිතය

විශේෂ සිදුවීම්/උත්සව

අනු අංකය	දිනය	සිදුවීම
01	2020.02.24	උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (CTHE) VIII - සමාරම්භක උත්සවය
02	2020.12.18	උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගැන්වීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (CTHE) VIII - සහතිකපත්‍ර ප්‍රදානෝත්සවය

2.4.7 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

2020 අගෝස්තු මස 27වන දින පැවැති 168වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ දී කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය කළමනාකරණ පීඨයට අයත් ගොඩනැගිල්ලේ තාවකාලික පදනමින් පිහිටුවන ලදී.මෙම ඒකකය උපකුලපති යටතේ ක්‍රියාත්මක වේ. පහත දැක්වෙන මානව සම්පත් පත් කිරීමට හා ඒකකය ස්ථාපනය සඳහා අවශ්‍ය භෞතික හා මූල්‍ය සම්පත් සපයා ගැනීමටත් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් අනුමැතිය ලබාදෙන ලද අතර 2020 සැප්තැම්බර් මස 12වන දින වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ අධ්‍යක්ෂ පත්කරන ලදී.

2020.01.05	37 වන ඇතුළත් කරගැනිමෙහි කඳවුරු සංචාරය
2020.01.06	උපාධි අධයයන පීඨයේ දී 37 වන ඇතුළත් කරගැනීමෙහි පිළිගැනීමේ කතාව
2020.01.09,10	කොඅාවි 2019 උපාධි ප්‍රධානෝත්සවය
2020.01.12	ගල්කිස්ස මහ හෝටලයේදී පැවති 2019 උපාධි ප්‍රධානෝත්සවයේ රාත්‍රී භෝජන සංග්‍රහය
2020.01.13	කොඅාවි කාර්ය මණ්ඩලය අමතා උපකුලපතිතුමා විසින් කරන ලද කතාව
2020.01.14	ආරක්ෂක හා ක්‍රමෝපායික සේවා පීඨයෙහි පීඨාධිපතිතුමා තනතුරෙහි රාජකාරී භාරගැනීම.
2020.01.14	උපකුලපති කාර්යාලයේදී සිහිවටන ප්‍රදානය කිරීම.
2020.01.14	රොටරැක්ට් සමාජය විසින් උපකුලපතිතුමා හා ආරක්ෂක හා ක්‍රමෝපායික සේවා පීඨයේ පීඨාධිපති සඳහා සමුගැනීමේ උත්සවයක් පැවැත්වීම
2020.01.14	සැරයන් භෝජනාගාරයේදී උපකුලපතිතුමා සඳහා පවත්වන ලද සමුගැනීමේ සාදය
2020.01.15	පෙළපාළියේ පෙරහුරුව
2020.01.16	ඉවත්ව යන උපකුලපති හා පැමිණෙන උප කුලපති සඳහා පැවැත්වූ පෙළපාළිය
2020.01.16	ඉවත්ව යන උපකුලපති සඳහා පවත්වන ලද රාත්‍රී භෝජන සංග්‍රහය
2020.01.17	සිවිල් සිසුන්ගේ 37 වන ඇතුළත්කරගැනීම සඳහා පවත්වන ලද නායකත්ව වැඩසටහන
2020.01.17	NMA ගේ කොඅාවි සංචාරය
2020.01.17	උපකුලපති විසින් කොඅාවි කාර්ය මණ්ඩලය ඇමතීම
2020.01.18	කොඅාවි කැඩෙට් නිලධාරීන් විසින් සැතපුම් 8 ක ධාවන තරඟයක යෙදීම
2020.01.19	34 වන ඇතුළත්කරගැනීම විසින් සංවිධානය කරන ලද මාසික ධර්ම දේශනා වැඩසටහන
2020.01.20	37 වන ඇතුළත්කරගැනීමේ දඩුවම් සරඹ සංදර්ශනය
2020.01.22	2019 දිස්ත්‍රික් සහ බස්නාහිර පළාත් කරාටේ තරඟාවලිය
22.01.2020	2020 රොටරැක්ට් චැම්පියන්ස් ලීගය
27.01.2020	ඉංජිනේරු පීඨයෙහි පැවත්වුණු ආරාධිත දේශනය
30.01.2020	2020 වැඩමුළුව - පුද්ගල පෞර්ෂ වර්ධනය පිළිබඳ සැසිය
2020 පෙබරවාරි	

2020.02.01	ටෝස්ට්මාස්ටර් ක්ලබ්
2020.02.03	නව උපකරණ හඳුන්වාදීම
2020.02.04	කොඅාවි හි පැවති රුක්රෝපණ වැඩසටහන
2020.02.05	සභාය නිලධාරී තනතුරෙහි ධූරය උසස්වීම - (ලුතිනන් කර්නල් තනතුරේ සිට කර්නල් තනතුර දක්වා)
2020.02.06	සම්මාන ප්‍රධානෝත්සවය (CISCO)
	රුක්මාල් වෙත නිවසක් ප්‍රදානය කිරීමේ උත්සවය
2020.02.08	අවි බිමක ගිනියම ආරාධිත දේශනය
2020.02.10	37 වන ඇතුළත්කරගැනීමේ ආරම්භක දේශනය
2020.02.10	කලමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයෙහි නම්නීකරණ වැඩසටහන
2020.02.11	ඉංජිනේරු පීඨයෙහි මාර්ගගත ඉදිරිපත්කිරීම
2020.02.13	කොඅාවි රෝහලෙහි ආරාධිත දේශනය
2020.02.14	පිහිණුම් තරඟය
2020.02.15	අවි බිමක ගිනියම ආරාධිත දේශනය
2020.02.19	බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණු දක්ෂිණ මණ්ඩප ප්‍රදර්ශනය
2020.02.21	බොක්සිං තරඟාවලිය
2020.02.22	නායකත්ව වැඩසටහන
2020.02.24	උසස් අධ්‍යාපනය තුළ ඉගැන්වීම පිලිබඳ සහතික පත්‍ර පාඨමාලාව - කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය
2020.02.26	තොරතුරු තාක්ෂණ වැඩමුළුව
2020.02.28	කොඅාවි වර්ණ රාත්‍රිය
2020 මාර්තු	
2020.03.02	පළමු දින පෙළපාළිය
2020.03.02	කුලපති තනතුර පිරිනැමීම සහ ලබාගැනීම
2020.03.02	සිවිල් සිසුන්ගේ නිලවරණය
2020.03.02	37 වන ඇතුළත් කර ගැනීමෙහි සිවිල් සිසුන්ගේ නායකත්ව වැඩසටහන - II වන කොටස
2020.03.05	ඉන්දියානු නියෝජිත පිරිසක් කොඅාවි හි සංචාරයක යෙදීම
2020.03.06	කොඅාවිහි පැවති මහානාම විද්‍යාලයේ නායකත්ව වැඩසටහන
2020.03.07	37 වන ඇතුළත් කර ගැනීමෙහි සිවිල් සිසුන්ගේ නායකත්ව වැඩසටහන
2020.03.07	කොඅාවි රෝහල් සේවක පවුල්වල සුහද හමුව
2020.03.11	උපකුලපති විසින් ප්‍රතිසංස්කරණය කරන ලද කොඅාවි නව ශ්‍රවණාගාරය විවෘත කිරීම
14 to 15.03.2020	වාර්ෂික ක්‍රීඩා උත්සවය
19.03.2020	ආරක්ෂක ලේකම් කොඅාවි රෝහලෙහි සංචාරයක යෙදීම.
2020 අප්‍රේල්	
2020.04.20	කොවිඩ් 19 පිසිආර් පරීක්ෂණ සිදු කිරීම
2020.04.21	උපාධි අධ්‍යයන පීඨ 1 වන ශ්‍රේණි මාණ්ඩලික නිලධාරි සිය තනතුරෙහි රාජකාරි බාර ගැනීම
2020.04.21	ඉංජිනේරු පීඨය විසින් MOD හි නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීම

2020.04.23	උපාධි අධ්‍යයන පීඨයෙහි උප කුලපති විසින් පවත්වන ලද මාධ්‍ය සැසිය
2020.04.27	කොවිඩ් සඳහා නව Chamber Machine යන්ත්‍රයක් හඳුන්වාදීම.
2020.04.30	කොඅාවි රෝහලෙහි පැවැත්වුණු ලේ දන්දීම
30.04.2020	ඉංජිනේරු පීඨය විසින් කොඅාවි රෝහලට රොබොටික් යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම
2020 මැයි	
2020.05.01	ආණ්ඩුකාරවරයා කොඅාවි හි සංචාරයක යෙදීම
2020.05.04	කෞතුකාගාරයේදී කොඅාවි වෙත ඉඩමක් පරිත්‍යාග කිරීම
2020.05.04	නිලධාරීන්ගේ ඉංග්‍රීසි පාඨමාලාවෙහි සමාරම්භක කතාව
2020.05.06	කොඅාවි රෝහලෙහි භාවිතය සඳහා වායු පවිත්‍රක යන්ත්‍ර 6 ක් (UV Air Purifiers) පරිත්‍යාග කිරීම
2020.05.13	කොඅාවි රෝහලෙහි හෙද දිනය සැමරීම
2020.05.29	පීසීආර් යන්ත්‍රයත් පරිත්‍යාග කිරීම (රියර් අද්මිරාල් සරත් වීරසේකර විසින්)
2020 ජූනි	
2020.06.03	වෛද්‍ය නිලධාරී විසින් රාජකාරි භාරගැනීම
2020.06.08	උප කුලපති විසින් කොඅාවිහි රුක් රෝපණය කිරීම
2020.06.11	කැඩෙට් නිලධාරී සම්මුඛ පරීක්ෂණ
2020.06.11	කොඅාවි රෝහලෙහි ලාඳ සුපිරි වෙළඳසැලක් විවෘත කිරීමේ උත්සවය
2020.06.15	කොඅාවි හි හුඅාවේ නව නිෂ්පාදන විද්‍යාගාරයක් (Huawei Innovation Laboratory) ස්ථාපනය කිරීම
2020.06.15	ආරක්ෂක සහ ක්‍රමෝපායික සේවා පීඨයෙහි ජාත්‍යන්තර සබඳතා උපාධි වැඩසටහන
2020.06.17	විද්‍යාපති උපාධිය සඳහා නවක සිසුන් ඇතුළත් කරගැනීමේ ආරම්භක උත්සවය
2020.06.22	උපාධි අධ්‍යයන පීඨයෙහි විද්‍යාපති හා විද්‍යාවේදී උපාධි ආරම්භ කිරීමේ උත්සවය
2020.06.23	කොඅාවි රෝහලෙහි පරිපාලන සමුළුව
2020.06.23	කොඅාවි රෝහල සඳහා සීමාවාසික වෛද්‍යවරුන් පත්කිරීම
2020.06.23	කොඅාවි රෝහලෙහි වෛද්‍යවරුන් සඳහා වූ සම්මුඛ පරීක්ෂණය
2020.06.24	උපාධි අධ්‍යයන පීඨයෙහි නීති ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ආරම්භ කිරීම
2020.06.26	උපාධි අධ්‍යයන පීඨයෙහි පාඨමාලා ආරම්භ කිරීමේ උත්සවය
ජූලි 2020	
2020.07.01	කොඅාවි රෝහලේ අධ්‍යනංශ සහ අංශ ප්‍රධානීන් වෙත පත්වීම් ලිපි භාරදීම.
2020.07.06	කාර්ය සම්පාදන සහ කළමනාකරණ පීඨයේ 7 වන ඉංග්‍රීසි පාඨමාලාවේ ආරම්භක දේශනය
2020.07.08	ඇමෙරිකා එක්සත් ජනපද දූත පිරිසක් උප කුලපති කාර්යාලය වෙත පැමිණීම
2020.07.11	ශ්‍රී ලංකා බාලදක්ෂ සංමයේ දිස්ත්‍රික් කොමසාරිස් සමුළුව 2020
2020.07.12	කැඩෙට් නිලධාරී සම්මුඛ පරීක්ෂණය
2020.07.14	35 වන ඇතුළත් කරගැනීමේ සංවත්සරය
2020.07.15	උපකුලපති ගේ දක්ෂිණ මණ්ඩප සංචාරය
2020.07.22	උපකුලපති පාකිස්තාන කැඩෙට් නිලධාරීන් ඇමතීම
2020.07.23	කථිකාචාර්යවරුන් සඳහා ඉංජිනේරු පීඨයේ පැවති වැඩමුළුව
2020.07.29	මාර්ගගතව ගනුදෙනු කළ හැකි යන්ත්‍රයක් (POS Machine) සම්පත් බැංකුව

	විසින් කොඅාවි වෙත පරිත්‍යාග කිරීම.
2020.07.30	තොරතුරු තාක්ෂණ විද්‍යාගාරයේ පැවති ඉංජිනේරු පීඨ වැඩමුළුව
අගෝස්තු 20	
2020.08.01	දක්ෂිණ මණ්ඩපයේ පැවත්වුණු උපකුලපති හා අධ්‍යක්ෂ කමිටු රැස්වීම.
2020.08.12	ඉංජිනේරු පීඨයේ CDC වැඩමුළුව
2020.08.13	උපාධි අධ්‍යයන පීඨයේ වාචික පරීක්ෂණය
2020.08.15	35 වන ඇතුළත් කර ගැනීමෙහි තෙවන වසර සංවත්සරය
2020.08.17	32 වන ඇතුළත් කරගැනීමේ වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උසස් යුධ පාඨමාලාව
2020.08.18	මාලදිවයින් මහ කොමසාරිස් කාර්යාලයේ කොඅාවි සංචාරය
2020.08.19	උපකුලපති කාර්යාලයේ පැවති මාර්ගගත බාලදක්ෂ සාකච්ඡාව
2020.08.20	LSC 6 කණ්ඩායම් සාකච්ඡාව
2020.08.25	ඇමෙරිකානු තානාපතිගේ කොඅාවි සංචාරය
2020.08.28	19 වන තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාවේ සමාජ්ත උත්සව කතාව
2020.08.31	සහායක නිලධාරී වැඩහාරගැනීම
2020 සැප්තැම්බර්	
2020.09.01	ඉංජිනේරු පීඨයේ පෝය දින වැඩසටහන
2020.09.02	පළමු දින පෙළපාළිය
2020.09.02	32 වන ඇතුළත්කරගැනීමේ වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උසස් යුධ පාඨමාලාව
2020.09.03	සෞඛ්‍ය අමාත්‍යවරියගේ කොඅාවි සංචාරය
2020.09.04	උපාධි අධ්‍යයන පීඨයේ පැවැත්වුණු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතාගේ ආරාධිත දේශනය
2020.09.08	කොඅාවි රෝහලේ තනතුරු ස්ථිර කිරීම
2020.09.10	වෛද්‍යවේදී හා ශල්‍ය වෛද්‍යවේදී උපාධි පාඨමාලාව සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.
2020.09.11	38 වන ඇතුළත්කරගැනීමේ සමාරම්භක උත්සවය
2020.09.12	37 වන ඇතුළත්කරගැනීමේ රාත්‍රී භෝජන සංග්‍රහය
2020.09.14	වෛද්‍ය පීඨයේ පීඨාධිපති විසින් තනතුරෙහි රාජකාරි බාරගැනීම.
2020.09.14	ක්‍රීඩා උළෙලෙහි සම්මාන ප්‍රදානෝත්සවය
2020.09.14	උපාධි අධ්‍යයන පීඨයේ කථන පරීක්ෂණය
2020.09.15	ඉංජිනේරු පීඨයේ කෘෂිවිද්‍යා වැඩමුළුව
2020.09.16	කොඅාවි රෝහලේ රුක් රෝපණ වැඩසටහන
2020.09.17	පකිස්තාන මහ කොමසාරිස්වරයාගේ කොඅාවි සංචාරය
2020.09.17	SDC වැඩමුළුව
2020.09.17	ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ආයතනයේ කොඅාවි සංචාරය
2020.09.18	උපාධි අධ්‍යයන පීඨයෙහි වාචික පරීක්ෂණ සමූළුව
2020.09.18	කැඩෙට් නිලධාරී රජය (කැඩෙට් නිලධාරීන් සඳහා නායකත්ව වැඩසටහන)
2020.09.21	ටෝස්ට්මාර්ටර් ක්ලබ් වැඩසටහන
2020.09.21	වොලිබෝල් තරඟාවලිය
2020.09.23	32 වන ඇතුළත්කරගැනීමේ වෛද්‍ය වේදී හා ශල්‍ය වෛද්‍යවේදී උසස් යුධ පාඨමාලාව
2020.09.23	වොලිබෝල් තරඟාවලිය
2020.09.24	ඇමෙරිකානු රාජ්‍ය දූත පිරිසකගේ කොඅාවි සංචාරය

2020.09.25	විදේශ කැඩෙට් නිලධාරීන් ශ්‍රී ලංකාවේ සංචාරය කිරීම
2020.09.25	නිලධාරීන්ගේ ඉංග්‍රීසි පාඨමාලා සහතික ප්‍රදානෝත්සවය
2020.09.25	උපාධි අධ්‍යයන පීඨයේ පැවති වාචික පරීක්ෂණය
2020.09.26	කැඩෙට් නිලධාරීන්ගේ දරාගැනීමේ ශක්තිය වර්ධනය කරන පෙළපාළිය
2020.09.28	පැසිපන්දු තරඟාවලිය
2020.09.29	පැසිපන්දු තරඟාවලිය
2020.09.29	උපාධි අධ්‍යයන පීඨයෙහි IRO රැස්වීම
2020.09.29	අධිකරණ අමාත්‍යාවරයාගේ කොඅාවි සංචාරය
2020.09.30	USM සමඟ පැවැත්වූ මත්ද්‍රව්‍ය පිටුදැකීමේ දේශන
2020 ඔක්තෝබර්	
2020.10.01	ධර්ම දේශනය
2020.10.02	මාසයේ පළමු දින පෙළපාලිය
2020.10.05	ආරක්ෂක සේවා අණදෙන මූලස්ථානය හා මාණ්ඩලික විද්‍යාල ඉංග්‍රීසි පාඨමාලාවෙහි සමාරම්භක උත්සවය
2020.10.06	ආචාර්ය සිතාරා විසින් ග්‍රන්ථයක් එළිදැක්වීමේ වැඩසටහන
2020.10.06	ඉන්දියානු නියෝජ්‍ය මහ කොමසාරිවරයාගේ කොඅාවි සංචාරය
2020.10.09	සිවිල් කාර්ය මණ්ඩල දීර්ඝ කාලීන සේවය ඇගයීමේ උත්සවය
2020.10.09	කැඩෙට් නිලධාරීන් අධිකාර ලත් තත්ත්වයට පත්කිරීම
2020.10.12	සනාතන මණ්ඩල රැස්වීම
2020.10.12	පිරිත් දේශනය
2020.10.16	13 වන අන්තර්ජාතික පර්යේෂණ සමුළුව 2020
2020.10.22,23	උරහිස් ලංඡන හා නිල ලාංඡන පැළඳවීමේ උත්සවය - 2020
2020.10.26	MOD හිදී මණ්ඩල සමූහ ඡායාරූපය ගැනීම
2020.10.27	කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයෙහි කෙටි කාලීන පාඨමාලාවක් ආරම්භ කිරීමේ උත්සවය
2020 නොවැම්බර්	
2020.11.02	ආරක්ෂක හා ක්‍රමෝපාය සේවා පීඨයේ පීඨාධිපතිගේ දේශනය
2020.11.04	උපකුලපති සම්මන්ත්‍රණ ශාලාවේදී පැවති බාලදක්ෂ වෙබ් අඩවියක් ආරම්භ කිරීම
2020.11.05	උපකුලපති සම්මන්ත්‍රණ ශාලාවේදී අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීම
2020.11.09	කොඅාවි රෝහලේදී පත්වීම් ලිපි ප්‍රදානය කිරීම.
2020.11.12	කොඅාවි උපකුලපති කාර්යාලයේ IRO ආචාර්ය ප්‍රේමදාස සමඟ ගිවිසුමක් අත්සන් කිරීම
2020.11.13	නියෝජ්‍ය උපකුලපති මාණ්ඩලික නිලධාරීන් ඇමතීම
2020.11.16	පීඨාධිපතිවරයාගේ සමාප්ත කථාව
17.11.2020	අණදෙන නිලධාරී (පාලන) රාජකාරි බාරගැනීම
2020.11.17	නියෝජ්‍ය උපකුලපති විසින් රාජකාරි බාරගැනීම
2020.11.19	ඇෆ්ගනිස්තාන විදේශ නියෝජිත පිරිසකගේ කොඅාවි සංචාරය
2020.11.19	නියෝජ්‍ය උපකුලපති ආරක්ෂක හා ක්‍රමෝපායික සේවා පීඨයේදී කතාවක් පැවැත්වීම.
2020.11.20	නව විද්‍යාගාරය සඳහා මුල්ගල තැබීමේ උත්සවය
2020.11.21	ආරක්ෂක හා ක්‍රමෝපායික සේවා පීඨ කාර්ය මණ්ඩලය සහ කැඩෙට් නිලධාරීන් ඇමතීම
2020.11.23	ආරක්ෂක හා ක්‍රමෝපායික සේවා පීඨයේ පීඨාධිපති තනතුරෙහි වැඩ භාර

	ගැනීම
2020.11.24	නියෝජ්‍ය උපකුලපති කොඅාවි ජ්‍යෙෂ්ඨ නැවියන් ඇමතීම
2020.11.25	කොඅාවි තොරතුරු මධ්‍යස්ථානය විවෘත කිරීමේ උත්සවය
2020.11.26	නිලධාරී භෝජනාගාරයේ දී පැවති සමුගැනීමේ සාදය (නියෝජ්‍ය උපකුලපති,පීඨාධිපති, නියෝජ්‍ය පීඨාධිපති සඳහා පැවැත්වුණු)
2020 දෙසැම්බර්	
2020.12.01	උසස් ඩිප්ලෝමාව පිළිබඳ සාකච්ඡාව
2020.12.02	මාලදිවයින් රාජ්‍ය දූත පිරිසකගේ කොඅාවි සංචාරය
2020.12.04	USM රාජකාරි බාරගැනීම
2020.12.07	තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ වැඩබාරගැනීම
2020.12.08	ඩිජිටල් ත්‍රිමාන තාක්ෂණ වැඩමුළුව
2020.12.09	කොඅාවි ආදි විද්‍යාර්ථී රැස්වීමේ න්‍යාය පත්‍රය
2020.12.09	රාජකාරි බාරගැනීම - නියෝජ්‍ය පීඨාධිපති
2020.12.09	36 වන ඇතුළත්කරගැනීමෙහි සම්මේලන ඉදිරිපත්කිරීම
2020.12.10	කොඅාවි රෝහලෙහි හමුදා සේවා වනිතා ඒකකයක් විවෘත කිරීම
2020.12.10	ඉංජිනේරු පීඨ වැඩමුළුව
2020.12.11	38 වන ඇතුළත්කරගැනීමෙහි සම්මේලන ඉදිරිපත්කිරීම
2020.12.11	36 වන ඇතුළත්කරගැනීමෙහි සම්මේලන ඉදිරිපත්කිරීම
2020.12.12	බාලදක්ෂ රැස්වීම
2020.12.13	38 වන ඇතුළත් කරගැනීමෙහි සිවිල් සිසුන්ගේ සම්මුඛ පරීක්ෂණය
2020.12.14	කොඅාවි රෝහලේ වෛද්‍ය පීඨයේ ආරම්භක දේශනය හා දිවුරුම් දීමේ උත්සවය
2020.12.14	2020 විශිෂ්ඨතම සාමූහික ඉදිරිපත්කිරීමට සම්මාන ප්‍රදානොත්සවය
2020.12.15	උපාධි අධ්‍යයන පීඨයෙහි නත්තල් කැරොල් ප්‍රසංගය
2020.12.15	විදේශ නියෝජිත කණ්ඩායමක් උපකුලපති කාර්යාලයට සංචාරයක යෙදීම
2020.12.16	කළමනාකරණ, සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය මඟින් සංවිධානය කරන ලද ධර්ම දේශනය
2020.12.16	36 වන ඇතුළත්කරගැනීමෙහි රාත්‍රී භෝජන සංග්‍රහය
2020.12.18	SDC ප්‍රදානෝත්සවය
2020.12.20	විදේශීය කැඩෙට් නිලධාරින් කුකුළේ ගඟ ප්‍රදේශයේ සංචාරයක නිරතවීම.
2020.12.21	බහුවිධ සංවර්ධන කාර්ය සාධන බලකායේ සහාය සම්බන්ධයෙන් හඳුන්වාදීමේ වැඩසටහනේ ආරම්භක කතාව
2020.12.25	විදේශීය සිසුන් සඳහා නත්තල් සාදය
2020.12.31	“ලොජිස්ටික් ටයිම්ස්” 2020 සඟරාව එළිදැක්වීම

8.8 ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල අනුස්මරණ කෞතුකාගාරය



ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා ශ්‍රී ලංකාවේ තෙවන අග්‍රාමාත්‍යවරයායි. 197 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ හමුදා අඥාපතිවරුන් විසින් හමුදා නිලධාරීන් පුහුණු කිරීම සඳහා අභ්‍යාස ආයතනයක අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී. පසුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ආඥාපතිවරයා (ලුතිනන් ජෙනරල් ඩෙනිස් පෙරේරා) මෙම යෝජනාව ශ්‍රීමත් ජොන් කොතලාවල මැතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී. ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමා විසින් 1979 ජූලි මස 11 වන දින සිය කඳවල පිහිටි නිවස සහ අක්කර 488 කින් සමන්විත ඉඩම ආරක්ෂක අභ්‍යාස විද්‍යාල ස්ථාපනය කිරීම සඳහා පරිත්‍යාග කරන ලදී. මෙම පවරාදීමෙන් නොබෝ කලකට පසු එනම් 1980 ඔක්තෝබර් මස 11 වන දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක අභ්‍යාස විද්‍යාලය ස්ථාපනය කරන ලදී.

දිවංගත ජෙනරාල්වරයාගේ නිවස වන කඳවල වලව්ව මේ වනවිටත් මෙම ආයතනයේ කේන්ද්‍රස්ථානයයි. පසුව, එවකට ජනාධිපති ධූරය හෙබවූ ඩී.බී. විජේතුංග මහතා විසින් 1993 ඔක්තෝබර් මස 11 වන දින කඳවල වලව්ව කෞතුකාගාරයක් බවට පත් කරන ලදී (ශ්‍රීමත් ජෝන් කොතලාවල අනුස්මරණ කෞතුකාගාරය). ජෙනරාල්වරයාගේ පෞද්ගලික පුස්තකාලය හා ඔහු අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කළ සියලු දෑ මෙම පුස්තකාලයෙහි අන්තර්ගත වේ. තවද ඔහුට විදේශ සංචාරයන්හිදී ලැබුණු ත්‍යාග සහ සිහිවටන මෙම කෞතුකාගාරයේ ආරක්ෂිතව තැන්පත් කර තිබේ. ශ්‍රී ලංකාවේ දී ලද ත්‍යාග සහ සිහිවටන ද මෙම කෞතුක භාණ්ඩ එකතුවට අයත් වේ.
ශ්‍රී වික්‍රම රාජසිංහ රාංසිංහ රජුගේ රාජකීය අසිපත සහ වසර 2000 ක් පැරණි ගාන්ධාර බුද්ධ ප්‍රතිමාව මෙම කෞතුකාගාරයේ ඇති සුවිශේෂී වටිනාකමකින් යුතු කෞතික භාණ්ඩ වේ. මීට අමතරව තවත් අගනා කෞතුක වස්තු රැසක් ද මෙම කෞතුකාගාරයෙහි පවතියි. ගෙවුණු යුගයේ කීර්තිමත් කාටූන් ශිල්පියෙකු වූ ඕව්‍රි ඒ කොලට් විසින් සිතුවමට නඟන ලද කාටූන් චිත්‍ර 488 ක් ද මෙම කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනය සඳහා තබා තිබේ. වෙනත් කිසිදු දේශීය කෞතුකාගාරයක මෙබඳු සිතුවම් දක්නට නොලැබේ.

ටෝකියෝ යතුර, ii වන එළිසබෙත් රැජිණගේ සහ එඩින්බරෝ ආදිපාදවරයාගේ අත්සන් සහිත තීන්ත පුවරුව ආදිය ද මෙහි පවතින විශිෂ්ඨ කෞතුක භාණ්ඩ වේ. ශ්‍රීමත් ජොන් කොතලාවල කෞතුකාගාරය මෙරට පවතින විශේෂිත පෞද්ගලික කෞතුකාගාරයක් වශයෙන් දැක්විය හැකිය.

8.9 කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල "ක්ලබ් හවුස්"

<u>කොඅාවි ක්ලබ් හවුස් විවෘත කිරීම</u>

කඳවල වැව ඔස්සේ පිහිටා ඇති මනස්කාන්ත සත්ව හා ශාක ගහණයෙන් හාත්පස සුසැදි කොඅාවි ක්ලබ් හවුස්, පැමිණෙන අමුත්තන් සඳහා රත්මලාන අවට සොබාදහම පිළිබඳ මනරම් දසුනක් මවා පායි. ක්ලබ් හවුස් ස්ථාපනය කිරීමේ මූලික අරමුණ ත්‍රිවිධ හමුදාවන්හි හා පොලිසියේ නිලධාරීන්ට, කොඅාවි අධ්‍යයන මෙන්ම අනධ්‍යයන කාර්ය මණ්ඩලයට රමණීය පරිසරයක් තුළ ආහාර පාන භුක්ති විඳීම සඳහා පහසුකම් සැලසීමයි. මීට අමතරව මෙම පහසුකම විදේශීය සිසුන්ට මෙන් ම කොඅාවි වෙත පැමිණෙන වෙනත් තැනැත්තන්ට ද හිමි වේ.



09. ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සපුරාලීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග

සමස්තයක් වශයෙන් රට විසින් 2030 වර්ෂය වන විට සපුරාලිය යුතු තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 කි. එම අරමුණු අතර, පවත්නා තත්වයන්ට වඩා යථාර්ථවාදී වන පරිදි වාර්ෂිකව සංශෝධනය කරනු ලබන ආයතනික සැලැස්මේ ඇතුළත්කර ඇති උපාය මාර්ග මගින් පහත නිශ්චිත ඉලක්ක සඳහා දායකත්වය සැපයීමට කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට හැකි විය.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 1 - සියලු ආකාරයේ දිළිඳුබව, සියලු තැන්හිම දුරු කිරීම

- කොඅාවි විසින් සමාලෝචිත වර්ෂය තුළ 1379 දෙනෙක් ඇතුළුව උපාධිධාරීන් 10121 ක් බිහි කර තිබේ. කොඅාවි සිය උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ නංවමින් සිටියි. මනා අධ්‍යාපනයක් ලබා දීමෙන් ප්‍රජාවන්ගේ දරිද්‍රතාවය තුරන්කිරීමට කොඅාවි දායකත්වය සපයා තිබේ.
- 2020 වර්ෂය අවසන් වන විට කොඅාවි හි කාර්ය මණ්ඩලය ස්ථීර කාර්ය මණ්ඩල සාමාජිකයන් 901 සහ තාවකාලික කාර්ය මණ්ඩල සාමාජිකයින් 152 ගෙන් සමන්විත විය. එමඟින් පවුල් විශාල සංඛ්‍යාවක දරිද්‍රතාවය පිටුදැකීමට දායක විය. කොඅාවි සිය ක්‍රියාකාරකම් පුළුල් කිරීම තුළින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමේ අඛණ්ඩව නියැලී සිටියි.
- කොඅාවි උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම උදෙසා එහි වෘත්තීය උපාධි වැඩසටහන් සඳහා අදාළ වෘත්තීය නියාමන ආයතනවල පිළිගැනීම ලබාගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.
- කොඅාවි උපාධිධාරීන්ගේ ගුණාත්මකභාවය සහ සේවා නියුක්තිය වර්ධනය කිරීම සඳහා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය සහ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය පිහිටුවන ලදී.
- කොඅාවි ව්‍යවසායකයින්ගේ ප්‍රදර්ශනය වාර්ෂිකව පවත්වනු ලැබේ. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මඟින් 2021 දී ව්‍යවසායකත්ව සමාජයක් පිහිටුවීමට ද සැලසුම් තිබේ.
- කොඅාවි උපාධි පාඨමාලාවන්හි සියලුම විෂයමාලා සංවර්ධනය කරනු ලබන්නේ සිසුන්ගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම සඳහාය. එමඟින් ඔවුන්ට සාර්ථක ව්‍යාපාර ආරම්භ කිරීමට හැකියාව සැලසේ.
- කොඅාවි රෝහලේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ප්‍රමුඛතා වෛද්‍ය සේවාවන් ගාස්තු අයකිරීමකින් තොරව සපයනු ලැබේ. තවද, කොඅාවි හි සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට නොමිලේ සෞඛ්‍යය රක්ෂණයක් ප්‍රදානය කරනු ලැබේ.
- පවුලේ ආසන්නතම සාමාජිකයෙකුගේ මරණයකදී මූල්‍යමය වශයෙන් ආධාර කිරීම සඳහා සුභසාධන සමිතියේ සාමාජිකයින්ට කාර්ය මණ්ඩල සුභසාධන දීමනාව ලබා දෙනු ලැබේ.
- කොඅාවි හි සියලුම කාර්ය මණ්ඩලය සඳහා ආපදා ණය, සුභසාධන ණය, වාහන ණය, පරිගණක ණය පහසුකම් සපයනු ලැබේ. සියලුම සිසුන්ට තම පන්ති ගාස්තු ගෙවීම සඳහා බැංකු ණය ඉල්ලුම් කළ හැකිය.
- "Z" ලකුණු ප්‍රමාණය 1.8 ට වඩා වැඩි සිසුන් සඳහා සියයට පනහක ශිෂ්‍යත්වයක් ලබා දෙන අතර ජාතික මට්ටමේ ක්‍රීඩක/ ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මුළු පන්ති ගාස්තුවෙන් 50% ක් අඩු කරනු ලැබේ.
- දෙමව්පියන් ත්‍රිවිධ හමුදාවේ සේවය කරන සිසුන් සඳහා කොඅාවි පාඨමාලා ගාස්තු වලින් 50% ක් අඩු කරනු ලැබේ. තම දරුවන් කොඅාවි හි උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගන්නා විට කොඅාවි සේවකයින්ට 40% ක පාඨමාලා ගාස්තු අඩු කිරීමක් ලැබේ.
- උපකුලපතිගේ ලැයිස්තුව සහ පීඨාධිපතිගේ ලැයිස්තුව මඟින් දීප්තිමත් සිසුන්ට ඔවුන්ගේ වාර්ෂික පන්ති ගාස්තු පිළිවෙලින් 50% සහ 25% කින් අඩු කර ගැනීමට අවස්ථාව ලබා දී තිබේ.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 03 - සෑම වයසක ම සියලු දෙනාට ම සෞඛ්‍ය සම්පන්න දිවියක් තහවුරු කරන අතර යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.

- කොඅාවි රෝහල විසින් ප්‍රතිකාර කරනු ලබන රෝගීන් සංඛ්‍යාව සහ පවත්වනු ලබන සායන සංඛ්‍යාව සෑම වයස් කාණ්ඩයකටම අයත් සියලුම දෙනාගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා කොඅාවි දක්වන දායකත්වය පිළිබඳ දර්ශකයකි.
- කොඅාවි රෝහලේ විවිධ අංශවල ප්‍රතිකාර ලබන රෝගීන් සංඛ්‍යාව සහ පුනරුත්ථාපන අවශ්‍යතා සඳහා භෞතචිකිත්සක අංශයට පැමිණෙන රෝගීන් සංඛ්‍යාව ද ඒ හා සමාන දර්ශකයකි.
- කොඅාවි රෝහල මඟින් ලබාදෙන ප්‍රතිකාරවල ගුණාත්මකභාවය පෙන්නුම් කරමින් 2019 සහ 2020 කාලය තුළ රෝහලෙන් කිසිදු මාතෘ මරණයක් වාර්තා වී නොමැත.
- කොඅාවි විසින් ඇවිදින මංතීරුවක් පවත්වා ගෙන යන අතර එහි සියලුම සේවකයින්ට ව්‍යායාම සඳහා නොමිලේ පහසුකම් සලසා තිබේ. කොඅාවි පිහිනුම් තටාකයක් ද පවත්වාගෙන යනු ලබන අතර සිය සේවකයින්ගේ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා දිවයිනෙහි උසම වෘත්තීය මට්ටමේ කඳු නැගීමේ පවුර (highest professionaly built climbing wall) නිර්මාණය කර තිබේ.
- කොඅාවි මත්ද්‍රව්‍ය භාවිතා නොකිරීමේ දැඩි ප්‍රතිපත්තියක් පවත්වාගෙන යනු ලැබේ.
- කොඅාවි විසින් ඉහළ විනයගරුක මෙන්ම සම වයසේ මිතුරන් අතර ආදර්ශමත් උපාධිධාරීන් බිහි කරනු ලබයි.
- කොඅාවි එහි සියලුම සේවකයින්ට අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවක් විශ්වවිද්‍යාල රෝහල මඟින් නොමිලේ සපයයි. තවද ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයින්ට ද කොඅාවි රෝහලේ දී ඒ හා සමාන ප්‍රතිකාර ලබා ගැනීමට අවස්ථාව සලසා දී තිබේ.
- කොඅාවි සිය සියලුම ජාත්‍යන්තර සිසුන්ගේ සෞඛ්‍ය ආරක්ෂණ අවශ්‍යතා නාමික ගාස්තුවක් අයකර සපුරාලයි.
- කොඅාවි විසින් එහි සියලුම සේවකයින්ට නොමිලේ පුළුල් සෞඛ්‍ය රක්ෂණයක් ප්‍රදානය කරනු ලැබේ.
- කොඅාවි සිය සියලුම අධ්‍යයන හා පරිපාලන පහසුකම් වලදී දුම් පානය නොකිරීම සම්බන්ධ දැඩි ප්‍රතිපත්තියක් පවත්වාගෙන යයි.
- කොවිඩ් 19 වසංගත සමයේ දී කොඅාවි විසින් කොවිඩ් 19 වැළඳුණු සේවකයින් සඳහා අවශ්‍ය සියලුම වෛද්‍ය පහසුකම් සපයන ලදී.
- මෙරටට පැමිණෙන විදේශීය සිසුන් සඳහා කොඅාවි රෝහලෙහිදී නිරෝධායන පහසුකම් සම්පූර්ණයෙන්ම නොමිලේ ලබා දෙන ලදී.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 4- සියල්ලන් සඳහා පරිපූර්ණ හා සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම හා දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම

- දේශීය උසස් පෙළ සුදුසුකම් හෝ ඒ හා සමාන විදේශීය සුදුසුකම් සහිත සිසුන්ට කොඅාවි විසින් පවත්වනු ලබන පාඨමාලා හැදෑරිය හැකිය. කොඅාවි හි ඇතැම් උපාධි පාඨමාලාවන්හි දෙවන වසර සඳහා සමාන සුදුසුකම් සහිත සිසුන්ට ඇතුළත්වීමේ අවස්ථාව පවතියි. මේ අනුව සිසුන්ට පරිපූර්ණ මෙන්ම සාධාරණ උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.
- දිවයිනේ විවිධ ප්‍රදේශවලින් බඳවා ගන්නා ලද සිසුන් සංඛ්‍යාවද පරිපූර්ණභාවය සඳහා දර්ශකයකි.
- කොඅාවි උපාධි පාඨමාලා සඳහා බඳවාගනු ලබන සිසුන්ට ශ්‍රී ලංකාවේ ඕනෑම බැංකුවකින් ශිෂ්‍ය ණය සඳහා ඉල්ලුම් කළ හැකිය.

- කොඅාවි විසින් 2020 වර්ෂයේ සිට සියලුම සිසුන්ට නොමිලේ ලැප්ටොප් පරිගණක ලබා දෙනු ලබන අතර එහි සියලුම මණ්ඩප වලට නොමිලේ වයිෆයි පහසුකම් සපයා තිබේ. එබැවින් වසංගත තත්ත්වය තුළ වුවද විශ්වවිද්‍යාලයට එහි සමස්ත ශිෂ්‍ය ප්‍රජාවට සාධාරණ ලෙස අධ්‍යාපනයක් ලබා දිය හැකි විය.
- කොඅාවි අනුබද්ධ යුධ අභ්‍යාස ආයතන 07 ක් පවතියි.
- කොඅාවි විසින් ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි පාඨමාලා 10 කට වැඩි ප්‍රමාණයක් සහ තවත් පශ්චාත් උපාධි සහතික පත්‍ර හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා කිහිපයක් මෙහෙයවමින් දිවිය පුරාම ඉගෙනුම් අවස්ථා ලබා දෙනු ලැබේ.
- කොඅාවි විසින් සති අන්ත පාඨමාලා වශයෙන් පිරිනමනු ලබන ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණ වැනි වෘත්තීය සංවර්ධන කෙටි කාලීන පාඨමාලා එහි සේවකයින්ට ජීවිත කාලය පුරාවටම ඉගෙනුම් අවස්ථා උදා කරයි.
- සාධාරණත්වය සහතික කරමින් කොඅාවි සේවකයින් ලියාපදිංචි වන ඕනෑම කොඅාවි මගින් පිරිනමන පාඨමාලාවක් සහනදායී ගාස්තු යටතේ හැදෑරීමට අවස්ථාව ලබා දී තිබේ.
- කොඅාවි විසින් විද්‍යුත් සම්පත් සඳහා වේගවත් ප්‍රවේශයක් ලබාදෙමින් වෙබ් අවකාශය සැලකියයුතු අන්දමෙන් පුළුල් කරන ලදී.
- කොඅාවි එහි සියලුම අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය වෙත අධ්‍යයන නිවාඩු/ හෝ පාඨමාලා ගාස්තු අඩුකිරීම් ලබා දෙමින් ඔවුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු නියමිත වේලාවට සම්පූර්ණ කිරීම සහතික කරයි.
- කොඅාවි සිය අනධ්‍යයන කාර්ය මණ්ඩලයට කොඅාවිහි ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබාදෙමින් ඔවුන් ඩිප්ලෝමා හෝ උපාධි සම්පූර්ණ කළ විට අමතර වැටුප් වර්ධක ලබා දෙනු ලැබේ.
- කොඅාවි සිය උපාධි පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය සහ ශ්‍රී ලංකා හෙද සභාව වැනි වෘත්තීය ආයතනයන්හි පිළිගැනීම ලබාගැනීම සේවක සංඛ්‍යාව, රසායනාගාර පහසුකම් ආදී අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගනුලැබේ. වෛද්‍ය පීඨය හා නීති පීඨය මඟින් පිරිනමනු ලබන පාඨමාලා සඳහා මේ වනවිටත් පිළිගැනීම ලැබී තිබේ.
- කොඅාවි සිසුන්ගේ සේවා නියුක්තිය ඉහළනැංවීමට අදාළ වන කාර්මික අවශ්‍යතා සපුරාලීම සඳහා සෑම සිව් වසරකටම වරක් උපාධි පාඨමාලාවන්හි විෂය මාලා සංශෝධනය කිරීමට කොඅාවි උනන්දුවක් දක්වයි.
- සියලුම කොඅාවි උපාධි පාඨමාලා සැලසුම් කර ඇත්තේ සියලුම කොඅාවි උපාධිධාරීන්ට ඉහළ රැකියා නියුක්තියක් හිමිවන බවට තහවුරු කරගැනීමේ යෙදවුම් උපයෝගී කරගනිමිනි.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 05 - ස්ත්‍රී-පුරුෂ සමානාත්වය ළඟා කරගැනීම සහ සියලුම කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම

- ඉහත ඉලක්කය සාක්ෂාත් කරගැනීම සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා සාධාරණත්වය සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී.
- කොඅාවි සියලුම බඳවා ගැනීම් හා ලියාපදිංචිකිරීම් වලදී ස්ත්‍රී පුරුෂ විෂමතාවය යන ප්‍රතිපත්තිය අනුගමනය නොකරන අතර එමඟින් සියලු ක්ෂේත්‍රයන්හි යහපත් ස්ත්‍රී පුරුෂ සමතුලිතතාවයක් පවත්වාගෙන යනු ලැබේ.
- සියලුම කොඅාවි උපාධි පාඨමාලා සකස් කර ඇත්තේ ශිෂ්‍යාවන්ට ඔවුන්ගේ ශිෂ්‍ය සොහොයුරන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට බලගැන්වීම සඳහාය.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 06 - සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබා ගත හැකි බව හා තිරසර කළමනාකරණය සහතික කිරීම

- කඳවල වැව, සියලුම අභ්‍යන්තර ජල පද්ධති සහ ජල මාර්ග පිරිසිදු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හා නඩත්තු කිරීම.
- පාරිසරික බලපෑම අවම කරමින් ජලය පිරිපහදු කිරීම හා නැවත භාවිතය සඳහා කොඅාවි රෝහලෙහි හි අපජල පවිත්‍රාගාර ස්ථාපනය කිරීම.
- කොඅාවි මූල්‍යමය සහයෝගය ලබාදෙමින් ජලයේ ගුණාත්මකභාවය පිළිබඳ පර්යේෂණ සඳහා දිරිගන්වනු ලැබේ.
- කොඅාවිහි සහ දක්ෂිණ මණ්ඩපයෙහි ස්ථාපනය කර ඇති අපජල පවිත්‍රාගාර තිරසර ජල කළමනාකරණ උපාය මාර්ග සඳහා කොඅාවි හි කැපවීම දැක්වෙන උදාහරණ වේ.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 07 - දැරිය හැකි, විශ්වසනීය, තිරසර හා නවීන බලශක්ති ප්‍රවේශය සියලුදෙනා තහවුරු කිරීම

- බලශක්ති පිරිවැය අවම කිරීම සඳහා උපාධි අධ්‍යයන පීඨය, ඉංජිනේරු පීඨය, විශ්වවිද්‍යාල රෝහල සහ දක්ෂිණ මණ්ඩපය සඳහා සූර්ය බලශක්තිය භාවිතා කිරීම.
- කොඅාවිහි හි අනාගත සියලුම ගොඩනැගිලිවල සූර්ය බලශක්ති පද්ධතිය සවිකිරීම.
- බලශක්ති භාවිතය අවම කිරීම සඳහා හරිත ගොඩනැගිලි සැලසුම් යොදා ගැනීම.
- කාබනික අපද්‍රව්‍ය වලින් ජීව වායුව නිපදවීමට කොඅාවි විසින් සියලුම මණ්ඩප දිරිමත් කරනු ලැබේ.
- හරිත බලශක්ති උත්පාදනය හා සම්බන්ධ පර්යේෂණ සඳහා කොඅාවි සසහයෝගය දක්වයි

තිරසර සංවර්ධන අභිමතාර්ථය 08 - සියලු දෙනා සඳහා කල්පවත්නා, පූර්ණ සහ තිරසාර ආර්ථික වර්ධනයක් සම්පූර්ණ හා ඵලදායී රැකියා හා ගෞරවනීය රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීම

- සියලුම කොඅාවි සේවකයින් කාර්යසාධනය මත පදනම්ව වාර්ෂික වැටුප් වර්ධක හිමිවීම.
- කොඅාවි කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ ආසන්නතම පවුලේ සාමාජිකයින් සඳහා නොමිලේ සෞඛ්‍ය රක්ෂණයක් පිරිනමනු ලබන අතර කොඅාවි රෝහල මඟින් සෞඛ්‍යය සත්කාර සපයනු ලැබේ.
- කොඅාවි සේවකයන් විසින් කොඅාවි රෝහලෙන් මුදල් ගෙවා ලබා ගනු ලබන ප්‍රතිකාර සඳහා සහනදායී ගාස්තු අය කරනු ලබයි.
- වගකිවයුතු සේවා යෝජකයෙකු වශයෙන් කාර්යභාරයන් සහ වගකීම් නිශ්චිතව දැක්වීම මඟින් කොඅාවි සිය සේවකයින්ගේ අයිතිවාසිකම් සෑම මට්ටමකින්ම සහතික කරයි.
- කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා කොඅාවි විසින් ඉගෙනුම් කළමනාකරණ පද්ධති (LMS) සහ ව්‍යවසාය සම්පත් සැලසුම්කරණය (ERP) වැනි නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දෙන ලදී.
- කොඅාවි ක්‍රියාකාරකම් පුලුල් කිරීම තුළින් බොහෝ සිසුන්ට උසස් අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීම පමණක් නොව,තරුණ තරුණියන් අතර රැකියා වියුක්තිය අවම කිරීමට සහයෝගය දක්වමින් ඔවුන් සඳහා රැකියා උත්පාදනය කිරීම සහ තරුණ තරුණියන් සඳහා වැඩි රැකියා අවස්ථා විවෘත කිරීම සිදු කරන ලදී.
- කොඅාවි විසින් සියලුම නව සංවර්ධන කටයුතු වලදී අනුගමනය කරන ලද හරිත ගොඩනැගිලි සංකල්ප බලශක්ති කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරයි.

- සේවකයින් බඳවා ගැනීමේදී කොඅාවි විසින් විෂමාකාරයෙන් නොසැලකීම යන ප්‍රතිපත්තිය අනුගමනය කිරීම.
- කොඅාවි විසින් ස්ත්‍රී පුරුෂ දෙපාර්ෂවයටම සමාන වටිනාකමෙන් යුතු කාර්යයන් සඳහා සමාන වැටුප් ගෙවීම තහවුරු කරමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිපත්ති දැඩි ලෙස පිළිපදිනු ලබයි.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 09 - ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඉදිකිරීම, පූර්ණ සහ තිරසර කාර්මීකරණය සහ නව නිපැයුම් ප්‍රවර්ධනය

- කොඅාවි හි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවීම.
- සියලුම ඉදිකිරීම් සහ ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි සැලසුම් හා ඉදිකිරීම් ප්‍රමිතීන්ට අනුව සහ යුධ, නාවික හෝ ගුවන් හමුදාව විසින් පත් කරන ලද සුදුසුකම් ලත් ඉංජිනේරුවන් විසින් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.
- විශේෂයෙන් සිවිල් ඉංජිනේරු උපාධි හදාරනු ලබන ඉංජිනේරු සිසුන්ට ඉංජිනේරුමය කුසලතා, පළපුරුද්ද ආදිය පරීක්ෂා කෙරෙන අභියෝගාත්මක තරඟ (Spaghetti Bridge competition) ආදී ක්‍රියාකාරකම් තුළින් ඔරොත්තු දෙන හා තිරසාර යටිතල පහසුකම් සංවර්ධන සංකල්ප ආරම්භයේ සිටම අනුගමනය කිරීමට පුහුණු කරනු ලැබේ.
- උපාධි අපේක්ෂක පර්යේෂණ ප්‍රදර්ශනය, ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳ ආයතනය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය වැනි ආයතන මඟින් සංවිධානය කරනු ලබන ජාතික ප්‍රදර්ශනවලට සහභාගී වීමට ඇති අවස්ථා සිසුන්ට ඔවුන්ගේ ගවේශණ හා නව නිපැයුම් ප්‍රදර්ශනය කිරීම සඳහා වේදිකාවක් සපයයි.
- ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සැලසුම් හා අධීක්ෂණය යටතේ කොඅාවි ශ්‍රවණාගාර ඉදිකිරීම නැවත ආරම්භ කිරීම.
- කඩදාසි අඩුවෙන් භාවිතා කිරීම පදනම් කරගත් පරිසරයක වැඩ කිරීමට අදාළ සියලු ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම සඳහා ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතිය ස්ථාපිත කිරීම.
- නව සාමාන්‍යකරණය තුළ අඛණ්ඩ අධ්‍යාපනයක් ලබා දීම සඳහා විවිධ මෘදුකාංග භාවිතා කරමින් මාර්ගගත ඉගැන්වීම්, ඉගෙනුම් හා ඇගයීම් වේදිකා සංවර්ධනය කරනු ලැබේ.
- ඩිජිටල් පුස්තකාල පහසුකම් සහ විද්‍යුත් පුස්තකාල මෙවලම් සඳහා ප්‍රවේශය වැඩි කිරීම මිලියන ගණනක ප්‍රකාශන සඳහා ප්‍රවේශ අවස්ථා වැඩි කරයි.
- දක්ෂිණ මණ්ඩපයේ හා වේරහැර සිසුවියන් සඳහා නවාතැන් පහසුකම් සැලසීමට ගොඩනැඟිලි ඉදිකිරීමෙන් ස්වකීය යන කාලය තුළ සියලුම සිසුන්ට නවාතැන් පහසුකම් හිමිවන බව තහවුරු කරගැනීම.
- පරිගණක, නීති සහ කළමනාකරණය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨ සඳහා නව පීඨ ගොඩනැගිලි ඉදිකිරීම.
- ඉගැන්වීම් හා ඉගෙනීම් පරිසරයේ ගුණාත්මකභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පීඨවලට අවශ්‍ය විද්‍යාගාර උපකරණ සහ අනෙකුත් භෞතික සම්පත් මිලදී ගැනීම.
- කර්මාන්ත පාදක පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම සඳහා කොඅාවි CARE Technology Pvt Ltd නැවත සක්‍රීයව කටයුතු ආරම්භ කර තිබේ.
- තවදුරටත් පර්යේෂණ කිරීම සඳහා දිරිගැන්වීමට පර්යේෂණ ප්‍රදාන සහ වෙනත් දිරිගැන්වීම් ලබා ගැනීමේ අවස්ථා වැඩි කිරීම.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 10 - රටවල් ඇතුළත හා රටවල් අතර අසමානතාව අඩු කිරීම.

- බහු වාර්ගික, බහු ආගමික පසුබිම් නියෝජනය කරන විවිධ සිසුන් සඳහා කොආවි විසින් හිතකර පරිසරයක් පවත්වා ගෙන යනු ලැබේ. මේ වන විට විවිධ රටවලින් පැමිණි සිසුහු 300 ක් පමණ දේශීය සිවිල් සිසුන්, ශිෂ්‍යාහට නිලධාරීන් සහ නිලධාරීන් සමඟ එක්ව ඉගෙනුම ලබමින් සිටිති.
- කොආවි විසින් බෞද්ධ, කතෝලික, මුස්ලිම් සහ හින්දු භක්තිකයින් සඳහා ඔවුන්ගේ ආගම් ඇදහීම සඳහා ආගමික මධ්‍යස්ථාන හතරක් (04) පිහිටුවා තිබේ.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 11 - නගර හා මානව ජනාවාස, පූර්ණ, ආරක්ෂිත, ඔරොත්තු දෙන, තිරසාර තත්ත්වයට පත් කිරීම

- සංස්කෘතික හා ජාතික උරුමයන් ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීම සඳහා හිටපු අගමැති ශ්‍රීමත් ජෝන් කොතලාවල මැතිතුමාගේ ඓතිහාසික වලව්ව සහ අවට පරිශ්‍රය කොආවි විසින් නඩත්තු කරනු ලබයි.
- කොආවි විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ඉදිකිරීම් කටයුතු හරිත පොදු අවකාශයන් නඩත්තු කිරීම තහවුරු කරයි.

තිරසර සංවර්ධන ඉලක්කය 15 - ගොඩබිම් පරිසර පද්ධති තිරසාර ලෙස භාවිතා කිරීම, ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා පිළිසකර කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාකරණය වැළැක්වීමට කටයුතු කිරීම හා ඉඩම් අවභාවිතය නැවැත්වීම හා පිළිසකර කිරීම සහ ජෛව විවිධත්වයට හානිවීම නතර කිරීම.

- කොආවි සියලුම මණ්ඩපවල ශාක හා සත්ව ජෛව විවිධත්වය පෝෂණය කිරීම සඳහා රත්මලාන, වේරහැර සහ සූරියවැව පරිශ්‍රයන්හි රුක් රෝපණය කිරීම.
- සුදුසුකම් ලත් උද්‍යාන පාලකයන් පත්කිරීම මගින් කොආවි මණ්ඩපවල රෝපණය කරන ලද සියලුම වෘක්ෂ ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම.
- රොටරැක්ට් ක්ලබ් සහ නේචර් ක්ලබ් හරහා පරිසර සංරක්ෂණ කටයුතුවල නිරත වීමට පහසුකම් සැලසීම තුළින් සිසුන් අතර යහපත් පුරුදු ඇති කිරීම.
- ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස්වීම හා බැහැර කිරීම මඟින් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා ප්ලාස්ටික් බෝතල් සහ ආහාර ඔතන පොලිතින් කොළ (lunch sheets) ශූන්‍ය කිරීමේ ප්‍රතිපත්තිය ඇතිකිරීම.
- සියලුම මණ්ඩප වල දෛනිකව ජනනය වන කාබනික අපද්‍රව්‍ය වලින් ස්වාභාවික ජීව වායුව හා කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමට දිරිගැන්වීම.
- කඳවල වැව සහ රත්මලාන සහ සූරියවැව පිහිටි අභ්‍යන්තර ජලාශ ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම ජෛව විවිධත්වය සහතික කරන අතර ආක්‍රමණික ශාක විශේෂයන්ගෙන් භූමි හා ජල පරිසර පද්ධතිවලට සිදුවන බලපෑම අවම කරයි. කඳවල වැව යනු පෙලිකන් වැනි දුර්ලභ සංක්‍රමණික පක්ෂි විශේෂ සඳහා ප්‍රසිද්ධ අභිජනන හා විවේක පරිසර පද්ධතියකි.
- සියලු නව සංවර්ධන හා දේශීය සැලසුම් කටයුතු සඳහා පාරිසරික බලපෑම් සලකා බැලීම.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 16 - තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාට ම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම

- සාමකාමීත්වය හා අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම ඉලක්කයට අනුගතව කොඅාවි හි ඉහළ විනයගරුක පරිසරයක් පවත්වාගෙන යනු ලැබේ.
- කොඅාවි දූෂණය ශූන්‍ය තත්ත්වයක පවත්වා ගනියි.
- නවක වදය සහ ශිෂ්‍ය හිංසනය කිසිදු අවස්ථාවක කොඅාවි සංස්කෘතියේ කොටසක් නොවේ. ඒ වෙනුවට, නායකත්වය සහ කණ්ඩායම් බන්ධන ක්‍රියාකාරකම් තුළින් කොඅාවි සිය සියලුම සිසුන් අතර අන්තර් සම්බන්ධතාවයක් ඇති කරයි.

තිරසර සංවර්ධන අභිමතාර්ථය 17 - තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාව ක්‍රියාත්මක කළහැකි විධික්‍රම හා නව පණගැන්වීම ශක්තිමත් කිරීම

- කොඅාවි විසින් ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලයක් පිහිටුවා ඇති අතර ගෝලීය හවුල්කාරිත්වයන් සක්‍රිය අන්දමෙන් සොයාබැලීම සඳහා අධ්‍යක්ෂවරයෙකු පත් කර තිබේ.
- විවිධ රටවල විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කර තිබේ.
- කොඅාවි වෙත පැමිණ ඇති විදේශීය නියෝජිතයින් සංඛ්‍යාව කොඅාවි ගෝලීයව සම්බන්ධ වීමට ඇති කැපවීම දක්වන දර්ශකයකි.
- සම සෞඛ්‍ය විද්‍යා පීඨය, කළමනාකරණ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය සහ KDU-CARE යන ආයතන සඳහා සහයෝගිතා වැඩසටහන් මගින් ලැබෙන පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව කොඅාවිහි ගෝලීය සම්බන්ධතාවය පෙන්නුම් කරයි.
- දේශීය හා විදේශීය පර්යේෂකයන් එකිනෙකා සමඟ සම්බන්ධවී ජාලයක් ගොඩනඟාගනිමින් සහයෝගීතාව ඇති කිරීමට වේදිකාවක් සැපයීම සඳහා ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව වාර්ෂිකව පවත්වන ලදී.
- ජාත්‍යන්තර සහයෝගීතා කටයුතු සඳහා වාර්ෂික පුනරාවර්තන අයවැයෙන් රු.මිලියන 20 ක් වෙන් කිරීම.
- නව නිපැයුම් හා නවෝත්පාදනයන්හි දැනුම හුවමාරුව සහ වාණිජකරණ කටයුතු සඳහා විදේශීය විශ්වවිද්‍යාල සමඟ බහු පාර්ශ්වීය හවුල්කාරිත්වයක් ඇතිකරගැනීම.
- KDU-CARE කර්මාන්ත හවුල්කරුවන් සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කරන අතර රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයට තවදුරටත් පහසුකම් සැලසීම සඳහා කර්මාන්ත ආශ්‍රිත පර්යේෂණ සිදු කරයි. කර්මාන්ත සමඟ ඇති සම්බන්ධතාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල-ව්‍යාපාර සම්බන්ධතාවය ගොඩනඟාගෙන තිබේ.
- කොඅාවි මේ වන විටත් විදේශීය විශ්වවිද්‍යාලවලින් අනුබද්ධ මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකු පත් කර ඇති අතර විදේශීය උගතුන් පර්යේෂණ සාමාජිකයන් ලෙස බඳවා ගැනීමෙන් විදේශීය පීඨ ආකර්ෂණය කර ගැනීමට පියවර ගෙන තිබේ.
- ද්විත්ව ආචාර්ය උපාධි පාඨමාලා, උපාධි පාඨමාලා හැදෑරීමට සුදුසුකම් සපුරාලන පාඨමාලා සහ වෙනත් ආකාරයේ විභේදනය වූ උපාධි පාඨමාලා ප්‍රදානය කිරීමට කටයුතු කරමින් සිටියි.
- කොඅාවි පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමයේ සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සංගමයේ සමාජිකත්වය ලබාගෙන තිබේ.

10. මූල්‍ය සමාලෝචනය

10.1 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

2020 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන විග්‍රහය සහ මුළු ආදායම පිළිබඳ විස්තරය (පුනරාවර්තන හා ප්‍රාග්ධන)

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2019 වර්ෂයට සාපේක්ෂව මුළු වත්කම් ප්‍රමාණය 2020 වර්ෂයේ දී 0.5% කින් වර්ධනය විය. පසුගිය පස් වසරක කාලයක් සඳහා වත්කම් අගය සහ උපනති විශ්ලේෂණය ඇතුළත් සාරාංශය පහත දැක්වෙන වගුව හා ප්‍රස්තාරය මඟින් දැක්වේ.

කොආවි වත්කම් විශ්ලේෂණය (රු.මි)

වර්ෂය	ජංගම වත්කම්	ස්ථාවර වත්කම්	මුළු වත්කම්
2016	6,448	27,363	33,811
2017	9,443	36,283	45,726
2018	8,359	41,177	49,536
2019	6,368	40,962	47,330
2020	4,835	42,743	47,578



මූල්‍ය පිරිවැය අයකිරීමට ප්‍රථම කොආවි හි 2019 වර්ෂයේ සහ 2020 වර්ෂයේ මෙහෙයුම් ලාභය පිළිවෙළින් රු.4,119,398,610/- සහ රු.4,417,762,210/- වශයෙන් වාර්තා වී තිබේ. මේ අනුව මූල්‍ය පිරිවැය ගණනය කිරීමට ප්‍රථම 2020 වර්ෂයේ දී මෙහෙයුම් ලාභය 7% කින් ඉහළ ගොස් තිබේ.

මෙම මෙහෙයුම් ලාභය කෙරෙහි හේතු වී ඇත්තේ 2020 වර්ෂය තුළදී කොආවි රෝහල සඳහා ලැබුණු ප්‍රදාන, පාඨමාලා ගාස්තු ආදායම, සහ රෝහලේ ආදායම වේ.

කෙසේ නමුත් 2019 වර්ෂයේ ක්ෂය 413,067,394/- වූ අතර එය 2020 වර්ෂයේදී රු. 508,518,953/- ක් විය. මෙසේ ක්ෂය ඉහළගොස් ඇත්තේ දීර්ඝ කාලීන ණය පොළී හේතුවෙනි.

තවද 2020 වර්ෂයේ ආදායම් ප්‍රකාශන විශ්ලේෂණය අනුව (මූල්‍ය ප්‍රකාශනවල 2 වන පිටුව) , ස්වයං උත්පාදක ක්‍රියාකාරකම්, දක්ෂිණ මණ්ඩපය, සහ SAITM විසින් පිළිවෙළින් රු.438,535,218/-, රු. 61,157,303/-, රු.17,565,446/- සහ රු.295,851,731/- වශයෙන් අතිරික්තය සඳහා දායකත්වය දක්වා තිබේ. පාඨමාලා ගාස්තු වැඩිවීම සහ ආයෝජන මත පොළී ආදායම වැනි ආදායම් 2020 වර්ෂයේ අතිරික්තය සඳහා ප්‍රධාන හේතු වේ.

10.2 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය					
සංක්ෂිප්ත මූල්‍ය තත්ව ප්‍රකාශනය					
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)					
දෙසැම්බර් 31 දිනට			2020		2019
					(නැවත ප්‍රකාශිත)
වත්කම්	සටහන				
ජංගම වත්කම්					
මුදල් හා මුදලට සමාන දෑ	02	3,388,206,854		5,243,179,028	
ණයකරුවන්	03	116,254,529		116,109,667	
භාණ්ඩ වට්ටෝරු	04	78,192,240		83,887,236	
පෙර ගෙවුම්/ලැබිය යුතු	05	1,209,012,285		868,483,763	
කැන්පතු හා අත්තිකාරම්	06	43,821,942		56,503,372	
ජංගම වත්කම් එකතුව			4,835,487,850		6,368,163,066
ආයෝජන	07		5,630,705,640		3,317,922,206
ජංගම නොවන වත්කම්					
ස්පෘශ්‍ය වත්කම්	08	36,718,456,276		37,021,752,022	
අස්පෘශ්‍ය වත්කම්	09	6,937,200		3,076,432	
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්	10	386,297,446		618,749,142	
ජංගම නොවන වත්කම් එකතුව			37,111,690,922		37,643,577,596
වත්කම් එකතුව			**47,577,884,412**		**47,329,662,868**
ස්කන්ධය හා වගකීම්					
ජංගම වගකීම්					
ණයගැතියන්	11	99,423,492		39,752,784	
උපචිත වියදම්	12	1,734,728,532		1,357,419,877	
වෙනත් ණයගැතියන්	13	1,275,831,949		1,162,266,887	
දිගු කාලීන ණය	15	68,172,000		68,172,000	
ජංගම වගකීම් එකතුව			3,178,155,973		2,627,611,549
ජංගම නොවන වගකීම්					
දිගු කාලීන ණය	15	35,446,821,114		35,192,568,364	
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	14	328,294,084		267,516,099	
ජංගම නොවන වගකීම් එකතුව			35,775,115,198		35,460,084,464
ස්කන්ධය					
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්	16	11,051,478,271		11,157,107,431	
රජයේ වෙනත් ප්‍රදානයන්	17	705,493,342		705,493,342	
ප්‍රාග්ධන සංචිත	18	321,919,644		325,125,146	
සමුච්චිත (හිඟය)/අතිරික්තය	19	(3,454,278,016)		(2,945,759,063)	
ස්කන්ධය එකතුව			8,624,613,240		9,241,966,856
ස්කන්ධය හා වගකීම් එකතුව			**47,577,884,412**		**47,329,662,868**
			(0)	-	**(0)**
විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසක් වන අදාල සටහන් සමගින් මෙම මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය .					
මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම කළමනාකරණ මණ්ඩලයේ වගකීමක්වේ . මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය මගින් අනුමත කරන ලද අතර ඒ වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ .					
මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ ආදායම් , වියදම්, ප්‍රාග්ධන, වගකීම් හා වත්කම් වල සත්‍ය ගිණුම් ඇතුලත් බවට අපි තරයේ විශ්වාස කරන බව සහතිකකර සිටිමු .					
අත්.කළේ :		අත්.කළේ :		අත්.කළේ :	
.....		.....		.....	
ජෙනරාල් (විශ්‍රාමික)කමල් ගුණරත්න		**මේජර් ජෙනරාල් එම්පී පීරිස්**		**එන්ඩබ් විමලවීර**	
WWV RWP RSP USP ndc psc		RWP RSP VSV USP		FCA,CIPFA,FMAAT,Bcom (Sp)Hons	
ආරක්ෂක ලේකම්		අප කුලපති		මූල්‍යාධිකාරි	
		කොආවි		කොආවි	

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය							
සංක්ෂිප්ත විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය							
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)							
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා		2020	2019				
			(නැවත ප්‍රකාශිත)				
	සටහන						
ස්වභාවය අනුව ආදායම							
රජයේ පුනරාවර්තන දායකත්වය	20	6,857,225,302	6,215,586,705				
පාඨමාලා ගාස්තු	21	1,479,563,744	1,454,532,662				
රෝහල් ආදායම	22	130,852,639	6,901,809				
වෙනත් විවිධ ආදායම්	23	451,261,515	406,282,319				
ආදායම් එකතුව		**8,918,903,200**	**8,083,303,494**				
ස්වභාවය අනුව ආදායම							
පුද්ගල පඩි නඩි	24	1,956,783,614	1,717,345,901				
ගමන් වියදම්	25	4,732,931	8,093,412				
සැපයුම් හා අවශ්‍යතා	26	231,452,952	112,765,023				
නඩත්තු	27	176,207,972	93,819,324				
ගිවිසුම්ගත සේවාවන්	28	497,943,861	456,376,480				
වෙනත් පුනරාවර්තන වියදම්	29	297,842,119	232,370,698				
රෝහල් වියදම්	30	72,288,867	-				
ක්ෂයකිරීම්	31	1,259,529,475	1,340,148,023				
ක්‍රමක්ෂය	32	2,292,053	1,792,047				
ස්ථාවර වත්කම් අපහරණය මත පාඩුව	33	2,067,147	1,193,977				
මෙහෙයුම් වියදම් එකතුව		**4,501,140,990**	**3,963,904,884**				
මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් කාලසීමාව සඳහා අතිරික්තය /(හිඟය)		**4,417,762,210**	**4,119,398,610**				
මූල්‍ය (ආදායම්)/වියදම්	34	4,926,281,163	4,532,466,004				
කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)		**(508,518,953)**	**(413,067,394)**				
විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසක් වන අදාල සටහන් සමඟින්							
මෙම මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය.							
ආදායම් ප්‍රකාශය විශ්ලේෂණය							
	විශ්වවිද්‍යාලය	**උපාධි අධ්‍යයන පීඨය**	**ස්වයං මූල්‍ය අරමුදල**	**දක්ෂිණ මණ්ඩපය**	**විශ්වවිද්‍යාල රෝහල-කොඅවි**	**සෞඛ්‍ය (SAITM)**	**එකතුව**
ආදායම (ශ්‍රීලරු)							
රජයේ පුනරාවර්තන ප්‍රදාන	1,496,112,007	-	-	150,517,154	5,210,596,141	-	6,857,225,302
පාඨමාලා ගාස්තු	-	67,632,995	880,511,420	116,401,895	53,767,853	361,249,582	1,479,563,744
රෝහල් ආදායම	-	-	-	-	130,852,639	-	130,852,639
වෙනත් ආදායම්	21,850,624	21,217,005	213,221,143	2,520,764	151,881,120	40,570,859	451,261,515
එකතුව	**1,517,962,631**	**88,850,000**	**1,093,732,563**	**269,439,813**	**5,547,097,753**	**401,820,441**	**8,918,903,200**
(-) වියදම් (ශ්‍රීලරු)							
පුද්ගල පඩිනඩි	1,336,941,129	-	57,958,825	154,805,832	391,839,660	15,238,167	1,956,783,614
ගමන් වියදම්	588,791	67,198	1,758,844	2,200,937	-	117,160	4,732,931
සැපයුම් හා අවශ්‍යතා	14,369,429	1,166,134	56,265,778	4,425,424	146,931,439	8,294,746	231,452,952
නඩත්තු	2,924,556	2,583,082	118,250,558	4,513,575	46,199,416	1,736,785	176,207,972
ගිවිසුම්ගත සේවාවන්	48,921,546	8,522,445	124,200,150	29,391,930	245,136,929	41,770,862	497,943,861
වෙනත් පුනරාවර්තන වියදම්	18,745,643	14,534,079	190,496,896	15,234,557	21,162,805	37,668,139	297,842,119
රෝහල් වියදම්					72,288,867		72,288,867
ක්ෂයකිරීම්	151,770,885	816,010	62,285,053	40,760,536	1,002,779,023	1,117,967	1,259,529,475
ක්‍රමක්ෂය	1,111,891	-	649,684	530,478	-	-	2,292,053
ස්ථාවර වත්කම් අපහරණය මත පාඩුව	2,056,049	-	-	11,098	-	-	2,067,147
එකතුව	**1,577,429,919**	**27,688,947**	**611,865,788**	**251,874,367**	**1,926,338,140**	**105,943,828**	**4,501,140,990**
මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් කාලසීමාව සඳහා අතිරික්තය /(හිඟය)	**(59,467,288)**	**61,161,053**	**481,866,775**	**17,565,446**	**3,620,759,612**	**295,876,613**	**4,417,762,210**
මූල්‍ය වියදම්	27,505	3,750	43,331,557	-	4,882,893,470	24,882	4,926,281,163
කාලසීමාව සඳහා ශුද්ධ අතිරික්තය/(හිඟය)	**(59,494,792)**	**61,157,303**	**438,535,218**	**17,565,446**	**(1,262,133,858)**	**295,851,731**	**(508,518,953)**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
අරමුදල් හා සංචිත වෙනස්වීම පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශනය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාර්තුව සඳහා
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

විස්තරය	රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	රජයේ වෙනත් ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත	සමුච්චිත අතිරික්තය/ හිඟය	ස්කන්ධ එකතුව
2019.01.01 දිනට ශේෂය	11,271,527,884	705,493,342	330,289,643	(2,315,702,807)	9,991,608,062
ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් හා වැරදි	-	-		(216,988,862)	(216,988,862)
2019.01.01 දිනට ශේෂය (නැවත ප්‍රකාශිත)	11,271,527,884	705,493,342	330,289,643	(2,532,691,669)	9,774,619,200
රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්	27,000,000	-	-	-	27,000,000
වසර තුල ආදායම් ප්‍රකාශන සඳහා ප්‍රාග්ධන මාරුකිරීම්	(141,420,453)	-	-	-	(141,420,453)
රන් පදක්කම් පරිත්‍යාග අරමුදල	-	-	96,717	-	96,717
පුස්තකාල පොත් පරිත්‍යාග අරමුදල	-	-	1,564,346	-	1,564,346
වාහන පරිත්‍යාග අරමුදල	-	-	(683,836)	-	(683,836)
විදුලි ආලෝක පරිත්‍යාග අරමුදල	-	-	(30,686)	-	(30,686)
ඔරු පැදීමේ උපකරණ පරිත්‍යාග අරමුදල	-	-	(160,000)	-	(160,000)
විලම්බිත ආදායම - රජයේ ප්‍රදාන කම්කරු සම්පත්	-	-	(5,951,038)	-	(5,951,038)
කාලසීමාව සඳහා අතිරික්තය / හිඟය	-	-	-	(413,067,394)	(413,067,394)
2020.01.01 දිනට ශේෂය	11,157,107,431	705,493,342	325,125,146	(2,945,759,063)	9,241,966,856
<u>ගැලපීම්</u>					
රජයේ ප්‍රාග්ධන ප්‍රදාන	33,000,000	-	-	-	33,000,000
විශ්වවිද්‍යාල රෝහල - කොආවි සඳහා ප්‍රාග්ධන ප්‍රදානය	7,000,000	-	-	-	7,000,000
වසර තුල ආදායම් ප්‍රකාශන සඳහා ප්‍රාග්ධන මාරුකිරීම්	(145,629,161)	-	-	-	(145,629,161)
රන් පදක්කම් පරිත්‍යාග අරමුදල	-	-	96,809	-	96,809
පුස්තකාල පොත් පරිත්‍යාග අරමුදල	-	-	2,839,413	-	2,839,413
විදුලි ආලෝක පරිත්‍යාග අරමුදල	-	-	(30,686)	-	(30,686)
ඔරු පැදීමේ උපකරණ පරිත්‍යාග අරමුදල			(160,000)	-	(160,000)
විලම්බිත ආදායම - රජයේ ප්‍රදාන කම්කරු සම්පත්	-	-	(5,951,038)	-	(5,951,038)
කාලසීමාව සඳහා අතිරික්තය / හිඟය	-	-	-	(508,518,953)	(508,518,953)
2020.12.31 දිනට ශේෂය	**11,051,478,271**	**705,493,342**	**321,919,644**	**(3,454,278,016)**	**8,624,613,240**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය						
මුදල් ප්‍රවාහ ප්‍රකාශය						
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)						
මාර්තු 31 දිනෙන් අවසන් වන වසර සඳහා		**2,020**			**2,019**	
					(නැවත ප්‍රකාශිත)	
	සටහන					
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය						
වසර සඳහා අතිරික්තය /(හිඟය)	20	(508,518,953)			(413,067,394)	
ගැලපුම් කිරීම් :						
ස්ථාවර වත්කම් ක්ෂය කිරීම	30	1,259,529,475			1,340,148,023	
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	31	2,292,053			1,792,047	
භූවමාරු පාඩුව/(ලාභය)	33	131,600,691			210,325,927	
විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය සඳහා ප්‍රතිපාදන	14	72,726,770			144,726,082	
බොල් ණය සඳහා ප්‍රතිපාදන		1,803,560		-	22,815	
දේපළ, පිරියත හා උපකරණ අපහරණය මත පාඩුව	32	2,067,147			1,193,977	
ලියාහරින ලද ණයභිමියන්	23	-			(10,052,580)	
ලියාහරින ලද නොගෙවූ ගෙවීම්	23	-			(335,736)	
ප්‍රාග්ධන ප්‍රදානයන් ක්‍රමක්ෂය	17	(145,629,161)			(141,420,453)	
වාහන පරිත්‍යාග ආදායම	23.01	-			(683,836)	
රජයේ ප්‍රදාන කම්කරු සම්පත් ආදායම	23.01	(5,951,038)			(5,951,038)	
විදුලි ආලෝක පරිත්‍යාග ආදායම	23.01	(30,686)			(30,686)	
උපකරණ පරිත්‍යාග ආදායම	23.01	(160,000)			(160,000)	
ණය පොළි වියදම	33	4,792,367,066			4,319,300,546	
පොළී ආදායම	23	(228,087,591)			(213,663,704)	
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර අතිරික්තය /(හිඟය)		5,374,009,334			5,232,143,989	
වට්ටෝරු භාණ්ඩ (වැඩිවීම)/ අඩුවීම		5,694,997			(45,533,343)	
ණයභිමියන් හා වෙනත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම		(337,523,438.61)			(24,389,639)	
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ වල වැඩිවීම /(අඩුවීම)		527,909,663			(1,806,175,790)	
මෙහෙයුම් මගින් උත්පාදනය වූ /(භාවිත කළ) මුදල්		5,570,090,555			3,356,045,217	
විශ්‍රාම පාරිකෝෂික සඳහා ගෙවීම්	14.01	(11,948,786)			(17,034,237)	
ගෙවූ ණය පොළී		(4,792,367,066)			(4,319,300,546)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් /(භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ			765,774,703			(980,289,566)
ආයෝජන ක්‍රියාකාරකම් මගින් /(භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ						
ස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම	08	(607,672,477)			(315,325,863)	
අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම	09	(6,152,820)			(300,000)	
සිදුකරමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්	10	(115,673,840)			(68,966,082)	
දේපළ, පිරියත හා උපකරණ අපහරණය මගින් ලද මුදල්	32	336,550			175,064	
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	07	(2,341,100,000)			(600,000,000)	
ස්ථාවර තැන්පතු ඉවත්කර ගැනීම්	07	250,000,000			-	
පොළී ආදායම	23	68,645,992			103,896,024	
ආයෝජන ක්‍රියාකාරකම් මගින් /(භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ			(2,751,616,595)			(880,520,858)
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් /(භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ						
රජයේ ප්‍රාග්ධන දායකත්වය	17	40,000,000			27,000,000	
ප්‍රාග්ධන සංචිතය	19	96,809			96,717	
ණය ආපසුගෙවීම	15	(68,172,000)			(68,172,000)	
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් /(භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහ			(28,075,191)			(41,075,283)
මුදල් හා මුදලට සමාන දෑවල ශුද්ධ වැඩිවීම /(අඩුවීම)			**(2,013,917,083)**			**(1,901,885,707)**
වසර ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ	02		5,243,179,028			7,175,654,343
වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ			**3,229,261,944**			**5,273,768,635**
මුදල් හා මුදලට සමාන දෑ						
බැංකුවේ ඇති මුදල්	02.01		3,388,206,854			5,243,179,028
භූවමාරු (පාඩුව)/ලාභය	33		(158,944,910)			30,589,608
වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ			**3,229,261,944**			**5,273,768,635**
			(0)	-	-	(0)
විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසක් වන අදාල සටහන් සමගින් මෙම මූල්‍ය ප්‍රකාශන කියවිය යුතුය .						

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍යය

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (මින්මතු කොආවි ලෙස හැඳින්වෙන) 1981 අංක 68 දරන පාර්ලිමේන්තු පනත මගින් සංස්ථාපිත කරන ලද අතර විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි කාර්යාලය කඳවල වත්ත, රත්මලාන, ශ්‍රී ලංකාව යන ස්ථානයේ පිහිටා ඇත. විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකවේ.

කොආවි විශ්වවිද්‍යාල රෝහල වෙනම නෛතික අස්තිත්වයක් ලෙස ස්ථාපනය කරන තෙක් විශ්වවිද්‍යාලය යටතේ මෙහෙයුම්කරන ලද අතර එය යටතේ දක්වා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

මෙම වසර තුල විශ්වවිද්‍යාලය උපාධි අපේක්ෂකයින්ට හා පශ්චාත් උපාධිධාරින්ට අධ්‍යාපනික සේවාවන් සැපයීම සහ කැඩෙට් නිලධාරීන්ට හා සිවිල් සිසුන්ට වෙනත් උසස් අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමේ සේවාවන්හි නිරත විය.

1.3 මව් ව්‍යවසාය හා අත්‍යන්ත අත්‍යන්ත ව්‍යවසාය

විශ්වවිද්‍යාලයේ අත්‍යන්ත මව් ආයතනයක් නොමැත. - මව් ආයතනය වන්නේ කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයයි.

1.4 කළමනාකරණ මණ්ඩලයේ වගකීම් ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීමවේ.

1.5 නිකුත් කිරීම සඳහා බලය ලැබූ දිනය

කළමනාකරණ මණ්ඩලය විසින් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2021 පෙබරවාරි 25වන දින බලය ලබාදෙනු ලැබීය.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1 පිළියෙල කිරීමේ පදනම

අනුකූලතා ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශනයන් මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සටහන් වලින් සමන්විතවේ. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAs) අනුකූලව පිළියෙල කර ඇත.

2.2 මූල්‍ය වර්ෂය

සෑම වසරකම ජනවාරි 1වන දින සිට දෙසැම්බර් 31 වන දින සිට කාලය මූල්‍ය වර්ෂය වේ.

2.3 පිළියෙල කිරීමේ පදනම

අදාල සටහන් යටතේ සාධාරණ අගය සම්බන්ධයෙන් සුදුසු අනාවරණයන් සිදුකරන අවස්ථාවන්හි හැර මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් හා ඓතිහාසික පිරිවැය පදනම යටතේ පිළියෙලකර ඇත.

2.4 ව්‍යවහාර හා ඉදිරිපත් කරන මුදල් වර්ගය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන, විශ්වවිද්‍යාලයේ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරන සියලු මූල්‍යමය තොරතුරු ආසන්න රුපියල් අගයට පූර්ණ සංඛ්‍යාවෙන් දැක්වේ.

2.5 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

නිල සංග්‍රහ		7,940		18,389
අන්තර්ජාල හා විද්‍යුත් තැපෑල		14,002,891		-
පුහුණු හා සංවර්ධන		-		696,300
දූරකතන වියදම්		169,355		127,432
උපාධි ප්‍රදානෝත්සවයේ වියදම්		1,280,000		-
වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණ		-		831,163
එකතුව		**41,770,862**		**14,957,045**
29. වෙනත් පුනරාවර්තන වියදම්				
29.01 විශ්වවිද්‍යාලය		18,745,643		47,232,772
29.02 උපාධි අධ්‍යයන පීඨය		14,534,079		17,002,264
29.03 ස්වයං මූල්‍ය අරමුදල		190,496,896		113,072,240
29.04. දක්ෂිණ මණ්ඩපය		15,234,557		11,740,302
29.05. විශ්වවිද්‍යාල රෝහල - කොආවි		21,162,805		12,225,393
29.06 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල		37,668,139		31,097,726
එකතුව		**297,842,119**		**232,370,698**
29.01. විශ්වවිද්‍යාලය				
රක්ෂණ වියදම්		-		353,600
පුහුණුකරු ගාස්තු		196,875		1,630,000
කළ. මණ්ඩල/ විගණන හා කළමනාකරණ රැස්වීම්		526,550		1,011,900
ලේකම් හා ලිපිකරු සඳහා දීමනා		28,700		27,300
දායකත්ව ගාස්තු		1,599,061		5,352,800
ශිෂ්‍ය පුහුණු ද්‍රව්‍ය හා සංචාර		14,229		246,164
ප්‍රකාශන හා මුද්‍රණ කාර්යයන්		12,210		1,567,495
විවිධ වියදම්		288,691		784,113
ටෙන්ඩර මණ්ඩල ගාස්තු		408,750		273,250
SVC කැඩෙට් නිලධාරීන් සඳහා සලාක දීමනා		-		644,452
විද්‍යාගාර හා රසායන ද්‍රව්‍ය වියදම්		213,276		1,952,955
විද්‍යාගාර පන්ති වියදම්		-		300,666
නෛතික වියදම්		9,610		108,380
විභාග ගාස්තු		7,495,552		12,894,278
ප්‍රතිපාදන යටතේ බොල් ණය		163,832		22,815
සම්මුඛ පරීක්ෂණ ගාස්තු		1,618,493		1,457,600
වෛද්‍ය සිසුන් පුහුණු කිරීමේ ගාස්තු		-		45,000
බාහිර කථිකාචාර්ය ගාස්තු		1,894,338		18,083,982
විශ්වවිද්‍යාලය කාර්ය මණ්ඩලයේ දේපළ ණය පොළිය		-		198,374
විගණන ගාස්තු		1,446,900		193,998
සේවක වන්දිගෙවීම්		2,719,501		-
විශ්‍රාම වැටුප් දායකත්වය		109,077		83,650
එකතුව		**18,745,643**		**47,232,772**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය				
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)				
දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා		2020		2019
				(නැවත ප්‍රකාශිත)
29.02 උපාධි අධ්‍යයන පීඨය				
දේශණ ගාස්තු - BSc		720,000		668,000
දේශණ ගාස්තු - MSc		2,568,000		3,324,000
දේශණ ගාස්තු - ඉංග්‍රීසි පාඨමාලාව		270,000		1,062,000
දේශණ ගාස්තු - ඊ-පාලනය		60,000		624,000
දේශණ ගාස්තු - Mphil/PHD		373,000		490,000
දේශණ ගාස්තු - MBA කාර්ය සම්පාදන කළමනාකරණ		1,581,000		1,848,000
දේශණ ගාස්තු - Master of LLB		1,128,000		1,281,000
දේශණ ගාස්තු - ආරක්ෂක අධ්‍යයන		1,101,000		1,047,000
දේශණ ගාස්තු - විදුලි ඉංජිනේරු විද්‍යාව		288,000		630,000
දේශණ ගාස්තු - ඉලෙක්ට්‍රොනික හා දුරකතන සන්නිවේදන		330,000		450,000
කම්කරු ගාස්තු		766,500		1,136,500
දේශණ ගාස්තු - CCNA		36,000		240,000
දේශණ ගාස්තු - DRRD		1,098,000		1,176,000
විවිධ වියදම්		247,339		342,144
විභාග ගාස්තු		1,435,190		549,120
VIVA /නිබන්ධන/PRC ගෙවීම්		1,742,000		1,477,000
සම්මුඛ පරීක්ෂණ ගාස්තු		60,050		55,000
සම්බන්ධීකාරක දීමනාව		730,000		602,500
එකතුව		**14,534,079**		**17,002,264**
29.03. ස්වයං මූල්‍ය අරමුදල				
වැඩමුළු වියදම්		2,365,048		3,416,905
බාහිර කථිකාචාර්ය ගාස්තු		12,970,332		1,172,063
සම්මන්ත්‍රණ වියදම්		9,324,659		8,910,602
KDU Care වියදම්		430,127		3,300,073
සම්මුඛ පරීක්ෂණ ගාස්තු		629,247		515,299
ශිෂ්‍ය පුහුණු ද්‍රව්‍ය හා සංචාර		181,750		6,884,240
නෛතික වියදම්		101,776		442,750
රක්ෂණ වියදම්		1,252,354		-
රෙදි සේදුම් වියදම්		-		54,323
පර්යේෂණ ප්‍රදාන වියදම්		24,940,621		20,611,209
සුභසාධන හා රක්ෂණ		13,267,564		27,200
පුද්ගලික සැලසුම් සටහන් හා කැලැන්ඩර වියදම්		12,814,550		1,921,375
කළ. මණ්ඩල/ විගණන හා කළමනාකරණ රැස්වීම්		938,386		2,400
ඖෂධ වියදම්		37,611,853		-
දායකත්ව ගාස්තු		21,172,850		3,449,978
කොඇවි මුද්‍රණාගාර වියදම්		1,215,601		1,074,086
නැගි වවුචර් වියදම්		13,220,000		18,550,000
විභාග ගාස්තු		20,778,257		3,925,012
පුහුණුකරු ගාස්තු		845,625		442,500
පාඨමාලා හැඹිරවීමේ ගාස්තු - 33 වන ඇතුළත් වීම		-		384,060
පාඨමාලා හැඹිරවීමේ ගාස්තු - 34වන ඇතුළත් වීම		-		683,434
පාඨමාලා හැඹිරවීමේ ගාස්තු - 35වන ඇතුළත් වීම		1,084,212		14,342,365
පාඨමාලා හැඹිරවීමේ ගාස්තු - 36වන ඇතුළත් වීම		614,902		18,948,793
පාඨමාලා හැඹිරවීමේ ගාස්තු - 37වන ඇතුළත් වීම		5,058,703		-
විවිධ වියදම්		4,175,126		3,549,523
පුස්තකාල සංවර්ධනය		-		464,052
විද්‍යාගාර වියදම්		2,582,904		-
රැස්වීම් සඳහා සහභාගිවීමේ දීමනාව		675,667		-
ලේකම් හා ලිපිකරු සඳහා දීමනා		2,700		-
ටෙන්ඩර මණ්ඩල ගාස්තු		647,000		-
ප්‍රතිපාදන යටතේ බොල් ණය හා අඩමාණ ණය		1,562,054		-
විද්‍යාගාර පන්ති		33,025		-
එකතුව		**190,496,896**		**113,072,240**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය				
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)				
දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා		2020		2019
				(නැවත ප්‍රකාශිත)
29.04. දක්ෂණ මණ්ඩපය				
විවිධ වියදම්		1,042,514		888,406
විභාග ගාස්තු		2,904,221		1,417,950
සිවිල් ආරක්ෂක වියදම්		1,483,550		2,056,650
බාහිර කථිකාචාර්ය වියදම්		8,489,428		7,203,126
උපදේශන ගාස්තු		52,000		-
සම්මුඛ පරීක්ෂණ වියදම්		-		174,170
CVCD වියදම්		430,976		-
ප්‍රදර්ශන වියදම්		654,194		-
ප්‍රතිපාදන යටතේ ඇති අඩමාන ණය		77,675		-
දායකත්ව ගාස්තු		100,000		-
එකතුව		**15,234,557**		**11,740,302**
29.05. විශ්වවිද්‍යාල රෝහල -කොආවි				
ආහාර පාන		16,077,251		9,820,040
ගිනි නිවීම් උපකරණ		374,727		548,379
සම්මුඛ පරීක්ෂණ ගාස්තු		128,350		12,400
රෙදි සේදුම් වියදම්		964,275		637,725
ප්‍රවාහන - වෛද්‍ය		-		374,950
විවිධ වියදම්		3,618,202		831,900
එකතුව		**21,162,805**		**12,225,393**
29.06 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල				
පාඨමාලා පැවැත්වීමේ ගාස්තු		1,182,049		21,874,152
සායනික වියදම්		16,156,000		-
දැනුවත්කිරීමේ වැඩසටහන් වියදම්		-		2,293,650
සම්මුඛ පරීක්ෂණ ගාස්තු		131,000		152,210
විභාග ගාස්තු		12,022,275		3,538,965
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය		1,878,440		411,044
සමාරම්භක උත්සවය		150,000		315,760
විද්‍යාගාර හා රසායන ද්‍රව්‍ය වියදම්		1,740,424		1,967,440
ශිෂ්‍ය පුහුණු ද්‍රව්‍ය		189,540		67,042
බාහිර කථිකාචාර්යවරුන් සඳහා වියදම්		3,344,262		-
VIVA ගෙවීම්		869,149		440,513
නෛතික වියදම්		-		35,000
දායකත්ව ගාස්තු		5,000		-
විවිධ වියදම්		-		1,950
එකතුව		**37,668,139**		**31,097,726**
30. රෝහල් වියදම්				
30.01 විශ්වවිද්‍යාල රෝහල -කොආවි		72,288,867		-
		72,288,867		**-**
30.01 විශ්වවිද්‍යාල රෝහල -කොආවි				
උපදේශකයින් සඳහා ගාස්තු		57,562,365		-
කාර්ය මණ්ඩලය සඳහා ගාස්තු		9,476,334		-
වෛද්‍ය සැපයුම්		2,099,563		-
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය		414,173		-
ආහාර පාන		251,779		-
නඩත්තු වියදම්		1,844,359		-
විවිධ වියදම්		640,293		-
		72,288,867		**-**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය				
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)				
දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා		2020		2019
				(නැවත ප්‍රකාශිත)
31. ක්ෂය කිරීම				
31.01 විශ්වවිද්‍යාලය	08.01.01	151,770,885		142,167,021
31.02 උපාධි අධ්‍යයන පීඨය	08.01.02	816,010		1,000,824
31.03 ස්වයං මූල්‍ය අරමුදල	08.01.03	62,285,053		76,969,351
31.04 දක්ෂිණ මණ්ඩපය	08.01.04	40,760,536		38,865,493
31.05 විශ්වවිද්‍යාල රෝහල - කොආවි	08.01.05	1,002,779,023		1,080,561,855
31.06 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල		1,117,967		583,478
එකතුව		**1,259,529,475**		**1,340,148,023**
32. ක්‍රමක්ෂය				
32.01 විශ්වවිද්‍යාලය	9.01	1,111,891		1,075,727
32.02 ස්වයං මූල්‍ය අරමුදල	9.02	649,684		185,842
32.03 දක්ෂිණ මණ්ඩපය	9.03	530,478		530,478
එකතුව		**2,292,053**		**1,792,047**
33. ස්ථාවර වත්කම් අපහරණය මත පාඩුව				
33.01 විශ්වවිද්‍යාලය		2,056,049		1,193,977
33.02 දක්ෂිණ මණ්ඩපය		11,098		-
එකතුව		**2,067,147**		**1,193,977**
33.01 විශ්වවිද්‍යාලය				
විකිණීමෙන් ලද මුදල්		336,550		175,064
අඩුකළා:ලියා තබන ලද අගය		2,392,599		1,369,041
ශුද්ධ පාඩුව		**2,056,049**		**1,193,977**
33.02 දක්ෂිණ මණ්ඩපය				
විකිණීමෙන් ලද මුදල්		-		-
අඩුකළා:ලියා තබන ලද අගය		11,098		-
ශුද්ධ පාඩුව		**11,098**		**-**
34. මූල්‍ය වියදම්				
34.01 විශ්වවිද්‍යාලය		27,505		80,796
34.02 උපාධි අධ්‍යයන පීඨය		3,750		11,510
34.03 ස්වයං මූල්‍ය අරමුදල		43,331,557		42,444,894
34.04 විශ්වවිද්‍යාල රෝහල - කොආවි		4,882,893,470		4,489,904,804
34.05 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල		24,882		24,000
එකතුව		**4,926,281,163**		**4,532,466,004**
34.01 විශ්වවිද්‍යාලය				
බැංකු ගාස්තු		27,505		80,796
එකතුව		**27,505**		**80,796**
34.02 උපාධි අධ්‍යයන පීඨය				
බැංකු ගාස්තු		3,750		11,510
එකතුව		**3,750**		**11,510**
34.03 ස්වයං මූල්‍ය අරමුදල				
බැංකු ගාස්තු		427,060		148,855
ණය පොලී වියදම්		42,193,673		62,255,630
හුවමාරු ලාභ	31.03.01	710,823		(19,959,590)
එකතුව		**43,331,557**		**42,444,894**

දෙසැම්බර් 31 දිනට		2020		2019
				(නැවත ප්‍රකාශිත)
34.03.01 විනිමය පාඩුව/(ලාභය)				
ලැබිය යුතු -නේවාසිකාගාර ගාස්තු -විදේශිය සිසුන්		98,366		(49,187)
ලැබිය යුතු -පාඨමාලා ගාස්තු -විදේශිය සිසුන්		995,357		360,059
ස්ථාවර තැන්පතු අංක : 080-60-02-00000178-4		-		(20,444,181)
ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොළිය		-		(12,827)
උසස් -පාඨමාලා ගාස්තු -විදේශිය සිසුන්		(382,900)		186,546
එකතුව		710,823		(19,959,590)
34.04 විශ්වවිද්‍යාලරෝහල - කොආවි				
විනිමය පාඩුව	31.04.01	130,889,868		230,285,517
බැංකු ගාස්තු		628,925		243,883
ණයවර ලිපි ගාස්තු		1,201,284		2,330,489
දිගුකාලීන ණය පොලී වියදම්		4,750,173,393		4,257,044,916
එකතුව		**4,882,893,470**		**4,489,904,804**
34.04.01 විනිමය පාඩුව/ (ලාභය)				
BOC ඇ.ඩො. ඉතිරුම් ගිණුම -74532847		(158,944,910)		30,589,608
ස්ථාවර තැන්පතු අංක : 080-60-02-00000178-4		(71,986,009)		-
මහජන බැංකුව- ස්ථාවර තැන්පතු - අංක: 080-60-02-00000190-8		7,250,000		-
ලංකා බැංකුව-ස්ථාවර තැන්පතු - අංක: 85991494		7,350,000		-
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය		644,851		-
LC ආන්තික		1,133,525		356,096
ගෙවිය යුතු රඳවා ගැනීම්		2,688,572		(33,308)
ගෙවිය යුතු ණය පොළිය		(1,600,208)		7,380
කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු		-		53,736
NSB ණය		322,424,750		217,952,870
ආනයන ණයහිමියන්		21,929,297		(18,640,865)
ශුද්ධ හුවමාරු ලාභ /(පාඩු)		**130,889,868**		**230,285,517**
34.05 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල				
බැංකු ගාස්තු		24,882		24,000
එකතුව		**24,882**		**24,000**
35.පාලන ගිණුම්		ලැබිය යුතු / (ගෙවිය යුතු)		ලැබිය යුතු / (ගෙවිය යුතු)
35.01 විශ්වවිද්‍යාලය		9,952,768		(52,499,037)
35.02උපාධි අධ්‍යයන පීඨය		5,413,347		5,955,347
35.03 ස්වයං මූල්‍ය අරමුදල		865,216,322		13,772,269
35.04 දක්ෂිණ මණ්ඩපය		(88,529,372)		(79,418,553)
35.05 විශ්වවිද්‍යාල රෝහල -කොආවි		(895,657,689)		-
35.06 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල		135,012,093		24,510,167
එකතුව		31,407,470		(87,679,808)

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය				
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්				
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)				
දෙසැම්බර් 31 දිනට		2020		2019
				(නැවත ප්‍රකාශිත)
35.01 විශ්වවිද්‍යාලය				
පාලන ගිණුම -ස්වයං මූල්‍ය අරමුදල		(8,910,493)		1,276,295
පාලන ගිණුම -දක්ෂිණ මණ්ඩපය		61,720,128		318,627,439
පාලන ගිණුම -විශ්වවිද්‍යාල රෝහල - කොආවි		(42,661,842)		(32,915,685)
පාලන ගිණුම - අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල		(195,025)		698,468
එකතුව		9,952,768		287,686,517
35.02උපාධි අධ්‍යයන පීඨය				
පාලන ගිණුම -ස්වයං මූල්‍ය අරමුදල		5,413,347		5,413,347
එකතුව		5,413,347		5,413,347
35.03 ස්වයං මූල්‍ය අරමුදල				
පාලන ගිණුම -විශ්වවිද්‍යාලය		38,089,283		-
පාලන ගිණුම -උපාධි අධ්‍යයන පීඨය		(5,413,347)		(5,413,347)
පාලන ගිණුම -දක්ෂිණ මණ්ඩපය		26,809,244		58,584,842
පාලන ගිණුම -විශ්වවිද්‍යාල රෝහල - කොආවි		938,319,531		(59,658,004)
පාලන ගිණුම - අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල		(132,588,388)		(24,470,325)
එකතුව		865,216,322		(30,956,834)
35.04 දක්ෂිණ මණ්ඩපය				
පාලන ගිණුම -විශ්වවිද්‍යාලය		(61,720,128)		(318,627,439)
පාලන ගිණුම -ස්වයං මූල්‍ය අරමුදල		(26,809,244)		(58,584,842)
එකතුව		(88,529,372)		(377,212,281)
35.05 විශ්වවිද්‍යාල රෝහල-කොආවි				
පාලන ගිණුම -විශ්වවිද්‍යාලය		42,661,842		32,915,685
පාලන ගිණුම -ස්වයං මූල්‍ය අරමුදල		(938,319,531)		59,658,004
එකතුව		(895,657,689)		92,573,689
35.06 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල				
පාලන ගිණුම -විශ්වවිද්‍යාලය		579,705		-
පාලන ගිණුම -ස්වයං මූල්‍ය අරමුදල		134,432,388		24,510,167
එකතුව		135,012,093		24,510,167

36. පෙර වසරේ ගැලපුම්

2019 වසරේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදුවූ පහත සඳහන් වැරදි හා මහ හැරීම් හේතුවෙන් වාර්තාකරණ කාලසීමාව තුල ආදායම් , වියදම්, වත්කම් හා වගකීම් ඇතුළත් කිරීමේදී සන්සන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශිතය . 2019 වසර සඳහා නැවත ප්‍රකාශකිරීමේ සමස්ත බලපෑම පහත පරිදිවේ :

		2019		2018
		(නැවත ප්‍රකාශිත)		(නැවත ප්‍රකාශිත)
36.01 විශ්වවිද්‍යාලය				
2019.01.01 දිනට ඉදිරියට ගෙන එන ලද අතිරික්ත / හිඟ ශේෂය		(291,177,921)		(310,802,277)
එකතුකළා : කාලසීමාව සඳහා නැවත ප්‍රකාශිත අතිරික්තය/ (හිඟය)	36.01.01	(132,788,041)		19,624,357
2019.12.31 දිනට ඉදිරියට ගෙනඑන ලද නැවත ප්‍රකාශිත අතිරික්තය /(හිඟය)		**(423,965,962)**		**(291,177,921)**
36.02 ස්වයං මූල්‍ය අරමුදල				
2019.01.01 දිනට ඉදිරියට ගෙනඑන ලද අතිරික්ත / හිඟ ශේෂය		1,897,245,256		1,296,749,266
එකතුකළා : කාලසීමාව සඳහා නැවත ප්‍රකාශිත අතිරික්තය/ (හිඟය)	36.02.01	600,671,932		600,495,990
2019.12.31 දිනට ඉදිරියට ගෙනඑන ලද නැවත ප්‍රකාශිත අතිරික්තය /(හිඟය)		**2,497,917,188**		**1,897,245,256**
36.03 දක්ෂිණ මණ්ඩපය				
2020.01.01 දිනට ඉදිරියට ගෙනඑන ලද අතිරික්ත / හිඟ ශේෂය		(127,967,227)		(74,528,318)
එකතුකළා : කාලසීමාව සඳහා නැවත ප්‍රකාශිත අතිරික්තය/ (හිඟය)	36.03.01	(3,592,350)		(53,438,909)
2019.12.31 දිනට ඉදිරියට ගෙනඑන ලද නැවත ප්‍රකාශිත අතිරික්තය /(හිඟය)		**(131,559,577)**		**(127,967,227)**
36.04 විශ්වවිද්‍යාලරෝහල-කොඅාවී				
2020.01.01 දිනට ඉදිරියට ගෙනඑන ලද අතිරික්ත / හිඟ ශේෂය		(4,242,114,579)		(1,321,157,797)
එකතුකළා : කාලසීමාව සඳහා නැවත ප්‍රකාශිත අතිරික්තය/ (හිඟය)	36.04.01	(1,352,852,558)		(2,920,956,782)
2019.12.31 දිනට ඉදිරියට ගෙනඑන ලද නැවත ප්‍රකාශිත අතිරික්තය /(හිඟය)		**(5,594,967,138)**		**(4,242,114,579)**
36.05අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල				
2020.01.01 දිනට ඉදිරියට ගෙනඑන ලද අතිරික්ත / හිඟ ශේෂය		19,888,381		-
එකතුකළා : කාලසීමාව සඳහා නැවත ප්‍රකාශිත අතිරික්තය/ (හිඟය)	36.05.01	431,042,027		19,888,381
2019.12.31 දිනට ඉදිරියට ගෙනඑන ලද නැවත ප්‍රකාශිත අතිරික්තය /(හිඟය)		**450,930,408**		**19,888,381**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	2019		2018
36.01.01 විශ්වවිද්‍යාලය	(නැවත ප්‍රකාශිත)		(නැවත ප්‍රකාශිත)
වසර සඳහා සමුච්චිත හිඟය	(136,997,977)		(51,606,401)
ගතුදෙනු ස්වභාවය			
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ විශ්‍රාම ප්‍රතිලාභ වියදම් ප්‍රත්‍යාවර්තනය	-		10,317,294
උපචිත වියදම් සඳහා වැඩිපුර ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්තනය	-		4,495,987
ගෘහභාණ්ඩ සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		6,157,866
උපකරණ සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		35,148,398
බැරැක්ක සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		13,619,793
විද්‍යාගාර උපකරණ සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	-		(666,840)
පුස්තකාල පොත් සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		2,276,722
දුරකථන හුවමාරුව සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		12,425
ජංගම වේදිකාව සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	-		(130,888)
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ වැටුප් හා වේතන පිරිවැය ප්‍රත්‍යාවර්තනය	-		223,974,854
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ EPF පිරිවැය ප්‍රත්‍යාවර්තනය	-		27,409,164
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ ETF පිරිවැය ප්‍රත්‍යාවර්තනය	-		5,481,837
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ පුනරාවර්තන ප්‍රදාන ආදායම ප්‍රත්‍යාවර්තනය	-		(256,865,856)
2019 වසර සඳහා දක්ෂිණ මණ්ඩපයේ විශ්‍රාම ප්‍රතිලාභ වියදම් ප්‍රත්‍යාවර්තනය	3,524,854		-
2019 වසර සඳහා වැඩිපුර හඳුනාගත් SMIB පොළී ආදායම ප්‍රත්‍යාවර්තනය	(270,548)		-
2019 වසර සඳහා උපචිත උපාධි ප්‍රදානෝත්සවයේ වියදම්	(51,280)		-
2019 වසර සඳහා උපචිත විභාග වියදම්	(1,764,904)		-
2019 වසර සඳහා උපචිත කසළ බැහැර කිරීමේ වියදම්	(60,568)		-
2019 වසර සඳහා උපචිත වාහන නඩත්තු වියදම්	(6,265)		-
2019 වසර සඳහා උපචිත ගොඩනැගිලි නඩත්තු වියදම්	(60,272)		-
2019 වසර සඳහා උපචිත උපකරණ නඩත්තු වියදම්	(508,024)		-
2019 වසර සඳහා උපචිත අතිකාල හා නිවාඩු දින ගෙවීම් වියදම්	(207,843)		-
2019 වසර සඳහා උපචිත විශ්‍රාම දායකත්ව වියදම්	(83,650)		-
2019 වසර සඳහා උපචිත සලාක දීමනා වියදම්	(644,452)		-
2019 වසර සඳහා උපචිත පර්යේෂණ හා සංවර්ධන වියදම්	(75,000)		-
2019 වසර සඳහා උපචිත පුහුණු හා සංවර්ධන වියදම්	(146,000)		-
2019 වසර සඳහා උපචිත බාහිර කථිකාචාර්ය ගාස්තු වියදම්	(482,411)		-
2019 වසර සඳහා දක්ෂිණ මණ්ඩපයේ වැටුප් හා වේතන පිරිවැය ප්‍රත්‍යාවර්තනය	88,846,526		-
2019 වසර සඳහා දක්ෂිණ මණ්ඩපයේ EPF පිරිවැය ප්‍රත්‍යාවර්තනය	13,157,889		-
2019 වසර සඳහා දක්ෂිණ මණ්ඩපයේ ETF පිරිවැය ප්‍රත්‍යාවර්තනය	2,631,579		-
2019 වසර සඳහා දක්ෂිණ මණ්ඩපයේ පුනරාවර්තන ප්‍රදාන ආදායම ප්‍රත්‍යාවර්තනය	(104,635,994)		-
ගෘහ භාණ්ඩ සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	(308,870)		-
උපකරණ සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	5,695,569		-
බැරැක්ක සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	(1,537,198)		-
විද්‍යාගාර උපකරණ සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂය කිරීම ප්‍රත්‍යාවර්තනය	143,667		-
පුස්තකාල පොත් සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	1,051,141		-
දුරකථන හුවමාරුව සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	1,991		-
2019.12.31 දිනට නැවත ප්‍රකාශිත සමුච්චිත හිඟය	(132,788,041)		19,624,357

	2019		2018
	(නැවත ප්‍රකාශිත)		(නැවත ප්‍රකාශිත)
36.02.01 ස්වයං මූල්‍ය අරමුදල			
කාලසීමාව සඳහා සමුච්චිත අතිරික්තය / (හිඟය)	680,918,426		600,495,990
ගනුදෙනු ස්වභාවය			
2019 වසර සඳහා වැඩිපුර හඳුනාගත් නේවාසිකාගාර ගාස්තු ආදායම ප්‍රත්‍යාවර්තනය	(6,542,814)		-
මාර්ග ජාලය සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	(833,251)		-
ස්වයං මූල්‍ය අරමුදලේ හඳුනාගනු ලැබූ කොආචි රෝහලේ ස්ථාවර තැන්පතු පොළි ආදායම ප්‍රත්‍යාවර්තනය	(32,910,090)		-
ස්වයං මූල්‍ය අරමුදලේ හඳුනාගනු ලැබූ කොආචි රෝහලේ ඉතිරිකිරීම් පොළි ආදායම ප්‍රත්‍යාවර්තනය	(26,747,914)		-
2019 වසර සඳහා උපචිත පර්යේෂණ දීමනා වියදම්	(13,212,425)		-
2019.12.31 දිනට නැවත ප්‍රකාශිත සමුච්චිත හිඟය	600,671,932		600,495,990
36.03.01 දක්ෂිණ මණ්ඩපය			
කාලසීමාව සඳහා සමුච්චිත අතිරික්තය / (හිඟය)	(67,496)		(43,121,615)
ගනුදෙනු ස්වභාවය			
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ විශ්‍රාම පාරිතෝෂික වියදම් හඳුනා ගැනීම	-		(10,317,294)
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ පුනරාවර්තන ප්‍රදාන ආදායම හඳුනා ගැනීම	-		256,865,856
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ වැටුප් හා වේතන පිරිවැය හඳුනා ගැනීම	-		(223,974,854)
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ EPF පිරිවැය හඳුනා ගැනීම	-		(27,409,164)
2018.12.31 දක්වා දක්ෂිණ මණ්ඩපයේ ETF පිරිවැය හඳුනා ගැනීම	-		(5,481,837)
2018.12.31 දිනට නැවත ප්‍රකාශිත සමුච්චිත හිඟය	-		
ගනුදෙනු ස්වභාවය			
2019 සඳහා දක්ෂිණ මණ්ඩපයේ විශ්‍රාම පාරිතෝෂික වියදම් හඳුනා ගැනීම	(3,524,854)		-
2019 සඳහා දක්ෂිණ මණ්ඩපයේ වැටුප් හා වේතන පිරිවැය හඳුනා ගැනීම	(88,846,526)		-
2019 සඳහා දක්ෂිණ මණ්ඩපයේ EPF පිරිවැය හඳුනා ගැනීම	(13,157,889)		-
2019 සඳහා දක්ෂිණ මණ්ඩපයේ ETF පිරිවැය හඳුනා ගැනීම	(2,631,579)		-
2019 සඳහා දක්ෂිණ මණ්ඩපයේ පුනරාවර්තන ප්‍රදාන ආදායම හඳුනා ගැනීම	104,635,994		-
2019.12.31 දිනට නැවත ප්‍රකාශිත සමුච්චිත හිඟය	(3,592,350)		(53,438,909)
36.04.01 විශ්වවිද්‍යාල රෝහල -කොආචි			
කාලසීමාව සඳහා සමුච්චිත අතිරික්තය / (හිඟය)	(1,348,746,226)		(2,875,879,513)
ගනුදෙනු ස්වභාවය			
ගොඩනැගිලි සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		18,548,617
විදුලිබල සැපයුම් මාර්ග සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		201,138
ජල සැපයුම් හා ජලාපවාහන පද්ධති සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		2,212,517
වෙනත් වත්කම් සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	-		(13,286)
රෝහල් ගොඩනැගිල්ලේ ගෘහ භාණ්ඩ සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	-		(68,185,748)
වෛද්‍ය උපකරණ සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	-		(344,731)
2019 වසර සඳහා ඇද ඇතිරිළි තොග හඳුනා ගැනීම	-		2,504,223
ගොඩනැගිලි සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	15,529,522		-
විදුලිබල සැපයුම් මාර්ග සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	201,138		-
ජල සැපයුම් හා ජලාපවාහන පද්ධති සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	2,212,517		-
වෙනත් වත්කම් සඳහා වැඩිපුර ලබාදුන් ක්ෂයකිරීම ප්‍රත්‍යාවර්තනය	1,307,396		-
රෝහල් ගොඩනැගිල්ලේ ගෘහ භාණ්ඩ සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	(68,185,748)		-
ස්වයං මූල්‍ය අරමුදලේ හඳුනාගනු ලැබූ කොආචි රෝහලේ ස්ථාවර තැන්පතු පොළි ආදායම හඳුනාගැනීම	32,910,090		-
ස්වයං මූල්‍ය අරමුදලේ හඳුනාගනු ලැබූ කොආචි රෝහලේ ඉතිරිකිරීම් පොළි ආදායම හඳුනාගැනීම	26,747,914		-
වෛද්‍ය උපකරණ සඳහා ක්ෂය කිරීම සඳහා අඩුවෙන් ලබාදීම ගැලපීම	(14,829,161)		-
2019.12.31 දිනට නැවත ප්‍රකාශිත සමුච්චිත හිඟය	(1,352,852,558)		(2,920,956,782)

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	2019	2018
	(නැවත ප්‍රකාශිත)	(නැවත ප්‍රකාශිත)
36.05.01 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල		
කාලසීමාව සඳහා සමුච්චිත අතිරික්තය / (හිඟය)	556,727,694	252,713,436
ගනුදෙනු ස්වභාවය		
2018දී හඳුනාගත් අගය අනුව පාඨමාලා ගාස්තු ආදායම ප්‍රත්‍යාවර්තනය	-	(232,825,055)
2019දී හඳුනාගත් අගය අනුව පාඨමාලා ගාස්තු ආදායම ප්‍රත්‍යාවර්තනය	(125,685,667)	-
2019.12.31 දිනට නැවත ප්‍රකාශිත සමුච්චිත හිඟය	431,042,027	19,888,381

37. පෙර වර්ෂයේ ගැලපුම් මත සම්පූර්ණ බලපෑම	2019	2018
	(නැවත ප්‍රකාශිත)	(නැවත ප්‍රකාශිත)
37.01 විශ්වවිද්‍යාලය		
ආදායම වැඩිවීම / (අඩුවීම)	(104,906,543)	(256,865,856)
වියදම් වැඩිවීම / (අඩුවීම)	(109,116,479)	(328,096,613)
අතිරික්තය වැඩිවීම / (අඩුවීම)	4,209,936	71,230,757
වත්කම් වැඩිවීම / (අඩුවීම)	8,866,419	56,417,476
වගකීම් වැඩිවීම / (අඩුවීම)	(3,524,854)	(14,813,281)
37.02 ස්වයං මූල්‍ය අරමුදල		
ආදායම වැඩිවීම / (අඩුවීම)	(66,200,818)	-
වියදම් වැඩිවීම / (අඩුවීම)	14,045,676	-
අතිරික්තය වැඩිවීම / (අඩුවීම)	(80,246,494)	-
වත්කම් වැඩිවීම / (අඩුවීම)	(67,034,068)	-
වගකීම් වැඩිවීම / (අඩුවීම)	13,212,425	-
37.03 දක්ෂිණ මණ්ඩපය		
ආදායම වැඩිවීම / (අඩුවීම)	104,635,994	256,865,856
වියදම් වැඩිවීම / (අඩුවීම)	108,160,848	267,183,150
අතිරික්තය වැඩිවීම / (අඩුවීම)	(3,524,854)	(10,317,294)
වගකීම් වැඩිවීම / (අඩුවීම)	3,524,854	10,317,294
37.04 විශ්වවිද්‍යාල රෝහල - කොආවී		
ආදායම වැඩිවීම / (අඩුවීම)	59,658,004	-
වියදම් වැඩිවීම / (අඩුවීම)	63,764,336	45,077,270
අතිරික්තය වැඩිවීම / (අඩුවීම)	(4,106,332)	(45,077,270)
වත්කම් වැඩිවීම / (අඩුවීම)	(4,106,332)	(45,077,270)
37.05 අන්තර්ග්‍රහණය කළ ශිෂ්‍ය අරමුදල		
ආදායම වැඩිවීම / (අඩුවීම)	(125,685,667)	(232,825,055)
අතිරික්තය වැඩිවීම / (අඩුවීම)	(125,685,667)	(232,825,055)
වත්කම් වැඩිවීම / (අඩුවීම)	(125,685,667)	(232,825,055)

11. විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. ඩීඊඑෆ්/සී/කේඩීයූ/01/20/එෆ්ඒ/49

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2021 නොවැම්බර් 03 දින

උප කුලපති
ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) විශ්ව විද්‍යාලයීය රෝහල සඳහා සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයන් වලදී මිලදීගෙන තිබුණු හා භාවිතයට ගන්නා එකතු වටිනාකම රු. 283,815,053 ක වෛද්‍ය උපකරණ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ඉදිරියට කල ගෙවීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා ස්ථාවර වත්කම් ඉහත ප්‍රමාණයෙන් හා වර්ෂයේ ක්ෂය වියදම රු 28,216,753 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 69 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතයට ගත් දින සිට ක්ෂය කිරීම ආරම්භ කලයුතු වුවත් මෙකී ස්ථාවර වත්කම් ක්ෂය නොකිරීම නිසා වත්කම්වල සමුච්චිත ක්ෂය හා සමුච්චිත ඌණතාවය රු රු. 86,499,999 ක් බැගින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) විශ්ව විද්‍යාලයීය දක්ෂිණ මණ්ඩපය පවත්වාගෙන යනු ලබන හෙක්ටයාර 56.8 ක් වූ ඉඩම 2020 මාර්තු 26 දින සෙවනගල ප්‍රාදේශීය ලේකම් විසින් විශ්ව විද්‍යාලය වෙත පවරාදී තිබුණු නමුත් එම ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්ව විද්‍යාලය විසින් 2014 වර්ෂයේදී පරිපාලිත සමාගමක් සංස්ථාපනය කර තිබුණු අතර එම සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබුණු රු.100 සාමාන්‍ය කොටස් 100 හි සම්පූර්ණ අයිතිය විශ්ව විද්‍යාලය සතුව පැවතුණි. එසේ වුවත් මෙම ආයෝජනය පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. එසේම මෙම පරිපාලිත සමාගමේ ගිණුම් විශ්ව විද්‍යාලයේ ගිණුම් සමඟ ඒකාබද්ධ කිරීමට හෝ ඒකාබද්ධ කිරීමට තාක්ෂණික ගැටළු තිබෙනම් ඒ පිළිබඳව හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්ව විද්‍යාලයට අනුබද්ධිත අංශයක වැඩබලන අධ්‍යක්ෂවරයකුගේ නිර්දේශය මත ඉහත කී පරිපාලිත සමාගමේ කොටස් මිලට ගැනීම සඳහා රු. 2,000,000 ක් විශ්ව විද්‍යාලය විසින් සමාගමට ගෙවා තිබුණු නමුත් එම මුදලට කොටස් අත්කර ගැනීමට කටයුතු නොකර ඉහත මුදල සමාලෝචිත වර්ෂයේ අයහාර වියදමක් ලෙස ආදායමට ලියාහැර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය ඉහත ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට විශ්ව විද්‍යාලයේ හා අනුබද්ධ ආයතන වල සම්පූර්ණයෙන් ක්ෂය වූ පිරිවැය රු. 471,600,374 ක් වූ වත්කම් භාවිතා කරමින් පැවතුණි. එසේ වුවත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මෙකී දේපළ පිරියත හා උපකරණ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. එමෙන්ම මෙම වත්කම් පිළිබඳ වූ ඵලදායී ජීවිත කාලයේ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතුකර නොතිබුණි.

(ඊ) විශ්ව විද්‍යාලීය රෝහලේ ප්‍රධාන ඖෂධ ගබඩාව හා අනෙකුත් අංශයන්හි 2020 දෙසැම්බර් 31 දිනට රු. 4,730,553 ක වෛද්‍ය සැපයීම් තොග ඉතිරිව පැවතියද එම තොගය වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව තිබීමෙන් ආදායම් ප්‍රකාශයේ ශුද්ධ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් විශ්ව විද්‍යාලයීය රෝහලේ භාවිතය සඳහා රු. 260,501,370 ක ඖෂධ ලබාදී තිබුණු අතර එම ඖෂධ සඳහා එම දෙපාර්තමේන්තුවට ගෙවීම් කළ යුතු වුවද එම ගෙවිය යුතු මුදල වගකීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එසේම මෙම ඖෂධ වලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පැවති රු. 50,131,260 ක් වූ ඖෂධ තොගය මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් අනුගමණය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිද මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි.

(ඌ) විශ්ව විද්‍යාලයේ ගිණුම් අනුව දැක්වෙන ස්කන්ධ ප්‍රාග්ධනය තුල රු. 321,919,644 ක සංචිත 21 ක් පවත්වා ගෙන ගොස් තිබුණද රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 , 98 (ආ) ඡේදය ප්‍රකාරව එම එක් එක් සංචිතයේ ස්වභාවය හා සංචිත පවත්වාගෙන යාමේ අරමුණු පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(එ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව කිසියම් දේපලක සාධාරණ අගය විශ්වාසදායී ලෙස මැනිය හැකිවිට එහි ප්‍රත්‍යාගණිත අගයට ධාරණය කළයුතු වුවද විශ්ව විද්‍යාලය වෙත 1980 වර්ෂයේදී පවරා තිබුණු අක්කර 48 ක භූමිය, එම වත්කම හඳුනාගත් අවස්ථාවේ පැවති රු. 73,653,874 ක පිරිවැය මත ගිණුම් ප්‍රකාශනවල දක්වා තිබුණි. එබැවින් එම වත්කමෙහි සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන මගින් නිරූපනය කර නොතිබුණි.

(ඒ) විශ්ව විද්‍යාලය, ස්වයං මූල්‍ය අරමුදල, දක්ෂිණ මණ්ඩපය සහ විශ්ව විද්‍යාලයීය රෝහල යන ඒකකයන්ට අයත් ස්පෘශ්‍ය වත්කම් සම්බන්ධ විස්තරාත්මක උපලේඛණ හා ගිණුම් ප්‍රකාශනයන්හි දැක්වෙන සංඛ්‍යා අතර රු. 87,905,907 ක වෙනසක් පැවතුණි.

(ඔ) විශ්ව විද්‍යාලය සතු භෞතික හා මානව සම්පත් භාවිතා කරමින් විශ්ව විද්‍යාලය තුළ පවත්වාගෙන යනු ලබන සමාජ ශාලාව, බේකරිය, ජන අවන්හල සහ ආපනශාලාව යන ඒකකයන් විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.3,129,740 ක ලාභයක් උපයා තිබුණු නමුත් එය විශ්ව විද්‍යාලයේ ආදායමක් ලෙස ගිණුම් තුළින් නිරූපණය කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 විශ්ව විද්‍යාලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්ව විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්ව විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්ව විද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්ව විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත්වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණයන් හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්ව විද්‍යාලය විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ගෙන් සමහරක් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්ව විද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	අංක 1/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය	අංක 1/2014 හා 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව සියළුම ව්‍යවස්ථාපිත ආයතන විසින් තම ව්‍යවස්ථාපිත පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමක් පිළියෙල කළයුතු වුවත් විශ්ව විද්‍යාලය විසින් 2020 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලසුමක් පිළියෙල කර නොතිබුණි.

(ආ)	අංක පීඊඩී/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	අංක පීඊඩී/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 ඡේදය ප්‍රකාරව යම් පරිපාලිත/ආශ්‍රිත හෝ වෙනත් අස්ථිත්වයක අරමුදල් ආයෝජනය කිරීම, මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය රහිතව සිදු නොකළයුතු වුවත් එවැනි එකඟතාවක් රහිතව ඉහත 1.2 (ඇ) ඡේදයේ සඳහන් පරිපාලිත සමාගමේ කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් රු. 2,000,000 ක් ලබාදී තිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අටවන පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරයේ 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව උපදේශ.	2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ශිෂ්‍යයන් බඳවාගැනීම සහ පාලක මණ්ඩලයේ තීරණ වලංගුකාවය යන කරුණු ආවරණය වන ලෙස විශ්ව විද්‍යාලයට ගැලපෙන ලෙස ජනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල පනත සංශෝධනය කරගන්නා ලෙස දැනුම් දී තිබුණද සමාලෝචිත වර්ෂය තුලදීද පනත සංශෝධනය කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ

(i)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) වගන්තිය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාල කරනු ලැබිය යුතු වුවත් 2020 වර්ෂයේ විශ්ව විද්‍යාලයේ ස්වයං මූල්‍ය අරමුදලින් ඉටුකිරීමට අපේක්ෂිත රු.මිලියන 1,663.32 ක ප්‍රසම්පාදන කාර්යයන් 24 ක් සඳහා පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.
(ii)	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) වගන්තිය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ වීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ඇතුලත් කර ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කර යුතු වුවත්

විශ්ව විද්‍යාලය විසින් ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කල ප්‍රසම්පාදන කාර්යයන් සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙළ කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2.(අ) වගන්තිය.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2.(අ) ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු ක්‍රමය මගින් ලංසු කැඳවීමේදී ප්‍රසම්පාදන දැන්වීම හැකි සෑම අවස්තාවකදීම අවම වශයෙන් වැඩි අලෙවියක් සහිත ජාතික පුවත්පතක පල කර යුතු වුවද ජාතික තරගකාරී ලංසු කැඳවීම් විද්‍යුත් තැපෑල මගින් සිදුකර තිබූ අවස්ථා පැවතුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර විශ්ව විද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
1981 අංක 68 දරණ ජෙනරල් ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන පනත සහ 1988 අංක 27 හා 2007 අංක 50 දරන සංශෝධන පනත්.	පූර්වෝක්ත පනතේ දැක්වෙන විශ්ව විද්‍යාලය පිහිටුවීමේ පරමාර්ථ අනුව කැඩෙට් නිළධරයන්, නිලධරයන් සහ රජයේ නිලධරයන් සඳහා රාජ්‍ය ආරක්ෂාව සහ යුධ හමුදා කළමනාකරණය සඳහා අදාල වන අධ්‍යයන අංශයන් සම්බන්ධයෙන් අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සහ උපදෙස් සැපයීම වුවද එම පරමාර්ථයෙන් බැහැරව 2011 වර්ෂයේ සිට කැඩෙට් නිළධරයන් හෝ රජයේ නිළධරයන් නොවන දේශීය හා විදේශීය සිසුන් වෙත මුදල් ගෙවීමේ පදනම මත උපාධි පිරිනැමීම ආරම්භකර තිබුණු අතර 2019/ 2020 අධ්‍යයන වර්ෂය සඳහා එවැනි සිසුන් 786 ක් සඳහා උපාධි පාඨමාලා 21 ක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර විශ්ව විද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

විශ්වවිද්‍යාලීය ශික්ෂණ රෝහල ඉදිකිරීම හා උපකරණ මිලදීගැනීම සඳහා භාණ්ඩාගාර ඇපකර මත 2013 වර්ෂයේදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රු. මිලියන 3,165.82 ක ණය මුදලක් හා එක්සත් ජනපද ඩොලර් මිලියන 177.33 ක ණය මුදලක් ලබාගෙන තිබුණි. මෙම ණය මුදලේ අවසන් වාරිකය 2017 ජනවාරි 10 දින

ලබාගෙන තිබූ අතර ඉන් එක්සත් ජනපද ඩොලර් 26,229,586 ක් සමාලෝචිත වර්ෂය වන විටත් නිශ්චිත කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණු අතර එක්සත් ජනපද ඩොලර් 20,911,260 ක් (රු.මිලියන 3,903.08) ස්ථාවර කැම්පතු ගිණුම් 03 ක ද, එක්සත් ජනපද ඩොලර් 6,229,586 ක් (රු.මිලියන 1,162.75) ඉතුරුම් තැන්පතු ගිණුමකද සියයට 01.02 සිට සියයට 5.5 ක් වූ වාර්ෂික පොලී අනුපාතයන් යටතේ ආයෝජනය කර තිබුණි. කෙසේ වෙතත් මෙම ණය මුදලේ වාර්ෂික පොලී ගෙවීම සඳහා සියයට 15 ක් හා සියයට 8.5 ක් බැගින් භාණ්ඩාගාර ප්‍රතිපාදන සලසා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) 2017 දෙසැම්බර් මාසයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණු විශ්ව විද්‍යාල රෝහල තුළ ඇඳන් 496 ක් ස්ථාපිතව පැවති අතර විගණනයට ඉදිරිපත්කල තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ රෝගීන් 16,255 ක් නේවාසික ප්‍රතිකාර ලබාගෙන තිබුණි. ඒ අනුව රෝහලේ ඇඳ පිරිවැටුම් අනුපාතය (Bed Turnover Rate) සියයට 45.12 ක ප්‍රතිශතයක පැවති බැවින් රෝහල් ඇඳන් උපයෝජනයේ ඵලදායීතාව (Productivity of Hospital Beds) අඩු මට්ටමක පැවතුණි.

(ආ) තවද 2017 දෙසැම්බර් මාසයේදී රෝහලේ මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණු නමුත් රෝහල තුල ස්ථාපිත හදිසි අනතුරු ඒකකය ඇතුළු ඒකක තුනක් හා වාට්ටු තුනක්, ප්‍රමාණවත් වෛද්‍ය සහ වෙනත් කාර්ය මණ්ඩල නොමැති වීම හේතුවෙන් 2021 අප්‍රේල් 28 දින දක්වාත් නිශ්චිත කාර්යය සඳහා යෙදවීමට නොහැකිව තිබුණි. කෙසේ වෙතත් හදිසි අනතුරු ඒකකය හා වාට්ටු දෙකක් පමණක් 2020 අප්‍රේල් මාසයේ සිට කොරෝනා වෛරසය ආසාදිත රෝගීන්ගේ ප්‍රතිකාර කිරීම වෙනුවෙන් භාවිතා කරමින් පැවතුණි.

(ඇ) 2018 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මිලදීගෙන තිබුණු වටිනාකම රු.2,058,138 ක් වූ වෛද්‍ය උපකරණ වර්ග 07 කට අදාල ඒකක 277 ක් භාවිතයට ගැනීමකින් තොරව ගබඩාගතව පැවතුණි.

(ඈ) 2018 මාර්තු 21 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විශ්ව විද්‍යාලයට අනුයුක්ත ත්‍රිවිධ හමුදා කාර්ය මණ්ඩල ප්‍රතිසංස්කරණයක් සිදුකර ඒ සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සිදුකරන ලෙස නිර්දේශ කර තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොමැති බවද නිරීක්ෂණය විය.

(ඉ) කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 577/ ඒ වෙරහැර දකුණ ග්‍රාම නිළධාරී වසෙම් පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් අක්කර 48 රූඩ් 02 පර්චස් 16.2 ක් වූ භූමිය තුල විශ්ව විද්‍යාලයීය ශීක්ෂණ රෝහල සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථාන වෛද්‍ය බලකාය ස්ථාපිත කර තිබූ අතර එම ඉඩම ආරක්ෂක අමාත්‍යාංශය වෙත අත්පත් කරගැනීම සඳහා රු. 5,054,000,000 ක අතිරේක ප්‍රතිපාදන සලසා දීමට 2017 අප්‍රේල් 25 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර තිබුණි.

පූර්වෝක්ත තීරණයෙන් වර්ෂ 04 කට අධික කාලයක් ගතවී ඇතත් අදාල ඉඩම අත්පත් කර ගැනීමේ කාර්යය අවසන් කර නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් රෝහල ඉදිකර තිබූ භූමියේ අයිතිය විශ්ව විද්‍යාලය වෙත පැවරී නොතිබුණි.

(ඊ) විශ්ව විද්‍යාලය සහ ඊට අනුබද්ධිත ආයතන විසින් පවත්වාගෙන ගොස් තිබූ ජංගම ගිණුම් 8 ක සමාලෝචිත වර්ෂය තුල පවත්වාගෙන ගොස් තිබූ සාමාන්‍ය මාසික ශේෂය රු.239,849,373 ක් විය. මෙම අතිරික්ත අරමුදල් කෙටිකාලීන ආයෝජන සඳහා යොදවා ආදායම් රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබලිව.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති